# මව්බස

## ගුරු මාර්ගෝපදේශය

## 1 ශ්‍රේණිය



(2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)


මුල් ළමාවිය සංවර්ධනය හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය, ශ්‍රී ලංකාව

www.nie.ac.lk

මුද්‍රණය හා බෙදා හැරීම : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# මව්බස
# ගුරු මාර්ගෝපදේශය

**(2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**

## 1 ශ්‍රේණිය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
www.nie.ac.lk

මුද්‍රණය හා බෙදා හැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

මව්බස-ගුරු මාර්ගෝපදේශය
1 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2025

© ජාතික අධ්‍යාපන ආයතනය
සියලු ම හිමිකම් ඇවිරිණි

කෙටි උපුටා දැක්වීම් සහ ප්‍රකාශන හිමිකම් නීතිය මගින් අවසර දී ඇති වෙනත් ඇතැම් වාණිජ නොවන භාවිත හැර, ප්‍රකාශකයාගේ පූර්ව ලිඛිත අවසරයකින් තොර ව, මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් කිසිදු ආකාරයකින් හෝ ඡායා පිටපත් කිරීම, පටිගත කිරීම හෝ වෙනත් විද්‍යුත් හෝ යාන්ත්‍රික ක්‍රම ඇතුළු ව කිසිදු ආකාරයකින් ප්‍රතිනිෂ්පාදනය, බෙදා හැරීම හෝ සම්ප්‍රේෂණය කළ නොහැකි ය.

ISBN

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.ac.lk
විද්‍යුත් තැපෑල : info@nie.edu.lk

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
..........................................................................
මුද්‍රණය කරවා බෙදා හරින ලදි.
Published by: National Institute of Education
Printed by :

# විෂයමාලා දායකත්වය

## උපදේශකත්වය

**මහාචාර්ය මංජුලා විතානපතිරණ**
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

**ආචාර්ය දර්ශන සමරවීර**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය

## අධීක්ෂණය

**ආර්. එම්. කුමුදුමලී ද සිල්වා මිය**
අධ්‍යක්ෂ, මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය

## විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| නිර්මලා ජයසිංහ මෙණෙවිය | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය |

## බාහිර සම්පත් දායකත්වය

| | | |
|---|---|---|
| එච්. පී. සුසිල් සිරිසේන මයා | - | උපපීඨාධිපති<br>හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය |
| ඩබ්ලිව්. කරුණාරත්න මයා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය, ගිරාගම |
| දීපිකා පෙරේරා මිය | - | (විශ්‍රාමික) ගුරු |
| කේ. ඩී. අයි. නදීරා මිය | - | විද්‍යාකර බාලිකා විද්‍යාලය, මහරගම |

## භාෂා සංස්කරණය

| | | |
|---|---|---|
| ඩබ්ලිව්. කරුණාරත්න මයා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය, ගිරාගම |

## පිටකවරය හා චිත්‍ර නිර්මාණය

| | | |
|---|---|---|
| සමන් කලුබෝවිල මයා | - | කථිකාචාර්ය, හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය |
| පසන් සම්පත් වික්‍රමතිලක මයා<br>(චිත්‍ර ගුරු) | - | බප/හෝ/වැලිකන්න රෝමානු කතෝලික<br>කනිෂ්ඨ විද්‍යාලය, වග |
| එම්. ඩී. ඉසුරු ධනුෂ්ක මඩපාත මයා | - | ර/අනුර මහා විද්‍යාලය, ගැටහැත්ත |

## පරිගණක අක්ෂර සංයෝජනය සහ පිටු සැකසුම

| | | |
|---|---|---|
| පී. කේ. සී. කේ. පිටිගල මයා | - | ර/නිවි/ ලෝකදෙණිය විද්‍යාලය, කරවිට |
| ඒ. ඩී. අනුෂා තරංගනී මිය | - | පරිගණක ග්‍රැෆික් නිර්මාණකරු<br>ජාතික අධ්‍යාපන ආයතනය |

## විවිධ සහාය

| | | |
|---|---|---|
| ඩබ්ලිව්.එච්. ටියුඩර් සිල්වා මයා | - | කළමනාකරණ සහකාර<br>ජාතික අධ්‍යාපන ආයතනය |

# ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පරිවර්තනීය ප්‍රතිසංස්කරණ ප්‍රයත්නය සෑම ඉගෙනුම්ලාභියෙකුගේ ම අවශ්‍යතා සපුරාලීම සඳහා තීරණාත්මක මාවතක් අරමුණු කර ඇත.

නිපුණතා පාදක ඉගෙනුම, විචාරාත්මක චින්තනය, නිර්මාණශීලීත්වය, විසි එක්වන සියවසේ කුසලතා, තාක්ෂණික නැඹුරුව, සදාචාරාත්මක පුරවැසිභාවය වැනි බොහෝ අංශ අවධාරණය කිරීමට හැකි වන පරිදි විෂයමාලාව, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම සහ තක්සේරු පිළිවෙත් යනාදිය නවීකරණය මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි පදනම විය.

අධ්‍යාපනඥයින්, අන්තර්වෛෂයික විද්වතුන්, ගුරුවරුන් සහ විවිධ පාර්ශ්වකරුවන් සමග සහයෝගී සංවාදයක් ඔස්සේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජිත විෂයමාලා හා අදාළ ඉගෙනුම් ද්‍රව්‍යවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා විශේෂ උනන්දුවකින් කටයුතු කළ ගරු අග්‍රාමාත්‍යතුමිය, අධ්‍යාපන ලේකම්තුමා, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන්, විෂයභාර නිලධාරීන්, විභාග කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් හා කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය අතිමහත් ය.

එමෙන්ම මෙම කාර්යයේදී විශේෂ කැපවීමක් සිදු කළ ජාතික අධ්‍යාපන ආයතනයේ පාලක සභාවේ හා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ කැපවීම ද ගෞරව පූර්වක ව සිහිපත් කරමි. මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීමට ඉමහත් ලෙස කැප වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සියලු කාර්ය මණ්ඩලයට ජාතියේ ගෞරවය හිමි විය යුතු බව සඳහන් කරමි.

**මහාචාර්ය මංජුලා විතානපතිරණ**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

සමස්ත පාසල් විෂයමාලාව සඳහා හඳුනා ගෙන ඇති පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර නිරන්තරයෙන් වෙනස් වන රටක සහ ලෝකයක තිරසර සංවර්ධනය කෙරෙහි වන අභියෝග ජය ගැනීමට එම ජාතියට ඇති හැකියාව පිළිබිඹු කරයි. එමෙන්ම කලින් කලට වෙනස් වන ඉල්ලුම්වලට ගැළපෙන සේ පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර ද හඳුනා ගෙන ඇත. එසේ ම පවතින පාසල් විෂයමාලාවෙහි විෂයයන් නවීකරණය වන අතර ම නව විෂයයන් පාසල් විෂයමාලාවට හඳුන්වා දීම සිදු කෙරෙයි. මෙම සිදු වන වෙනස්කම්වලට අනුරූප ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ද කාලානුරූප ව සංවර්ධනය වෙයි. ඒ අනුව 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන නව විෂයමාලාවට අදාළ ව සෑම පාසල් විෂයයක් සඳහා ම ඉගෙනුම් ද්‍රව්‍ය හඳුන්වා දී ඇත.

2026 වර්ෂයේදී 1 ශ්‍රේණිය සඳහාත් 2027 වර්ෂයේදී 2 ශ්‍රේණිය සඳහාත් 2028 වර්ෂයේදී 3 ශ්‍රේණිය සඳහාත් 2029 වර්ෂයේදී 4 ශ්‍රේණිය සඳහාත් 2030 වර්ෂයේදී 5 ශ්‍රේණිය සඳහාත් ප්‍රාථමික අධ්‍යාපන ශ්‍රේණි සඳහා නව විෂයමාලා හඳුන්වා දීමට නියමිත ය. ප්‍රාථමික අධ්‍යාපන අවධියේ සිසුන් සඳහා ක්‍රියාකාරකම් පොත් සකස් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය මගපෙන්වීම ගුරුවරයාගෙන් සිදු කෙරෙයි. ගුරුවරුන්ට ලබා දෙන උපදෙස් ගුරු මාර්ගෝපදේශවල ඇතුළත් කර ඇති අතර සිසුන්ට අවශ්‍ය සංකල්ප පිළිබඳ දැනුම මෙන් ම ලබා ගත් දැනුම භාවිත අවස්ථාවලට යොමු කර සිසු හැකියා සංවර්ධනයට මෙම විෂයමාලාව බෙහෙවින් උපකාර වන බව අපගේ විශ්වාසයයි. විසි එක්වන සියවසේ කුසලතා සංවර්ධනයටත් එමගින් සිසු පෞරුෂය සංවර්ධනයටත් හඳුන්වා දෙනු ලබන විෂයමාලාවේ ඇතුළත් ක්‍රියාකාරකම් මනා පිටුබලයක් වනු ඇත.

නව විෂයමාලා ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට මූලික කටයුතු කළ අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරුන්ගේ හා ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ සේවාව ඉතා අගය කරමි. තවද මෙම විෂයමාලා ද්‍රව්‍ය සකස් කිරීමේදී දායක වූ ආයතනයේ සියලු ම කාර්ය මණ්ඩලයට ද ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, අධ්‍යක්ෂවරුන් මෙන් ම රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ලබා දෙන ලද දායකත්වය මෙම ඉගෙනුම් ද්‍රව්‍ය ගුණාත්මක ව ඉහළ මට්ටමකට සංවර්ධනය වීමට ඉවහල් වූ බව ඉතා සතුටින් සිහිපත් කරමි.

**ආචාර්ය එස්. ඒ. ඩී. සමරවීර**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යක්ෂ පණිවුඩය

ප්‍රාථමික අධ්‍යාපන කාල පරිච්ඡේදය ළමා සංවර්ධනයේ ඉතා ම තීරණාත්මක අවධියකි. අනාගතයේ සාර්ථක පුරවැසියෙක් වශයෙන් ජීවත් වීමට අවශ්‍ය කුසලතා මෙන් ම ඉදිරි ඉගෙනුම සඳහා වන පදනම සංවර්ධනය වන්නේ ද මෙම කාල පරිච්ඡේදයේදී ය. මෙම අවධිය තුළ කායික, බුද්ධිමය, සමාජීය හා චිත්තවේගීය වශයෙන් සිදු වන්නා වූ සමස්ත සංවර්ධනය උපරිම අයුරින් ගොඩනැගීම සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කර දීම ප්‍රාථමික අධ්‍යාපනයේ ප්‍රමුඛ කාර්යභාරය විය යුතු ය.

අභියෝගවලට සාර්ථක ව මුහුණදීමට හැකි වන පරිදි සිසුන්ගේ පෞරුෂ සංවර්ධනයට අවශ්‍ය පදනම සකස් කිරීම අත්‍යවශ්‍ය ය. ළමා සංවර්ධනයේදී දරුවාට නිවැරදි ව හා පීඩාවක් නොවන අයුරින් උත්තේජන සැපයීම සිදු කෙරෙන ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර දීම අනිවාර්යයෙන් ම සිදු විය යුතු ය. ඒ සඳහා සෙල්ලම්, විනෝදජනක ක්‍රියාකාරකම් හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් ආශ්‍රිත ඉගෙනුම් අද්දැකීම් ලබා දීම අවශ්‍ය ය. මේ සඳහා සැම සිසුවෙකුට ම ඉගෙනුමට ප්‍රවේශ විය හැකි ආකාරයට මෙම ඉගෙනුම් අද්දැකීම් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය ය. එමෙන්ම නිවසින් හා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයෙන් විධිමත් පාසලේ පළමුවන ශ්‍රේණියට ද, ප්‍රාථමික පාසලෙන් ද්විතීයික පාසලට ද සුමට ලෙස සංක්‍රාන්ති වීම සඳහා දරුවාට අවශ්‍ය සහාය ලබා දීම කෙරෙහි අවධානය යොමු කිරීම මෙහි දී සිදු විය යුතු ය.

ඒ අනුව ප්‍රාථමික ශ්‍රේණි සඳහා නව විෂයමාලාව සකස් කිරීමේදී ලෝකයේ විවිධ රටවල පිළිගත් ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලා අධ්‍යයනය කරන ලද අතර ළමා සංවර්ධනය හා ඉගෙනුම පිළිබඳ ව දාර්ශනිකයන් හා මනෝවිද්‍යාඥයන් විසින් පළ කරන ලද අදහස් පිළිබඳ අවධානය යොමු කරන ලදි. එමෙන්ම මෙයට පෙර වසරවල සිදු කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විෂයමාලා නවීකරණ මෙන් ම විෂයමාලා යාවත්කාලීන කිරීම් පිළිබඳව ද අධ්‍යයනයට භාජනය විය. ඊට අමතර ව විවිධ ක්ෂේත්‍රවල විද්වතුන් සමග සිදු කරන ලද සාකච්ඡා ඇසුරින් ලද තොරතුරු ද 2020න් ඔබ්බට පුරවැසියන්ට මුහුණ දීමට සිදු වන අභියෝග පිළිබඳව ද අවධානයට ලක් විය. එහිදී දරුවන්ගේ කුසලතා සංවර්ධනය කිරීම මෙන් ම සමාජීය හා චිත්තවේගීය නිපුණතා සංවර්ධනය කිරීම සඳහා අත්‍යවශ්‍ය මගපෙන්වීම් පිළිබඳ ව ද සැලකිල්ලට භාජනය කරන ලදි. උක්ත කරුණු පදනම් කර ගෙන සංවර්ධනය කරන ලද මෙම විෂයමාලාව සැම සිසුවකුට ම තම අනන්‍යතාවට ගැළපෙන පරිදි උපරිම සංවර්ධනයක් ලබා ගැනීමට මගපෙන්වන්නකි.

2026 වසරේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පළමුවන ශ්‍රේණියේ මූලික විද්‍යාව හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්, සෞන්දර්ය අධ්‍යාපනය, ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි සහ දෙවන ජාතික භාෂාව යන විෂයවලට අදාළ ව හඳුන්වා දෙන ගුරු මාර්ගෝපදේශයෙහි ඒ ඒ විෂය යටතේ පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම් ඇතුළත් කර ඇත. මව්බස සහ ගණිතය සඳහා වෙන වෙන ම ගුරු මාර්ගෝදේශ ඉදිරිපත් කෙරේ. එම මගපෙන්වීම් අනුව ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සංවිධානය කර ගැනීම ගුරුභවතුන්ගේ වගකීම වේ.

**ආර්. එම්. කේ. ද සිල්වා**
අධ්‍යක්ෂ
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# හැඳින්වීම

2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන අධ්‍යාපන ප්‍රතිසංස්කරණයට අදාළ ව සකස් කරන ලද පළමුවන ශ්‍රේණියේ මව්බස (සිංහල) විෂය නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳ සංක්ෂිප්ත සටහනක් මෙයින් ඉදිරිපත් කෙරෙයි.

විසි එක්වන සියවසේ අධ්‍යාපන අභියෝග ජයගත හැකි වන පරිදි ජාතික අධ්‍යාපන අරමුණු පදනම් කර ගෙන මව්බස (සිංහල) විෂයමාලාව සකස් කර ඇත. ඒ අනුව සකස් කර ඇති මව්බස (සිංහල) විෂය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අභිමතාර්ථ හයක් හඳුනා ගෙන ඇත. එම අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා කාර්ය සාධන ක්ෂේත්‍ර හයක් ඉදිරිපත් කර ඇත. එක් එක් කාර්ය සාධන ක්ෂේත්‍ර යටතේ හඳුනා ගත් සීමාව ඉගෙනුම් පල මගින් ද එම ඉගෙනුම් පල ඉටු කර ගැනීමේදී ශිෂ්‍යයාගෙන් අපේක්ෂිත සාධන මට්ටම් කාර්ය සාධන ප්‍රමිති යටතේ ද දක්වා තිබේ. කාර්ය සාධන ප්‍රමිති කරා ළඟා වීමට යෝග්‍ය වන විෂය අන්තර්ගතය ද ඉදිරිපත් කර ඇත.

පූර්වෝක්ත කරුණු සැලකිල්ලට ගනිමින් පියවර අනුක්‍රමයක් සහිත සංවිධිත වූ ක්‍රියාකාරකම් සන්තතියක් සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා මගපෙන්වීම් මෙම මව්බස ගුරු මාර්ගෝපදේශයෙහි ඇතුළත් වේ. මව්බස විෂය සඳහා සතියකට පැය 05 ක කාලයක් වෙන් කෙරෙයි. මෙම ක්‍රියාකාරකම් ක්‍රීඩා පාදක ඉගෙනුම් අද්දැකීම් සහ සුතථ්‍ය ඉගෙනුම් අද්දැකීම් ඔස්සේ සංවර්ධනය කර ඇත.

සෑම ඉගෙනුම් පලයකට ම අදාළ ව ක්‍රියාකාරකම් ආරම්භයට පෙර ඊට අදාළ විෂය නිර්දේශයේ උද්ධෘත කොටස ඉදිරිපත් කර ඇත. සමස්ත ගුරු මාර්ගෝපදේශයේ ම ක්‍රියාකාරකම් සැලසුම් කර ඇති ආකාරය පිළිබඳ ගුරුවරයාට මනා අවබෝධයක් තිබිය යුතු ය. ඒ සඳහා ගුරු මාර්ගෝපදේශය හොඳින් අධ්‍යයනය කර මව්බස විෂයට අදාළ පරිඥානය ලබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

එක් එක් කාර්ය සාධන ප්‍රමිතියට දී ඇති නිර්ණායක සහ අදාළ ප්‍රාප්ති මට්ටම් ඔබ හොඳින් අධ්‍යයනය කිරීම ඉතා වැදගත් වේ. ඒ අනුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී සෑම සිසුවෙකු වෙත ම ගොස් ඔවුන් නිරීක්ෂණය කරමින්, අවශ්‍ය සහාය දැක්වීම හා මගපෙන්වීම ඔබ සතු වගකීමකි. ඒ අතරතුරදී සෑම සිසුවෙකුගේ ම ප්‍රාප්ති මට්ටමේ ස්වභාවය මැනවින් විනිශ්චය කර අදාළ තක්සේරු පත්‍රිකාවේ සටහන් කළ යුතු ය. සෑම කාර්ය සාධන ප්‍රමිතියකට ම අදාළ ව සෑම සිසුවෙකුගේ ම ප්‍රාප්ති මට්ටම් ඔබ විසින් තහවුරු කළ යුතු ය. ඉන් අනතුරුව අදාළ කාර්ය සාධන ප්‍රමිතියේ එක් එක් සිසුවාගේ ප්‍රාප්ති මට්ටමට ගැළපෙන පරිදි අවශ්‍ය ඉදිරි පෝෂණ හෝ ප්‍රතිපෝෂණ ක්‍රියාකාරකම් සිදු කළ යුතු ය. සියලු සිසුන් ප්‍රවීණතා මට්ටමට ළඟා කරවීම ඔබ සතු යුතුකමක් මෙන් ම වගකීමක් ද වේ.

සෑම ක්‍රියාකාරකමකට ම අදාළ ව ඉගෙනුම් සම්පත් සකස් කර ගැනීම හා ඒවා ඵලදායි ලෙස භාවිත කිරීම අත්‍යවශ්‍ය වූවකි. අදාළ ඉගෙනුම් සම්පත්වලින් තොර ව ක්‍රියාකාරකම් සාර්ථක ව සිදු කිරීම අසීරු වනු ඇත. ගුරු මාර්ගෝපදේශය හොඳින් අධ්‍යයනය කර, මනා සූදානමකින් හා කැපවීමකින් යුතු ව සිදු කරන ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායි වනු නියත ය.

පළමුවන ශ්‍රේණියේ පළමුවන වාරයට සිසුන් සඳහා **අකුරු නුවණ 1**, **අකුරු නුවණ 2** ලෙස ක්‍රියාකාරකම් පොත් දෙකක් සකස් කර ඇත. **අකුරු නුවණ 1** පොත පූර්ව භාෂා කුසලතා සඳහාත් **අකුරු නුවණ 2** පොත පෙර ලිවීමේ අකුරු හැඩ සහ මධ්‍ය අක්ෂර ලිවීම සඳහාත් වෙන් කර ඇත. **කියවීම් පොත** පළමුවන වාරයේදී ලබා දුන්න ද එය වර්ෂය පුරා වාර තුන සඳහා භාවිත කළ යුතු ය. ඉගෙනුම් පල සාධනය සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ යෝජනා කර ඇති පරිදි එම ක්‍රියාකාරකම් පොත් සහ කියවීම් පොත භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

මෙම කුසලතා පූර්ණත්වයෙන් අනතුරුව දෙවන වාරය සඳහා සිසුන් මනා සූදානමකින් යුතු ව සිටිනු ඇතැයි අපේක්ෂා කරන අතර එමගින් ලබා ගත් හැකියාව දෙවන වාරයට නිර්දිෂ්ට ඉගෙනුම් පල කරා ළඟා කරවීමට මනා පිටුබලයක් වනු ඇතැයි අපේක්ෂා කරමි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයට පූර්වයෙන් මව්බස ගුරු මාර්ගෝපදේශයේ ඇතුළත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සහ තක්සේරුකරණය පිළිබඳ පූර්ණ අවබෝධයකින් යුතු ව කටයුතු කර දෙවන වාරයට නිර්දිෂ්ට ඉගෙනුම් පල කරා සිසුන් ළඟා කරවනු ඇතැයි අපේක්ෂා කරමි. කියවීමේදී හා ලිවීමේදී ආරෝහණ අක්ෂර, අවරෝහණ අක්ෂර නිවැරදි ව භාවිත කිරීමේ කුසලතා සංවර්ධනය සඳහා **අකුරු නුවණ 3** පොත ලබා දී ඇත.

ඔබ පන්ති කාමරයේ සිටින සිසුන් පළමුවන හා දෙවන වාරවලදී නිර්දිෂ්ට ඉගෙනුම් පල අත්පත් කර ගෙන තුන්වන වාරයට සූදානම් වී සිටිනු ඇතැයි අපේක්ෂා කරමු. තුන්වන වාරය සඳහා ද සමාජ භාෂා කාර්යය සංවර්ධනයට අවස්ථාව ලබා දී ඇති අතර ශාස්ත්‍රීය භාෂා කාර්යය සංවර්ධනයෙහිලා කියවීමේදී හා ලිවීමේදී පිලි යෙදුණු අකුරුවල භාවිතය අවධාරණය කර ඇත. ඒ සඳහා වන අභ්‍යාස **අකුරු නුවණ 4** පොතෙහි ඇතුළත් වේ. අර්ථවත් වාක්‍ය, කථන ව්‍යවහාරයෙන් ලිවීමට අවස්ථාව සපයා දී ඇති අතර මෙකී සියල්ල භාෂා සංවර්ධනයෙහි ලා උපකාර වන අයුරින් සංවර්ධනය කර ඇත. භාෂාව විෂයයක් ලෙස එහි වපසරිය තුළ පළමුවන ශ්‍රේණියේ සිසුවෙකුගෙන් අපේක්ෂිත හැකියාවත් දෙවන ශ්‍රේණිය සඳහා අවශ්‍ය භාෂාමය සූදානමත් අනාගතයේදී භාෂාව විෂයයක් ලෙස හැදෑරීමට අවශ්‍ය පදනමත් සපයා දීම සඳහා අවශ්‍ය විෂය අන්තර්ගත තුන්වන වාරය සඳහා ද ඉදිරිපත් කර ඇත.

පළමුවන ශ්‍රේණිය අවසන් වන විට සිසුන් භාෂා භාවිතයත් වාක්කෝෂ සංවර්ධනය හා භාවිතයත් භාෂා විග්‍රහයත් රස වින්දනයත් චින්තනය හා නිර්මාණශීලිත්වයත් විෂයාන්තර සමෝධානයත් මව්බස විෂයයට අයත් කාර්ය සාධන ක්ෂේත්‍ර ඔස්සේ අදාළ කාර්ය සාධන ප්‍රමිති මගින් ඉගෙනුම් පල කරා ළඟා වනු ඇතැයි අපේක්ෂා කරමු. මේ සඳහා මව්බස විෂයයේ ප්‍රධාන අරමුණ, අභිමතාර්ථ හා කාර්ය සාධන ක්ෂේත්‍ර ඔස්සේ පළමුවන ශ්‍රේණියේ සිසුවෙකුගෙන් අපේක්ෂා කරන ඉගෙනුම් පලත් එහි සීමාව පිළිබඳවත් ලබා ගන්නා නිවැරදි අවබෝධය ඉතා වැදගත් වේ.

මව්බස විෂය ඉගැන්වීමේදී සතුටින්, සැහැල්ලුවෙන් හා විනෝදයෙන් අදාළ විෂය කරුණු සිසුන්ට ලබා දීමට අවශ්‍ය පරිසරය සකස් කළ යුතු ය. ඒ සඳහා ගුරු මාර්ගෝපදේශයේ දී ඇති ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මනා ව අධ්‍යයනය කර කිසිදු පීඩනයකින් තොර ව අවශ්‍ය විෂය කරුණු සිසුන්ට ලබා දීමට කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි. ක්‍රීඩා පාදක ඉගෙනුම සහ සුතථ්‍ය ඉගෙනුම ප්‍රමුඛ කර ගනිමින් ඉතා රසවත් ව මව්බස විෂය ඉගැන්විය යුතු ය. සිසුන් සාහිත්‍ය කලාවලින් ඈත් වන යුගයක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී අදාළ විෂය කරුණු සාහිත්‍ය ප්‍රවේශ ආශ්‍රයෙන් ඉදිරිපත් කිරීමට පළමුවන ශ්‍රේණියේ මව්බස විෂය මගින් කටයුතු කර ඇති ආකාරය ද මනා ව අවබෝධ කර ගත යුතු ය. **විෂය සමගාමී ක්‍රියාකාරකම්, පන්ති කාමර පුස්තකාලය, පන්ති කාමර වේදිකාව** භාවිතය මගින් භාෂා කුසලතා ඔප් නැංවීමට කටයුතු කිරීම වැදගත් වේ. සියලු ම සිසුන්ට මව්බස විෂය සතුටින් හැදෑරීමටත් පාසල් සිසුවෙකු වශයෙන් මෙන් ම සමාජීය පුරවැසියෙකු වශයෙන් කටයුතු කිරීමට අවශ්‍ය පරිසරය මෙම විෂයයෙන් ලබා දීමට කටයුතු කරනු ඇතැයි උදක් ම අපේක්ෂා කරමු.

**පළමුවන ශ්‍රේණියේ මව්බස ප්‍රවීණතාව සාක්ෂාත්කරණය සඳහා ඔබට මගපෙන්වීමේ අරමුණින් සහ ඔබට සහායක් වශයෙන් QR කේත ගුරු මාර්ගෝපදේශයෙහි අන්තර්ගත වේ. ඒ අනුව මව්බස ගුරු මාර්ගෝපදේශයේ ඉදිරිපත් කර ඇති ඉගෙනුම් පල සාධනය කරනු පිණිස වන ක්‍රියාකාරකම්වල ශ්‍රව්‍ය පට, වීඩියෝ සහ පින්තූර ප්‍රදර්ශනය කිරීම සඳහා QR කේත ඇතුළත් කර ඇත. සුහුරු පුවරුව මගින් හෝ රූපවාහිනිය මගින් හෝ බහු මාධ්‍ය ප්‍රක්ෂේපකය මගින් හෝ මෙම අන්තර්ගත සිසුන්ට ප්‍රදර්ශනය කිරීම අරමුණු කර ගනිමින් මෙම QR කේත යොදා ඇත. විසි එක්වන සියවසේ කුසලතා ලබා දීම මෙන් ම මිශ්‍ර ඉගෙනුම (Blended learning) පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ඵලදායි ලෙස යොදා ගැනීමට අවස්ථාව ලබා දීම ද අරමුණු කර ගනිමින් හඳුන්වා දී ඇති QR කේත භාවිතය ඔබට හැකි අවස්ථාවලදී භාවිත කිරීම අපේක්ෂා කෙරෙයි.**

**එබැවින් එම QR කේතවල ඇතුළත් ශ්‍රව්‍ය, දෘශ්‍ය වීඩියෝ පට හෝ පින්තූර ගුරුවරුන් විසින් හෝ දෙමව්පියන් විසින් හෝ මිල දී ගැනීම අවශ්‍ය නොවේ. ඒවා මුද්‍රණය කර බෙදා හැරීම ද විකිණීම ද නොකළ යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඵලදායි ලෙස සිදු කිරීමේ අරමුණින් මෙන් ම මිශ්‍ර ඉගෙනුම පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී යොදා ගැනීමේ අරමුණින් ලබා දී ඇති QR කේතවල අන්තර්ගත ඵලදායි ලෙස භාවිත කරනු ඇතැයි අපේක්ෂා කරමි.**

මෙහි සඳහන් සියලු ම කාරණා කෙරෙහි සුවිශේෂ අවධානය යොමු කර ශ්‍රී ලාංකේය සිසු පරපුරේ අනාගතය සාර්ථක කර ගැනීමට ඇප කැප වීමට අදිටන් කර ගනිමු.

**නිර්මලා ජයසිංහ**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පටුන


| | පිටු අංක |
|---|---|
| ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය | iv |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය | v |
| අධ්‍යක්ෂ පණිවුඩය | vi |
| හැඳින්වීම | vii |
| මව්බස විෂයමාලා ආකෘතිය | xi |
| පළමුවන වාරයට අදාළ ක්‍රියාකාරකම් | 1 - 60 |
| දෙවන වාරයට අදාළ ක්‍රියාකාරකම් | 62 - 108 |
| තුන්වන වාරයට අදාළ ක්‍රියාකාරකම් | 110 - 202 |

# මව්බස විෂයමාලා ආකෘතිය

**මව්බස විෂය අරමුණ**


ඉගෙනුම් මාධ්‍යයක් සහ විෂයයක් ලෙස සිංහල භාෂාවත් සාහිත්‍යයත් භාෂා කාර්යයන් ඉටු කර ගැනීම සඳහා ඵලදායි ව භාවිත කිරීමට සහ විෂයාන්තර අවබෝධය මගින් අධ්‍යාපනයේ ශාස්ත්‍රීය පදනම ශක්තිමත් කර ගැනීමට අවශ්‍ය භාෂා කුසලතා සංවර්ධනය කිරීම

**පළමුවන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය දක්වා මව්බස විෂයයේ අභිමතාර්ථ**

1. ධනාත්මක ආකල්ප සහිත ව මව්බස භාවිත කිරීම
2. භාෂා කුසලතා ඔප් නංවා ගනිමින් සන්නිවේදන ක්‍රියාවලිය සාර්ථක ව සිදු කිරීම
3. ආත්ම විශ්වාසයකින් යුතු ව අදහස් ප්‍රකාශ කිරීම සඳහා වාංමාලාව භාවිත කිරීම
4. සරල ව සහ අවබෝධාත්මක ව විග්‍රහ කරමින් භාෂාව නිවැරදි ව භාවිත කිරීම
5. රස වින්දන හැකියාව, නිර්මාණාත්මක චින්තනය හා තාර්කික චින්තනය ප්‍රදර්ශනය කරමින් භාෂාව හැසිරවීම
6. විෂයාන්තර සමෝධානය මගින් ශාස්ත්‍රීය අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා භාෂාව මාධ්‍යයක් ලෙස භාවිත කිරීම

## මව්බස විෂයට අදාළ කාර්ය සාධන ක්ෂේත්‍ර

1. භාෂා භාවිතය
2. වාක්කෝෂය සංවර්ධනය හා භාවිතය
3. භාෂා විග්‍රහය
4. රස වින්දනය
5. චින්තනය හා නිර්මාණශීලිත්වය
6. විෂයාන්තර සමෝධානය



## මව්බස විෂයට අදාළ කාර්ය සාධන ක්ෂේත්‍ර සහ නිර්වචන

| කාර්ය සාධන ක්ෂේත්‍රය | නිර්වචනය |
|---|---|
| භාෂා භාවිතය | ශ්‍රවණ සහ කථන කුසලතා සංවර්ධනය මගින් සාර්ථක ව වාචික සන්නිවේදන ක්‍රියාවලිය සිදු කර ගැනීම මෙන් ම විධිමත් ලෙස කියවීම හා ලිවීම සඳහා අවශ්‍ය පදනම ගොඩනඟා ගැනීම 'භාෂා භාවිතය' යන්නෙන් අදහස් වේ. |
| වාක්කෝෂය සංවර්ධනය හා භාවිතය | ප්‍රාථමික අවධියේ මව්බස විෂය සහ වෙනත් විෂයන්ට අදාළ, වචන හා යෙදුම්වල ශබ්දාර්ථ අවබෝධ කර ගෙන චතුර්විධ භාෂා ක්‍රියාකාරකම්වලදී අර්ථවත් ව භාවිත කිරීම 'වාක්කෝෂය සංවර්ධනය හා භාවිතය' යන්නෙන් අදහස් වේ. |
| භාෂා විග්‍රහය | අක්ෂර ලිවීමේ යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් අකුරු සහ වචන ලිවීමත් සරල ව්‍යාකරණ රීති සහ අක්ෂර වින්‍යාස රීති අනුගමනය කරමින් විරාම ලකුණු උචිත පරිදි භාවිත කර අර්ථවත් සරල වාක්‍ය ලිවීමත් 'භාෂා විග්‍රහය' යන්නෙන් අදහස් වේ. |
| රස වින්දනය | ළමයින් සඳහා නිර්මාණය වූ සාහිත්‍ය හා කලා නිර්මාණ පරිශීලනය කර භාෂා ක්‍රියාකාරකම්වල නිරත වෙමින් ඒවා අගය කිරීම 'රස වින්දනය' යන්නෙන් අදහස් වේ. |
| චින්තනය හා නිර්මාණශීලිත්වය | නිර්මාණශීලි චින්තනය මෙහෙයවා නව අදහස් චිත්‍ර, සරල ළමා කවි, දෙබස්, සංවාද, කතන්දර, චිත්‍ර කතා ආදිය මගින් ඉදිරිපත් කිරීම 'චින්තනය හා නිර්මාණශීලිත්වය' යන්නෙන් අදහස් වේ. |
| විෂයාන්තර සමෝධානය | ප්‍රාථමික විෂයමාලාවේ අනෙකුත් භාෂා නොවන විෂයවලින් ලබන ඉගෙනුම් අද්දැකීම් වර්ධනය සඳහා භාෂා භාවිතය මෙන් ම එම විෂය කොටස් යොදා ගනිමින් භාෂා කුසලතා ප්‍රදර්ශනය කිරීම 'විෂයාන්තර සමෝධානය' යන්නෙන් අදහස් වේ. |

# පළමුවන වාරය

## පළමුවන වාරයට නිර්දිෂ්ට ඉගෙනුම් පල

- ශ්‍රවණ විභේදන කුසලතා ප්‍රදර්ශනය කරයි.
- දෘෂ්ටි විභේදන කුසලතා ප්‍රදර්ශනය කරයි.
- මනෝචාලක කුසලතා ප්‍රදර්ශනය කරයි.
- පෙර කියවීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.
- පෙර ලිවීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.
- සරල උපදෙස්වලට අවධානයෙන් සවන් දී අවබෝධයෙන් නිවැරදි ප්‍රතිචාර දක්වයි.
- සරල පණිවුඩයකට සවන් දී එය තවත් අයෙකුට නිවැරදි ව පවසයි.
- සරල නිවේදනයකට සවන් දී ඒ ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්නවලට නිවැරදි වාචික ප්‍රතිචාර ලබා දෙයි.
- ඇසූ සිද්ධියක් හෝ දුටු සිද්ධියක් හෝ මුල, මැද හා අග සබඳතාවයෙන් යුතු ව පවසයි.
- කියවීමේදී හා ලිවීමේදී මධ්‍ය අක්ෂර නිවැරදි ව භාවිත කරයි.

## හැඳින්වීම-පූර්ව භාෂා කුසලතා

පළමුවන ශ්‍රේණියේදී ඔබට හමු වන්නේ ප්‍රභාස්වර මනසකින් යුතු මල් වැනි අහිංසක දරුවන් පිරිසකි. ඔවුන් වෙනුවෙන් ඔබට භාරදූර කාර්යයක් පැවරී තිබේ. ඒ ඔවුන්ට සමාජයේ ජීවත් වීම සඳහා යහමග පෙන්වීම හා අනාගත ලෝකය සඳහා සූදානම් කිරීමේ කාර්යයයි. ඔබේ පන්ති කාමරයට පැමිණෙන දරුවන් හඳුනා ගැනීමෙන් අනතුරුව ප්‍රාථමික විෂයමාලාවට අයත් විෂයයන් සමූහය ඉගැන්වීමට ඔබට සිදු වේ. මෙහිදී මව්බස විෂයයට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. ඒ අනෙක් සියලු විෂයයන් ඉගැන්වීමේ පදනම ද චින්තනයට අවශ්‍ය ශක්තිය ද සැපයෙන්නේ මව්බසින් වන බැවිනි. විධිමත් ලෙස මව්බස ඉගැන්වීමට ප්‍රථමයෙන් ඔබ විසින් දරුවන් තුළ ප්‍රගුණ කළ යුතු කුසලතා සමූහයක් වෙයි. අපි ඒවා පූර්ව භාෂා කුසලතා යනුවෙන් හඳුන්වමු.

පළමුවන ශ්‍රේණියේ පළමුවන වාරයේ පැය 30ක් පූර්ව භාෂා කුසලතාවලට අදාළ ව ඇති ක්‍රියාකාරකම් සඳහා වෙන් කර ඇත. පූර්ව භාෂා කුසලතා විධිමත් ලෙස භාෂාවක් ඉගෙනීමට අවශ්‍ය වන පදනම සපයයි. ඒ අනුව එක් එක් ඉගෙනුම් පල සඳහා, දී ඇති සෑම කාර්ය සාධන ප්‍රමිතියක් ම ආවරණය වන පරිදි, දී ඇති ක්‍රියාකාරකම් උපරිමය කිරීම සිසුන්ගේ සාධන මට්ටම ඉහළ නැංවීමට හේතු වෙයි. සෑම ක්‍රියාකාරකමක් ම සිදු කිරීමේදී ගුරු ආදර්ශනය ඉතා වැදගත් වනු ඇත.

දරුවෙක් ඔහුට හෝ ඇයට උචිත වේගයකින් ඉගෙනුම ලබයි. සෑම දරුවෙක් ම එක ම වේගයෙන් යමක් ග්‍රහණය නොකරයි. ඉගෙන නො ගනියි. ඔබ ගුරුවරයෙකු වශයෙන් මෙම කරුණ අවබෝධ කර ගත යුතු ය. එමෙන්ම සෑම දරුවකුගේ ම හැකියා සහ නොහැකියා හඳුනා ගැනීම මෙන් ම දරුවන් ධනාත්මක ලෙස උපස්තම්භනය කිරීමත් ඔබ සතු වගකීමකි; යුතුකමකි.

## පූර්ව භාෂා කුසලතාවල වැදගත්කම

පළමුවන ශ්‍රේණියට ඇතුළත් වන විටත්, දරුවෝ සවන් දීමේ හා කතා කිරීමේ කුසලතා අත්පත් කර ගෙන පැමිණෙති. එහෙත් ඔවුහු සවන් දීමේ හා කතා කිරීමේ කුසලතාවල ප්‍රවීණයෝ නො වෙති. විධිමත් ලෙස ලිවීමේ හා කියවීමේ කුසලතා ඔවුන් සතු ව නොමැත. විධිමත් ලෙස ලිවීම හා කියවීම ඉගැන්වීමට පෙර භාෂාව සම්බන්ධයෙන් දරුවන් තුළ ප්‍රගුණ කළ යුතු කුසලතා පූර්ව භාෂා කුසලතා නමින් හැඳින්වේ.

දරුවන් තුළ ප්‍රගුණ කළ යුතු පූර්ව භාෂා කුසලතා මොනවා ද?

විධිමත් ව භාෂාව ඉගැන්වීමට පෙර දරුවන් තුළ ප්‍රගුණ කළ යුතු කුසලතා ප්‍රධාන වශයෙන් පහකි.

පූර්ව භාෂා කුසලතා ප්‍රගුණ කිරීම මගින් දරුවන් ව විධිමත් ලෙස කියවීම හා ලිවීම සඳහා හුරු කරනු ලැබේ.

| | |
|---|---|
| **1. ශ්‍රවණ විභේදන කුසලතා** | පරිසරයේ ඇති විවිධ ස්වාභාවික ශබ්ද අතර ඇති වෙනස්කම් හඳුනා ගැනීම සහ කෘත්‍රිම ශබ්ද අතර ඇති වෙනස්කම් හඳුනා ගැනීමේ කුසලතාවයි. |
| **2. දෘෂ්ටි විභේදන කුසලතා** | සමාන ව පෙනෙන එහෙත් සියුම් වෙනස්කම් සහිත දේවල එම සියුම් වෙනස්කම් හඳුනා ගැනීමේ කුසලතාවයි. |
| **3. මනෝචාලක කුසලතා** | ඇස සහ අත සමායෝජනය කර සියුම් මාංශ පේශි ක්‍රියාත්මක කිරීමේ කුසලතාවයි. |
| **4. පෙර කියවීමේ කුසලතා** | අකුරු, වචන, වාක්‍ය සහ ඡේද කියවීමට පෙර වමේ සිට දකුණට සහ ඉහළ සිට පහළට ඇස ගෙන යාමේ කුසලතාව සහ පින්තූර කියවීමේ කුසලතාවයි. |
| **5. පෙර ලිවීමේ කුසලතා** | අකුරු ලිවීමට පෙර, ලිවීම සඳහා පැන්සල හෝ පෑන ඇල්ලීමත් පොත නිවැරදි ව තබා ගැනීමට හුරු වීමත් මෙන් ම අකුරුවලට අදාළ හැඩ ඇඳීමේ සහ ලිවීමේ කුසලතාවයි. |

**පූර්ව භාෂා කුසලතා ප්‍රගුණ කළ යුත්තේ ඇයි ?**

සවන් දීමේ හා කතා කිරීමේ කුසලතා යම් තාක් දුරකට ප්‍රගුණ කර ගෙන පැමිණෙන දරුවන්ට භාෂාත්මක ශබ්ද හුරු ය. කියවීමේදී හා ලිවීමේදී භාෂාමය ශබ්ද අතිශයින් වැදගත් වේ. කියවීමේදී දරුවා කරන්නේ දෘශ්‍ය සංකේත ශබ්ද සංකේත බවට පරිවර්තනය කිරීමයි. ලිවීමේදී ශබ්ද සංකේත දෘශ්‍ය සංකේතවලට පරිවර්තනය කරයි. අප කතා කරන ශබ්ද ලියා දැක්වීම සඳහා ඇති සංකේත, අක්ෂර වශයෙන් අපි හඳුන්වමු.

අප කතා කරන ශබ්ද එකිනෙකට වෙනස් ය.

උදා: **ග ඝ** | **ශ ෂ** | **ප ෆ**

එහෙත් එම අක්ෂරවල උච්චාරණය වෙනස් ය. ඒ නිසා එම අක්ෂරවල ඇති සියුම් වෙනස්කම් හඳුනා ගැනීමේ හැකියාව දරුවන් සතු වීම වැදගත් වේ.

එසේ ම,

අක්ෂරවල ඇති හැඩ එකිනෙකට වෙනස් ය. ඇතැම් අක්ෂර අතර ඇත්තේ සුළු වෙනස්කම් ය.

උදා: **හ භ** | **ස ඝ** | **ව ච** | **ත ත**

එම ශබ්ද අතර ඇති සියුම් වෙනස්කම් ද දරුවන් හඳුනා ගත යුතු ය.

සිංහල භාෂාව කියවන්නේ වමේ සිට දකුණට ය. එම නිසා වමේ සිට දකුණට ඇස ගෙන යාමට හුරු වීම අත්‍යවශ්‍ය කරුණකි. ලිවීමේදී ඇස හා අත සමායෝජනය විය යුතු ය. එසේ ම පැන්සලෙන් හෝ පෑනෙන් ලිවීමට නිවැරදි ව හුරු වීම අවශ්‍ය වේ.

**ඉහත දැක්වෙන කරුණු නිසා දරුවන් තුළ චතුර්විධ කුසලතා සමෝධානය කරමින් භාෂාව විධිමත් ව ඉගෙනීම සඳහා පූර්ව භාෂා කුසලතා වර්ධනය මගින් ඇති වන පෙර පුහුණුව ඉතා වැදගත් වේ. පූර්ව භාෂා කුසලතා සංවර්ධනය සඳහා, දී ඇති ක්‍රියාකාරකම් මෙහි දැක්වෙන අනුපිළිවෙළට සිදු කිරීම වඩාත් යෝග්‍ය වේ.**

**ශ්‍රවණ විභේදන කුසලතා**
මෙම කුසලතාව ලබා ගැනීමෙන් සිසුන් තුළ ශබ්ද අතර ඇති සියුම් වෙනස්කම් පිළිබඳ අවබෝධය තහවුරු වෙයි.

**විෂය නිර්දේශයේ උද්ධෘතය**

| සමාජ භාෂා කාර්යය/ ශාස්ත්‍රීය භාෂා කාර්යය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා. | 1. ශ්‍රවණ විභේදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | ▪ පරිසරයේ ඇසෙන ස්වාභාවික ශබ්ද<br>▪ පරිසරයේ ඇසෙන කෘත්‍රිම ශබ්ද<br>▪ භාෂාත්මක ශබ්ද | ▪ ශ්‍රවණ විභේදනය | 1.1 පරිසරයේ ඇසෙන ස්වභාවික ශබ්දවලට සවන් දී එයින් හයක් නිවැරදි ව නම් කරයි. | 1.1.1 නිවැරදි වීම<br>1.1.2 ප්‍රමාණවත් වීම |
| | | | | 1.2 පරිසරයේ ඇසෙන කෘත්‍රිම ශබ්දවලට සවන් දී එයින් හයක් නිවැරදි ව නම් කරයි. | 1.2.1 නිවැරදි වීම<br>1.2.2 ප්‍රමාණවත් වීම |
| | | | | 1.3 උච්චාරණයේ වෙනස්කම් සහිත භාෂාත්මක ශබ්ද කිහිපයකට සවන් දී එයින් හතරක් නිවැරදි ව නැවත උච්චාරණය කරයි. | 1.3.1 නිවැරදි වීම<br>1.3.2 ප්‍රමාණවත් වීම |
| | | | | 1.4 මුල් ශබ්දයේ වෙනස්කම් සහිත වචන කිහිපයකට සවන් දී එයින් වචන හතරක මුල් ශබ්දය නිවැරදි ව උච්චාරණය කරයි. | 1.4.1 නිවැරදි වීම<br>1.4.2 ප්‍රමාණවත් වීම |

**ක්‍රියාකාරකම 1.1** : **ස්වාභාවික ශබ්දවලට සවන් දෙමු; ඒවා නම් කරමු.**

**කාලය** : මිනිත්තු 30යි.

**ඉගෙනුම් සම්පත්** : පරිසරයේ ඇසෙන ස්වාභාවික ශබ්ද ඇතුළත් QR කේත

**වාංමාලාව** : ස්වාභාවික, ශබ්ද, සවන් දීම, අවදි වුණා, නැවුම්, මිහිරි

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

### පියවර 01

- පහත සඳහන් සිද්ධිය සිසුන්ට පවසන්න.
- අදාළ අවස්ථාවල යෝජිත සතුන්ගේ ශබ්දවලට සවන් දීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඒ සඳහා පහත QR කේත භාවිත කරමින් සතුන්ගේ ශබ්ද ඇසීමට ද සැලැස්විය හැකි ය.

> "ඔයාල දන්නවා ද දුවේ පුතේ, අද මම ඉස්කෝලෙට එන්න සූදානම් වුණේ ගොඩක් සතුටින් කියලා. මොකද? මට පුංචි ඔයාලාව දකිනකම් ඉවසිල්ලක් තිබුණේ නෑ. ඒ නිසා මම අද උදේ ම අවදි වුණා. එතකොට මට ඇතින් ඇහුණා කුකුළෙක් හඬලන හඬක්. කොහොම ද කුකුළා හඬලන්නේ ? (**Audio** – කුකුළාගේ හඬ). ඉතිං, මම උදේ පාන්දර නැවුම් සුළඟ කාමරයට එන්න ඕනෑ නිසා ජනේලය ඇරියා. ඔයාලා දන්නවා ද? මට ඒ වෙලාවේ ඇසුණේ මොකක් ද? කියලා. කුරුලු පැටියෙකුගේ නාදයක්. හරියට ලස්සන මිහිරි ගීතයක් වගේ. (**Audio** – කුරුලු නාදය) මම කුස්සියට ගියා. වතුර වීදුරුවක් ම බිව්වා. ඒ වෙලාවේ මට ඇතින් ඇසුණේ වසුපැටියෙකු කෑ ගසන හඬක්. (**Audio** – වසුපැටියෙකුගේ හඬ) එයත් උදේ ම නැගිටලා, අම්මාගෙන් කිරි බොන්න හදනවා වාගේ. ඉතිං ඔහොම අද උදේ මට ගොඩක් ශබ්ද ඇසුණා. මම ඒවා මතක තියා ගෙන ආවා පුංචි ඔයාලට කියන්න."

කුකුළාගේ හඬ

කුරුලු නාදය

වසුපැටියෙකුගේ හඬ

- ඉහත සිද්ධිය පිළිබඳ සිසුන් සමග සාකච්ඡාවක යෙදෙන්න.
- එහිදී උදෑසන ම අවදි වීමේ වැදගත්කම සහ පරිසරයෙන් ඇසුණු ස්වාභාවික ශබ්ද පිළිබඳ සිසුන්ගෙන් විමසා සාකච්ඡාවක නිරත වන්න.

### පියවර 02

- මෙලෙස උදෑසනක ඇසුණු ස්වාභාවික ශබ්ද පිළිබඳ සිසු අද්දැකීම් ද ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

### පියවර 03

- අප අවට වටපිටාවෙන් විවිධ ස්වාභාවික ශබ්ද ඇසෙන බවත්, ඒවාට සවන් දීමේ වැදගත්කමත් සරල ව සිසුන්ට පවසන්න.
- අප සිටින ස්ථානය අනුව අප අවටින් ඇසෙන ස්වාභාවික ශබ්දවල වෙනස්කම් ඇති බවට උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න.

### පියවර 04

- පරිසරයේ ඇසෙන ස්වාභාවික ශබ්දවලට සවන් දීම සඳහා සිසුන් එළිමහන් පරිසරයකට රැගෙන යන්න.
- එවන් ස්ථානයක් නොමැති නම් සිසුන් නිශ්ශබ්ද ස්ථානයකට රැගෙන යන්න. මේ සඳහා පන්තිකාමරය වුව ද භාවිත කළ හැකි ය.

- එළිමහන් ස්ථානයකට සිසුන් රැගෙන යන්නේ නම් අවට වටපිටාවෙන් ඇසෙන ස්වාභාවික ශබ්දවලට සවන් දීමටත් එවන් ස්ථානයක් නොමැති ව මෙම ක්‍රියාකාරකම සිදු කරන්නේ නම් ස්වාභාවික ශබ්ද පටිගත කර හෝ සිසුන්ට සවන් දීමට සලස්වන්න.
- මෙහිදී සිසුන්ට ශබ්ද නම් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- මෙය කණ්ඩායම් වශයෙන් මෙන් ම කේවල වශයෙන් ද සිදු කරන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 1.1 පරිසරයේ ඇසෙන ස්වාභාවික ශබ්දවලට සවන් දී එයින් හයක් නිවැරදි ව නම් කරයි. | 1.1.1 නිවැරදි වීම<br>1.1.2 ප්‍රමාණවත් වීම | ශබ්ද හයක් හෝ පහක් නිවැරදි ව නම් කරයි. | ශබ්ද හතරක් හෝ තුනක් නිවැරදි ව නම් කරයි. | ශබ්ද දෙකක් නිවැරදි ව නම් කරයි. | එක් ශබ්දයක් නිවැරදි ව නම් කරයි. |

පසු දින උදෑසන තමා අවට පරිසරයේ ඇසෙන ස්වාභාවික ශබ්දවලට සවන් දී ඒවා මොනවා දැයි මතකයේ තබා පැමිණ පන්තියේදී ප්‍රකාශ කරන ලෙසට සිසුන්ට උපදෙස් ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 1.2** : **කෘත්‍රිම ශබ්දවලට සවන් දෙමු; ඒවා නම් කරමු.**

**කාලය** : මිනිත්තු 30යි.

**ඉගෙනුම් සම්පත්** : පරිසරයේ ඇසෙන කෘත්‍රිම ශබ්ද ඇතුළත් QR කේත

**වාංමාලාව** : ශබ්ද, කෘත්‍රිම

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 01**

- පහත සඳහන් කෘත්‍රිම ශබ්දවලට කිහිප වරක් සවන් දීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

  උදා: - සංගීත භාණ්ඩයක වාදනයක්, අත්පොළසන් හඬක්, දොරක සීනු නාදයක්, වාහනයක නළා හඬක්, විදුලි පංකාවක හඬක්, ගිලන් රථයක නාදයක්
- එක් එක් ශබ්දය හඳුනා ගෙන ප්‍රකාශ කිරීමට සිසුන්ට පවසන්න.

**පියවර 02**

- අවට පරිසරයෙන් ඇසෙන කෘත්‍රිම ශබ්ද පිළිබඳ සිසුන්ගෙන් විමසා සාකච්ඡාවක නිරත වන්න.

**පියවර 03**

- අප අවට වටපිටාවෙන් විවිධ කෘත්‍රිම ශබ්ද ඇසෙන බවත්, ඒවාට සවන් දීමේ වැදගත්කමත් සරල ව සිසුන්ට පවසන්න.
- අප සිටින ස්ථානය අනුව අප අවටින් ඇසෙන කෘත්‍රිම ශබ්දවල වෙනස්කම් ඇති බවට උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න.

**පියවර 04**

- පරිසරයේ ඇසෙන කෘත්‍රිම ශබ්දවලට සවන් දීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එළිමහන් ස්ථානයකට සිසුන් රැගෙන යන්නේ නම් අවට වටපිටාවෙන් ඇසෙන කෘත්‍රිම ශබ්දවලට සවන් දීමටත් එවන් ස්ථානයක් නොමැති ව මෙම ක්‍රියාකාරකම සිදු කරන්නේ නම් කෘත්‍රිම ශබ්ද හයක් පටිගත කර හෝ වෙනත් ක්‍රමවේදයක් භාවිත කර හෝ සිසුන්ට කෘත්‍රිම ශබ්දවලට සවන් දීමට සලස්වන්න.
- මෙහිදී ශබ්ද නම් කිරීමට සිසුන්ට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- මෙය කණ්ඩායම් වශයෙන් මෙන් ම කේවල වශයෙන් ද සිදු කරන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | **4** | **3** | **2** | **1** |
| 1.2<br>පරිසරයේ ඇසෙන කෘත්‍රිම ශබ්දවලට සවන් දී එයින් හයක් නිවැරදි ව නම් කරයි. | 1.2.1<br>නිවැරදි වීම<br>1.2.2<br>ප්‍රමාණවත් වීම | ශබ්ද හයක් හෝ පහක් නිවැරදි ව නම් කරයි. | ශබ්ද හතරක් හෝ තුනක් නිවැරදි ව නම් කරයි. | ශබ්ද දෙකක් නිවැරදි ව නම් කරයි. | එක් ශබ්දයක් නිවැරදි ව නම් කරයි. |

පසු දින තමා අවට පරිසරයේ ඇසෙන කෘත්‍රිම ශබ්දවලට සවන් දී ඒවා මොනවා දැයි මතකයේ තබා පැමිණ පන්තියේදී ප්‍රකාශ කරන ලෙසට සිසුන්ට උපදෙස් ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 1.3 : භාෂාවේ ශබ්දවලට සවන් දෙමු; නැවත උච්චාරණය කරමු.**

**කාලය** : මිනිත්තු 30යි.

**ඉගෙනුම් සම්පත්** : සිංහල අක්ෂර මාලාව ඇතුළත් ගීතය සහිත QR කේතය

**වාංමාලාව** : ශබ්ද, සවන් දීම

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 01**

- සිංහල අක්ෂර මාලාව ඇතුළත් ගීතය හෝ වෙනත් සුදුසු ගීතයක් ගුරුවරයා විසින් කිහිප වරක් ගායනා කරන්න.
- ඒ සඳහා මෙම QR කේතය ද භාවිත කළ හැකි ය.
- එම ගීතයට සවන් දීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

Channel NIE

සිංහල අක්ෂර මාලාව ඇතුළත් ගීතය

- මෙහි ඇතුළත් විවිධ අකුරු ශබ්ද සිසුන් සමග නිවැරදි ව උච්චාරණය කරමින් ගායනා කරන්න.
- අප කතා කරන වචන ගොඩනැගී ඇත්තේ මෙම අකුරු ශබ්ද මූලික කර ගනිමින් බව පවසා මෙම ශබ්ද නිවැරදි ව උච්චාරණය කිරීමේ වැදගත්කම සරල ව පැහැදිලි කරන්න.

**පියවර 02**

- පහත දැක්වෙන භාෂාත්මක ශබ්ද එකින් එක වෙන වෙන ම නිවැරදි ව කිහිප වරක් ශබ්ද නඟා උච්චාරණය කරන්න.

**ග, හ, ය, ස, ප, න, ත, ක, ට, ව**

- එම එක් එක් ශබ්ද ගුරුවරයා විසින් උච්චාරණය කිරීමෙන් පසු ව සිසුන්ට උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.
- මෙය කණ්ඩායම් වශයෙන් මෙන් ම කේවල ව ද සිදු කරන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 1.3 උච්චාරණයේ වෙනස්කම් සහිත භාෂාත්මක ශබ්ද කිහිපයකට සවන් දී එයින් හතරක් නිවැරදි ව නැවත උච්චාරණය කරයි. | 1.3.1 නිවැරදි වීම 1.3.2 ප්‍රමාණවත් වීම | ශබ්ද හතරක් නිවැරදි ව උච්චාරණය කරයි. | ශබ්ද තුනක් නිවැරදි ව උච්චාරණය කරයි. | ශබ්ද දෙකක් නිවැරදි ව උච්චාරණය කරයි. | එක් ශබ්දයක් නිවැරදි ව උච්චාරණය කරයි. |

**ක්‍රියාකාරකම 1.4** : **වචනවල මුල් ශබ්දය හඳුනා ගනිමු; උච්චාරණය කරමු.**

**කාලය** : මිනිත්තු 30යි.

**ඉගෙනුම් සම්පත්** : 'බලමු බලමු අපි අහස' ගීතය ඇතුළත් QR කේතය

**වාංමාලාව** : මුල් ශබ්දය, ආරම්භක ශබ්දය, සවන් දීම

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 01**

- වචනවල මුල් ශබ්දය පැවසීමේ ගීතය හෙවත් 'බලමු බලමු අපි අහස' ගීතය හෝ වෙනත් සුදුසු ගිතයක් ගුරුවරයා විසින් කිහිප වරක් ගායනා කරන්න.
- ඒ සඳහා මෙම QR කේතය ද භාවිත කළ හැකි ය.
- එම ගීතයට සවන් දීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

'බලමු බලමු අපි අහස' ගීතය

- අනතුරුව මෙම ගීතය සිසුන් සමග එක් ව ගායනා කරන්න.
- අප කතා කරන වචන, ශබ්ද එකතුවකින් සැදුම්ලත් බවත් මෙම ගීතයේ 'අහස, සරම, කළය' යන වචන සහ එම වචනවල මුල් ශබ්දය ඇසුරෙන් සරල ව පැහැදිලි කරන්න.
- ඒ අනුව වචනවල ශබ්ද හඳුනා ගැනීමේ වැදගත්කම සරල ව සිසුන් සමග සාකච්ඡා කරන්න.

**පියවර 02**.

- පහත දැක්වෙන වචන එකින් එක වෙන වෙන ම නිවැරදි ව ශබ්ද නගා කිහිප වරක් උච්චාරණය කරන්න.

**මල, ගස, ඉදල, කඩය, පහන, නළාව, ඔරුව, තරුව, දඹල,වතුර**

- එම එක් එක් වචනවල මුල් ශබ්දය හඳුනා ගෙන උච්චාරණය කරන ආකාරය සිසුන්ට පැහැදිලි කරන්න.
- ඒ අනුව ගුරුවරයා විසින් එක් එක් වචනය පැවසූ පසු ව එම වචනවල මුල් ශබ්දය හඳුනා ගෙන උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙය කණ්ඩායම් වශයෙන් මෙන් ම කේවල වශයෙන් ද සිදු කරන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 1.4 මුල් ශබ්දයේ වෙනස්කම් සහිත වචන කිහිපයකට සවන් දී එයින් වචන හතරක මුල් ශබ්දය නිවැරදි ව උච්චාරණය කරයි. | 1.4.1 නිවැරදි වීම<br>1.4.2 ප්‍රමාණවත් වීම | වචන හතරක මුල් ශබ්දය නිවැරදි ව උච්චාරණය කරයි. | වචන තුනක මුල් ශබ්දය නිවැරදි ව උච්චාරණය කරයි. | වචන දෙකක මුල් ශබ්දය නිවැරදි ව උච්චාරණය කරයි. | එක් වචනයක මුල් ශබ්දය නිවැරදි ව උච්චාරණය කරයි. |

**දෘෂ්ටි විභේදන කුසලතා**

මෙම කුසලතාව ලබා ගැනීමෙන් සිසුන් තුළ රූප සහ අකුරු අතර ඇති සියුම් වෙනස්කම් පිළිබඳ අවබෝධය තහවුරු වෙයි.

**විෂය නිර්දේශයේ උද්ධෘතය**

| සමාජ භාෂා කාර්යය/ ශාස්ත්‍රීය භාෂා කාර්යය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා | 2. දෘෂ්ටි විභේදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | ■ හැඩයෙන් සමාන රූප<br>■ සමාන රූප අතර අඩුවක් ඇති රූප<br>■ සමාන රූප අතර වැඩි යමක් ඇති රූප<br>■ සමාන රූප අතර පිහිටීමේ දිශාව වෙනස් රූප<br>■ සමාන රූප අතර පිහිටීමේ ස්ථානය වෙනස් රූප<br>■ සමාන රූප අතර ප්‍රමාණයෙන් කුඩා හා විශාල රූප<br>■ සමාන ව පෙ-නෙන එහෙත් සියුම් වෙනස්කම් ඇති පින්තූර<br>■ අක්ෂර රූප අතර ඇති සියුම් වෙනස්කම් සහිත අක්ෂර | ■ දෘෂ්ටි විභේදනය | 2.1 දෙන ලද රූප අටක ඇති සමාන රූප යුගල හතරක් නිවැරදි ව තෝරා යා කරයි. | 2.1.1 නිවැරදි වීම |
| | | | | 2.2 දෙන ලද රූප හතරක් අතරින් අඩුවක් ඇති රූපය නිවැරදි ව තෝරා සලකුණු කරයි. | 2.2.1 නිවැරදි වීම |
| | | | | 2.3 දෙන ලද රූප හතරක් අතරින් වැඩි යමක් ඇති රූපය නිවැරදි ව තෝරා සලකුණු කරයි. | 2.3.1 නිවැරදි වීම |
| | | | | 2.4 දෙන ලද රූප හතරක් අතරින් පිහිටීමේ දිශාව වෙනස් රූපය නිවැරදි ව තෝරා සලකුණු කරයි. | 2.4.1 නිවැරදි වීම |
| | | | | 2.5 දෙන ලද රූප හතරක් අතරින් පිහිටීමේ ස්ථානය වෙනස් රූපය නිවැරදි ව තෝරා සලකුණු කරයි. | 2.5.1 නිවැරදි වීම |
| | | | | 2.6 දෙන ලද රූප හතරක් අතරින් ප්‍රමාණයෙන් කුඩා රූපය නිවැරදි ව තෝරා සලකුණු කරයි. | 2.6.1 නිවැරදි වීම |
| | | | | 2.7 දෙන ලද රූප හතරක් අතරින් ප්‍රමාණයෙන් විශාල රූපය නිවැරදි ව තෝරා සලකුණු කරයි. | 2.7.1 නිවැරදි වීම |
| | | | | 2.8 සමාන ව පෙනෙන පින්තූර දෙකක ඇති වෙනස්කම් හතරක් හඳුනා ගෙන ප්‍රකාශ කරයි | 2.8.1 නිවැරදි වීම |
| | | | | 2.9 අක්ෂර රූප හතරක් අතරින් වෙනස් අක්ෂර රූපය තෝරා සලකුණු කරයි. | 2.9.1 නිවැරදි වීම |

**ක්‍රියාකාරකම 2.1** : **සමාන රූප යුගල තෝරමු; යා කරමු.**

**කාලය** : පැය 06යි.

**ඉගෙනුම් සම්පත්** : දෘෂ්ටි විභේදනය හඳුන්වා දීම සඳහා භාවිත කරන ද්‍රව්‍ය, දෘෂ්ටි විභේදන කුසලතා සඳහා ලබා දෙන අභ්‍යාස

**වාංමාලාව** : සමාන, දිශාව, ප්‍රමාණය, පිහිටීම, ස්ථානය, සලකුණු කිරීම

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 01**

- සිසුන් එළිමහන් ස්ථානයකට රැගෙන යන්න.
- අවට ඇති දේවල් නරඹන ලෙසට සිසුන් දැනුවත් කරන්න.
- ඒ සඳහා සිසුන්ට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- අනතුරුව අවට ඇති දේවල් හඳුනා ගනිමින් ඒවා නම් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**පියවර 02**

- පියවර 01ට අනුව නැරඹූ දේවල්වල සමාන ව පෙනෙන දේවල් පෙන්වීමට සිසුන්ට උපදෙස් දෙන්න.

  උදා : එක වගේ පුටු, එක වගේ මේස යනාදි
- ඒ අනුව අප අවට පරිසරයේ ඇති ද්‍රව්‍යවල සමාන හෙවත් එක වාගේ දේවල් තිබෙන බවට සිසුන්ට පැහැදිලි කරන්න.

**පියවර 03**

- 'අකුරු නුවණ 1' පොතේ පිටු අංක 1, 2, 3, 4හි ඇතුළත් අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- එක් එක් අභ්‍යාසය සිදු කිරීමට පෙර සහ සිදු කිරීමෙන් අනතුරුව ඊට අදාළ සමාන රූප හඳුනා ගත හැකි ආකාරය සහ හඳුනා ගත් ආකාරය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

**පියවර 04**

- තම පන්ති කාමරයේ, තම නිවසේ මෙන් ම තමන් සිටින හෝ තමන් යන එන ඕනෑ ම ස්ථානයක සමාන ද්‍රව්‍ය තිබිය හැකි බවත් ඒවා සමාන වන්නේ කුමන ලක්ෂණ හේතුවෙන් දැයි නිරීක්ෂණය කිරීමටත් සිසුන්ට උපදෙස් දෙන්න.
- ඒ අනුව තම නිවසේ ඇති සමාන ද්‍රව්‍ය මොනවා දැයි හඳුනා ගෙන පසු දින ප්‍රකාශ කිරීමට සූදානම් ව පැමිණෙන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.

**තක්සේරුකරණය :**


| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 2.1 දෙන ලද රූප අටක ඇති සමාන රූප යුගල හතරක් නිවැරදි ව තෝරා යා කරයි. | 2.1.1 නිවැරදි වීම | යුගල හතර ම නිවැරදි ව තෝරයි. | යුගල දෙකක් නිවැරදි ව තෝරයි. | යුගලයක් නිවැරදි ව තෝරයි. | අන් අයගේ උදවු ඇති ව එක් යුගලයක්වත් තෝරයි. |

**ක්‍රියාකාරකම 2.2 : අඩුවක් ඇති රූප හඳුනා ගනිමු.**

**පියවර 01**

- එක ම වර්ගයේ ද්‍රව්‍ය කිහිපයක් හා එම වර්ගවලට ම අයත් එක් අඩුවක් පෙන්විය හැකි ද්‍රව්‍ය ද සූදානම් කර ගන්න.

  උදා : සමාන කෝප්ප හතරක් අතුරින් එක් කෝප්පයක අඩුවක් සහිත වීම



- මෙලෙස එක් වර්ගයකට අයත් ද්‍රව්‍ය හතරක් බැගින් ප්‍රදර්ශනය කරන්න.
- එම ද්‍රව්‍ය හතරෙන් අඩුවක් සහිත ද්‍රව්‍ය තෝරා පෙන්වීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- එය අනෙක් ද්‍රව්‍ය තුනෙන් වෙනස් වීමට හේතුව කුමක් දැයි සිසුන්ගෙන් විමසන්න.
- මෙලෙස සකස් කර ගත් අනෙක් ද්‍රව්‍ය වර්ග ද පෙන්වා අඩුවක් සහිත ද්‍රව්‍ය තේරීමට හා එය තේරීමට හේතුව පැවසීමට ද සිසුන්ට අවස්ථාව දෙන්න.

**පියවර 02**

- මෙලෙස එක ම වර්ගයට අයත් ද්‍රව්‍යවල අඩුවක් ඇති ද්‍රව්‍ය තිබිය හැකි බවත් එය එසේ වීමට බලපෑ ප්‍රායෝගික සාධකත් සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ඒ අනුව රූප අතර වුව ද අඩුවක් ඇති බව නිරීක්ෂණය සඳහා සියුම් ලෙස ඒ නිරීක්ෂණය කළ යුතු බවට පැහැදිලි කරන්න.

**පියවර 03**

- 'අකුරු නුවණ 1' පොතේ පිටු අංක 5, සහ 6හි ඇතුළත් අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- එම එක් එක් අභ්‍යාසය සිදු කිරීමට පෙර සහ සිදු කිරීමෙන් අනතුරුව, දෙන ලද රූප අතරින් අඩුවක් ඇති රූප හඳුනා ගත හැකි ආකාරය සහ හඳුනා ගත් ආකාරය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

**තක්සේරුකරණය :**


| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 2.2 දෙන ලද රූප හතරක් අතරින් අඩුවක් ඇති රූපය නිවැරදි ව තෝරා සලකුණු කරයි. | 2.2.1 නිවැරදි වීම | නිවැරදි රූපය තෝරා සලකුණු කරයි. | නිවැරදි රූපය තෝරා සලකුණු කළ නොහැකියි. |

**ක්‍රියාකාරකම 2.3 : වැඩි යමක් ඇති රූපය තෝරමු; සලකුණු කරමු.**

**පියවර 01**

- එක ම වර්ගයේ ද්‍රව්‍ය කිහිපයක් සහ එක් එක් වර්ගයට අදාළ එක් ද්‍රව්‍යයක වැඩි යමක් සහිත ද්‍රව්‍යයක් බැගින් ද සපයා ගන්න.

  උදා : එක ම වර්ණයෙන් පිටකවර දැමූ පොත් හතරක් හා එම එක් පොතක රූපයක් අලවා තිබීම



- මෙලෙස එක් වර්ගයකට අයත් ද්‍රව්‍ය හතරක් බැගින් සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- එම ද්‍රව්‍ය හතරෙන් වැඩි යමක් ඇති ද්‍රව්‍ය තෝරා පෙන්වීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- එය අනෙක් ද්‍රව්‍ය තුනෙන් වෙනස් වීමට හේතුව කුමක් දැයි සිසුන්ගෙන් විමසන්න.
- මෙලෙස සපයා ගත් අනෙකුත් ද්‍රව්‍ය වර්ග ද පෙන්වා වැඩි යමක් සහිත ද්‍රව්‍ය තේරීමට හා එය තේරීමට හේතුව පැවසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**පියවර 02**

- එක ම වර්ගයකට අයත් ද්‍රව්‍යවල වැඩි යමක් ඇති ද්‍රව්‍ය තිබිය හැකි බව පවසා එසේ වීමට බලපෑ ප්‍රායෝගික සාධක ද තිබිය හැකි බවට උදාහරණ දක්වමින් සිසුන් සමග සාකච්ඡා කරන්න.
- මෙලෙස රූප අතර වුව ද වැඩි යමක් ඇති අවස්ථා තිබිය හැකි බවත් සියුම් ලෙස නිරීක්ෂණයෙන් ඒවා සොයා ගත හැකි බවත් උදාහරණ දක්වමින් සරල ව පැහැදිලි කරන්න.

**පියවර 03**

- 'අකුරු නුවණ 1' පොතේ පිටු අංක 7හි ඇතුළත් අභ්‍යාසයේ සිසුන් නිරත කරවන්න.
- එම අභ්‍යාස සිදු කිරීමට පෙර සහ සිදු කිරීමෙන් අනතුරුව, දෙන ලද රූප අතරින් වැඩි යමක් ඇති රූප හඳුනා ගත හැකි ආකාරය සහ හඳුනා ගත් ආකාරය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

**තක්සේරුකරණය :**


| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 2.3<br>දෙන ලද රූප හතරක් අතරින් වැඩි යමක් ඇති රූපය නිවැරදි ව තෝරා සලකුණු කරයි. | 2.3.1<br>නිවැරදි වීම | නිවැරදි රූපය තෝරා සලකුණු කරයි. | නිවැරදි රූපය තෝරා සලකුණු කළ නොහැකියි. |

**ක්‍රියාකාරකම 2.4 : දිශාව වෙනස් රූපය තෝරමු; සලකුණු කරමු.**

**පියවර 01**

- මෙම පින්තූරය විශාල ලෙස සකස් කර සැම සිසුවෙකුට ම පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරන්න.
- මෙම පින්තූරයට අදාළ ව පහත QR කේතය ද භාවිත කළ හැකි ය.

Channel NIE



- මෙම පින්තූරයේ පෙනෙන දේවල් මොනවා දැයි සිසුන්ගෙන් විමසන්න.
- මෙහි දක්නට ලැබෙන කුරුල්ලන්, ළමයින් සහ මල්වල සුවිශේෂත්වය සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ඒ අනුව කුරුල්ලන් හතර දෙනාගෙන් තිදෙනෙක් එක් දිශාවක් දෙස බලා සිටින අතර අනෙක් කුරුල්ලා වෙනත් දිශාවක් දෙස බලා සිටින බවත් ළමයින් හතර දෙනාගෙන් තිදෙනෙක් එක් දිශාවක් දෙස බලා සිටින අතර අනෙක් ළමයා වෙනත් දිශාවක් දෙස බලා සිටින බවත් මල් හතරෙන් තුනක් එක් දිශාවකට හැරී තිබෙන බවත් අනෙක් මල වෙනත් දිශාවකට හැරී තිබෙන බවත් සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ඒ අනුව එක ම වර්ගවලට අයත් ද්‍රව්‍යවල හෝ පුද්ගලයින් හෝ සිටින දිශාවේ වෙනස්කම් තිබිය හැකි බවට සිසුන්ට පින්තූරයේ අදාළ අවස්ථා පෙන්වමින් පැහැදිලි කරන්න.

**පියවර 02**

- මෙම වෙනස්කම් දැකිය හැකි ප්‍රායෝගික අවස්ථා උදාහරණ දක්වමින් සිසුන් සමග සාකච්ඡා කරන්න.

**පියවර 03**

- මෙලෙස එක ම වර්ගවලට අයත් ද්‍රව්‍ය/පුද්ගලයන් තිබෙන/සිටින අවස්ථාවල ඔවුන් සිටින දිශාව අනුව වුව ද වෙනස්කම් දැකිය හැකි බවත් ඒ සඳහා හේතු විය හැකි කාරණා පිළිබඳ සිසුන්ට සරල ව පැහැදිලි කරන්න.
- ඒ අනුව රූප අතර වුව ද පිහිටීමේ දිශාව වෙනස් රූප තිබිය හැකි බවත් සියුම් ලෙස නිරීක්ෂණයෙන් ඒවා සොයා ගත හැකි බවත් උදාහරණ සහිත ව සරල ව පැහැදිලි කරන්න.

**පියවර 04**

- 'අකුරු නුවණ 1' පොතේ පිටු අංක 8හි ඇතුළත් අභ්‍යාසයේ සිසුන් නිරත කරවන්න.
- එම අභ්‍යාස සිදු කිරීමට පෙර සහ සිදු කිරීමෙන් අනතුරුව, දෙන ලද දිශාව වෙනස් රූපය හඳුනා ගත හැකි ආකාරය සහ හඳුනා ගත් ආකාරය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.


**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 2.4<br>දෙන ලද රූප හතරක් අතරින් පිහිටීමේ දිශාව වෙනස් රූපය නිවැරදි ව තෝරා සලකුණු කරයි. | 2.4.1<br>නිවැරදි වීම | නිවැරදි රූපය තෝරා සලකුණු කරයි. | නිවැරදි රූපය තෝරා සලකුණු කළ නොහැකියි. |

**ක්‍රියාකාරකම 2.5 : පිහිටීමේ ස්ථානය තෝරමු; සලකුණු කරමු.**

### පියවර 01

- එක ම වර්ගයේ ද්‍රව්‍ය හතර බැගින් වර්ග කිහිපයකින් ද්‍රව්‍ය සපයා ගන්න.
- එක ම වර්ගයට අයත් ද්‍රව්‍ය හතරෙන් තුනක් එක ම පේළියකටත් එක් ද්‍රව්‍යයක් පමණක් ඊට මඳක් ඉහළින් හෝ මඳක් පහළින් හෝ වන ලෙස තබන්න.



- එම ද්‍රව්‍ය හතරෙන් වෙනස් ව තබා ඇති ද්‍රව්‍ය තේරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- අනතුරුව අනෙකුත් වර්ගවලට අයත් ද්‍රව්‍ය ද ප්‍රදර්ශනය කර පිහිටීමේ ස්ථානය අනුව වෙනස් ද්‍රව්‍ය තේරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙලෙස විවිධ වර්ගවලට අයත් වෙනත් ද්‍රව්‍ය ද ගෙන එම ද්‍රව්‍යවල පිහිටීමේ ස්ථානය වෙනස් ද්‍රව්‍යය තේරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

### පියවර 02

- මෙම වෙනස්කම් දැකිය හැකි ප්‍රායෝගික අවස්ථා උදාහරණ දක්වමින් සිසුන් සමග සාකච්ඡා කරන්න.
- මෙලෙස පිහිටීමේ ස්ථානය අනුව වෙනස්කම් දැකිය හැකි ප්‍රායෝගික අවස්ථා සඳහා හේතු විය හැකි කාරණා පිළිබඳ සිසුන්ට සරල ව පැහැදිලි කරන්න.

### පියවර 03

- ඒ අනුව රූප අතර වුවද පිහිටීමේ ස්ථානය වෙනස් රූප තිබිය හැකි බවත් සියුම් ලෙස නිරීක්ෂණය කිරීමෙන් ඒවා සොයා ගත හැකි බවත් උදාහරණ සහිත ව සිසුන්ට පැහැදිලි කරන්න.

### පියවර 04

- 'අකුරු නුවණ 1' පොතේ පිටු අංක 9හි ඇතුළත් අභ්‍යාසයේ සිසුන් නිරත කරවන්න.
- එම අභ්‍යාසය සිදු කිරීමට පෙර සහ සිදු කිරීමෙන් අනතුරුව, දෙන ලද පිහිටීමේ ස්ථානය වෙනස් රූපය හඳුනා ගත හැකි ආකාරය සහ හඳුනා ගත් ආකාරය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 2.5<br>දෙන ලද රූප හතරක් අතරින් පිහිටීමේ ස්ථානය වෙනස් රූපය නිවැරදි ව තෝරා සලකුණු කරයි. | 2.5.1<br>නිවැරදි වීම | නිවැරදි රූපය තෝරා සලකුණු කරයි. | නිවැරදි රූපය තෝරා සලකුණු කළ නොහැකියි. |

**ක්‍රියාකාරකම 2.6 : ප්‍රමාණයෙන් කුඩා රූපය තෝරමු; සලකුණු කරමු.**

**පියවර 01**

- සිසුන් සමග එළිමහන් ස්ථානයක/පන්ති කාමරය තුළ නිරීක්ෂණයක යෙදෙන්න.
- එම ස්ථානයේ එක ම වර්ගයට අයත් ද්‍රව්‍ය සමග ප්‍රමාණයෙන් කුඩා ද්‍රව්‍ය ද තිබීම අවශ්‍ය වේ.
- එක ම වර්ගයකට අයත් ද්‍රව්‍ය සමග එම වර්ගයට අයත් ප්‍රමාණයෙන් කුඩා ද්‍රව්‍යයක් බැගින් තේරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මෙහිදී සිසුන් විසින් පෙන්වන ද්‍රව්‍ය අතර ප්‍රමාණයෙන් කුඩා ද්‍රව්‍ය ද තිබෙන බව ප්‍රකාශ කිරීමට යෝග්‍ය වන පරිදි ප්‍රශ්න විමසන්න.

**පියවර 02**

- එක ම වර්ගයට අයත් ද්‍රව්‍ය අතරින් ප්‍රමාණයෙන් කුඩා ද්‍රව්‍ය තිබෙන බවට ප්‍රායෝගික උදාහරණ දක්වමින් සිසුන් සමග සාකච්ඡාවේ යෙදෙන්න.

**පියවර 03**

- 'අකුරු නුවණ 1' පොතේ පිටු අංක 10හි ඇතුළත් **ප්‍රමාණයෙන් කුඩා රූපය සොයා පාට කරමු** යන අභ්‍යාසයේ සිසුන් නිරත කරවන්න.
- එම අභ්‍යාස සිදු කිරීමට පෙර සහ සිදු කිරීමෙන් අනතුරුව, දෙන ලද ප්‍රමාණයෙන් කුඩා රූපය හඳුනා ගත හැකි ආකාරය සහ හඳුනා ගත් ආකාරය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- **ගණිතය විෂයයේ පූර්ව ගණිත සංකල්පවල ඇතුළත් කුඩා රූපය තේරීමට අදාළ අභ්‍යාස ද මෙම ක්‍රියාකාරකම සඳහා සම්බන්ධ කර ගන්න.**
- **ඒ අනුව කුඩා රූපය තේරීමට අදාළ ගණිතය විෂයයේ ඇති සංකල්ප මෙම ක්‍රියාකාරකම හඳුන්වා දීමේදී ප්‍රයෝජනයට ගන්න.**

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 2.6<br>දෙන ලද රූප හතරක් අතරින් ප්‍රමාණයෙන් වෙනස් රූපය නිවැරදි ව තෝරා සලකුණු කරයි. | 2.6.1<br>නිවැරදි වීම | නිවැරදි රූපය තෝරා සලකුණු කරයි. | නිවැරදි රූපය තෝරා සලකුණු කළ නොහැකියි. |

**ක්‍රියාකාරකම 2.7 : ප්‍රමාණයෙන් විශාල රූපය තෝරමු; ඒ වටා රවුමක් අඳිමු.**

**පියවර 04**

- සිසුන් සමග එළිමහන් ස්ථානයක/පන්ති කාමරය තුළ නිරීක්ෂණයක යෙදෙන්න.
- එම ස්ථානයේ එක ම වර්ගයට අයත් ප්‍රමාණයෙන් විශාල ද්‍රව්‍ය ද තිබීම අවශ්‍ය වේ.
- එක ම වර්ගයකට අයත් ප්‍රමාණයෙන් විශාල ද්‍රව්‍යයක් බැගින් වර්ග කිහිපයකින් තේරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- මෙහිදී සිසුන් විසින් පෙන්වන ද්‍රව්‍ය එම වර්ගයට අයත් ද්‍රව්‍යවලින් ප්‍රමාණයෙන් විශාල බව ප්‍රකාශ කිරීමට යෝග්‍ය වන පරිදි ප්‍රශ්න විමසන්න.

**පියවර 05**

- එක ම වර්ගයට අයත් ද්‍රව්‍ය අතරින් ප්‍රමාණයෙන් විශාල ද්‍රව්‍ය තිබෙන බවට ප්‍රායෝගික උදාහරණ දක්වමින් සිසුන් සමග සාකච්ඡාවේ යෙදෙන්න.

**පියවර 06**

- 'අකුරු නුවණ 1' පොතේ පිටු අංක 10හි ඇතුළත් **ප්‍රමාණයෙන් විශාල රූපය සොයා පාට කරමු** යන අභ්‍යාසයේ සිසුන් නිරත කරවන්න.
- එම අභ්‍යාස සිදු කිරීමට පෙර සහ සිදු කිරීමෙන් අනතුරුව, දෙන ලද ප්‍රමාණයෙන් විශාල රූපය හඳුනා ගත හැකි ආකාරය සහ හඳුනා ගත් ආකාරය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- **ගණිතය විෂයයේ පූර්ව ගණිත සංකල්පවල ඇතුළත් විශාල රූපය තේරීමට අදාළ අභ්‍යාස ද මෙම ක්‍රියාකාරකම සඳහා සම්බන්ධ කර ගන්න.**
- **ඒ අනුව විශාල රූපය තේරීමට අදාළ ගණිතය විෂයයේ ඇති සංකල්ප මෙම ක්‍රියාකාරකම** හඳුන්වා දීමේදී ප්‍රයෝජනයට ගන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 2.7<br>දෙන ලද රූප හතරක් අතරින් ප්‍රමාණයෙන් වෙනස් රූපය නිවැරදි ව තෝරා සලකුණු කරයි. | 2.7.1<br>නිවැරදි වීම | නිවැරදි රූපය තෝරා සලකුණු කරයි. | නිවැරදි රූපය තෝරා සලකුණු කළ නොහැකියි. |

- දෘෂ්ටි විභේදන කුසලතාවට අයත් විවිධ සංකල්ප එක් ව සකස් කළ අකුරු නුවණ 1 පොතේ පිටු අංක 11හි ඇතුළත් අභ්‍යාසයේ සිසුන් නිරත කරවන්න.

- තම පන්ති කාමරයේ, තම නිවසේ මෙන් ම තමන් සිටින හෝ තමන් යන එන ඕනෑ ම ස්ථානයක තිබිය හැකි සමාන ද්‍රව්‍ය අතර එම වර්ගයට අයත් අසමාන ද්‍රව්‍ය තිබෙන්නේ ද යන්නත් එය අසමාන වන්නේ කුමක් නිසා ද යන්නත් නිරීක්ෂණය කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ඒවා පිළිබඳ පසු දින ප්‍රකාශ කිරීමට සූදානම් ව පැමිණෙන ලෙස සිසුන්ට පවසන්න.

**ක්‍රියාකාරකම 2.8 : සමාන ව පෙනෙන පින්තූර දෙකක වෙනස්කම් හඳුනා ගනිමු; ප්‍රකාශ කරමු.**

**පියවර 01**

- සිසුන් තම පන්ති කාමරයේ නිරීක්ෂණයක යොදවන්න.
- තම පන්ති කාමරයේ තිබෙන දේවල් මොනවා දැයි සිසුන්ගෙන් විමසන්න.

**පියවර 02**

- සිසුන් තවත් පන්ති කාමරයක නිරීක්ෂණයක යොදවන්න.
- එම පන්ති කාමරයේ තිබෙන දේවල් මොනවා දැයි සිසුන්ගෙන් විමසන්න.

**පියවර 03**

- පන්ති කාමර දෙකෙහි තිබූ සමාන දේවල් හා අසමාන දේවල් පිළිබඳ මෙන් ම ප්‍රමාණයෙන් සමාන හෝ අසමාන දේවල් පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- මේ අනුව පන්ති කාමර දෙක සමාන ව පෙනුණ ද යම් පමණක සමානකම් හා අසමානකම් පවතින බව සිසුන්ට සරල ව පැහැදිලි කරන්න.

**පියවර 04**

- සමාන ව පෙනෙන පින්තූර දෙකක ඇති වෙනස්කම් හඳුනා ගෙන ප්‍රකාශ කිරීමට අදාළ ව පින්තූර දෙකක් සකස් කර ප්‍රදර්ශනය කරන්න.
- එම පින්තූර දෙකෙහි ඇති වෙනස්කම් හඳුනා ගන්නා ආකාරය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

**පියවර 05**


- සමාන ව පෙනෙන පින්තූර දෙකක ඇති වෙනස්කම් හඳුනා ගෙන ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- 'රූප දෙකෙහි වෙනස්කම් හඳුනා ගනිමු' යන උදාහරණය සැලකිල්ලට ගනිමින් අදාළ පින්තූර සකස් කර ගන්න.
- සකස් කර ගත් පින්තූර සැම සිසුවෙකුට ම පෙනෙන පරිදි පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- එක් එක් පින්තූරයේ ඇති දේවල් වෙන වෙන ම සාකච්ඡා කරන්න. ඒ සඳහා පහත QR කේත ද භාවිත කළ හැකි ය.
- එම එක් එක් පින්තූර කාණ්ඩයේ පළමුවන පින්තූරය දෙස බලා දෙවන පින්තූරයේ ඇති වෙනස්කම් හඳුනා ගෙන ප්‍රකාශ කිරීමට අවශ්‍ය බව සිසුන්ට පැහැදිලි කරන්න.
- වෙනස්කම් ප්‍රකාශ කිරීමේදී රූපවල ඇති දේවල්වල අඩු වැඩි බව සංඛ්‍යාත්මක ව ප්‍රකාශ කිරීම අවශ්‍ය නො වේ. ඒ අනුව පහත සඳහන් ආකාරයේ ප්‍රකාශ කිරීම ප්‍රමාණවත් වේ.

  උදාහරණ: පළමුවන පින්තූරයේ සිටින හංසයන්ට වඩා දෙවන පින්තූරයේ හංසයන් අඩුයි.
- මේ ආකාරයේ තවත් අභ්‍යාස කිහිපයක් නිර්මාණය කර ලබා දී අදාළ කුසලතාව සිසුන් තුළ වර්ධනය කරන්න.


උදා:

**රූප දෙකෙහි වෙනස්කම් හඳුනා ගනිමු; කියමු.**

1 රූපය



2 රූපය




**රූප දෙකෙහි වෙනස්කම් හඳුනා ගනිමු; කියමු.**

1 රූපය



2 රූපය



**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 2.8 සමාන ව පෙනෙන පින්තූර දෙකක ඇති වෙනස්කම් හතරක් හඳුනා ගෙන ප්‍රකාශ කරයි. | 2.8.1 නිවැරදි වීම | වෙනස්කම් හතර ම නිවැරදි ව ප්‍රකාශ කරයි. | වෙනස්කම් තුනක් නිවැරදි ව ප්‍රකාශ කරයි. | වෙනස්කම් දෙකක් නිවැරදි ව ප්‍රකාශ කරයි. | වෙනස්කමක් නිවැරදි ව ප්‍රකාශ කරයි. |

**ක්‍රියාකාරකම 2.9 : වෙනස් අක්ෂර රූපය තෝරමු.**

**පියවර 01**

- සිසුන් සමග පාසල් පරිශ්‍රය තුළ නිරීක්ෂණ චාරිකාවක යෙදෙන්න.
- පාසල තුළ ඇති සුවිශේෂ ස්ථාන හඳුන්වා දීමට යොදා ඇති නාම පුවරු යනාදිය පෙන්වන්න.
- ඒවායේ එම ස්ථාන හඳුන්වා ඇති බවටත් ඒ සඳහා අකුරු භාවිත කර ඇති බවත් පවසන්න.
- එම එක් එක් අකුරට සුවිශේෂ හැඩයක් ඇති බව ද සරල ව එම නාම පුවරුවල ඇති අකුරුවල හැඩය පමණක් පෙන්වමින් සිසුන්ට පැහැදිලි කරන්න.
- **මෙහිදී අකුරු කියවීම, වචන කියවීම කිසිසේත් නොකරන්න.**
- අකුරුවල සුවිශේෂ හැඩ ඇති බව පෙන්වා දෙන්න.

**පියවර 02**

- 'අකුරු නුවණ 1' පොතේ පිටු අංක 12, 13, 14, 15හි ඇතුළත් අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- එම අභ්‍යාස සිදු කිරීමට පෙර සහ සිදු කිරීමෙන් අනතුරුව සමාන අක්ෂර රූප අතරින් වෙනස් අක්ෂර රූපය හඳුනා ගත හැකි ආකාරය සහ හඳුනා ගත් ආකාරය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 2.9<br>අක්ෂර රූප හතරක් අතරින් වෙනස් අක්ෂර රූපය තෝරා සලකුණු කරයි. | 2.9.1<br>නිවැරදි වීම | නිවැරදි රූපය තෝරා සලකුණු කරයි. | නිවැරදි රූපය තෝරා සලකුණු කළ නොහැකියි. |

**මනෝචාලක කුසලතා**

මෙම කුසලතාව ලබා ගැනීමෙන් සිසුන් තුළ සියුම් මාංශ පේශි සක්‍රිය වීමත් ඇස හා අත සමායෝජනය විධිමත් ව සිදු කිරීමට අවශ්‍ය කුසලතාව සංවර්ධනය වීමත් තහවුරු වෙයි.

## විෂය නිර්දේශයේ උද්ධෘතය


| සමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා. | 3. මනෝචාලක කුසලතා ප්‍රදර්ශනය කරයි. | ▪ කැපීම<br>▪ ඇමිණීම<br>▪ ඇලවීම<br>▪ ඇනීම සහ ඇඹීම<br>▪ නැමීම<br>▪ ඇඳීම<br>▪ පාට කිරීම<br>▪ වමේ සිට දකුණට ඇස ගෙන යෑම | ▪ මනෝචාලක කුසලතා | 3.1 දෙන ලද හැඩයක් කතුරකින් නිවැරදි ව කපයි. | 3.1.1 නිවැරදි වීම |
| | | | | 3.2 දෙන ලද ද්‍රව්‍ය සමූහයක් රටාවකට අමුණයි. | 3.2.1 නිවැරදි වීම |
| | | | | 3.3 දෙන ලද සීමාවක් තුළ ද්‍රව්‍ය සමූහයක් පිළිවෙළකට අලවයි. | 3.3.1 පිළිවෙළක් සහිත වීම<br>3.3.2 සීමාව තුළ ඇලවීම |
| | | | | 3.4 පදම් කළ මැටි අනා නම් කරන ලද ආකෘති දෙකක් නිර්මාණය කරයි. | 3.4.1 නිමාවක් සහිත වීම<br>3.4.2 නිර්මාණශීලීත්වය |
| | | | | 3.5 ආදර්ශනය කරන ලද හැඩවලට අනුව කඩදාසියක් නිවැරදි ව නමයි. | 3.5.1 නිවැරදි වීම |
| | | | | 3.6 අච්චුවක් තබා හැඩතලයක් මනා නිමාවකින් යුතු ව අඳියි. | 3.6.1 නිමාවක් සහිත වීම |
| | | | | 3.7 දෙන ලද හැඩතලයක සීමාව තුළ වර්ණ ගන්වයි. | 3.7.1 සීමාව තුළ වර්ණ ගැන්වීම |
| | | | | 3.8 අනුපිළිවෙළින් එක පෙළට ඇති පින්තූර හතරක් ඇසුරෙන් කතන්දරයක් ගොඩනගා ප්‍රකාශ කරයි. | 3.8.1 අන්තර් සම්බන්ධතාවක් සහිත වීම |

| | | |
|---|---|---|
| **ක්‍රියාකාරකම 3.1** | : | **කතුරකින් හැඩයක් කපමු.** |
| **කාලය** | : | පැය 06යි. |
| **ඉගෙනුම් සම්පත්** | : | කතුරක්, විවිධ හැඩ අඳින ලද පාට A4 කොළ, වීඩියෝ දර්ශන ඇතුළත් QR කේත |
| **වාංමාලාව** | : | හැඩය, සීමාව, ද්‍රව්‍ය, රටාව, ආකෘතිය, හැඩතල, රවුම්, හතරැස්, ත්‍රිකෝණ, අනුපිළිවෙළ, පෙළ |

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 01**

- පළමු ව කතුර ඇඟිලිවලින් අල්ලන ආකාරය සිසුන්ට පෙන්වා දෙන්න.
- අනතුරුව කතුරේ කොටස් දෙක ඇඟිලිවල ආධාරයෙන් විවෘත කරන ආකාරය පෙන්වා දෙන්න.



**පියවර 02**


- සිසුන්ට ද කතුර අල්ලන ආකාරය පුහුණු කරන්න.
- කතුර ඇඟිලිවල ආධාරයෙන් විවෘත කරන අයුරු ද පුහුණු කරන්න.
- කතුර අල්ලන ආකාරය පුහුණු කිරීමේදී අනතුරක් සිදු නොවන ලෙසින් ආරක්ෂිත ආකාරයට සකස් කළ කතුරු ලබා දී ආදාළ පුහුණු කිරීම් සිදු කරන්න.

**පියවර 03**

- කොළයක් කතුරකින් කපන ආකාරය ආදර්ශනය කරන්න.
- එය සිසුන්ට ද පුහුණු කරන්න.

**පියවර 04**

- පහත සඳහන් හැඩ සහිත A4 කොළය බැගින් සකස් කර සිසුන්ට ලබා දෙන්න.




- අනතුරුව සිසුන්ට එම එක් එක් හැඩය කැපීමට ලබා දී ඊට සහාය වන්න.

**පියවර 05**

- දෙන ලද හැඩයක් කතුරකින් කපා ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.

  උදාහරණ : රවුම් හැඩයක්, හතරැස් කොටුවක්, කුඩා මලක්
- මෙහිදී නිවැරදි ව කතුර ඇල්ලීමට මෙන් ම සීමාව තුළ කැපීමට, ඉර දිගේ කැපීමට සිසුන්ට සහාය වන්න.

**පියවර 06**

- එම දෙන ලද හැඩ යොදා ගෙන ගුරුවරයා සිසුන් සමග එක් ව නිර්මාණයක් කරන්න.
- සකස් කරන ලද නිර්මාණය ප්‍රදර්ශනය කරන්න.
- කපන ලද කොළවලින් අලංකාර නිර්මාණ කළ හැකි බව සිසුන්ට පහදා දෙන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 3.1<br>දෙන ලද හැඩයක් කතුරකින් නිවැරදි ව කපයි. | 3.1.1<br>නිවැරදි වීම | නිවැරදි ව හැඩය කපයි. | නිවැරදි ව හැඩය කැපීමට නොහැකියි. |

**ක්‍රියාකාරකම 3.2 : රටාවකට අමුණමු.**

**පියවර 01**

- සිසුන් කණ්ඩායම්වලට වෙන් කරන්න.
- වර්ග දෙකකට අයත් ද්‍රව්‍ය කිහිපයක් මිශ්‍ර කර ප්‍රදර්ශනය කරන්න.
- එම වර්ග දෙකෙන් ම එක් එක් කණ්ඩායමට ද්‍රව්‍ය ලබා දෙන්න.

  උදාහරණ : මල් වර්ග දෙකක්, ශාක පත්‍ර වර්ග දෙකක්
- එහි වර්ග දෙකකට අයත් දේ තිබෙන බවත් එය අලංකාර ව පිළිවෙළට ගොනු කළ හැකි බවත් පවසන්න.
- එක් වර්ගයක ද්‍රව්‍ය එක් පේළියකටත් අනෙක් වර්ගයේ ද්‍රව්‍ය තවත් පේළියකටත් තැබීම එලෙස ගොනු කළ හැකි එක් ක්‍රමයක් බව පවසන්න.
- එය සිදු කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන්ට ද තම කණ්ඩායම් තුළ එක ම වර්ගයට අයත් ද්‍රව්‍ය වර්ග දෙක පේළි දෙකකට තැබීමට උපදෙස් දෙන්න.
- එහි යම් රටාවක් ඇති බව සිසුන්ට පැහැදිලි කරන්න.

**පියවර 02**

- මෙම ද්‍රව්‍ය වර්ග දෙක ම යොදා ගෙන තවත් අලංකාර ලෙස ද්‍රව්‍ය ගොනු කළ හැකි ආකාර තිබෙන බව පවසන්න.
- ඒ අනුව එක් වර්ගයක ද්‍රව්‍යයකට පසු තවත් වර්ගයක ද්‍රව්‍යයක් යනාදි ලෙසට ද්‍රව්‍ය දෙක මාරු කරමින් ද්‍රව්‍ය පෙළගැස්විය හැකි බව සිසුන්ට පවසන්න.

- එය සිදු කරන අයුරු සිසුන්ට පෙන්වා දෙන්න.
- සිසුන්ට ද කණ්ඩායම් තුළ එය සිදු කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එම රටාව තුළ ඇති අලංකාරවත් බව පිළිබඳ සාකච්ඡා කරන්න.

**පියවර 03**

- මෙලෙස රටාවක් ගොඩනැඟෙන ලෙස මෙම ද්‍රව්‍ය තැබිය හැකි තවත් ආකාර පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- සිසුන්ගෙන් ඒ සඳහා අදහස් නොලැබුණ හොත් ඔබ තවත් අදහසක් පවසා සිසුන් බුද්ධි කලම්බනයක යොදවන්න.

**පියවර 04**

- මෙලෙස ප්‍රායෝගික ජීවිතයේ විවිධ අවස්ථාවලදී ද භාණ්ඩ හා නිර්මාණ පිළිවෙළට තැබීම සහ එහි වටිනාකම පිළිබඳ උදාහරණ සහිත ව සිසුන් සමග සාකච්ඡා කරන්න.

**පියවර 05**

- දෙන ලද ද්‍රව්‍ය සමූහයක් රටාවකට ඇමිණීමට සිසුන් යොමු කරන්න.

  උදාහරණ : නූලකට වර්ග දෙකක මල්, කම්බියකට පාට දෙකක පබළු, ඉරටුවකට පාට දෙකක මඤ්ඤොක්කා බඩ, . . .
- මෙහිදී ක්‍රමවත් ව රටාව ගැළපීමට සිසුන්ට සහාය වන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 3.2<br>දෙන ලද ද්‍රව්‍ය සමූහයක් රටාවකට අමුණයි. | 3.2.1<br>නිවැරදි වීම | නිවැරදි ව රටාවට අමුණයි. | නිවැරදි ව රටාවකට ඇමිණිය නොහැකියි. |

**ක්‍රියාකාරකම 3.3 : සීමාවක් තුළ පිළිවෙළකට අලවමු.**

**පියවර 01**

- පොත්පත් පිළිවෙළකට අසුරා ඇති සහ විවිධ නිර්මාණ සැරසිලි පිළිවෙළකට ප්‍රදර්ශනය කර ඇති පන්ති කාමරයක් සිසුන්ට පෙන්වන්න.
- ඒ සඳහා පහත QR කේතය ද භාවිත කළ හැකි ය.

Channel NIE

- එම ද්‍රව්‍ය හා නිර්මාණ අසුරා ඇති හා ප්‍රදර්ශනය කර ඇති ආකාරය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- අනතුරුව පිළිවෙළකට භාණ්ඩ ඇසිරීමේ වටිනාකම ප්‍රායෝගික උදාහරණ සහිත ව සිසුන්ට සරල ව පැහැදිලි කරන්න.
- මේ අනුව පිළිවෙළකට ද්‍රව්‍ය ඇසිරීමේදී, ඇලවීමේදී හා ඉදිරිපත් කිරීමේදී වැදගත් වන සාධක සිසුන් සමග සාකච්ඡා කරන්න.

  උදාහරණ : අදාළ සීමාව තුළ ඇසිරීම සහ ඇලවීම තුළ ක්‍රමවත් බවක් ඇති වීම යනාදි ලෙසට

**පියවර 02**

- පහත සඳහන් අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.

  උදාහරණ :
  - A4 කොළයක අඳින ලද අඹ ගෙඩියක රූපයක් තුළ කොළ ඇලවීම
  - A4 කොළයක අඳින ලද අන්නාසි ගෙඩියක රූපයක් තුළ කොළ ගුළි කර ඇලවීම
- මෙහිදී සීමාව තුළ ඇලවීමට සිසුන්ට සහාය වන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 3.3 දෙන ලද සීමාවක් තුළ ද්‍රව්‍ය සමූහයක් පිළිවෙළකට අලවයි. | 3.3.1 පිළිවෙළක් සහිත වීම | නිවැරදි ව පිළිවෙළකට අලවයි. | පිළිවෙළකට ඇලවිය නොහැකියි. |
| | 3.3.2 සීමාව තුළ ඇලවීම | සීමාව තුළ ඉතා නිවැරදි ව අලවයි. | සීමාව තුළ නිවැරදි ව ඇලවිය නොහැකියි. |

**ක්‍රියාකාරකම 3.4 : මැටි අනා ආකෘති නිර්මාණය කරමු.**

**පියවර 01**

- සිසුන් කුඩා කණ්ඩායම්වලට වෙන් කරන්න.
- පදම් කළ මැටිවලින් සැකසූ විවිධ නිර්මාණ කිහිපයක් බැගින් සෑම කණ්ඩායමකට ම ලබා දෙන්න.

  උදාහරණ :







- ඒවායේ අලංකාර බව හා නිමාව පිළිබඳ සිසුන්ට අවබෝධ වන පරිදි ඔවුන් සමග පිළිසඳරක යෙදෙන්න.
- මේවායේ අලංකාර බව හා නිමාව මනා ලෙස සිදු වී ඇත්තේ ඒවා ක්‍රමවත් ව නිර්මාණය කර ඇති නිසා යැයි සිසුන්ට සරල ව පැහැදිලි කරන්න.

**පියවර 02**

- මෙවැනි විවිධ නිර්මාණ වෙළෙඳ පොළෙහි ඇත්තේ සහ එම නිර්මාණ මිල දී ගැනීමට යොමු වන්නේ විවිධ හැඩ, පාට යොදා ක්‍රමවත් ව අලංකාරවත් ව කළ නිසා බව සිසුන්ට පැහැදිලි කරන්න.
- විවිධ නිර්මාණ වෙළෙඳ පොළෙහි ඇති ආකාරය සහ එම නිර්මාණවල අලංකාරවත් බව පෙන්වීම සඳහා එවන් ස්ථානයකට සිසුන් රැගෙන යන්න.
- ඒ සඳහා පහත QR කේතය ද භාවිත කළ හැකි ය.

- ඒ පිළිබඳ සිසු අදහස් හා අද්දැකීම් ද විමසන්න.

**පියවර 03**

- පදම් කළ මැටි භාවිත කරමින් විවිධ ආකෘති ගොඩනගන ආකාරය ආදර්ශනය කරන්න
- පදම් කළ මැටි ලබා දී සරල ආකෘති ගොඩනැගීමට සිසුන් යොමු කරන්න.

  උදාහරණ : පලතුරු වර්ග, කැවිලි වර්ග, සතුන්, . . .
- මෙහිදී ඇඟිලි තුඩු, හොඳින් ක්‍රියාකාරී වන පරිදි මැටි ඇනීමටත් සියුම් ලෙස සරල ආකෘති ගොඩනැගීමටත් සිසුන්ට සහාය වන්න.

**තක්සේරුකරණය :**




| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 3.4 පදම් කළ මැටි අනා නම් කරන ලද ආකෘති දෙකක් නිර්මාණය කරයි. | 3.4.1 නිමාවක් සහිත වීම | ආකෘති දෙක ම මනා නිමාවක් සහිත ව නිර්මාණය කරයි. | එක් ආකෘතියක සුළු අඩු පාඩු සහිත ව ආකෘති දෙක ම නිර්මාණය කරයි. | එක් ආකෘතියක් පමණක් නිර්මාණය කරයි. | අන් අයගේ උදවු ඇති ව ආකෘති නිර්මාණය කරයි. |
| | 3.4.2 නිර්මාණශීලිත්වය | ආකෘති දෙකෙහි ම ඉහළ මට්ටමේ නිර්මාණශීලිත්වයක් ප්‍රදර්ශනය කරයි. | එක් ආකෘතියක පමණක් ඉහළ මට්ටමේ නිර්මාණශීලිත්වයක් ප්‍රදර්ශනය කරයි. | ආකෘති දෙකෙහි ම සාමාන්‍ය මට්ටමේ නිර්මාණශීලිත්වයක් ප්‍රදර්ශනය කරයි. | ඉතා අඩු නිර්මාණශීලිත්වයක් ප්‍රදර්ශනය කරයි. |

**ක්‍රියාකාරකම 3.5 : කඩදාසියක් විවිධ හැඩවලට නමමු; නිර්මාණ කරමු.**

**පියවර 01**

- සිසුන් කුඩා කණ්ඩායම්වලට වෙන් කරන්න.
- සරල ඔරිගාමි නිර්මාණ දෙකක් බැගින් සෑම කණ්ඩායමකට ම ලබා දෙන්න.


උදාහරණ :







- එම නිර්මාණ නිරීක්ෂණයට හා අධ්‍යයනයට සිසුන් යොමු කරන්න.
- එම නිර්මාණ සිදු කරන්නට ඇති ආකාරය පිළිබඳ උපකල්පිත අදහස් පැවසීමට සිසුන් යොමු කරන්න.
- ගුරුවරයා ද එම නිර්මාණ සිදු කර ඇති ආකාරය පිළිබඳ අදහස් පවසන්න.

- පහත දී ඇති එක් එක් ඔරිගාමි නිර්මාණවලින් දෙකක් සිදු කරන අයුරු ආදර්ශනය කරන්න.

උදාහරණ :



**පියවර 02**

- ආදර්ශනය කරන ලද සරල හැඩ සහිත නිර්මාණයක් ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.
- සිසුන් හා එක්ව කළ ඔරිගාමි නිර්මාණ භාවිත කර නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සිදු කර පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- මෙවැනි නිර්මාණ විවිධ සැරසිලි සඳහා යොදා ගත හැකි බව සිසුන්ට පැහැදිලි කරන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 3.5 ආදර්ශනය කරන ලද හැඩවලට අනුව කඩදාසියක් නිවැරදි ව නමයි. | 3.5.1 නිවැරදි වීම | කඩදාසියක් නිවැරදි ව නමයි. | කඩදාසියක් නිවැරදි ව නැමීමට නොහැකියි. |

**ක්‍රියාකාරකම 3.6 : අච්චු තබා විවිධ හැඩතල අඳිමු.**

**පියවර 01**

- සිසුන් එළිමහන් ස්ථානයකට රැගෙන යන්න.
- අවට පරිසරය නැරඹීමට සිසුන් යොමු කරන්න.
- වටපිටාවේ ඇති දේවලින් රවුම් හැඩය, හතරැස් හැඩය, ත්‍රිකෝණ හැඩය යනාදිය මතු වෙන අවස්ථා සෙවීමට යොමු කර ඒ පිළිබඳ සාකච්ඡා කරන්න.

  උදාහරණ : - ගස්වල අතු අතර ඇති විය හැකි විවිධ හැඩ
  - බිත්තියක ඇති හතරැස් හැඩ
  - වලාකුළුවල ඇති විවිධ හැඩ


**පියවර 02**

- අච්චු තබා විවිධ සරල හැඩතල ඇඳීමට සිසුන් යොමු කරන්න.

  උදාහරණ : රවුම් හැඩය, හතරැස් හැඩය, ත්‍රිකෝණ හැඩය, . . .
- මෙහිදී හැඩතල වටා අඳින රේඛා මනා නිමාවකින් යුතු ව ඇඳීමට සිසුන්ට සහාය වන්න.

**පියවර 03**

- අත්ල තබා මොනරෙක් ඇඳීම සඳහා පහත සඳහන් රූපය A4 කඩදාසියක ඇඳ සිසුන්ට ලබා දෙන්න.
- එය ඇඳ ඇති ආකාරය සිසුන් සමග සාකච්ඡා කරන්න.
- සෑම සිසුවෙකුට ම තම අත්ල තබා මොනරෙක් ඇඳීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.



- මෙලෙස අත්ල තබා ඇඳිය හැකි තවත් නිර්මාණ පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- එම නිර්මාණ කිරීමට ද අවස්ථාව ලබා දෙන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 3.6 අච්චුවක් තබා හැඩතලයක් මනා නිමාවකින් යුතු ව අඳියි. | 3.6.1 මනා නිමාවක් සහිත වීම | මනා නිමාවක් සහිත ව අඳියි. | නිමාවක් සහිත ව ඇඳිය නොහැකියි. |

**ක්‍රියාකාරකම 3.7 : හැඩතලයක සීමාව තුළ වර්ණ ගන්වමු.**

**පියවර 01**

- සිසුන් කුඩා කණ්ඩායම්වලට වෙන් කරන්න.
- වර්ණ ගන්වන ලද විවිධ හැඩතල හතරක් බැගින් සෑම කණ්ඩායමකට ම ලබා දෙන්න.
  (රවුම් හැඩය, ඍජුකෝණාස්‍ර හැඩය, සමචතුරස්‍ර හැඩය හා ත්‍රිකෝණ හැඩය)
- එම හැඩතල විවිධ වර්ණ ගන්වා ඇති අයුරු නිරීක්ෂණයට සිසුන් යොමු කරන්න.
- ඒවායේ ක්‍රමවත්බව ඉස්මතු කර ඒ පිළිබඳ සාකච්ඡා කරන්න.

**පියවර 02**

- ඉහත හැඩතල වර්ණ ගන්වා ඇති ලෙසට ම දෙන ලද රූපමය හැඩ ද ක්‍රමවත් ව වර්ණ ගැන්විය හැකි බවට සරල ව පැහැදිලි කරන්න.

**පියවර 03**

- දෙන ලද සරල හැඩතල සීමාව තුළ වර්ණ ගැන්වීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- 'අකුරු නුවණ 1' පොතේ පිටු අංක 16, 17, 18, 19, 20, 21හි ඇතුළත් අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- මෙහිදී සීමාව තුළ වර්ණ ගැන්වීමට සිසුන්ට සහාය වන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 3.7<br>දෙන ලද හැඩතලයක සීමාව තුළ වර්ණ ගන්වයි. | 3.7.1<br>සීමාව තුළ වර්ණ ගැන්වීම | සීමාව තුළ වර්ණ ගන්වයි. | සීමාව තුළ වර්ණ ගැන්විය නොහැකියි. |

**ක්‍රියාකාරකම 3.8 : පින්තූර ඇසුරෙන් කතන්දරයක් ගොඩනගමු; ප්‍රකාශ කරමු.**

**පියවර 01**

- සිසුන්ට ඇස සහ අත සමායෝජනය වන පරිදි ක්‍රියාකාරකම් සිදු කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- 'අකුරු නුවණ 1' පොතේ පිටු අංක 22, 23, 24, 25, 26, 27, 28හි ඇතුළත් අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- මෙහිදී යම්කිසි එක් ද්‍රව්‍යයක් සහ තවත් ද්‍රව්‍යයක් අතර ඇති සම්බන්ධතාව සෙවීම ඔස්සේ තර්කානුකූල ව සිසුන්ගේ මනස මෙහෙයවා එම ක්‍රියාකාරකම්වල නිරත කරන්න.
- පින්තූර ඇසුරෙන් කතන්දර ගොඩනැඟීමට පෙර දෙන ලද ද්‍රව්‍ය අතර අන්තර් සම්බන්ධතාව පෙන්වන එම ක්‍රියාකාරකම්වල අවබෝධයෙන් නිරත වීමට සිසුන්ට මග පෙන්වන්න.

**පියවර 02**


- පහත සඳහන් උදාහරණය සැලකිල්ලට ගනිමින් පින්තූර හතරක් සකස් කර ගන්න.
- මෙම පින්තූරවලට අදාළ ව පහත QR කේත ද භාවිත කළ හැකි ය.
- එම පින්තූර හතර වරකට එක බැගින් සෑම සිසුවෙකුට ම පෙනෙන පරිදි පන්තියේ ප්‍රදර්ශනය කරන්න.




1 පින්තූරය



2 පින්තූරය



3 පින්තූරය



4 පින්තූරය


- එක් එක් පින්තූරයේ පෙනෙන දේවල් නම් කරන ලෙසට සිසුන්ට පවසන්න.
- මෙලෙස පින්තූර හතර ම ප්‍රදර්ශනය කර එම පින්තූරවල පෙනෙන දේවල් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.


**පියවර 03**

- එම පින්තූර හතර අනුපිළිවෙළට තබා ප්‍රදර්ශනය කරන්න.
- එම පින්තූර හතර මගින් කතන්දරයක් ගොඩනැඟිය හැකි ආකාරය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

**පියවර 04**

- අනුපිළිවෙළින් එක පෙළට ලබා දී ඇති පින්තූර හතරක් සෑම සිසුවෙකුට ම පෙනෙන පරිදි සකස් කර පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- එම පින්තූර හතර ඇසුරෙන් කතන්දර ගොඩනැඟීමට සිසුන් යොමු කරන්න.
- පින්තූරවලට අදාළ ව ලබා දී ඇති QR කේත ද භාවිත කළ හැකි ය.
- ඒ සඳහා පහත සඳහන් උදාහරණ සැලකිල්ලට ගනිමින් පින්තූර ඇසුරෙන් කතන්දර ගොඩනැඟීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.





තක්සේරුකරණය :

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 3.8<br>එක පෙළට ඇති පින්තූර හතරක් ඇසුරෙන් කතන්දරයක් ගොඩනගා ප්‍රකාශ කරයි. | 3.8.1<br>මනා අන්තර් සම්බන්ධතාවක් සහිත වීම | පින්තූර හතර ම ඇසුරු කර ගෙන ඉතා හොඳ අන්තර් සම්බන්ධතාවක් සහිත ව කතන්දරය ඉදිරිපත් කරයි. | පින්තූර හතර ම ඇසුරු කර ගෙන අන්තර් සම්බන්ධතාවක් සහිත ව කතන්දරය ඉදිරිපත් කළ නොහැකියි. |

**පෙර කියවීම**

මෙම කුසලතාව ලබා ගැනීමෙන් සිසුන් තුළ විධිමත් ලෙස කියවීමට අවශ්‍ය පදනම සැපයෙන අතර කියවීමේ රුචිකත්වය වර්ධනය වීම ද තහවුරු වෙයි.

**විෂය නිර්දේශයේ උද්ධෘතය**

| සමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා. | 4. පෙර කියවීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි. | ▪ පින්තූර පත්<br>▪ පින්තූර පොත් | ▪ පෙර කියවීම | 4.1 දෙන ලද පින්තූර පහක් හඳුනා ගෙන නිවැරදි ව නම් කරයි. | 4.1.1 නිවැරදි වීම |
| | | | | 4.2 දෙන ලද පින්තූරයක ඇති සිද්ධියක් නිවැරදි ව නම් කරයි. | 4.2.1 නිවැරදි වීම |
| | | | | 4.3 පින්තූර පොතක ඇතුළත් පින්තූර ඇසුරෙන් කතන්දරයක් ගොඩනඟා කියයි. | 4.3.1 අන්තර් සම්බන්ධතාවක් සහිත වීම |

**ක්‍රියාකාරකම 4.1 : පින්තූර හඳුනා ගනිමු; නම් කරමු.**

**කාලය** : පැය 04යි.

**ඉගෙනුම් සම්පත්** : පින්තූර

**වාංමාලාව** : ශබ්දය, පලතුරුවල නම්, එළවුළුවල නම්, රූපවල නම්, සතුන්ගේ නම්, මල්වල නම්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 01**

- තම නිවසේ ඇති එළවුළු/පලතුරුවල නම් මොනවා දැයි ප්‍රකාශ කිරීමට සූදානම් ව පැමිණෙන ලෙස පෙර දින සිසුන් දැනුවත් කරන්න.
- එළවුළු/පලතුරුවල නම් පැවසීමට සෑම සිසුවෙකුට ම අවස්ථාව දෙන්න.

**පියවර 02**

- තම පන්ති කාමරය තුළ හා පාසල් පරිශ්‍රය තුළ සිසුන් සමග නිරීක්ෂණයක යෙදෙන්න.
- එහිදී දකින ද්‍රව්‍යවල නම් පැවසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මේ අනුව සෑම ද්‍රව්‍යයක් ම නමකින් හඳුන්වන බව සිසුන්ට පැහැදිලි කරන්න.

**පියවර 03**

- දෙන ලද පින්තූර කියවීමට සිසුන් යොමු කරන්න.
- 'අකුරු නුවණ 1' පොතේ පිටු අංක 29, 30, 31හි ඇතුළත් අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- මෙහිදී වචන නිවැරදි ව උච්චාරණය කිරීම කෙරෙහි සුවිශේෂ අවධානය යොමු කරන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 4.1<br>දෙන ලද පින්තූර පහක් හඳුනා ගෙන නිවැරදි ව නම් කරයි. | 4.1.1<br>නිවැරදි වීම | පින්තූර පහක් හෝ හතරක් නම් කරයි. | පින්තූර තුනක් නම් කරයි. | පින්තූර දෙකක් නම් කරයි. | එක් පින්තූරයක් නම් කරයි. |

**පියවර 04**

- රූපවල නම් කියවීම හා එම නම්වල මුල් අකුරේ ශබ්දය පැවසීමට අදාළ අභ්‍යාසවලට සිසුන් යොමු කරන්න.
- 'අකුරු නුවණ 1' පොතේ පිටු අංක 32, 33, 34, 35හි ඇතුළත් අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- එම රූපවල නම් කියවීම හා එම නම්වල මුල් අකුරේ ශබ්දය පැවසීමට සිසුන් පුහුණු කරවන්න.
- මේ සඳහා සිසුන් පුහුණු කරවීමට පෙර ගුරු ආදර්ශන ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 4.2 : පින්තූරයක ඇති සිද්ධියක් නම් කරමු.**

**පියවර 01**

- චිත්‍ර ප්‍රදර්ශනයක් නැරඹීමේ අවස්ථාවකට සිසුන් යොමු කරන්න.
- ඒ සඳහා දී ඇති QR කේතය ද භාවිත කළ හැකි ය.
- එම අවස්ථාව පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

Channel NIE

- චිත්‍ර නරඹන පුද්ගලයන් චිත්‍ර අසල නතර වී ඒ දෙස බලා සිටින්නේ එම චිත්‍රයෙන් ප්‍රකාශ වන්නේ කුමක් ද යන්න පිළිබඳ සිතීමට බව පවසන්න.

**පියවර 02**


- පින්තූරවල ඇතුළත් සිද්ධි නම් කිරීමට අදාළ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- පහත සඳහන් උදාහරණ සැලකිල්ලට ගනිමින් අදාළ පින්තූර සකස් කර ගන්න.
- එම පින්තූර වරකට එක බැගින් සෑම සිසුවෙකුට ම පෙනෙන පරිදි පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- එම එක් එක් පින්තූරවල ඇති සිද්ධි දෙස අවධානයෙන් යුතු ව බලමින්, ඒ පිළිබඳ සාකච්ඡා කරමින් සිද්ධි නම් කිරීමට අදාළ අද්දැකීම් සිසුන්ට ලබා දෙන්න.





### පියවර 03

- පහත සඳහන් උදාහරණ සැලකිල්ලට ගනිමින් අදාළ පින්තූර සකස් කර ගන්න.
- එම පින්තූරවල ඇති සිද්ධි නිවැරදි ව නම් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.





- පියවර 2ට හා පියවර 3ට අදාළ පින්තූර සඳහා පහත QR කේත ද භාවිත කළ හැකි ය.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 4.2<br>දෙන ලද පින්තූරයක ඇති සිද්ධියක් නිවැරදි ව නම් කරයි. | 4.2.1<br>නිවැරදි වීම | සිද්ධිය නිවැරදි ව නම් කරයි. | සිද්ධිය නම් කළ නොහැකියි. |

### ක්‍රියාකාරකම 4.3 : පින්තූර පොතකින් කතන්දරයක් ගොඩනගමු; කියමු.

### පියවර 01

- පින්තූර සහිත කතන්දර පොතක් ඇසුරෙන් කතන්දරයක් ගොඩනඟන අයුරු ආදර්ශනය කරන්න.
- සියලු ම සිසුන් සහභාගි කර ගනිමින් කතන්දර කිහිපයක් ගොඩනගන්න.

### පියවර 02

- සිසුන් කුඩා කණ්ඩායම්වලට වෙන් කරන්න.
- එක් එක් කණ්ඩායමට විශාල පින්තූර සහිත කතන්දර පොත බැගින් ලබා දෙන්න.

- එම පොත්වල පින්තූර පමණක් බලා ඒ ඇසුරෙන් කතන්දරයක් ගොඩනැඟීමට සිසුන්ට සහාය වන්න.
- එම කණ්ඩායම් අසලට ගොස් ඔවුන් විසින් ගොඩනඟන ලද කතන්දරය විමසන්න.

### පියවර 03

- සුදුසු පින්තූර සහිත කතන්දර පොතක් බැගින් සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- එම පොත්වල ඇති පින්තූර බලා කතන්දර ගොඩනැඟීමට සිසුන් යොමු කරන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 4.3 පින්තූර පොතක ඇතුළත් පින්තූර ඇසුරෙන් කතන්දරයක් ගොඩනඟා කියයි. | 4.3.1 මනා අන්තර් සම්බන්ධතාවක් සහිත වීම | පින්තූර සියල්ල ම ඇසුරු කර ගෙන ඉතා හොඳ අන්තර් සම්බන්ධතාවක් සහිත ව කතන්දරය ඉදිරිපත් කරයි. | පින්තූර කිහිපයක් ඇසුරු කර ගෙන අන්තර් සම්බන්ධතාවක් සහිත ව කතන්දරය ඉදිරිපත් කරයි. | අන් අයගේ උදවු ඇති ව පින්තූර කිහිපයක් ඇසුරු කරගෙන අන්තර් සම්බන්ධතාවක් සහිත ව කතන්දරය ඉදිරිපත් කරයි. | පින්තූර ඇසුරු කරගෙන අන්තර් සම්බන්ධතාවක් සහිත ව කතන්දරය ඉදිරිපත් කිරීමට උත්සාහ නොකරයි. |

**පෙර ලිවීම**

මෙම කුසලතාව ලබා ගැනීමෙන් සිසුන් තුළ විධිමත් ලෙස අකුරු ලිවීමට අවශ්‍ය පදනම ලබා ගැනීම තහවුරු වෙයි.

**විෂය නිර්දේශයේ උද්ධෘතය**

| සමාජ භාෂා කාර්ය/ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා. | 5. පෙර ලිවීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි. | ■ පින්තූර<br>■ අකුරුවලට අදාළ හැඩ | ■ පෙර ලිවීම | 5.1 තිත් නිවැරදි ව යා කර දෙන ලද පින්තූරයක් සම්පූර්ණ කරයි. | 5.1.1 නිවැරදි වීම |
| | | | | 5.2 තිත් යා කර අකුරුවලට අදාළ හැඩ 21ක් නිවැරදි ව සම්පූර්ණ කරයි. | 5.2.1 නිවැරදි වීම |
| | | | | 5.3 අකුරුවලට අදාළ හැඩ 21ක් බලා නිවැරදි ව අඳියි. | 5.3.1 නිවැරදි වීම |

නිවැරදි ව පැන්සල අල්ලන ආකාරය, පොත තබා ගන්නා ආකාරය සහ අසුන් ගන්නා ආකාරය සිසුන්ට පුහුණු කරන්න. මෙම පොතෙහි 56 සහ 57 පිටුවල ඒ සඳහා ආදර්ශ පින්තූර සපයා ඇත.

**ක්‍රියාකාරකම 5.1 : තිත් යා කරමු; පින්තූර සම්පූර්ණ කරමු.**

**කාලය** : පැය 12යි.

**වාංමාලාව** : හැඩ, සම්පූර්ණ

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 01**

- හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ තිත් යා කර සම්පූර්ණ කළ හැකි පින්තූරයක් ප්‍රදර්ශනය කරන්න.
- එය ක්‍රමවත් ලෙස තිත් යා කර සම්පූර්ණ කරන අයුරු ආදර්ශනය කරන්න.
- මෙලෙස තිත් යා කර පින්තූරය සම්පූර්ණ කිරීමට හැකි වූයේ හුණු කූර/පෑන, පැන්සල නිවැරදි ලෙස ඇල්ලීමෙන් හා නිවැරදි ව තිත් උඩ පමණක් ඉර ඇඳීමෙන් බව සිසුන්ට පැහැදිලි කරන්න.

**පියවර 02**

- දෙන ලද පින්තූරවල තිත් යා කර සම්පූර්ණ කිරීමට සිසුන් යොමු කරන්න.
- 'අකුරු නුවණ 1' පොතේ පිටු අංක 36, 37, 38හි ඇතුළත් අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 5.1<br>තිත් නිවැරදි ව යා කර දෙන ලද පින්තූරයක් සම්පූර්ණ කරයි. | 5.1.1<br>නිවැරදි වීම | තිත් නිවැරදි ව යා කර පින්තූරය සම්පූර්ණ කරයි. | තිත් යා කර පින්තූරය සම්පූර්ණ කළ නොහැකියි. |

5.2 සහ 5.3 ක්‍රියාකාරකම්වල තිත් යා කර අකුරුවලට අදාළ හැඩයක් සම්පූර්ණ කිරීමේ අභ්‍යාසයක් සිදු කිරීමෙන් අනතුරුව ඊට අදාළ හැඩය බලා ඇඳීමේ අභ්‍යාසයෙහි සිසුන් නිරත කරවන්න. අකුරුවලට අදාළ හැඩ තිත් යා කිරීමේ හා බලා ලිවීමේ සියලු අභ්‍යාස සඳහා මෙම ක්‍රමය අනුගමනය කරන්න.

**ක්‍රියාකාරකම 5.2 : තිත් යා කරමු; අකුරුවලට අදාළ හැඩ සම්පූර්ණ කරමු.**

**පියවර 01**

- හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ අකුරුවලට අදාළ සරල හැඩ දෙකක් තිත් මගින් ප්‍රදර්ශනය කරන්න.
- තිත් යා කර පින්තූරයක් සම්පූර්ණ කළ ආකාරයට ම මෙම හැඩ ද සම්පූර්ණ කළ හැකි බව පවසන්න.
- නිවැරදි දිශාවට ක්‍රමවත් ව සහ නිවැරදි ව තිත් යා කරන ආකාරය ආදර්ශනය කරන්න.

## පියවර 02

- අකුරුවලට අදාළ නිවැරදි හැඩ තිත් යා කර සම්පූර්ණ කිරීමට සිසුන් යොමු කරන්න.
- ඒ සඳහා **'අකුරු නුවණ 2'** පොතෙහි පිටු අංක 1 සිට 21 තෙක් ඇති අකුරුවලට අදාළ හැඩ තිත් මත ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- මෙහිදී තිත් යා කිරීම ක්‍රමවත් ව හා මනා නිමාවකින් යුතු ව කිරීමට සිසුන්ට සහාය වන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 5.2 තිත් යා කර අකුරුවලට අදාළ හැඩ විසි එකක් නිවැරදි ව සම්පූර්ණ කරයි, | 5.2.1 නිවැරදි වීම | තිත් නිවැරදි ව යා කර අකුරුවලට අදාළ හැඩ දහහතේ සිට විසි එක තෙක් සම්පූර්ණ කරයි. | තිත් නිවැරදි ව යා කර අකුරුවලට අදාළ හැඩ එකොළහේ සිට දහසය තෙක් සම්පූර්ණ කරයි. | තිත් නිවැරදි ව යා කර අකුරුවලට අදාළ හැඩ පහේ සිට දහය තෙක් සම්පූර්ණ කරයි. | තිත් යා කර අකුරුවලට අදාළ හැඩ හතරකට අඩු සංඛ්‍යාවක් සම්පූර්ණ කරයි. |

**ක්‍රියාකාරකම 5.3 : අකුරුවලට අදාළ හැඩ බලා අඳිමු.**

## පියවර 01

- හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ අකුරුවලට අදාළ හැඩ දෙකක් බලා ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- අකුරුවලට අදාළ හැඩ 21ක් බලා ඇඳීමට කිරීමට සිසුන් යොමු කරන්න.

## පියවර 02

- ඒ සඳහා **'අකුරු නුවණ 2'** පොතෙහි පිටු අංක 1 සිට 21 තෙක් ඇති අකුරුවලට අදාළ හැඩ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- මෙහිදී නිවැරදි දිශාවට ක්‍රමානුකූල ව හැඩ අඳින්නේ දැයි නිරීක්ෂණය කර සිසුන්ට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 5.3 අකුරුවලට අදාළ හැඩ විසි එකක් බලා නිවැරදි ව අඳියි. | 5.3.1 නිවැරදි වීම | අකුරුවලට අදාළ හැඩ දහහතේ සිට විසි එක තෙක් බලා නිවැරදි ව අඳියි. | අකුරුවලට අදාළ හැඩ එකොළහේ සිට දහසය තෙක් බලා නිවැරදි ව අඳියි. | අකුරුවලට අදාළ හැඩ පහේ සිට දහය තෙක් බලා නිවැරදි ව අඳියි. | අකුරුවලට අදාළ හැඩ හතරකට අඩු සංඛ්‍යාවක් බලා නිවැරදි ව අඳියි. |

පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් සවන් දීමට හා කතා කිරීමට සිසුන් යොමු කරලීම අපේක්ෂා කෙරෙයි. මෙමගින් මනා ලෙස භාෂාවක් භාවිතය සඳහා අවශ්‍ය පදනම සැපයීම සිදු වෙයි. ඒ අනුව 6, 7, 8, 9 ඉගෙනුම් පලවලට අදාළ ක්‍රියාකාරකම් 17 ඉගෙනුම් පලයට අදාළ ක්‍රියාකාරකම් අතරතුර සිදු කිරීම වඩාත් යෝග්‍ය වේ.

## විෂය නිර්දේශයේ උද්ධෘතය

| සමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස..භා.කා. | 6. සරල උපදෙස්වලට අවධානයෙන් සවන් දී අවබෝධයෙන් නිවැරදි ප්‍රතිචාර දක්වයි. | 'අපේ පාසල' තේමාව ඇසුරෙන් පාසලක කටයුතු හා සම්බන්ධ වචන 60කට නොවැඩි, එක් සිද්ධියක් සහිත, චරිත කිහිපයකින් යුත් නිර්මිත කතන්දරයක් ඇසුරෙන් සකසන උපදෙස්<br>■ උපදෙස් ලබා දීමේදී භාවිත වචන හා යෙදුම් (මිදුලට යන්න. වැටුණු කොළයක් රැගෙන එන්න.)<br>■ කථන බසෙහි විධි ක්‍රියාව<br>■ විධි ක්‍රියාව සහිත වාක්‍ය<br>■ ප්‍රතිචාර දැක්වීම සඳහා භාවිත ඉරියවු<br>■ සංයමය<br>■ විධානවලට නිසි ප්‍රතිචාර | ■ සවන් දීම<br>■ කතා කිරීම | 6.1 සරල උපදෙසකට අවධානයෙන් හා සංයමයෙන් යුතු ව සවන් දී එයින් කියවෙන දේ නැවත ප්‍රකාශ කරයි. | 6.1.1 නිවැරදි වීම |
| | | | | 6.2 සරල උපදෙසකට සවන් දී අවබෝධයෙන් යුතු ව සංයමය හා ආචාරශීලීත්වය ප්‍රදර්ශනය කරමින් ඒ අනුව ක්‍රියා කරයි. | 6.2.1 නිවැරදි වීම<br>6.2.2 සංයමය හා ආචාරශීලීත්වය ප්‍රදර්ශනය කිරීම |

**ක්‍රියාකාරකම 6.1, 6.2 : උපදෙස්වලට සවන් දෙමු; ඒ අනුව ක්‍රියා කරමු.**

**කාලය** : පැය 01යි.

**වාංමාලාව** : උපදෙස්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- පහත සඳහන් සිද්ධියට කිහිප වරක් සවන් දීමට සිසුන් යොමු කරන්න.

> **හොඳ ළමයි**
>
> ගගන, සරෝජා, ළසඳ සහ ෆාතිමා උදෙන් ම පාසලට ඇවිල්ලා සෙල්ලම් කරමින් හිටියා.
>
> 'හැම දෙනා ම ඔක්කොම අර අඹ ගහ යටට දුවගෙන යන්න', ගුරුතුමිය කිව්වා.
>
> එකයි. දෙකයි. තුනයි. සියලු දෙනා වේගයෙන් දිවුවා.
>
> 'ගගන, කෝටු කැලි අහුලන්න',
>
> 'සරෝජා, කඩදාසි කැලි අහුලන්න',
>
> 'ළසඳයි ෆාතිමායි වේළිච්ච කොළ අහුලන්න',
>
> 'දැන් ඕවා පොහොර වළට දාලා ඉක්මනට අත් සෝදා ගෙන පන්තියට යන්න',
>
> හතර දෙනා ම ගුරුතුමිය කියූ දේවල් කළා.

- එම සිද්ධියේ අන්තර්ගතය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- මෙහි අන්තර්ගත උපදෙස් මොනවා ද? යන්න වාචික ව සරල ව පැහැදිලි කරන්න.
- එම උපදෙස් භාවිතයේ වැදගත්කම, ඒවාට දැක්වූ ප්‍රතිචාර හා උපදෙස් ලබා දීමේදී හා පිළිපැදීමේදී පවත්වා ගත යුතු ආචාරධර්ම පිළිබඳ සිසුන් සමග සාකච්ඡාවක යෙදෙන්න.
- දෛනික ජීවිතයේදී උපදෙස් ලැබිය හැකි අවස්ථා සහ ඒවාට ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය පිළිබඳ සිසුන් සමග බුද්ධි කලම්බනයක යෙදෙන්න.
- කණ්ඩායම් වශයෙන් මෙන් ම තනි ව කටයුතු කිරීමේදී ද උපදෙස් ලබා දීමට මෙන් ම ඒවාට ප්‍රතිචාර දැක්වීමට සිදු වන බවත්, එහිදී කටයුතු කළ යුතු ආකාරයත්, ප්‍රායෝගික ජීවිතයේදී එහි ඇති වටිනාකමත් සිසුන් සමග සාකච්ඡා කරන්න.

**පියවර 02**

- සරල උපදෙසක් පවසන්න.

  උදා : 
  - පොත් පිළිවෙළට තබන්න.
  - නිවැරදි ඉරියව්වෙන් අසුන් ගන්න.

- එයට සවන් දීමට සිසුන් යොමු කරන්න.
- එම උපදෙසට ප්‍රතිචාර දැක්වීමට සිසුන්ට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- මෙලෙස සරල උපදෙස් කිහිපයක් වරකට එක බැගින් පවසා ඒ සඳහා ප්‍රතිචාර දැක්වීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- පන්ති කාමර ක්‍රියාකාරකම්වල නිරත වන අවස්ථාවල උපදෙස් පිළිපැදීමේදී සුදුසු ආචාරධර්ම පිළිපැදීමට යොමු කරන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 6.1<br>සරල උපදෙසකට අවධානයෙන් හා සංයමයෙන් යුතු ව සවන් දී එයින් කියවෙන දේ නැවත ප්‍රකාශ කරයි. | 6.1.1<br>නිවැරදි වීම | උපදෙසින් කියවෙන දේ නිවැරදි ව නැවත ප්‍රකාශ කරයි. | උපදෙසින් කියවෙන දේ නිවැරදි ව නැවත ප්‍රකාශ කළ නොහැකියි. |
| 6.2<br>සරල උපදෙසකට සවන් දී අවබෝධයෙන් යුතු ව සංයමය හා ආචාරශීලිත්වය ප්‍රදර්ශනය කරමින් ඒ අනුව ක්‍රියා කරයි. | 6.2.1<br>නිවැරදි වීම | නිවැරදි ප්‍රතිචාර දක්වයි. | නිවැරදි ප්‍රතිචාර නො දක්වයි. |
| | 6.2.2<br>සංයමය හා ආචාරශීලිත්වය ප්‍රදර්ශනය කිරීම | සංයමය හා ආචාරශීලිත්වය ඉතා හොඳින් ප්‍රදර්ශනය කරයි. | සංයමය හා ආචාරශීලිත්වය ප්‍රදර්ශනය නො කරයි. |

**විෂය නිර්දේශයේ උද්ධෘතය**

| සමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා. | 7. සරල පණිවුඩයකට සවන් දී එය තවත් අයෙකුට නිවැරදි ව පවසයි. | 'අපේ පාසල' තේමාව ඇසුරෙන් පාසලක කටයුතු හා සම්බන්ධ වචන 60කට නොවැඩි, එක් සිද්ධියක් සහිත, චරිත කිහිපයකින් යුත් නිර්මිත කතන්දරයක් ඇසුරෙන් සකසන වචන හතරකට නොඅඩු පණිවුඩ<br>■ පණිවුඩයක් ලබා දීමේදී භාවිත වචන හා යෙදුම්<br>■ කථන බසෙහි විධි ක්‍රියාව හා අතීත ක්‍රියාව<br>■ සරල කෙටි වාක්‍ය<br>■ සංයමය<br>■ නිවැරදි උච්චාරණය<br>■ හඬ පාලනය | ■ සවන් දීම<br>■ කතා කිරීම | 7.1 කරුණු එකකින් යුත් සරල පණිවුඩයකට අවධානයෙන් යුතු ව සවන් දී එම පණිවුඩය නිවැරදි ව මතකයෙන් නැවත කියයි. | 7.1.1 නිවැරදි වීම |
| | | | | 7.2 කරුණු එකකින් යුත් සරල පණිවුඩයකට අවධානයෙන් සවන් දී එම පණිවුඩය තවත් අයෙකුට පැහැදිලි ව සහ නිවැරදි ව පවසයි. | 7.2.1 නිවැරදි වීම |

**ක්‍රියාකාරකම 7.1, 7.2 : උපදෙස්වලට සවන් දෙමු; ඒ අනුව ක්‍රියා කරමු.**

**කාලය** : පැය 01යි.

**වාංමාලාව** : පණිවුඩය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 01**

- පහත සඳහන් කතන්දරයට සවන් දීමට සිසුන් යොමු කරන්න.

> **ටින් බෙරය**
>
> ගගන පාසල අවසන් වී ඉක්මනින් ගෙදර ආවා. වෙනදාට වඩා සතුටින් තමයි ගගන හිටියේ. "පුතා අද හරි ම සතුටින්'' ගගනගේ අම්මා කිවුවා. ''ඔව් අම්මේ, හෙට පෙරහැරක් යනවා කියලා ටින් බෙරයක් හදන් එන්න කියලා ගුරුතුමී කිවුවා." "හොඳයි පුතේ අපි ටින් බෙරයක් හදමු." අම්මා කිවුවා. ගගන අම්මාත් තාත්තාත් එක්ක එකතු වෙලා ලස්සන ටින් බෙරයක් හැදුවා. බෙරය වාදනය කරන්නත් පුරුදු වුණා. ගගනට හරි ම සතුටුයි. හෙට පාසල් යනකම් ගගනට ඉවසුමක් නෑ.

- ඉහත කතන්දරයේ අන්තර්ගතය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- අනතුරුව මෙහි අන්තර්ගත පණිවුඩය කුමක් ද? යන්න සිසුන්ට සරල ව පැහැදිලි කරන්න.
- පණිවුඩවල වැදගත්කම හා ඒවා ප්‍රායෝගික ජීවිතයේදී වැදගත් වන අවස්ථා පිළිබඳ සිසුන් සමග සාකච්ඡාවක යෙදෙන්න.
- පණිවුඩ ලබා දීමේදී මෙන් ම ඒවා ලබා ගැනීමේදී ද පිළිපැදිය යුතු ආචාරධර්ම පිළිබඳ සාකච්ඡාවක යෙදෙන්න.
- පණිවුඩ ලබා දීමේදී නිරවද්‍යතාව හා එහි වටිනාකම පිළිබඳ සිසුන්ට සරල ව පැහැදිලි කරන්න.
- එමෙන්ම පණිවුඩයක් ලබා දීමේදී එය නිවැරදි ව මතක තබා ගෙන පැවසිය යුතු බව පවසන්න.
- ඒ සඳහා ප්‍රායෝගික උදාහරණ ලබා දෙන්න.

**පියවර 02**

- එක් කරුණක් සහිත සරල පණිවුඩයක් සිසුන්ට පවසන්න. එයට සවන් දීමට යොමු කරන්න.

  උදා : • හෙට එනකොට සුදුපාට මල් පහක් ගේන්න.
  
  • පොත් රාක්කයෙන් කතන්දර පොතක් තෝරා ගන්න.

- එම පණිවුඩය මතකයෙන් ප්‍රකාශ කිරීමට සියලු ම සිසුන්ට අවස්ථාව දෙන්න.

**පියවර 03**

- සිසුන් යුගල කරන්න.
- එක් සිසුවෙකුට එක් කරුණක් සහිත සරල පණිවුඩයක් පවසන්න.
- එය අනෙක් සිසුවාට පැවසීමට අවස්ථාව දෙන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 7.1 කරුණු එකකින් යුත් සරල පණිවුඩයකට අවධානයෙන් යුතු ව සවන් දී එම පණිවුඩය නිවැරදි ව මතකයෙන් නැවත කියයි. | 7.1.1 නිවැරදි වීම | පණිවුඩය මතකයෙන් නිවැරදි ව පවසයි. | පණිවුඩය මතකයෙන් පැවසිය නොහැකියි. |
| 7.2 කරුණු එකකින් යුත් සරල පණිවුඩයකට අවධානයෙන් සවන් දී එම පණිවුඩය තවත් අයෙකුට පැහැදිලි ව සහ නිවැරදි ව පවසයි. | 7.2.1 නිවැරදි වීම | නිවැරදි ව පණිවුඩය පවසයි. | නිවැරදි ව පණිවුඩය පැවසිය නොහැකියි. |

**විෂය නිර්දේශයේ උද්ධෘතය**

| සමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්‍ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා. | 8. සරල නිවේදනයකට සවන් දී ඒ ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්නවලට නිවැරදි වාචික ප්‍රතිචාර ලබා දෙයි. | 'අපේ පාසල' තේමාව ඇසුරෙන් පාසලක කටයුතු හා සම්බන්ධ මිනිත්තු තුනක පමණ නිවේදනයක් <br>■ නිවේදනයක් සඳහා භාවිත වචන හා යෙදුම් <br>■ ප්‍රශ්න වාචක පද <br>■ සංයමය <br>■ නිවැරදි උච්චාරණය | ■ සවන් දීම <br>■ කතා කිරීම | 8.1 මිනිත්තු තුනක පමණ නිවේදනයකට අවධානයෙන් හා සංයමයෙන් සවන් දී එයින් කියවෙන මූලික අදහස ප්‍රකාශ කරයි. | 8.1.1. නිවැරදි වීම |
| | | | | 8.2 මිනිත්තු තුනක පමණ නිවේදනයකට අවධානයෙන් හා සංයමයෙන් සවන් දී ඒ ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්න තුනකට වාචික ව නිවැරදි පිළිතුරු ලබා දෙයි. | 8.2.1 නිවැරදි වීම |

**ක්‍රියාකාරකම 8.1, 8.2** : **නිවේදනයකට සවන් දෙමු; ප්‍රතිචාර දක්වමු.**

**කාලය** : පැය 01යි.

**වාංමාලාව** : නිවේදනය, දිනය, ස්ථානය, ප්‍රධානත්වය, කාරණය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 01**

- පහත සඳහන් කතන්දරයට කිහිප වරක් සවන් දීමට සිසුන් යොමු කරන්න.
- එම කතන්දරයේ අන්තර්ගතය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- එහි ඇතුළත් නිවේදනය කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරන්න.

**අලුත් අවුරුදු නිවේදනය**

ගුරුතුමිය පන්තියට ආවා.

"ආයුබෝවන් ළමයි."

"ආයුබෝවන් ගුරුතුමී."

"අද පාඩම පටන් ගන්න කලින් හැම දෙනාට ම පුංචි නිවේදනයක් දෙන්න තියෙනවා.

හොඳට අහගන්න ඕනෑ."

"අපේ සිංහල දෙමළ අලුත් අවුරුද්ද ළඟයි. අපේ පාසලේත් අවුරුදු උත්සවයක් පවත්වනවා. අප්‍රේල් මාසයේ හතරවනදා උදේ 8.00ට පටන් ගන්නවා. පාසලේ ක්‍රීඩා පිටියේ තමයි අවුරුදු උත්සවය තියෙන්නේ. උත්සවයේ ප්‍රධාන අමුත්තා විදුහල්පතිතුමා. දූලා පුතාලා එදාට පාට ඇඳුම් ඇඳගෙන එන්න. එදාට අවුරුදු ක්‍රීඩාවලටත් සහභාගි වෙන්න පුළුවන්."

"අද ගෙදර ගිහින් මේ ගැන වැඩිහිටියන්ට කියන්න. හැම දෙනා ම අවුරුදු උත්සවයට සහභාගි වෙන්න."

නිවේදනය ඇසූ ළමයි හැමෝම ගොඩක් සතුටු වුණා.

"හොඳයි, එහෙනම් අපි පාඩම පටන් ගනිමු."

- මෙහි ඇතුළත් නිවේදනය හා එහි සුවිශේෂ කරුණු පිළිබඳ සිසුන්ට පැහැදිලි කරන්න.
- එම නිවේදනයේ අරමුණ/මූලික අදහස පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ඉහත නිවේදනය ඇසුරෙන් සරල ප්‍රශ්න කිහිපයක් අසා සිසුන්ගෙන් වාචික ප්‍රතිචාර ලබා ගන්න.
- නිවේදනයක් ලබා දෙන්නේ ඇයි? නිවේදනයක වැදගත්කම හා එහි ඇතුළත් සුවිශේෂ කරුණු හා ඒවා දෛනික ජීවිතයේදී වැදගත් වන ආකාරය පිළිබඳ සිසුන් සමග සාකච්ඡාවක යෙදෙන්න.

**පියවර 02**

- සිසුන්ගේ බුද්ධි මට්ටමට ගැළපෙන හා අද්දැකීම්වලට සමීප සරල නිවේදනයකට සවන් දීමට යොමු කරන්න.
- එම නිවේදනයේ මූලික අදහස පැවසීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- නිවේදනය ඇසුරෙන් ප්‍රශ්න කිහිපයක් අසා පිළිතුරු ලබා ගන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| 8.1 මිනිත්තු තුනක පමණ නිවේදනයකට අවධානයෙන් හා සංයමයෙන් සවන් දී එයින් කියවෙන මූලික අදහස ප්‍රකාශ කරයි. | 8.1.1 නිවැරදි වීම | මූලික අදහස නිවැරදි ව ප්‍රකාශ කරයි. | | මූලික අදහස ප්‍රකාශ කළ නොහැකියි. | |
| 8.2 මිනිත්තු තුනක පමණ නිවේදනයකට අවධානයෙන් හා සංයමයෙන් සවන් දී ඒ ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්න තුනකට වාචික ව නිවැරදි පිළිතුරු ලබා දෙයි. | 8.2.1 නිවැරදි වීම | **4** | **3** | **2** | **1** |
| | | ප්‍රශ්න තුනට ම වාචික ව නිවැරදි පිළිතුරු ලබා දෙයි. | ප්‍රශ්න දෙකකට වාචික ව නිවැරදි පිළිතුරු ලබා දෙයි. | එක් ප්‍රශ්නයකට වාචික ව නිවැරදි පිළිතුරු ලබා දෙයි. | අන් අයගේ උදවු ඇති ව එක් ප්‍රශ්නයකට හෝ වාචික ව නිවැරදි පිළිතුරු ලබා දෙයි. |

## විෂය නිර්දේශයේ උද්ධෘතය

| සමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා. | 9. ඇසූ සිද්ධියක් හෝ දුටු සිද්ධියක් හෝ මුල, මැද හා අග සබඳතාවයෙන් යුතු ව පවසයි. | 'අපේ නිවස' තේමාව ඇසුරෙන් නිවසේ සිද්ධියක් ඇසුරෙන් වචන 60කට නොවැඩි, එක් සිද්ධියක් සහිත, චරිත කිහිපයකින් යුත් නිර්මිත කතන්දරයක්<br>▪ සිද්ධියක් විස්තර කිරීමේදී යොදා ගන්නා වචන (නාම විශේෂණ, ක්‍රියා විශේෂණ, සාම්ප්‍රදායික යෙදුම්)<br>▪ කථන ව්‍යවහාරයේ අතීත කාල ක්‍රියාව<br>▪ කථන ව්‍යවහාරයේ වාක්‍ය හා එම වාක්‍ය අතර සම්බන්ධතාව<br>▪ සංයමය<br>▪ ඉරියවු සහ අංග චලන<br>▪ නිවැරදි වචන උච්චාරණය<br>▪ හඬ පාලනය | ▪ සවන් දීම<br>▪ කතා කිරීම | 9.1 තම නිවසේදී, සමීප වටපිටාවකදී ඇසූ සිද්ධියක් හෝ දුටු සිද්ධියක් හෝ නම් කරයි. | 9.1.1. පැහැදිලි වීම |
| | | | | 9.2 තම නිවසේදී හෝ සමීප වටපිටාවකදී ඇසූ සිද්ධියක් හෝ දුටු සිද්ධියක් මුල, මැද හා අග සබඳතාවකින් යුතු ව පැහැදිලි ව හා නිරවුල් ව පවසයි. | 9.2.1 පැහැදිලි වීම<br>9.2.2 මුල, මැද, අග සබඳතාවකින් යුතු වීම<br>9.2.3 උචිත ඉරියවු හා අංග චලන භාවිතය<br>9.2.4 සංයමය ප්‍රදර්ශනය කිරීම |

**ක්‍රියාකාරකම 9.1, 9.2** : **ඇසූ සිද්ධියක් හෝ දුටු සිද්ධියක් හෝ මුල, මැද හා අග සබඳතාවයෙන් යුතු ව පවසමු.**

**කාලය** : පැය 01යි.

**වාංමාලාව** : සිද්ධිය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 01**

- පහත සඳහන් කතන්දරයට සවන් දීමට සිසුන් යොමු කරන්න.

**ලේන් කූඩුව**

රෑ කෑම මේසයට හැම දෙනා ම වාඩි වුණා. අත්තම්මා මට කෑම බෙදුවා. "පුතා දන්නවා ද අද නංගි හොඳ වැඩක් කළා කියලා." "මොකක් ද? අත්තම්මේ" මා ඕනෑකමින් ම ඇසුවා. "අද උදේ ලොකු සුළඟක් හැමුවා. අපේ ගේ ළඟ අඹ ගහේ තිබුණ ලේන් කූඩුව බිමට වැටිලා. ලේන් අම්මා හොඳට ම බය වෙලා. කූඩුවේ පැටවු දෙන්නෙක් ඉන්නවා නංගි දැකලා. නංගිට ගොඩක් දුක හිතිලා. තාත්තාට කියලා ලේන් කූඩුව අඹ ගහේ අත්තක් උඩ තියලා." "අපේ නංගි හරි ම හොඳයි අත්තම්මේ, නංගි කරලා තියෙන්නේ හොඳ වැඩක්." "පුතාලා දෙන්න ම හොඳ ළමයිනේ." කියලා අත්තම්මා මගේ හිස අතගෑවා.

- එම කතන්දරයේ අන්තර්ගතය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ඉහත කතන්දරය ඇසුරෙන් යම් සිද්ධියක් විස්තර කිරීමේදී එහි මුල, මැද හා අග අතර සම්බන්ධතාවයේ වැදගත්කම සරල ව සිසුන්ට පැහැදිලි කරන්න.
- මෙලෙස යමක් විස්තර කිරීම වැනි අවස්ථා ප්‍රායෝගික ජීවිතයේදී හමු වන බවත් එහිදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳවත් තම අද්දැකීම් සිසුන් සමග සාකච්ඡා කරන්න.

**පියවර 02**

- තම නිවසේදී හෝ සමීප පරිසරයකදී හෝ ඇසූ දුටු සිද්ධියක් නම් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- තම නිවසේදී හෝ සමීප පරිසරයකදී හෝ ඇසූ දුටු සිද්ධියක් මුල, මැද හා අග සම්බන්ධතාවකින් යුතු ව පැවසීමට ද අවස්ථාව දෙන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 9.1 තම නිවසේදී, සමීප වටපිටාවකදී ඇසූ සිද්ධියක් හෝ දුටු සිද්ධියක් හෝ නම් කරයි. | 9.1.1 පැහැදිලි වීම | සිද්ධිය පැහැදිලි ව නම් කරයි. | සිද්ධිය නම් කළ නොහැකියි. |
| 9.2 තම නිවසේදී හෝ සමීප වටපිටාවකදී ඇසූ සිද්ධියක් හෝ දුටු සිද්ධියක් | 9.2.1 පැහැදිලි වීම | සිද්ධිය පැහැදිලි ව පවසයි. | සිද්ධිය පැහැදිලි ව නො පවසයි. |
| | 9.2.2 මුල, මැද, අග සබඳතාවකින් යුතු වීම | මුල, මැද, අග සබඳතාව ඉතා හොඳින් සුරකිමින් සිද්ධිය පවසයි. | මුල, මැද, අග සබඳතාව සුරකිමින් සිද්ධිය පැවසීමට නොහැකියි. |

| | | | |
|---|---|---|---|
| මුල, මැද හා අග සබඳතාවකින් යුතු ව පැහැදිලි ව හා නිරවුල් ව පවසයි. | 9.2.3 උචිත ඉරියවු හා අංග චලන භාවිතය | ඉරියවු හා අංග චලන ඉතා හොඳින් උචිත සෑම අවස්ථාවකදී ම භාවිත කරයි. | ඉරියවු හා අංග චලන උචිත සෑම අවස්ථාවකදී ම භාවිත නොකරයි. |
| | 9.2.4 සංයමය ප්‍රදර්ශනය කිරීම | සංයමය ඉතා හොඳින් ප්‍රදර්ශනය කරයි. | සංයමය ප්‍රදර්ශනය නොකරයි. |

අකුරු කියවීම හා ලිවීම යනු යාන්ත්‍රික ක්‍රියාවලියකි. මෙම ක්‍රියාවලිය බොහෝ විට සිසුන්ට ආයාසකර වූවක් විය හැකි ය. එහෙයින් ඔවුන් තුළ ප්‍රථමයෙන් කියවීමට රුචිකත්වයක් ඇති කිරීම වැදගත් වේ. මෙහිදී පළමුවන ශ්‍රේණියට නිර්දිෂ්ට අකුරු කියවීම හා ලිවීම හඳුන්වා දීමට පෙර පහත සඳහන් ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවීම අවශ්‍ය වේ.

- පළමුවන ශ්‍රේණියේ සිසුන්ට සුදුසු පින්තූර සහිත වචන ඉතා අඩුවෙන් යෙදුණු සරල ළමා කතන්දර පොත් තෝරා ගන්න.
- සිසුන් එළිමහන් ස්ථානයකට හෝ පන්ති කාමරයේ පහසු ආකාරයකට වාඩි කරවන්න.
- විධිමත් ලෙස සකස්කර ඇති පන්ති කාමරයේ ඇති මේසය හා පුටුව භාවිත නො කරන්න.
- කතන්දර පොතක් තෝරා ගෙන එය කියවන ආකාරය ගුරු ආදර්ශනයක යෙදෙන්න.
- අනතුරුව ගුරුවරයා **'සහකියවීමේ'** ක්‍රමවේදය භාවිත කර වචනයෙන් වචනය කියවීම සිදු කරමින් සිසුන්ට ද කියවීමට අවස්ථාව දෙන්න.
- මෙලෙස එක ම පොතක් කිහිප වරක් කියවීමේ යෙදෙන්න.
- **'සහකියවීමේ'** ක්‍රමවේදය භාවිත කරමින් ගුරුවරයා විසින් කියවන අවස්ථාවේදී සහ සිසුන් කියවීමේ යෙදෙන අවස්ථාවේදී කියවන වචනවලට ඇඟිල්ල තැබීමෙන් හෝ යම් ආධාරකයක් යොදා ගෙන එම වචන පෙන්වීම සිදු කරන්න.
- ඉතා වේගයෙන් වචන හා වාක්‍ය කියවීම සිදු නො කරන්න.
- මේ ආකාරයට පොත් කිහිපයක් **'සහකියවීමේ'** ක්‍රමවේදය භාවිත කරමින් කියවීමේ යෙදෙන්න.
- මෙහිදී කිසි විටෙකත් අකුරු හඳුන්වා දීම සිදු නො කරන්න.

මෙම ක්‍රියාවලියෙන් අනතුරුව පළමුවන ශ්‍රේණියට නිර්දිෂ්ට අකුරු කියවීමේ හා ලිවීමේ ක්‍රියාකාරකම්වල අනුක්‍රමික ව නිරත කරවන්න.

- **අකුරු හඳුන්වා දීමේ ක්‍රියාවලිය අතරතුර හා අවසානයේ පළමුවන ශ්‍රේණිය කියවීම් පොතේ ඇති පාඩම් ද 'සහකියවීමේ' ක්‍රමවේදය භාවිත කර කියවන්න.**

## විෂය නිර්දේශයේ උද්ධෘතය

| සමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්‍ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා.<br>ශා.භා.කා. | 17. කියවීමේදී හා ලිවීමේදී මධ්‍ය අක්ෂර නිවැරදි ව භාවිත කරයි. | ▪ වචනයක මුල් ශබ්දය<br>▪ වචනයක අග ශබ්දය<br>▪ සිංහල අක්ෂර (මධ්‍ය අක්ෂර) ග,හ,ය,ස,ප,න,ත,ක,ශ<br>▪ නිවැරදි උච්චාරණය<br>▪ කියවීම<br>▪ ලිවීම<br>▪ ලිවීමට සූදානම (නිවැරදි ව අසුන් ගැනීම, පොත තබා ගැනීම, පැන්සල ඇල්ලීම)<br>▪ පස්රූල<br>▪ තනිරූල<br>▪ ලිවීමේ යාන්ත්‍රික කුසලතා (අකුරක නියමිත අංග, හැඩය, ප්‍රමාණය, දිශාව හා වචනයක අකුරු අතර පරතරය)<br>▪ උගත් අකුරුවලින් සමන්විත වචන<br>▪ අක්ෂර සංයෝජනය<br>▪ පිලි රහිත අකුරු දෙකේ වචන<br>▪ පිලි රහිත අකුරු තුනේ වචන | ▪ සවන් දීම<br>▪ කතා කිරීම<br>▪ කියවීම<br>▪ ලිවීම | 17.1 යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් නිර්දිෂ්ට මධ්‍ය අක්ෂර නවය පස්රූලේ ලියයි. | 17.1.1 නියමිත අංග සහිත වීම<br>17.1.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>17.1.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>17.1.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම |
| | | | | 17.2 නිර්දිෂ්ට මධ්‍ය අක්ෂර නවය නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නඟා කියවයි. | 17.2.1 නිවැරදි වීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 17.3 නිර්දිෂ්ට මධ්‍ය අක්ෂර යෙදුණු පිලි රහිත අකුරු දෙකේ සහ තුනේ වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් පස්රූලේ ලියයි. | 17.3.1 නියමිත අංග සහිත වීම<br>17.3.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>17.3.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>17.3.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම<br>17.3.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම |
| | | | | 17.4 පස්රූලේ ලියන ලද වචන හතරක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නගා කියවයි. | 17.4.1 නිවැරදි වීම |
| | | | | 17.5 යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් නිර්දිෂ්ට මධ්‍ය අක්ෂර නවය තනිරූලේ ලියයි. | 17.5.1 නියමිත අංග සහිත වීම<br>17.5.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>17.5.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>17.5.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 17.6 නිර්දිෂ්ට මධ්‍ය අක්ෂර යෙදුණු පිලි රහිත අකුරු දෙකේ සහ තුනේ වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරූලේ ලියයි. | 17.6.1 නියමිත අංග සහිත වීම<br>17.6.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>17.6.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>17.6.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම<br>17.6.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම |
| | | | | 17.7 තනිරූලේ ලියන ලද වචන හතරක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නඟා කියවයි. | 17.7.1 නිවැරදි වීම |

**කියවීමට හා ලිවීමට සූදානම් වීම**



**♦ නිවැරදි ව අසුන් ගැනීම**

- පුටුව මේසයට ළං කර ගන්න.
- දෙපා හොඳින් බිම ස්පර්ශ වන ලෙස තබා ගන්න.
- වැලමිටෙන් පහළ දෙ අත් මේසය මත තබා ගන්න.
- ලියන කඩදාසි හෝ පොත හුරු අතට පහසු වන පරිදි තබා ගන්න.
- ලියන ලද අකුරු හෝ කියවන අකුරු පහසුවෙන් පෙනෙන පරිදි හිස තබා ගන්න.

**♦ නිවැරදි ව පැන්සල ඇල්ලීම**

- පින්තූරයෙහි පෙනෙන පරිදි පැන්සල අල්ලා ගන්න.
- පැන්සලෙහි උල් කරන ලද කොටසෙහි ඇඟිලි නොගැවෙන ලෙස තබා ගන්න.





♦ නිවැරදි ව පොත තබා ගැනීම






- පුටුව මේසයට ළං කර ගන්න.
- දෙපා බිම ස්පර්ශ වන ලෙස තබා ගන්න.
- දෙ අත් මේසය මත තබා, හුරු අතේ දබර ඇඟිල්ල අකුරු මත ගෙන යමින් ශබ්ද නගා කියවන්න.
- පහසුවෙන් අකුරු පෙනෙන පරිදි හිස තබා ගන්න.

♦ අකුරු හඳුන්වා දීම


සිංහල වර්ණ මාලාවෙන් අකුරු 37 පමණක් පළමුවන ශ්‍රේණියේ සිසුන්ට ඉගැන්වීම සඳහා තෝරා ගෙන ඇත. වැඩිපුර භාවිත වන සිංහල අකුරු සැලකිල්ලට ගෙන මෙම තෝරා ගැනීම සිදු කර තිබේ. ඒ අනුව, පළමුවන ශ්‍රේණියේ පළමුවන වාරයට ඉගැන්වීමට නියමිත මධ්‍ය අක්ෂර නවය, ඉගැන්විය යුතු අනුපිළිවෙළ පහතින් දැක්වේ.

**මධ්‍ය අක්ෂර ( 9 )**




උදා

සිංහල අකුරු ලිවීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති පස්රැල් භාවිතය 2016 සිට පළමුවන ශ්‍රේණිය සඳහා නිර්දේශ කර තිබේ. ඒ අනුව ඉහත සඳහන් ව ඇත්තේ පළමුවන ශ්‍රේණියට නියමිත මධ්‍ය අක්ෂර නවයයි. මධ්‍ය අක්ෂර යනු 'පස්රැල්වල දෙවන හා හතරවන රැල් අතර ලියවෙන අක්ෂර' ය.



මෙම අක්ෂර ඉගැන්වීමේ අනුක්‍රමය සැකසීමේදී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගන්නා ලදි.

01. පළමුවන ශ්‍රේණියේ සිසුන්ට පහසුවෙන් හා පැහැදිලි ව උච්චාරණය කළ හැකි ශබ්ද සහිත අක්ෂර පළමුවෙන් ඉගැන්වීම

02. අක්ෂරවල හැඩය ද අනුක්‍රමය සැකසීමේදී සැලකිල්ලට ගන්නා ලද අතර 'ග' අක්ෂරය ලිවීමට හුරු වූ දරුවාට ඊළඟට 'හ' අක්ෂරය ඉගැන්වීම පහසු ය. 'ය' එම හැඩයෙන් ලියන තවත් අක්ෂරයකි. ඒ අනුව අකුරු හැඩය ද සැලකිල්ලට ගනිමින් සමාන හැඩ සහිත අක්ෂර රූප එක ළඟට එන පරිදි අක්ෂර අනුක්‍රමය සකසා තිබීම

    උදා : න ත ක

03. එදිනෙදා වැඩිපුර භාවිත වන සිංහල වචනවල යෙදෙන අකුරු, අනුක්‍රමයේ ඉහළට ගැනීමට සැලකිලිමත් වූ අතර එහිදී සඤ්ඤක අකුරු අඩුවෙන් භාවිත වන බැවින් සෑම අක්ෂර වර්ගයක ම අගට ඒවා යෙදීම

**ක්‍රියාකාරකම 17.1, 17.2, 17.5 : අකුරු කියවමු; ලියමු.**

**කාලය** : පැය 09යි.

**ඉගෙනුම් සම්පත්** : පින්තූර කාඩ්, අකුරු කාඩ්, වචන කාඩ්,

**වාංමාලාව** : අකුරු, අක්ෂර, පස්රූල, තනිරූල, ඉහළ, මැද, පහළ, අංග, දිශාව, ප්‍රමාණය, හැඩය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- පහත කවිය ගුරුවරයා විසින් කිහිප වරක් ගායනා කරන්න.
- එම කවියට සවන් දීම සඳහා සිසුන් යොමු කරන්න.

උදාහරණ:


| | |
|---|---|
| ගස ගල ගම 'ග' ශබ්දය - | මුලට යෙදෙනවාලූ |
| 'ග' අකුරින් පටන් ගන්න - | වචන කියමු යාළු |
| ගලපිටමඩ ගමක නමක් - | ගගන කියනවාලූ |
| ගස්ලබු ගඩුගුඩා මෙහැම - | ගන්න එන්න යාළු |

- ඉහත කවිය ඇසුරෙන් 'ග' අක්ෂරය මුලට යෙදෙන වචන දෙකක් හෝ තුනක් ශබ්ද නඟා පවසන්න. (උදා : ගස, ගම, ගල)
- එම වචනවල මුලට යෙදෙන ශබ්දය 'ග' ශබ්දය බව හඳුන්වා දෙන්න.
- එම කවිය සිසුන්ට ද ගායනා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන්ට 'ග' ශබ්දය මුලට යෙදෙන වචන කීමට අවස්ථාව දෙන්න.
- එම ශබ්දයට අදාළ අක්ෂර රූපය පෙන්වන්න. එම අක්ෂර රූපය 'ග' බව කියන්න. මේ සඳහා කාඩ්පතක් භාවිත කිරීම ද, හුණු පුවරුවේ ලිවීම ද සිදු කළ යුතු ය.

**පියවර 02**

- විවිධ අකුරුවලින් ආරම්භ වන පින්තූර කාඩ් සිසු කණ්ඩායම්වලට ලබා දෙන්න. ඒ අතර ඇති 'ග' අකුරින් ආරම්භ වන පින්තූර තේරීමට සිසුන්ට කියන්න.
- එම අකුර නිවැරදි ව ලියන දිශාව ඊතල මගින් අංක යොදා පියවර වශයෙන් පෙන්වන්න.


උදාහරණ:




- 'ග' අකුර ශබ්ද කරමින් මේසය මත හෝ අවකාශයේ ඇඟිල්ලෙන් ලිවීමට සිසුන් යොමු කරන්න.
- කපන ලද 'ග' අකුරේ හැඩය මත නිවැරදි දිශාවට ඇඟිල්ලෙන් ස්පර්ශ කිරීමට සෑම සිසුවෙකුට ම අවස්ථාව ලබා දෙන්න.

- මිලි මීටර් 28 ප්‍රමාණයට සකස් කරන ලද පස්රූල භාවිත කරමින් තිත් මත අකුරු ලිවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

(මෙම මිලි මීටර් 28 ප්‍රමාණයට සකස් කරන ලද පස්රූලෙහි අංක 01 සහ 02 රේඛා අතර පරතරය මිලි මීටර් 07ක් ද, අංක 2 සහ 3 රේඛා අතර පරතරය මිලි මීටර් 3.5ක් ද, අංක 03 හා 04 රේඛා අතර පරතරය මිලි මීටර් 10.5ක් ද, අංක 04 හා 05 රේඛා අතර පරතරය මිලි මීටර් 07ක් ද වන ලෙස යොදා ගන්න.)




- එහිදී නිවැරදි දිශාවට අකුර ලියන ආකාරය හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා පැහැදිලි කරන්න.
- මේ සඳහා **'අකුරු නුවණ 2'** පොතෙහි අකුරු තිත් මත ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- පස්රූලේ ලියන ලද අකුරු ශබ්ද නඟා කියවීමට සිසුන් යොමු කරන්න.
- එම අකුරු බලා ලිවීම සඳහා **අකුරු නුවණ 2** පොතෙහි ඇති අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.

## පියවර 03

- අංග සම්පූර්ණ අකුරු හඳුන්වා දීමේ පිළිවෙළට සියලු ම පිලි රහිත අකුරු 'ග' අක්ෂරය ලිවීමට හා කියවීමට අනුගමනය කළ ක්‍රියාවලිය ම භාවිත කරමින් අනෙකුත් අක්ෂර සියල්ල ම ලිවීමට හා කියවීමට යොමු කරන්න.
- අකුරු කියවීමේදී හැකිතාක් අකුරේ ශබ්දය උච්චාරණය කරන අභ්‍යාසවල නිරත කරන්න.

  උදාහරණ : දුරකථනයක් ලබා දී රිසීවරය කනේ තබා උගත් අකුරේ/අකුරුවල ශබ්ද උච්චාරණය කිරීමට දීම

- අකුරු කිහිපයක් පස්රූලේ බලා ලිවීමෙන් පසු ව එම අකුරු පස්රූලේ අසා ලිවීම සඳහා ද සිසුන්ට අවස්ථාව දෙන්න.
- අකුරු කිහිපයක් හඳුන්වා දීමෙන් පසු ව එම අකුරු සහිත කාඩ් ලබා දී, නම් කරන ලද අකුර පෙන්වීමට අවස්ථාව ලබා දෙන්න.
- මෙය ක්‍රීඩාවක් ආකාරයට සිදු කරන්න.
- මෙලෙස අකුරු කිහිපයක් හඳුන්වා දීමෙන් පසු අකුරේ ශබ්දය නැවත මතක් කරන විවිධ ක්‍රීඩා සහිත ක්‍රියාකාරකම් සංවිධානය කරන්න.

  උදාහරණ : 'ග' ශබ්දය මුලට යෙදෙන වචන කියන විට සිසුන්ට අත්පුඩියක් ගැසීමට/අත් එසවීමට . . . පවසන්න.

- එක් අකුරක් පස්රූලේ ලිවීම පුහුණු වීමෙන් පසු ව එම අකුරු තනිරූලේ ලිවීම ද පුහුණු කරවන්න. සෑම අකුරක් සඳහා ම මෙම ක්‍රමය අනුගමනය කරන්න.
- තනිරූලේ අකුරු ලිවීම සඳහා **'අකුරු නුවණ 2'** පොතෙහි ඇති අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න
- තනිරූලේ බලා ලිවීම සඳහා **'අකුරු නුවණ 2'** පොතෙහි ඇති අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- තව දුරටත් අකුරු ලිවීම පුහුණු කිරීම සඳහා තනිරූල් පොතක් භාවිත කරන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 17.1 යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් නිර්දිෂ්ට මධ්‍ය අක්ෂර නවය පස්රූලේ ලියයි. | 17.1.1 නියමිත අංග සහිත වීම | මධ්‍ය අක්ෂර නවයක් හෝ අටක් නියමිත අංග සහිත ව ලියයි. | මධ්‍ය අක්ෂර හතක් හෝ හයක් නියමිත අංග සහිත ව ලියයි. | මධ්‍ය අක්ෂර පහක් හෝ හතරක් නියමිත අංග සහිත ව ලියයි. | මධ්‍ය අක්ෂර තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් නියමිත අංග සහිත ව ලියයි. |
| | 17.1.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | මධ්‍ය අක්ෂර නවයක් හෝ අටක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | මධ්‍ය අක්ෂර හතක් හෝ හයක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | මධ්‍ය අක්ෂර පහක් හෝ හතරක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | මධ්‍ය අක්ෂර තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. |
| | 17.1.3 නියමිත ප්‍රමාණයට ලිවීම | මධ්‍ය අක්ෂර නවයක් හෝ අටක් නියමිත ප්‍රමාණයට ලියයි. | මධ්‍ය අක්ෂර හතක් හෝ හයක් නියමිත ප්‍රමාණයට ලියයි. | මධ්‍ය අක්ෂර පහක් හෝ හතරක් නියමිත ප්‍රමාණයට ලියයි. | මධ්‍ය අක්ෂර තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් නියමිත ප්‍රමාණයට ලියයි. |
| | 17.1.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම | නිවැරදි දිශාව අනුගමනය කරමින් මධ්‍ය අක්ෂර නවයක් හෝ අටක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් මධ්‍ය අක්ෂර හතක් හෝ හයක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් මධ්‍ය අක්ෂර පහක් හෝ හතරක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් මධ්‍ය අක්ෂර තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් ලියයි. |
| 17.2 නිර්දිෂ්ට මධ්‍ය අක්ෂර නවය නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නඟා කියවයි. | 17.2.1 නිවැරදි වීම | අක්ෂර නවයක් හෝ අටක් නිවැරදි ව උච්චාරණය කරයි. | අක්ෂර නවයෙන් හතක් හෝ හයක් නිවැරදි ව උච්චාරණය කරයි. | අක්ෂර පහක් හෝ හතරක් නිවැරදි ව උච්චාරණය කරයි. | අක්ෂර තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් නිවැරදි ව උච්චාරණය කරයි. |
| 17.5 යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් නිර්දිෂ්ට මධ්‍ය අක්ෂර නවය තනිරූලේ ලියයි. | 17.5.1 නියමිත අංග සහිත වීම | මධ්‍ය අක්ෂර නවයක් හෝ අටක් නියමිත අංග සහිත ව ලියයි. | මධ්‍ය අක්ෂර හතක් හෝ හයක් නියමිත අංග සහිත ව ලියයි. | මධ්‍ය අක්ෂර පහක් හෝ හතරක් නියමිත අංග සහිත ව ලියයි. | මධ්‍ය අක්ෂර තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් නියමිත අංග සහිත ව ලියයි. |
| | 17.5.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | මධ්‍ය අක්ෂර නවයක් හෝ අටක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | මධ්‍ය අක්ෂර හතක් හෝ හයක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | මධ්‍ය අක්ෂර පහක් හෝ හතරක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | මධ්‍ය අක්ෂර තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. |
| | 17.5.3 නියමිත ප්‍රමාණයට ලිවීම | මධ්‍ය අක්ෂර නවයක් හෝ අටක් නියමිත ප්‍රමාණයට ලියයි. | මධ්‍ය අක්ෂර හතක් හෝ හයක් නියමිත ප්‍රමාණයට ලියයි. | මධ්‍ය අක්ෂර පහක් හෝ හතරක් නියමිත ප්‍රමාණයට ලියයි. | මධ්‍ය අක්ෂර තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් නියමිත ප්‍රමාණයට ලියයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 17.5.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම | නිවැරදි දිශාව අනුගමනය කරමින් මධ්‍ය අක්ෂර නවයක් හෝ අටක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් මධ්‍ය අක්ෂර හතක් හෝ හයක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් මධ්‍ය අක්ෂර පහක් හෝ හතරක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් මධ්‍ය අක්ෂර තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් ලියයි. |

අකුරු ලිවීමේ දුෂ්කරතා දක්වන සිසුන් සඳහා වැලිපිල්ලේ ලිවීම සහ හිදැස් පත්වල ලිවීම වැනි ක්‍රියාකරකම් යෝග්‍ය පරිදි භාවිත කරන්න.

**ක්‍රියාකාරකම 17.3, 17.4, 17.6, 17.7 : අකුරු එකතු කර වචන කියවමු; ලියමු.**

**කාලය** : පැය 6යි.

**ඉගෙනුම් සම්පත්** : අකුරු කාඩ්, වචන කාඩ්,

**වාංමාලාව** : අකුරු, අක්ෂර, පස්රූල, තනිරූල, ඉහළ, මැද, පහළ, අංග, දිශාව, ප්‍රමාණය, හැඩය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- පස්රූලේ 'ග, හ' යන අකුරු ලිවීමට සහ කියවීමට හඳුන්වා දීමෙන් අනතුරුව එම අකුරු එකතු කර 'ගහ' යන වචනය සකස් කර පස්රූලේ ලිවීමට සහ කියවීමට සිසුන් යොමු කරන්න.
- මේ ආකාරයට හඳුන්වා දෙන එක් එක් අකුර භාවිත කරමින් අර්ථවත් වචන සාදා පස්රූලේ ලිවීමට සහ කියවීමට සිසුන් යොමු කරන්න.
- වචන බලා ලිවීමේ අභ්‍යාසවලින් පසු අසා ලිවීමේ අභ්‍යාසවල ද සිසුන් නිරත කරන්න.
- මේ සඳහා **'අකුරු නුවණ 2'** පොතෙහි ඇති අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- වචන ලිවීමේදී අකුරු අතර නිසි පරතරය තබමින් ලිවීමට උපදෙස් දෙන්න.
- මේ සඳහා හුණු පුවරුව හෝ ප්‍රදර්ශන පුවරුව හෝ භාවිත කරමින් අකුරු අතර නිසි පරතරය තබන ආකාරය ආදර්ශනය කරන්න.
- අනතුරුව **'අකුරු නුවණ 2'** පොතෙහි පස්රූලේ තිත් මත වචන ලිවීමේ අභ්‍යාසවලින් පසු බලා ලිවීමේ අභ්‍යාසවල ද සිසුන් නිරත කරන්න.
- පස්රූලක විශාල ව ලියා ගත් 'ග, හ, ය, ස, ප' යන අකුරු සහිත කාඩ්පත් සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- එම අකුරු ගළපමින් අර්ථවත් වචන සෑදීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි නිරත වන අතරතුර සෑම සිසුවකු ම කරා ගොස්, ඔවුන් වචන සාදන ආකාරය පිළිබඳ විමසිලිමත් වන්න.
- වචන සාදා ලිවීමේදී පස්රූල් පොතක් භාවිත කරන්න.
- සෑම සිසුවෙකුගේ ම අභ්‍යාස පොත් පරික්ෂා කිරීමේදී, අකුරු නිවැරදි ව ලියා තිබේ දැයි විමසිලිමත් විය යුතු අතර, වැරදි ලෙස ලියා ඇති නම් නිවැරදි කර ගැනීමට සහාය වන්න.
- ලියන ලද වචන කියවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 02**

- මෙලෙස 'න, ත, ක' යන මධ්‍ය අක්ෂර ලිවීම ද හඳුන්වා දීම සිදු කරන්න.
- මෙහිදී 'න, ත, ක' යන අකුරු හඳුන්වා දීමෙන් අනතුරුව එම අකුරු එකතු කර වචන ලිවීමට හා කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- වචන කියවීමේදී අකුරු නිවැරදි ව උච්චාරණය කිරීමට සිසුන් පුහුණු කරන්න.
- **වචන උච්චාරණයේදී වචනවල මුල් අකුර, අග අකුර අවධාරණය වන සේ උච්චාරණය කරවන්න.**
- මෙය ක්‍රීඩාවක් ලෙස සිදු කරන්න.
- සිසුන් කණ්ඩායම් දෙකකට හෝ සුදුසු පරිදි කුඩා කණ්ඩායම් ලෙස හෝ යුගල වශයෙන් හෝ වෙන් කරන්න.
- එක් කණ්ඩායමක් හෝ යුගලයක එක් අයෙකු වචන කාඩ්පතක් පෙන්වා, නම් කරන ලද කණ්ඩායමට හෝ යුගලයේ අනෙක් සිසුවාට හෝ එම වචන කාඩ්පත කියවීමට අවස්ථාව දෙන්න.
- මෙය ක්‍රීඩාවක් ලෙස සිදු කරන්න.
- **උගත් අකුරු භාවිත කර රිද්මයානුකූල වචන සකස් කර සිසුන්ට කියවීමට අවස්ථාව ලබා දෙන්න.**

උදා:- ⋆ ගස, හස, යස, පස, කස

⋆ සහය, පහය, නහය

- උගත් පිලි රහිත අකුරු යෙදුණු වචන, කියවීම් පොතේ ඇති පාඩම්වලින් සොයා කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පස්රූලේ වචන ලිවීමට සහ කියවීමට හඳුන්වා දුන් ඉහත ක්‍රමය ම භාවිත කර තනිරූලේ වචන ලිවීම ද කියවීම ද සිදු කරන්න.
- අකුරු එකතු කර වචන ලිවීමේදී පස්රූලේ ලිවීම හා තනිරූලේ ලිවීම එකවර සිදු කරන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 17.3 නිර්දිෂ්ට මධ්‍ය අක්ෂර යෙදුණු පිලි රහිත අකුරු දෙකේ සහ තුනේ වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් පස්රූලේ ලියයි. | 17.3.1 නියමිත අංග සහිත වීම | අකුරුවල නියමිත අංග සහිත ව වචන හතර ම ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන තුනක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන දෙකක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව එක් වචනයක් ලියයි. |
| | 17.3.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන හතර ම ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන තුනක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන දෙකක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව එක් වචනයක් ලියයි. |
| | 17.3.3 නියමිත ප්‍රමාණයට ලිවීම | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන හතර ම ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන තුනක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන දෙකක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව එක් වචනයක් ලියයි. |
| | 17.3.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන හතර ම ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන තුනක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන දෙකක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් එක් වචනයක් ලියයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 17.3.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම | අකුරු අතර නිසි පරතරය තබමින් වචන හතර ම ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන තුනක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන දෙකක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් එක් වචනයක් ලියයි. |
| 17.4 පස්රූලේ ලියන ලද වචන හතරක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නඟා කියවයි. | 17.4.1 නිවැරදි වීම | වචන හතර ම නිවැරදි ව උච්චාරණය කරයි. | වචන තුනක් නිවැරදි ව උච්චාරණය කරයි. | වචන දෙකක් නිවැරදි ව උච්චාරණය කරයි. | එක් වචනයක් නිවැරදි ව උච්චාරණය කරයි. |
| 17.6 නිර්දිෂ්ට මධ්‍ය අක්ෂර යෙදුණු පිලි රහිත අකුරු දෙකේ සහ තුනේ වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරූලේ ලියයි. | 17.6.1 නියමිත අංග සහිත වීම | අකුරුවල නියමිත අංග සහිත ව වචන හතර ම ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන තුනක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන දෙකක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව එක් වචනයක් ලියයි. |
| | 17.6.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන හතර ම ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන තුනක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන දෙකක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව එක් වචනයක් ලියයි. |
| | 17.6.3 නියමිත ප්‍රමාණයට ලිවීම | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන හතර ම ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන තුනක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන දෙකක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව එක් වචනයක් ලියයි. |
| | 17.6.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන හතර ම ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන තුනක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන දෙකක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් එක් වචනයක් ලියයි. |
| | 17.6.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම | අකුරු අතර නිසි පරතරය තබමින් වචන හතර ම ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන තුනක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන දෙකක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් එක් වචනයක් ලියයි. |
| 17.7 තනිරූලේ ලියන ලද වචන හතරක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නඟා කියවයි. | 17.7.1 නිවැරදි වීම | වචන හතර ම නිවැරදි ව උච්චාරණය කරයි. | වචන තුනක් නිවැරදි ව උච්චාරණය කරයි. | වචන දෙකක් නිවැරදි ව උච්චාරණය කරයි. | එක් වචනයක් නිවැරදි ව උච්චාරණය කරයි. |

# දෙවන වාරය

**දෙවන වාරයට නිර්දිෂ්ට ඉගෙනුම් පල**

- ස්වාභාවික දර්ශනයක් /කෙටි වීඩියෝ දර්ශනයක් නරඹා එහි අන්තර්ගතය ප්‍රකාශ කරයි.
- අන් අය හා සුහද ව කතාබහ කරයි.
- පින්තූරයක් නිරීක්ෂණය කර ඒ ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්නවලට වාචික ව පිළිතුරු ලබා දෙයි.
- සරල ළමා ගීතයකට සවන් දී ඒ ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්නවලට වාචික ව පිළිතුරු ලබා දෙයි.
- සරල ඡේදයකට සවන් දී ඒ ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්නවලට වාචික ව පිළිතුරු ලබා දෙයි.
- කියවීමේදී හා ලිවීමේදී ආරෝහණ අක්ෂර නිවැරදි ව භාවිත කරයි.
- කියවීමේදී හා ලිවීමේදී අවරෝහණ අක්ෂර නිවැරදි ව භාවිත කරයි.
- කියවීමේදී හා ලිවීමේදී හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු නිවැරදි ව භාවිත කරයි.
- ඡේද, කතන්දර හා දෙබස් ශබ්ද නගා නිවැරදි ව කියවයි.

භාෂාවක් භාවිතයේදී සවන් දීම හා කතා කිරීම ඉතාමත් වැදගත් වේ. සවන් දීම හා කතා කිරීම සංවර්ධනයෙහි ලා සිදු කළ හැකි ක්‍රියාකාරකම් කිහිපයකි. ඒ අනුව ස්වාභාවික දර්ශනයක්/ වීඩියෝ දර්ශනයක් නැරඹීමෙන් පසු ව එහි අන්තර්ගතය පිළිබඳ අදහස් පැවසීමට අවකාශය ලබා දීම මගින් සහ අන් අය හා සුහද ව කතා කිරීමට අවස්ථාව ලබා දීම මගින් ද භාෂාවක් භාවිත කිරීමේ හැකියාව ප්‍රගුණ කිරීමට අවස්ථාව උදාකරලිය හැකි ය.

එමෙන්ම පින්තූරයක් නිරීක්ෂණය කර එහි ඇති දේවල් පිළිබඳ අවබෝධයෙන් යුතු ව ඒ ඇසුරෙන් අසන ප්‍රශ්නවලට වාචික ව පිළිතුරු ලබා දීමටත් සරල ළමා ගීතයකට සවන් දී එම ගීතයේ අන්තර්ගතය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ඒ ඇසුරෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීමටත් සරල ඡේදයකට සවන් දී එහි අන්තර්ගතය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ඒ ඇසුරෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීමටත් හැකියාව වර්ධනය කර ගත යුතු ය. යම් දෙයකට අවධානයෙන් හා සංයමයෙන් සවන් දීම මගින් අවබෝධය ලැබීමටත් එමගින් වාංමාලාව පුළුල් කර ගැනීමටත් අවස්ථාව උදා වෙයි. වාංමාලාව පුළුල් වීම කතා කිරීම සංවර්ධනය සඳහා බොහෝ සේ වැදගත් වන්නකි.

පහත දී ඇති ක්‍රියාකාරකම් මනා ව සිදු කිරීමෙන් සිසුන්ගේ භාෂා භාවිතයේ හැකියාව සංවර්ධනය කිරීමට අවස්ථාව ලබා ගත හැකි ය.

**විෂය නිර්දේශයේ උද්ධෘතය**

**ස්වාභාවික දර්ශන/ වීඩියෝ දර්ශන**

| සමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | ඇගයීම් නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා. | 10. ස්වාභාවික දර්ශනයක්/ කෙටි වීඩියෝ දර්ශනයක් නරඹා එහි අන්තර්ගතය ප්‍රකාශ කරයි. | 'අප අවට සත්තු' තේමාව ඇසුරෙන් ස්වාභාවික දර්ශනයක් හෝ නිර්මාණය කරන ලද මිනිත්තු තුනක පමණ වීඩියෝ දර්ශනයක්<br>■ ස්වාභාවික දර්ශනයේ/ වීඩියෝ දර්ශනයේ ඇති දේ විස්තර කිරීම සඳහා අවශ්‍ය වචන<br>■ කථන ව්‍යවහාරයේ වර්තමාන කාල ක්‍රියාව<br>■ කථන ව්‍යවහාරයේ සරල වාක්‍ය<br>■ සංයමය<br>■ වචන නිවැරදි ව උච්චාරණය | ■ සවන් දීම<br>■ කතා කිරීම | 10.1 ස්වාභාවික දර්ශනයක්/ මිනිත්තු තුනක පමණ වීඩියෝ දර්ශනයක් අවධානයෙන් යුතු ව නරඹා එහි ඇතුළත් චරිත/ද්‍රව්‍ය තුනකට නො අඩු සංඛ්‍යාවක් නම් කරයි. | 10.1.1 නිවැරදි වීම |
| | | | | 10.2 ස්වාභාවික දර්ශනයක්/ මිනිත්තු තුනක පමණ වීඩියෝ දර්ශනයක් අවධානයෙන් යුතු ව නරඹා එහි ඇතුළත් එක් සිද්ධියක් නම් කරයි. | 10.2.1 නිවැරදි වීම |

**ක්‍රියාකාරකම 10.1, 10.2 : ස්වාභාවික දර්ශනයක්/ වීඩියෝ දර්ශනයක් නරඹමු; චරිත/ද්‍රව්‍ය හා සිද්ධි නම් කරමු.**

**කාලය** : පැය 01යි.

**ඉගෙනුම් සම්පත්** : වීඩියෝ දර්ශනයක්

**වාංමාලාව** : චරිත, ද්‍රව්‍ය, සිද්ධි

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 01**

- සතුන් ආහාර ගන්නා, විවේකය ගත කරන ආකාරය වැනි අවස්ථා ඇතුළත් ස්වාභාවික දර්ශනයක්/ වීඩියෝ දර්ශනයක් නැරඹීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙහිදී අවධානයෙන් සහ සංයමයෙන් යුතු ව ස්වාභාවික දර්ශනය/ වීඩියෝ දර්ශනය නැරඹීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- අවධානයෙන් සහ සංයමයෙන් යුතු ව නැරඹීමේ වැදගත්කම සහ එයින් ඇති වන වාසි පිළිබඳ සිසුන්ට සරල ව පැහැදිලි කරන්න.

**පියවර 02**

- ස්වාභාවික දර්ශනය/ වීඩියෝ දර්ශනයෙහි ඇතුළත් චරිත/ද්‍රව්‍ය නම් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඒ පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

**පියවර 03**

- ස්වාභාවික දර්ශනයේ/ වීඩියෝ දර්ශනයේ ඇති සිද්ධි මොනවා දැයි සිසුන්ගෙන් විමසන්න.
- ඒ පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 10.1 ස්වාභාවික දර්ශනයක්/මිනිත්තු තුනක පමණ වීඩියෝ දර්ශනයක් අවධානයෙන් යුතු ව නරඹා එහි ඇතුළත් චරිත/ද්‍රව්‍ය තුනකට නො අඩු සංඛ්‍යාවක් නම් කරයි. | 10.1.1 නිවැරදි වීම | චරිත/ද්‍රව්‍ය තුනකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි ව නම් කරයි. | චරිත/ද්‍රව්‍ය තුනක් නිවැරදි ව නම් කරයි. | චරිත/ද්‍රව්‍ය දෙකක් හෝ එකක් නිවැරදි ව නම් කරයි. | අන් අයගේ උදවු ඇති ව චරිත/ද්‍රව්‍ය එකක්වත් නිවැරදි ව නම් කරයි. |
| 10.2 ස්වාභාවික දර්ශනයක්/මිනිත්තු තුනක පමණ වීඩියෝ දර්ශනයක් අවධානයෙන් යුතු ව නරඹා එහි ඇතුළත් එක් සිද්ධියක් නම් කරයි. | 10.1.2 නිවැරදි වීම | නිවැරදි ව සිද්ධියක් නම් කරයි. | | සිද්ධියක් නම් කළ නොහැකියි. | |

## විෂය නිර්දේශයේ උද්ධෘතය

### සුහද කතාබහ

| සමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | ඇගයීම් නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා. | 11. අන් අය හා සුහද ව කතාබහ කරයි. | 'අපේ ගෙදර' තේමාව ඇසුරෙන් නිවසේ කටයුතු හා සම්බන්ධ, පාසලේදී කරන කටයුතු පිළිබඳ මිනිත්තු තුනක පමණ කතාබහක්<br>■ සුහදබව වර්ධනය සඳහා උචිත වචන (ස්තුතියි, කරුණාකර, සමාවෙන්න,)<br>■ ආමන්ත්‍රණයේදී යහළුවන්ගේ නම් භාවිතය<br>■ කථන ව්‍යවහාරයේ වාක්‍ය<br>■ සක්‍රිය සවන් දීම<br>■ අන්‍යෝන්‍ය ගරුත්වයෙන් යුතු ව සවන් දීම හා කතා කිරීම<br>■ නිවැරදි වචන උච්චාරණය<br>■ හඬ පාලනය | ■ සවන් දීම<br>■ කතා කිරීම | 11.1 අන් අය හා සුහද ව කතාබහ කිරීමේදී ආචාරශීලිත්වය ප්‍රදර්ශනය වන වචන තුනක් පවසයි. | 11.1.1 නිවැරදි වීම |
| | | | | 11.2 සුහදශීලී වචන භාවිත කරමින් තවත් කෙනෙකුගෙන් තොරතුරු දෙකක් විමසයි. | 11.2.1 සුහදශීලී වචනවලින් යුතු වීම<br>11.2.2 තොරතුරු ප්‍රමාණවත් වීම<br>11.2.3 උචිත ඉරියවු හා අංග චලන ප්‍රදර්ශනය වීම |
| | | | | 11.3 තවත් කෙනෙක් විමසන කරුණු දෙකකට සුහදශීලී වචන භාවිත කරමින් වාචික ව පිළිතුරු දෙයි. | 11.3.1 සුහදශීලී වචනවලින් යුතු වීම<br>11.3.2 කරුණු ප්‍රමාණවත් වීම<br>11.3.3 උචිත ඉරියවු හා අංග චලන ප්‍රදර්ශනය වීම |

**ක්‍රියාකාරකම 11.1, 11.2, 11.3 : සුහද ව කතාබහ කරමු.**

**කාලය** : පැය 01යි.

**වාංමාලාව** : ස්තුතියි, සමාවෙන්න, කරුණාකර

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- පහත කතන්දරයට කිහිප වරක් සවන් දීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**ගගන සහ මලිති**

ගගන කාමරයේ පාඩම් කරමින් සිටියා.

'පුතා මෙන්න මලිති ඇවිත්' අම්මා කිවුවා.

'මේ එනවා අම්මේ' යැයි කියමින් ගගන සාලයට ආවා.

'ආ . . . ගගන සුබ උදෑසනක්' මලිති කිවුවා.

'සුබ උදෑසනක් මලිති' ගගන ද කිවුවා.

'පුතයි දුවයි කතා කර කර ඉන්න. මම ගිහිං තේ හදන්නම්'

'ස්තුතියි නැන්දේ. මම තේ බීලා ආවේ.' මලිති ගගනගේ අම්මා දෙස බලමින් කිවුවා.

'අනේ සමාවෙන්න මලිති, එදා මගේ අතින් ඔයාගේ පොතේ කොළයක් ඉරුණට. මම හිතලා එහෙම කළේ නැහැ. නොදැනුවත්වයි වුණේ' ගගන කිවුවා.

'හරි ගගන, මම ඒක දන්නවා. මටත් සමාවෙන්න. මට ඒ වෙලාවේ දුක හිතුණා. ඒකයි ඒ ගැන ගුරුතුමියට කිවුවේ' මලිති කිවුවා.

'මලිති, කරුණාකරලා ඔයාගේ ළඟ එදා තිබුණු කතන්දර පොත මට දෙනව ද?' ගගන ඇසුවා.

'මම දෙන්නම් ගගන' මලිති හිනා වෙලා කිවුවා.

- ඉහත කතන්දරයේ අන්තර්ගතය සිසුන් සමග සාකච්ඡා කරන්න.
- කතන්දරයේ ඇතුළත් සුහදතාව පළ කරන අවස්ථා පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- එලෙස සුහදතාව පළ කරන වචන කතන්දරය ඇසුරෙන් උපුටා දක්වන්න.
- තම සමීපතමයන්, හිතවතුන්, ඥාතීන් සමග සුහද ව කතා බහ කිරීමේදී සුහදතාව පළ කරන වචන භාවිත කිරීමේ වටිනාකම සරල ව සිසුන්ට පැහැදිලි කරන්න.
- සුහදතාව පළ කරන වචන මෙන් ම සුහදතාව පළ කිරීමේදී හැසිරිය යුතු ආකාරය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- දෛනික ජීවිතයේදී සුහදතාව ප්‍රදර්ශනය වන අවස්ථා මොනවා දැයි සිසුන් සමග සාකච්ඡා කරන්න.
- මෙවැනි අවස්ථා පිළිබඳ සිසු අද්දැකීම් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 02**

- සිසුන් යුගලවලට වෙන් කරන්න.
- එදිනෙදා කරන කටයුතු පිළිබඳ තම යහළුවන් සමග කතා කිරීමට අවස්ථාව දෙන්න.
- ඒ සඳහා ලබා දී ඇති උදාහරණ සහිත අවස්ථා ඉදිරිපත් කරන්න.

උදාහරණ : ● පන්තියේ යහළුවෙකුගෙන් පැන්සලක්/පොතක් ඉල්ලීම
- පෙර දින නිවසේදී සිදු කළ ක්‍රීඩාවක් පිළිබඳ විමසීම
- පාසලට පැමිණෙන විට දුටු දේවල් පිළිබඳ විමසීම
- කරන ලද උදව්වකට ස්තුති කිරීම

■ සුහදශීලී වචන භාවිත කරමින් අදාළ තොරතුරු විමසීමට සිසුන්ට උපදෙස් දෙන්න.

■ තම යහළුවා විමසන ප්‍රශ්නවලට සුහදතාව පළ කරන වචන භාවිත කරමින් පිළිතුරු දීමට සිසුන් යොමු කරන්න.

■ එහිදී සුහදතාව පළ කරන වචන මෙන් ම ආචාරශීලීත්වය සහ සුහදතාව ප්‍රදර්ශනය කරන ඉරියව් භාවිත කිරීමට අවධාරණය කරන්න.

■ මෙහිදී පියවර 01හිදී යොදා ගත් 'හොඳ යහළුවෝ' කතන්දරයෙහි 'ගගන, මලිති සහ අම්මා' යන චරිත ඇසුරෙන් සුහදශීලී ව සහ ආචාරශීලී ව තොරතුරු විමසන ආකාරය සහ ඊට පිළිතුරු ලබා දෙන ආකාරය නැවත උදාහරණයට ගෙන අවධාරණය කරන්න.

■ තොරතුරු විමසීමේ සහ පිළිතුරු ලබා දීමේ ගුරු ආදර්ශනයක් සිසු ක්‍රියාකාරකම්වලට පෙර ලබා දෙන්න.

### පියවර 03

■ හැකි සෑම විට ම සිසුන්ගේ කතා බහ නිරීක්ෂණය කර සුහදතාව ප්‍රදර්ශනය කරන වචන භාවිතයට යොමු කරන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 11.1 අන් අය හා සුහද ව කතාබහ කිරීමේදී ආචාරශීලීත්වය ප්‍රදර්ශනය වන වචන තුනක් පවසයි. | 11.1.1 නිවැරදි වීම | වචන තුන ම නිවැරදි ව පවසයි. | වචන තුන ම නිවැරදි ව පැවසිය නොහැකියි. |
| 11.2 සුහදශීලී වචන භාවිත කරමින් තවත් කෙනෙකුගෙන් තොරතුරු දෙකක් විමසයි. | 11.2.1 සුහදශීලී වචනවලින් යුතු වීම | සුහදශීලී වචන භාවිත කරයි. | සුහදශීලී වචන භාවිත නො කරයි. |
| | 11.2.2 තොරතුරු ප්‍රමාණවත් වීම | තොරතුරු දෙක ම නිවැරදි ව විමසයි. | තොරතුරු දෙක ම නිවැරදි ව විමසිය නොහැකියි. |
| | 11.2.3 උචිත ඉරියවු හා අංග චලන ප්‍රදර්ශනය වීම | සෑම විට ම උචිත ඉරියවු ප්‍රදර්ශනය කරයි. | සෑම විට ම උචිත ඉරියවු ප්‍රදර්ශනය නො කරයි. |

| | | | |
|---|---|---|---|
| 11.3<br>තවත් කෙනෙක් විමසන කරුණු දෙකකට සුහදශීලී වචන භාවිත කරමින් වාචික ව පිළිතුරු දෙයි. | 11.3.1<br>සුහදශීලී වචනවලින් යුතු වීම | සැම විට ම සුහදශීලී වචන භාවිත කරයි. | සැම විට ම සුහදශීලී වචන භාවිත නො කරයි. |
| | 11.3.2<br>කරුණු ප්‍රමාණවත් වීම | කරුණු දෙකට ම නිවැරදි ව පිළිතුරු දෙයි. | කරුණු දෙකට ම නිවැරදි පිළිතුරු ලබා නො දෙයි. |
| | 11.3.3<br>උචිත ඉරියවු හා අංග චලන ප්‍රදර්ශනය වීම | සැම විට ම උචිත ඉරියවු ප්‍රදර්ශනය කරයි. | සැම විට ම උචිත ඉරියවු ප්‍රදර්ශනය නො කරයි. |

**විෂය නිර්දේශයේ උද්ධෘතය**

| සමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | ඇගයීම් නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා. | 12.<br>පින්තූරයක් නිරීක්ෂණය කර ඒ ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්නවලට වාචික ව පිළිතුරු ලබා දෙයි. | 'අප අවට සත්තු' තේමාව ඇසුරෙන් එක් සිද්ධියක් සහ චරිත කිහිපයකින් යුත් ඉර පායා ගෙන එන දර්ශනයක් සහිත පින්තූරයක්<br>■ පින්තූරයේ ඇති දේ විස්තර කිරීම සඳහා අවශ්‍ය වචන<br>■ කථන ව්‍යවහාරයේ සරල වාක්‍ය<br>■ ප්‍රශ්නවාචී වාක්‍ය<br>■ සංයමය<br>■ නිවැරදි වචන උච්චාරණය | ■ සවන් දීම<br>■ කතා කිරීම | 12.1 එක් සිද්ධියක් නිරූපිත පින්තූරයක් අවධානයෙන් යුතු ව නිරීක්ෂණය කර එහි ඇතුළත් චරිත/ද්‍රව්‍ය ඇසුරෙන් ඉස්මතු වන අදහසක් පවසයි. | 12.1.1<br>නිවැරදි වීම |
| | | | | 12.2 එක් සිද්ධියක් නිරූපිත පින්තූරයක් අවධානයෙන් යුතු ව නිරීක්ෂණය කර ඒ ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්න තුනකට වාචික ව පිළිතුරු ලබා දෙයි. | 12.2.1<br>නිවැරදි වීම |

**ක්‍රියාකාරකම 12.1, 12.2 : පින්තූරයක් නිරීක්ෂණය කරමු; ප්‍රතිචාර දක්වමු.**


**කාලය** : පැය 01යි.

**ඉගෙනුම් සම්පත්** : සකස් කරන ලද පින්තූරය/පින්තූරය ඇතුළත් QR කේතය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 01**

- පහත සඳහන් පින්තූරය සිසුන්ට පැහැදිලි ව පෙනෙන සේ පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- ඒ සඳහා ලබා දී ඇති QR කේතය ද භාවිත කළ හැකි ය.



Channel NIE

- එම පින්තූරයේ පෙනෙන දේවල් නම් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**පියවර 02**

- පින්තූරයෙන් ඉස්මතු වන අදහසක් පැවසීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- පින්තූරයෙන් ඉස්මතු වන අදහසක් පැවසීමේදී එහි නිරූපිත සියලු ම කාරණා සැලකිල්ලට ගත යුතු බවට සරල ව උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.
- එහිදී පින්තූරයේ ඇති සියලු ම දේවල් සියුම් ලෙස නිරීක්ෂණය කළ යුතු බවත් පින්තූරයේ ඇති එක් එක් කොටස් අතර අන්තර් සම්බන්ධතාව කෙරෙහි අවධානය යොමු කිරීමේ වැදගත්කමත් සිසුන්ට සරල ව පැහැදිලි කර දෙන්න.

**පියවර 03**

- ඉහත පින්තූරය ඇසුරෙන් සරල ප්‍රශ්න තුනක් සිසුන්ගෙන් විමසන්න.
- ඒ සඳහා වාචික පිළිතුරු ලබා ගන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| 12.1<br>එක් සිද්ධියක් නිරූපිත පින්තූරයක් අවධානයෙන් යුතු ව නිරීක්ෂණය කර එහි ඇතුළත් චරිත/ද්‍රව්‍ය ඇසුරෙන් ඉස්මතු වන අදහසක් පවසයි. | 12.1.1<br>නිවැරදි වීම | නිවැරදි ව අදහසක් පවසයි. | | නිවැරදි ව අදහසක් නො පවසයි. | |
| 12.2<br>එක් සිද්ධියක් නිරූපිත පින්තූරයක් අවධානයෙන් යුතු ව නිරීක්ෂණය කර ඒ ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්න තුනකට වාචික ව පිළිතුරු ලබා දෙයි. | 12.2.1<br>නිවැරදි වීම | **4**<br>ප්‍රශ්න තුනට ම නිවැරදි පිළිතුරු කියයි. | **3**<br>ප්‍රශ්න දෙකකට නිවැරදි පිළිතුරු කියයි. | **2**<br>එක් ප්‍රශ්නයකට නිවැරදි පිළිතුර කියයි. | **1**<br>අන් අයගේ උදවු ඇති ව එක් ප්‍රශ්නයකටවත් නිවැරදි පිළිතුර කියයි. |

**විෂය නිර්දේශයේ උද්ධෘතය**

| සමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | | ඇගයීම් නිර්ණායක |
|---|---|---|---|---|---|---|
| ස.භා.කා. | 13.<br>සරල ළමා ගීතයකට සවන් දී ඒ ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්නවලට වාචික ව පිළිතුරු ලබා දෙයි. | 'අප අවට සත්තු' යන තේමාව ඇසුරෙන් රචනා කරන ලද සරල ගීතයක්<br>■ ප්‍රශ්නවාචක පද<br>■ සංයමය<br>■ අවධානය<br>■ අවබෝධය<br>■ නිවැරදි උච්චාරණය<br>■ ඉරියවු හා අංග චලන | ■ සවන් දීම<br>■ කතා කිරීම | 13.1 | සරල ළමා ගීතයකට අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව සවන් දී එහි ඇතුළත් සිද්ධියක් මතකයෙන් පවසයි. | 13.1.1<br>නිවැරදි වීම |
| | | | | 13.2 | සරල ළමා ගීතයකට අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව සවන් දී ඒ ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්න තුනකට වාචික ව නිවැරදි පිළිතුරු ලබා දෙයි. | 13.2.1<br>නිවැරදි වීම |

**ක්‍රියාකාරකම 13.1, 13.2 : ගීතයකට සවන් දෙමු; ප්‍රතිචාර දක්වමු.**

**කාලය** : පැය 01යි.

**වාංමාලාව** : ගීතය, හිරු, වන්නම්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 01**

- අබේසීල රත්නායක මහතා විසින් පද රචනය කරන ලද "චූටි කුරුල්ලනි චූටි බටිත්තනි - පියාසලා අහසේ" යන ගීතය සිසුන්ට කිහිප වරක් සවන් දීමට යොමු කරන්න.
- එහිදී අවධානයෙන් සහ සංයමයෙන් සවන් දීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- අවධානයෙන් සහ සංයමයෙන් සවන් දීමේ වැදගත්කම ද සිසුන්ට සරල ව පැහැදිලි කරන්න.

**පියවර 02**

- ගීතයේ අන්තර්ගතය සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ගීතයේ ඇතුළත් සිද්ධි පිළිබඳ සිසුන්ගේ අවධානය යොමු කර එම එක් එක් සිද්ධියක් පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- එහි ඇතුළත් සිද්ධියක් මතකයෙන් පැවසීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 03**

- ගීතය ඇසුරෙන් සරල ප්‍රශ්න තුනක් විමසා සිසුන්ගෙන් වාචික පිළිතුරු ලබා ගන්න.

උදාහරණ :

  - රංචු ගැසී පියාඹන්නේ කවුරුන් ද?
  - හිරු නැඟ එන බව පෙනෙන්නේ කොහෙන් ද?
  - චූටි කුරුල්ලන් ගීත ගැයීමෙන් පසු ව කරන්නේ කුමක් ද?

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| 13.1 සරල ළමා ගීතයකට අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව සවන් දී එහි ඇතුළත් සිද්ධියක් මතකයෙන් පවසයි. | 13.1.1 නිවැරදි වීම | සිද්ධිය නිවැරදි ව මතකයෙන් පවසයි. | | සිද්ධිය මතකයෙන් නො පවසයි. | |
| 13.2 සරල ළමා ගීතයකට අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව සවන් දී ඒ ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්න තුනකට වාචික ව නිවැරදි පිළිතුරු ලබා දෙයි. | 13.2.1 නිවැරදි වීම | **4**<br>ප්‍රශ්න තුනට ම නිවැරදි පිළිතුරු කියයි. | **3**<br>ප්‍රශ්න දෙකකට නිවැරදි පිළිතුරු කියයි. | **2**<br>එක් ප්‍රශ්නයකට නිවැරදි පිළිතුරු කියයි. | **1**<br>අන් අයගේ උදවු ඇති ව එක් ප්‍රශ්නයකටවත් නිවැරදි පිළිතුරු කියයි. |

**විෂය නිර්දේශයේ උද්ධෘතය**

| සාමාන්‍ය භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | ඇගයීම් නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා | 14. සරල ඡේදයකට සවන් දී ඒ ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්නවලට වාචික ව පිළිතුරු ලබා දෙයි. | 'අප අවට සත්තු' යන තේමාව ඇසුරෙන් රචනා කරන ලද වචන 60ක පමණ සරල ඡේදයක්<br>■ ප්‍රශ්නවාචක පද<br>■ සංයමය<br>■ අවධානය<br>■ අවබෝධය<br>■ නිවැරදි උච්චාරණය<br>■ ඉරියවු හා අංග චලන | ■ සවන් දීම කතා කිරීම | 14.1 වචන 60ක පමණ සරල ඡේදයකට අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව සවන් දී එහි ඇතුළත් සිද්ධියක් මතකයෙන් පවසයි. | 14.1.1 නිවැරදි වීම |
| | | | | 14.2 වචන 60ක පමණ සරල ඡේදයකට අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව සවන් දී ඒ ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්න තුනකට නිවැරදි පිළිතුරු ලබා දෙයි. | 14.2.1 නිවැරදි වීම |

**ක්‍රියාකාරකම 14.1, 14.2 : ඡේදයකට සවන් දෙමු; ප්‍රතිචාර දක්වමු.**

**කාලය** : පැය 01යි.

**වාංමාලාව** : උදෑසන, නාදය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 01**

- පහත සඳහන් ඡේදයට කිහිප වරක් සවන් දීමට සිසුන් යොමු කරන්න.

**උදෑසන**

උදෑසන ඉර පෑයුවා. කුරුල්ලන් කූඩුවලින් එළියට ආවා. ඔවුන් කෑම සොයා ගෙන පියෑඹුවා. කිචි බිචි නාදය හැම තැන ම පැතිරුණා.

මල් ගස්වල පාට පාට මල් පිපිලා. හරි ම ලස්සනයි. මල් පැණි බොන්න සමනලුන් ආවා. මල් පැණි බොන්න මී මැස්සන් ද ආවා.

උදෑසන අවට පරිසරය හරි ම ලස්සනයි. මලිති සහ ගගන ලස්සන පරිසරය දිහා ගොඩක් වෙලා බලා ගෙන සිටියා. පරිසරය නරඹමින් ඔවුන් පාඩම් වැඩ කළා.

- එහිදී අවධානයෙන් හා සංයමයෙන් සවන් දීමට උපදෙස් දෙන්න.
- අවධානයෙන් හා සංයමයෙන් සවන් දීමේ වැදගත්කම ද සරල ව සිසුන්ට පැහැදිලි කරන්න.

**පියවර 02**

- ඡේදයේ අන්තර්ගතය සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ඡේදයේ ඇතුළත් සිද්ධි පිළිබඳ සිසුන්ගේ අවධානය යොමු කර එම සිද්ධි පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- එහි ඇතුළත් සිද්ධියක් මතකයෙන් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 03**

- ඡේදය ඇසුරෙන් සරල ප්‍රශ්න තුනක් විමසා සිසුන්ගෙන් වාචික ව පිළිතුරු ලබා ගන්න.

උදා :
- උදෑසන කාලයේ කූඩුවලින් එළියට ආවේ කවුරුන් ද?
- සමනල්ලු සහ මී මැස්සෝ බිවුවේ මොනවා ද?
- මලිති සහ ගගන පාඩම් වැඩ කළේ දවසේ කුමන කාලයකදී ද?

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| 14.1<br>වචන 60ක පමණ සරල ඡේදයකට අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව සවන් දී එහි ඇතුළත් සිද්ධියක් මතකයෙන් පවසයි. | 14.1.1<br>නිවැරදි වීම | සිද්ධිය නිවැරදි ව මතකයෙන් පවසයි. | | සිද්ධිය මතකයෙන් නො පවසයි. | |
| 14.2<br>වචන 60ක පමණ සරල ඡේදයකට අවධානයෙන් හා අවබෝධයෙන් යුතු ව සවන් දී ඒ ඇසුරෙන් අසනු ලබන ප්‍රශ්න තුනකට නිවැරදි පිළිතුරු ලබා දෙයි. | 14.2.1<br>නිවැරදි වීම | **4**<br>ප්‍රශ්න තුනට ම නිවැරදි පිළිතුරු කියයි. | **3**<br>ප්‍රශ්න දෙකකට නිවැරදි පිළිතුරු කියයි. | **2**<br>එක් ප්‍රශ්නයකට නිවැරදි පිළිතුරු කියයි. | **1**<br>අන් අයගේ උදවු ඇති ව එක් ප්‍රශ්නයකටවත් නිවැරදි පිළිතුරු කියයි. |

**විෂය නිර්දේශයේ උද්ධෘතය**

| සාමාන්‍ය භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | ඇගයීම් නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා<br>ශා.භා.කා | 18.<br>කියවීමේදී හා ලිවීමේදී ආරෝහණ අක්ෂර නිවැරදි ව භාවිත කරයි. | ▪ වචනයක මුල් ශබ්දය<br>▪ වචනයක අග ශබ්දය<br>▪ සිංහල අක්ෂර (මධ්‍ය අක්ෂර) ග,හ,ය,ස,ප, න,ත,ක,ශ<br>▪ සිංහල අක්ෂර (ආරෝහණ අක්ෂර) ට,ව,ච, ඩ,එ,ඒ,ම,ඔ,ඕ,බ, ඹ,ර,ඊ,ජ,ණ,ඬ,ළ<br>▪ නිවැරදි උච්චාරණය<br>▪ ලිවීම<br>▪ ලිවීමට සූදනම (නිවැරදි ව අසුන් ගැනීම, පොත තබා ගැනීම, පැන්සල ඇල්ලීම) | ▪ සවන් දීම<br>▪ කතා කිරීම<br>▪ කියවීම<br>▪ ලිවීම | 18.1 යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් නිර්දිෂ්ට ආරෝහණ අක්ෂර දහහත පස්රුලේ ලියයි. | 18.1.1 නියමිත අංග සහිත වීම<br>18.1.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>18.1.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>18.1.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම |
| | | | | 18.2 නිර්දිෂ්ට ආරෝහණ අක්ෂර දහහත නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නඟා කියවයි. | 18.2.1 නිවැරදි වීම |


| | | | | | |
|---|---|---|---|---|---|
| | | ■ පස්රූල<br>■ තනිරූල<br>■ ලිවීමේ යාන්ත්‍රික කුසලතා (අකුරක නියමිත අංග, හැඩය, ප්‍රමාණය දිශාව හා වචනයක අකුරු අතර පරතරය)<br>■ උගත් අකුරුවලින් සමන්විත වචන<br>■ අක්ෂර සංයෝජනය<br>■ පිලි රහිත අකුරු දෙකේ වචන<br>■ පිලි රහිත අකුරු තුනේ වචන<br>■ පිලි රහිත අකුරු හතරේ වචන | | 18.3 නිර්දිෂ්ට ආරෝහණ අක්ෂර යෙදුණු පිලි රහිත අකුරු දෙකේ සහ තුනේ වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් පස්රූලේ ලියයි. | 18.3.1 නියමිත අංග සහිත වීම<br>18.3.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>18.3.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>18.3.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම<br>18.3.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම |
| | | | | 18.4 පස්රූලේ ලියන ලද වචන හතරක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නඟා කියවයි. | 18.4.1 නිවැරදි වීම |
| | | | | 18.5 යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් නිර්දිෂ්ට ආරෝහණ අක්ෂර දහහත තනිරූලේ ලියයි. | 18.5.1 නියමිත අංග සහිත වීම<br>18.5.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>18.5.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>18.5.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම |
| | | | | 18.6 නිර්දිෂ්ට ආරෝහණ අක්ෂර යෙදුණු පිලි රහිත අකුරු දෙකේ සහ තුනේ වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරූලේ ලියයි. | 18.6.1 නියමිත අංග සහිත වීම<br>18.6.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>18.6.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>18.6.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම<br>18.6.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම |
| | | | | 18.7 නිර්දිෂ්ට ආරෝහණ අක්ෂර සහ මධ්‍ය අක්ෂර යෙදුණු පිලි රහිත අකුරු දෙකේ, තුනේ සහ හතරේ වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරූලේ ලියයි. | 18.7.1 නිවැරදි දිශාව අනුගමනය කිරීම<br>18.7.2 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම |
| | | | | 18.8 තනිරූලේ ලියන ලද වචන හයක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නඟා කියවයි. | 18.8.1 නිවැරදි වීම |

♦ **අකුරු හඳුන්වා දීම**

**ක්‍රියාකාරකම 02**

සිංහල වර්ණ මාලාවෙන් අකුරු 37ක් පමණක් පළමුවන ශ්‍රේණියේ සිසුන්ට ඉගැන්වීම සඳහා තෝරා ගෙන ඇත. වැඩිපුර භාවිත වන සිංහල අකුරු සැලකිල්ලට ගෙන මෙම තෝරා ගැනීම කර තිබේ. ඒ අනුව, පළමුවන ශ්‍රේණියේ දෙවන වාරයේදී ඉගැන්වීමට නියමිත ආරෝහණ අක්ෂර, ඉගැන්විය යුතු අනුපිළිවෙළ පහතින් දැක්වේ. ආරෝහණ අක්ෂර යනු 'පස්රූල්වල පළමුවන රූලත් හතරවන රූලත් අතර ලියවෙන අක්ෂරයි'.

**ආරෝහණ අක්ෂර (17)**




මෙම අක්ෂර ඉගැන්වීමේ අනුක්‍රමය සැකසීමේදී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගන්නා ලදි.

01. පළමුවන ශ්‍රේණියේ සිසුන්ට පහසුවෙන් හා පැහැදිලි ව උච්චාරණය කළ හැකි ශබ්ද සහිත අක්ෂර පළමුවෙන් ඉගැන්වීම

02. අක්ෂරවල හැඩය ද අනුක්‍රමය සැකසීමේදී සැලකිල්ලට ගන්නා ලද අතර 'ට' අක්ෂරය ලිවීමට හුරු වූ දරුවාට ඊළඟට 'ව' අක්ෂරය ඉගැන්වීම පහසු ය. 'ච' එම හැඩයෙන් ලියන තවත් අක්ෂරයකි. ඒ අනුව අකුරු හැඩය ද සැලකිල්ලට ගනිමින් සමාන හැඩ සහිත අක්ෂර රූප එක ළඟට එන පරිදි අක්ෂර අනුක්‍රමය සකසා තිබීම

    උදා : ට ව ච

03. එදිනෙදා වැඩිපුර භාවිත වන සිංහල වචනවල යෙදෙන අකුරු, අනුක්‍රමයේ ඉහළට ගැනීමට සැලකිලිමත් විය. එහිදී සඤ්ඤක අකුරු අඩුවෙන් භාවිත වන බැවින් සෑම තීරුවක් අගට ඒවා යෙදීම

    ඉහත දක්වන ලද කරුණු සියල්ල සලකා බලා මෙම අක්ෂර අනුක්‍රමය සකසා ඇති බව සැලකිය යුතු ය.

- අක්ෂර ඉගැන්වීමේදී සිසුන්ට මානසික ව බරක් නොවන ආකාරයට ඉගැන්විය යුතු ය.
- ඒ අනුව ඉගැන්විය යුතු අක්ෂර හඳුන්වා දීමේදී සරල කවි, ගීත සහ කතන්දර වැනි නිර්මාණාත්මක ක්‍රියාකාරකම් භාවිත කරන්න.

**ක්‍රියාකාරකම 18.1, 18.2, 18.5 : අකුරු කියවමු; ලියමු.**

**කාලය** : පැය 25යි.

**ඉගෙනුම් සම්පත්** : අකුරු කාඩ්, වචන කාඩ්

**වාංමාලාව** : අකුරු, අක්ෂර, පස්රූල, තනිරූල, ඉහළ, මැද, පහළ, ආරම්භය, අවසානය, අංග, දිශාව, ප්‍රමාණය, හැඩය


**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- පහත ඡේදය කිහිප වරක් ශබ්ද නගා කියවන්න.

> ගෙදර රඹුටන් ගස මුදුනේ අපි **ටකයක්** බැන්දා. ඒ **ටකයේ** හඬට බිය වී රඹුටන් ගසට කුරුල්ලන් ආවේ නැහැ. ඒ නිසා අපි **ටකරමක්** උඩට රඹුටන් දමා කුරුල්ලන්ට රඹුටන් කෑමට වෙන ම තැනක් සාදා දුන්නා. ඒ **ටකරම** අසල ඇති **ටයරය** උඩට වී ගිරවුන් රඹුටන් කෑවා.

- ඡේදයේ අන්තර්ගතය සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ඡේදයේ අන්තර්ගත 'ට' ශබ්දය මුලට යෙදෙන වචනවලට සිසුන්ගේ අවධානය යොමු කරන්න.
- 'ට' අක්ෂරය මුලට යෙදෙන වචන දෙකක් හෝ තුනක් හඬ නගා කියන්න (උදා : ටකය, ටයරය, ටකරම)
- එම වචනවල මුලට යෙදෙන ශබ්දය 'ට' ශබ්දය බව හඳුන්වා දෙන්න.
- සිසුන්ට ද 'ට' ශබ්දය මුලට යෙදෙන වචන පැවසීමට අවස්ථාව දෙන්න.
- එම ශබ්දයට අදාළ අක්ෂර රූපය පෙන්වන්න, එම අක්ෂර රූපය 'ට' බව කියන්න. මේ සඳහා කාඩ්පතක් භාවිත කිරීම ද, හුණු පුවරුවේ ලිවීම ද සිදු කළ යුතු ය.
- විවිධ අකුරුවලින් ආරම්භ වන පින්තූර කාඩ්පත් සිසු කණ්ඩායම්වලට ලබා දෙන්න. ඒ අතර ඇති 'ට' අකුරින් ආරම්භ වන පින්තූර තේරීමට සිසුන්ට පවසන්න.
- අනතුරුව එම අකුර නිවැරදි ව ලියන දිශාව ඊතල මගින් අංක යොදා පෙන්වන්න.

උදා :




- 'ට' අකුර ශබ්ද නගා කියමින් මේසය මත හෝ අවකාශයේ ඇඟිල්ලෙන් ලිවීමට සිසුන් යොමු කරන්න.
- අකුරේ හැඩය කපා දී ඒ මත නිවැරදි දිශාවට ඇඟිල්ල ගෙන යාමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මිලි මීටර් 28 ප්‍රමාණයට සකස් කරන ලද පස්රූල භාවිත කරමින් තිත් මත අකුරු ලිවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- එහිදී නිවැරදි දිශාවට අකුර ලියන ආකාරය හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා පැහැදිලි කරන්න.
- අනතුරුව **අකුරු නුවණ 3** පොතෙහි ඇති අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- පස්රූලේ ලියන ලද අකුරු ශබ්ද නගා කියවීමට සිසුන් යොමු කරන්න.
- එම අකුරු බලා ලිවීම සඳහා **අකුරු නුවණ 3** පොතෙහි ඇති අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- අකුරු හඳුන්වා දීමේ පිළිවෙළට අනුව සියලු ම පිලි රහිත අකුරු 'ට' අක්ෂරය ලිවීමට අනුගමනය කළ ක්‍රියාවලිය ම භාවිත කරමින් ලිවීමට හා කියවීමට යොමු කරන්න.

- අකුරු කියවීමේදී අකුරේ ශබ්දය උච්චාරණය කරන ක්‍රියාකාරකම්වල හැකිතාක් සිසුන් නිරත කරවන්න.

  උදා: දුරකථනයක් දී රිසීවරය කනේ තබා උගත් අකුරේ/අකුරුවල ශබ්ද උච්චාරණය කිරීමට දීම
- අකුරු කිහිපයක් පස්රුලේ බලා ලිවීමෙන් පසු ව එම අකුරු පස්රුලේ අසා ලිවීම සඳහා ද සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අසා ලිවීමේ අභ්‍යාස සඳහා පස්රුල් පොතක් භාවිත කරන්න.
- අකුරු කිහිපයක් හඳුන්වා දීමෙන් පසු ව එම අකුරු සහිත කාඩ්පත් සිසුන්ට ලබා දී නම් කරන ලද අකුර පෙන්වීමට අවස්ථාව දෙන්න.
- මෙය ක්‍රීඩාවක් ආකාරයට සිදු කරන්න.
- මෙලෙස අකුරු කිහිපයක් හඳුන්වා දීමෙන් පසු අකුරේ ශබ්දය නැවත මතක් කරන විවිධ ක්‍රීඩා සහිත ක්‍රියාකාරකම් සංවිධානය කරන්න.

  උදා : 'ට' ශබ්දය ඇති වචන කියන විට නම් කරන ලද ස්ථානයකට දුව ගෙන යෑම
- මෙලෙස පස්රුලේ අකුරු හඳුන්වා දීමේ ක්‍රියාවලිය ම අනුගමනය කරමින් තනිරුලේ ලිවීම සඳහා ද සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- තනිරුලේ තිත් මත අකුරු ලිවීම සඳහාත් අකුරු බලා ලිවීම සඳහාත් අසා ලිවීම සඳහාත් තනිරුල් පොතක් භාවිත කරන්න.

අකුරු ලිවීමේ දුෂ්කරතා දක්වන සිසුන් සඳහා වැලිපිල්ලේ ලිවීම සහ හිදැස්පත්වල ලිවීම වැනි ක්‍රියාකාරකම් යෝග්‍ය පරිදි භාවිත කරන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 18.1 යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් නිර්දිෂ්ට ආරෝහණ අක්ෂර 17 පස්රුලේ ලියයි. | 18.1.1 නියමිත අංග සහිත වීම | ආරෝහණ අක්ෂර දහහතේ සිට පහළොව තෙක් නියමිත අංග සහිත ව ලියයි. | ආරෝහණ අක්ෂර දහහතරේ සිට දොළහ තෙක් නියමිත අංග සහිත ව ලියයි. | ආරෝහණ අක්ෂර එකොළහේ සිට නවය තෙක් නියමිත අංග සහිත ව ලියයි. | ආරෝහණ අක්ෂර අටක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් නියමිත අංග සහිත ව ලියයි. |
| | 18.1.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | ආරෝහණ අක්ෂර දහහතේ සිට පහළොව තෙක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | ආරෝහණ අක්ෂර දහහතරේ සිට දොළහ තෙක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | ආරෝහණ අක්ෂර එකොළහේ සිට නවය තෙක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | ආරෝහණ අක්ෂර අටක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. |
| | 18.1.3 නියමිත ප්‍රමාණයට ලිවීම | ආරෝහණ අක්ෂර දහහතේ සිට පහළොව තෙක් නියමිත ප්‍රමාණයට ලියයි. | ආරෝහණ අක්ෂර දහහතරේ සිට දොළහ තෙක් නියමිත ප්‍රමාණයට ලියයි. | ආරෝහණ අක්ෂර එකොළහේ සිට නවය තෙක් නියමිත ප්‍රමාණයට ලියයි. | ආරෝහණ අක්ෂර අටක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් නියමිත ප්‍රමාණයට ලියයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 18.1.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම | නිවැරදි දිශාව අනුගමනය කරමින් ආරෝහණ අක්ෂර දහහතේ සිට පහළොව තෙක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් ආරෝහණ අක්ෂර දහහතරේ සිට දොළහ තෙක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් ආරෝහණ අක්ෂර එකොළහේ සිට නවය තෙක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් ආරෝහණ අක්ෂර අටක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් ලියයි. |
| 18.2 නිර්දිෂ්ට ආරෝහණ අක්ෂර දහහත නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නගා කියවයි. | 18.2.1 නිවැරදි වීම | අක්ෂර දහහතේ සිට පහළොව තෙක් නිවැරදි ව උච්චාරණය කරයි. | අක්ෂර දහහතරේ සිට දොළහ තෙක් නිවැරදි ව උච්චාරණය කරයි. | අක්ෂර එකොළහේ සිට නවය තෙක් නිවැරදි ව උච්චාරණය කරයි. | අක්ෂර අටක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් නිවැරදි ව උච්චාරණය කරයි. |
| 18.5 යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් නිර්දිෂ්ට ආරෝහණ අක්ෂර දහහත තනිරූලේ ලියයි. | 18.5.1 නියමිත අංග සහිත වීම | ආරෝහණ අක්ෂර දහහතේ සිට පහළොව තෙක් නියමිත අංග සහිත ව ලියයි. | ආරෝහණ අක්ෂර දහහතරේ සිට දොළහ තෙක් නියමිත අංග සහිත ව ලියයි. | ආරෝහණ අක්ෂර එකොළහේ සිට නවය තෙක් නියමිත අංග සහිත ව ලියයි. | ආරෝහණ අක්ෂර අටක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් නියමිත අංග සහිත ව ලියයි. |
| | 18.5.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | ආරෝහණ අක්ෂර දහහතේ සිට පහළොව තෙක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | ආරෝහණ අක්ෂර දහහතරේ සිට දොළහ තෙක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | ආරෝහණ අක්ෂර එකොළහේ සිට නවය තෙක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | ආරෝහණ අක්ෂර අටක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි |
| | 18.5.3 නියමිත ප්‍රමාණයට ලිවීම | ආරෝහණ අක්ෂර දහහතේ සිට පහළොව තෙක් නියමිත ප්‍රමාණයට ලියයි. | ආරෝහණ අක්ෂර දහහතරේ සිට දොළහ තෙක් නියමිත ප්‍රමාණයට ලියයි. | ආරෝහණ අක්ෂර එකොළහේ සිට නවය තෙක් නියමිත ප්‍රමාණයට ලියයි. | ආරෝහණ අක්ෂර අටක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් නියමිත ප්‍රමාණයට ලියයි. |
| | 18.5.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම | නිවැරදි දිශාව අනුගමනය කරමින් ආරෝහණ අක්ෂර දහහතේ සිට පහළොව තෙක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් ආරෝහණ අක්ෂර දහහතරේ සිට දොළහ තෙක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් ආරෝහණ අක්ෂර එකොළහේ සිට නවය තෙක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් ආරෝහණ අක්ෂර අටක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් ලියයි. |

**ක්‍රියාකාරකම 18.3, 18.4, 18.6, 18.7, 18.8 : අකුරු එකතු කර වචන කියවමු; ලියමු.**

- පස්රූලේ 'ට, ච, ව, ඩ' යන අකුරු ලිවීමට සහ කියවීමට හඳුන්වා දීමෙන් අනතුරුව එම අකුරු යෙදුණු වචන පස්රූලේ ලිවීමට සහ කියවීමට සිසුන් යොමු කරන්න.
- මේ ආකාරයට හඳුන්වා දෙන එක් එක් අකුර භාවිත කරමින් අර්ථවත් වචන සාදා පස්රූලේ ලිවීමට සහ කියවීමට සිසුන් යොමු කරන්න.
- වචන බලා ලිවීමේ අභ්‍යාසවලින් පසු අසා ලිවීමේ අභ්‍යාසවල ද සිසුන් නිරත කරවන්න.
- මේ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.
- වචන ලිවීමේදී අකුරු අතර නිසි පරතරය තබමින් ලිවීමට උපදෙස් දෙන්න.
- මේ සඳහා හුණු පුවරුව හෝ ප්‍රදර්ශන පුවරුව හෝ භාවිත කරමින් වචනවල අකුරු අතර නිසි පරතරය තබන ආකාරය ආදර්ශනය කරන්න.
- අනතුරුව **අකුරු නුවණ 3** පොතෙහි ඇති පස්රූලේ තිත් මත වචන ලිවීමේ අභ්‍යාසවලින් පසු වචන බලා ලිවීමේ අභ්‍යාසවල ද සිසුන් නිරත කරවන්න.
- වචන අසා ලිවීම සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.
- අනතුරුව උගත් අකුරු භාවිත කරමින් වචන ගොඩනැගීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- පළමුවන ශ්‍රේණියේ පළමුවන වාරයේදී උගත් මධ්‍ය අක්ෂර සහ මෙලෙස හඳුන්වා දුන් ආරෝහණ අක්ෂර යොදා ගනිමින් අකුරු දෙකේ, තුනේ වචන පස්රූලේ ලිවීම සිදු කරන්න.
- මේ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි නිරත වන අතරතුර සෑම සිසුවෙකු ම කරා ගොස්, ඔවුන් වචන ලියන ආකාරය පිළිබඳ විමසිලිමත් වන්න.
- සෑම සිසුවෙකුගේ ම අභ්‍යාස පොත් පරීක්ෂා කිරීමේදී, අකුරු නිවැරදි ව ලියා තිබේ දැයි විමසිලිමත් විය යුතු අතර, වැරදි ලෙස ලියා ඇති නම් නිවැරදි කර ගැනීමට සහාය වන්න.
- මෙලෙස ඉතුරු ආරෝහණ අක්ෂර ලිවීම හඳුන්වා දීම ද සිදු කරන්න.
- මෙහිදී එම අකුරු හඳුන්වා දීමෙන් අනතුරුව එම අකුරු යෙදුණු වචන ලිවීමට හා කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- වචන කියවීමේදී අකුරු නිවැරදි ව උච්චාරණය කිරීමට සිසුන් පුහුණු කරන්න.
- **වචන උච්චාරණයේදී වචනවල මුල් අකුර, අග අකුර අවධාරණය වන සේ උච්චාරණය කරවන්න.**
- සිසුන් කණ්ඩායම් දෙකකට හෝ සුදුසු පරිදි කුඩා කණ්ඩායම් ලෙස හෝ යුගල වශයෙන් හෝ වෙන් කරන්න.
- එක් කණ්ඩායමක් හෝ යුගලයක අයෙකු හෝ වචන කාඩ්පතක් පෙන්වා නම් කරන ලද කණ්ඩායමකට හෝ යුගලයේ අනෙක් සිසුවාට හෝ එම වචන කාඩ්පත කියවීමට දෙන්න.
- මෙය ක්‍රීඩාවක් ලෙස සිදු කරන්න.
- **උගත් අකුරු භාවිත කර රිද්මයානුකූල වචන සකස් කර සිසුන්ට කියවීමට අවස්ථාව ලබා දෙන්න.**

  උදා:- ⋆ වම, එම, මම ⋆ රසය, බසය, කසය
- උගත් පිලි රහිත අකුරු යෙදුණු වචන, කියවීම් පොතේ ඇති පාඩම්වලින් සොයා කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- වචන කියවීම සඳහා ගමන් ගන්නා මඟතොටදී හෝ යන එන ස්ථානවලදී හෝ දකින්නට ලැබෙන නාම පුවරු කියවීමට උපදෙස් ලබා දෙන්න.
- එසේ දකින්නට ලැබුණු වචන මොනවා දැයි සිසුන්ගෙන් විමසන්න.
- පස්රූලේ වචන ලිවීමට සහ කියවීමට හඳුන්වා දුන් ඉහත ක්‍රමය ම භාවිත කරමින් තනිරූලේ වචන ලිවීම ද කියවීම ද සිදු කරන්න.
- තනිරූලේ වචන බලා ලිවීම සඳහාත් වචන අසා ලිවීම සඳහාත් වචන ගොඩනැගීම සඳහාත් තනිරූල් පොතක් භාවිත කරන්න.
- වචන ගොඩනැගීමේදී පෙර උගත් අක්ෂර සමග වචන ලිවීමටත් කියවීමටත් සිසුන්ට අවස්ථාව දෙන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | **4** | **3** | **2** | **1** |
| 18.3 නිර්දිෂ්ට ආරෝහණ අක්ෂර යෙදුණු පිලි රහිත අකුරු දෙකේ සහ තුනේ වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් පස්රුලේ ලියයි. | 18.3.1 නියමිත අංග සහිත වීම | අකුරුවල නියමිත අංග සහිත ව වචන හතර ම ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන තුනක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන දෙකක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව එක් වචනයක් ලියයි. |
| | 18.3.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන හතර ම ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන තුනක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන දෙකක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව එක් වචනයක් ලියයි. |
| | 18.3.3 නියමිත ප්‍රමාණයට ලිවීම | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන හතර ම ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන තුනක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන දෙකක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව එක් වචනයක් ලියයි. |
| | 18.3.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන හතර ම ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන තුනක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන දෙකක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් එක් වචනයක් ලියයි. |
| | 18.3.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම | අකුරු අතර නිසි පරතරය තබමින් වචන හතර ම ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන තුනක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන දෙකක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් එක් වචනයක් ලියයි. |
| 18.4 පස්රුලේ ලියන ලද වචන හතරක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නඟා කියවයි. | 18.4.1 නිවැරදි වීම | වචන හතර ම නිවැරදි ව උච්චාරණය කරයි. | වචන තුනක් නිවැරදි ව උච්චාරණය කරයි. | වචන දෙකක් නිවැරදි ව උච්චාරණය කරයි. | එක් වචනයක් නිවැරදි ව උච්චාරණය කරයි. |
| 18.6 නිර්දිෂ්ට ආරෝහණ අක්ෂර යෙදුණු පිලි රහිත අකුරු දෙකේ සහ තුනේ වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරුලේ ලියයි. | 18.6.1 නියමිත අංග සහිත වීම | අකුරුවල නියමිත අංග සහිත ව වචන හතර ම ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන තුනක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන දෙකක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව එක් වචනයක් ලියයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 18.6.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන හතර ම ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන තුනක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන දෙකක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව එක් වචනයක් ලියයි. |
| | 18.6.3 නියමිත ප්‍රමාණයට ලිවීම | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන හතර ම ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන තුනක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන දෙකක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව එක් වචනයක් ලියයි. |
| | 18.6.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන හතර ම ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන තුනක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන දෙකක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් එක් වචනයක් ලියයි. |
| | 18.6.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම | අකුරු අතර නිසි පරතරය තබමින් වචන හතර ම ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන තුනක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන දෙකක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් එක් වචනයක් ලියයි. |
| 18.7 නිර්දිෂ්ට ආරෝහණ අක්ෂර සහ මධ්‍ය අක්ෂර යෙදුණු පිලි රහිත අකුරු දෙකේ, තුනේ සහ හතරේ වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරූලේ ලියයි. | 18.7.1 නියමිත අංග සහිත වීම | අකුරුවල නියමිත අංග සහිත ව වචන හයක් හෝ පහක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන හතරක් හෝ තුනක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන දෙකක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව එක් වචනයක් ලියයි. |
| | 18.7.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන හයක් හෝ පහක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන හතරක් හෝ තුනක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන දෙකක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව එක් වචනයක් ලියයි. |
| | 18.7.3 නියමිත ප්‍රමාණයට ලිවීම | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන හයක් හෝ පහක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන හතරක් හෝ තුනක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන දෙකක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව එක් වචනයක් ලියයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 18.7.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන හයක් හෝ පහක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන හතරක් හෝ තුනක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන දෙකක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් එක් වචනයක් ලියයි. |
| | 18.7.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම | අකුරු අතර නිසි පරතරය තබමින් වචන හයක් හෝ පහක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන හතරක් හෝ තුනක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන දෙකක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් එක් වචනයක් ලියයි. |
| 18.8 තනිරූලේ ලියන ලද වචන හයක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නගා කියවයි. | 18.8.1 නිවැරදි වීම | වචන හයක් හෝ පහක් නිවැරදි ව උච්චාරණය කරයි. | වචන හතරක් හෝ තුනක් නිවැරදි ව උච්චාරණය කරයි. | වචන දෙකක් නිවැරදි ව උච්චාරණය කරයි. | එක් වචනයක් නිවැරදි ව උච්චාරණය කරයි. |

විෂය නිර්දේශයේ උද්ධෘතය

| සමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | ඇගයීම් නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා<br>ශා.භා.කා | 19. කියවීමේදී හා ලිවීමේදී අවරෝහණ අක්ෂර නිවැරදි ව භාවිත කරයි. | ■ වචනයක මුල් ශබ්දය<br>■ වචනයක අග ශබ්දය<br>■ සිංහල අක්ෂර (මධ්‍ය අක්ෂර) ග,හ,ය,ස,ප,න,ත,ක,ග<br>■ සිංහල අක්ෂර (ආරෝහණ අක්ෂර) ට,ව,ච,ඩ,ඵ,ඒ,ම, ඹ,ඕ,බ,ඖ,ර,ඊ,ජ, ණ,ඞ,එ<br>■ සිංහල අක්ෂර (අවරෝහණ අක්ෂර) ල,ළ,උ,ඌ,ද,අ,ආ,ඇ, ඈ,ඉ,ඳ<br>■ නිවැරදි උච්චාරණය<br>■ කියවීම<br>■ ලිවීම<br>■ ලිවීමට සූදානම (නිවැරදි ව අසුන් ගැනීම, පොත තබා ගැනීම, පැන්සල ඇල්ලීම)<br>■ පස්රූල<br>■ තනිරූල<br>■ ලිවීමේ යාන්ත්‍රික කුසලතා (අකුරක නියමිත අංග, හැඩය, ප්‍රමාණය, දිශාව හා වචනයක අකුරු අතර පරතරය)<br>■ උගත් අකුරුවලින් සමන්විත වචන<br>■ අක්ෂර සංයෝජනය<br>■ පිලි රහිත අකුරු දෙකේ වචන<br>■ පිලි රහිත අකුරු තුනේ වචන<br>■ පිලි රහිත අකුරු හතරේ වචන | ■ සවන් දීම<br>■ කතා කිරීම<br>■ කියවීම<br>■ ලිවීම | 19.1 යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් නිර්දිෂ්ට අවරෝහණ අක්ෂර එකොළහ පස්රූලේ ලියයි. | 19.1.1 නියමිත අංග සහිත වීම<br>19.1.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>19.1.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>19.1.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම |
| | | | | 19.2 නිර්දිෂ්ට අවරෝහණ අක්ෂර එකොළහ නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නඟා කියවයි. | 19.2.1 නිවැරදි වීම |
| | | | | 19.3 නිර්දිෂ්ට අවරෝහණ අක්ෂර යෙදුණු පිලි රහිත අකුරු දෙකේ සහ තුනේ වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් පස්රූලේ ලියයි. | 19.3.1 නියමිත අංග සහිත වීම<br>19.3.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>19.3.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>19.3.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම<br>19.3.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 19.4 පස්රූලේ ලියන ලද වචන හතර නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නගා කියවයි. | 19.4.1 නිවැරදි වීම |
| | | | | 19.5 යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් නිර්දිෂ්ට අවරෝහණ අක්ෂර එකොළහ තනිරූලේ ලියයි. | 19.5.1 නියමිත අංග සහිත වීම<br>19.5.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>19.5.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>19.5.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම |
| | | | | 19.6 නිර්දිෂ්ට අවරෝහණ අක්ෂර යෙදුණු පිලි රහිත අකුරු දෙකේ සහ තුනේ වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරූලේ ලියයි. | 19.6.1 නියමිත අංග සහිත වීම<br>19.6.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>19.6.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>19.6.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම<br>19.6.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 19.7 නිර්දිෂ්ට මධ්‍ය අක්ෂර, ආරෝහණ අක්ෂර සහ අවරෝහණ අක්ෂර යෙදුණු පිලි රහිත අකුරු දෙකේ, තුනේ සහ හතරේ වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරූලේ ලියයි. | 19.7.1 නියමිත අංග සහිත වීම<br>19.7.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>19.7.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>19.7.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම<br>19.7.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම |
| | | | | 19.8 තනිරූලේ ලියන ලද වචන හය නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නඟා කියවයි. | 19.8.1 නිවැරදි වීම |

**ක්‍රියාකාරකම 19.1, 19.2, 19.5 : අකුරු කියවමු; ලියමු.**

**කාලය** : පැය 15යි.

**ඉගෙනුම් සම්පත්** : අකුරු කාඩ්, වචන කාඩ්


**වාංමාලාව** : අකුරු, අක්ෂර, පස්රූල, තනිරූල, ඉහළ, මැද, පහළ, ආරම්භය, අවසානය, අංග, දිශාව, ප්‍රමාණය, හැඩය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

- ආරෝහණ අක්ෂර පස්රූලේ සහ තනිරූලේ ලිවීමට ඉගැන්වූ ක්‍රමය ම අනුගමනය කරමින් පහත සඳහන් අවරෝහණ අක්ෂර 11 ද හඳුන්වා දෙන්න.
- අවරෝහණ අක්ෂර යනු, පස්රූල් අතර දෙවන සහ පස්වන රූල් අතර ලියවෙන අක්ෂර හෙවත් හතරවන රූලෙන් පහළට ලියවෙන අක්ෂරයි.
- පස්රූලේ තිත් මත අකුරු ලිවීම සඳහා **අකුරු නුවණ 3** පොතෙහි ඇති අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- පස්රූලේ අකුරු බලා ලිවීම සඳහා **අකුරු නුවණ 3** පොතෙහි ඇති අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- අකුරු අසා ලිවීම සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.
- තනිරූලේ තිත් මත අකුරු ලිවීම සඳහාත් අකුරු බලා ලිවීම සඳහාත් අකුරු අසා ලිවීම සඳහාත් තනිරූල් පොතක් භාවිත කරන්න.

අකුරු ලිවීමේ දුෂ්කරතා දක්වන සිසුන් සඳහා වැලිපිල්ලේ ලිවීම සහ හිදැස්පත්වල ලිවීම වැනි ක්‍රියාකාරකම් යෝග්‍ය පරිදි භාවිත කරන්න.

**අවරෝහණ අක්ෂර (11)**




**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 19.1 යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් නිර්දිෂ්ට අවරෝහණ අක්ෂර එකොළහ පස්රූලේ ලියයි. | 19.1.1 නියමිත අංග සහිත වීම | අවරෝහණ අක්ෂර එකොළහේ සිට නවය තෙක් නියමිත අංග සහිත ව ලියයි. | අවරෝහණ අක්ෂර අටේ සිට හය තෙක් නියමිත අංග සහිත ව ලියයි. | අවරෝහණ අක්ෂර පහක් හෝ හතරක් නියමිත අංග සහිත ව ලියයි. | අවරෝහණ අක්ෂර තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් නියමිත අංග සහිත ව ලියයි. |
| | 19.1.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | අවරෝහණ අක්ෂර එකොළහේ සිට නවය තෙක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | අවරෝහණ අක්ෂර අටේ සිට හය තෙක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | අවරෝහණ අක්ෂර පහක් හෝ හතරක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | අවරෝහණ අක්ෂර තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. |
| | 19.1.3 නියමිත ප්‍රමාණයට ලිවීම | අවරෝහණ අක්ෂර එකොළහේ සිට නවය තෙක් නියමිත ප්‍රමාණයට ලියයි. | අවරෝහණ අක්ෂර අටේ සිට හය තෙක් නියමිත ප්‍රමාණයට ලියයි. | අවරෝහණ අක්ෂර පහක් හෝ හතරක් නියමිත ප්‍රමාණයට ලියයි. | අවරෝහණ අක්ෂර තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් නියමිත ප්‍රමාණයට ලියයි. |
| | 19.1.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම | නිවැරදි දිශාව අනුගමනය කරමින් අවරෝහණ අක්ෂර එකොළහේ සිට නවය තෙක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් අවරෝහණ අක්ෂර අටේ සිට හය තෙක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් අවරෝහණ අක්ෂර පහක් හෝ හතරක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් අවරෝහණ අක්ෂර තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් ලියයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 19.2 නිර්දිෂ්ට අවරෝහණ අක්ෂර එකොළහ නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නඟා කියවයි. | 19.2.1 නිවැරදි වීම | අක්ෂර එකොළහේ සිට නවය තෙක් නිවැරදි ව උච්චාරණය කරයි. | අක්ෂර අටේ සිට හය තෙක් නිවැරදි ව උච්චාරණය කරයි. | අක්ෂර පහක් හෝ හතරක් නිවැරදි ව උච්චාරණය කරයි. | අක්ෂර තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් නිවැරදි ව උච්චාරණය කරයි. |
| 19.5 යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් නිර්දිෂ්ට අවරෝහණ අක්ෂර එකොළහ තනිරූලේ ලියයි. | 19.5.1 නියමිත අංග සහිත වීම | අවරෝහණ අක්ෂර එකොළහේ සිට නවය තෙක් නියමිත අංග සහිත ව ලියයි. | අවරෝහණ අක්ෂර අටේ සිට හය තෙක් නියමිත අංග සහිත ව ලියයි. | අවරෝහණ අක්ෂර පහක් හෝ හතරක් නියමිත අංග සහිත ව ලියයි. | අවරෝහණ අක්ෂර තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් නියමිත අංග සහිත ව ලියයි. |
| | 19.5.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | අවරෝහණ අක්ෂර එකොළහේ සිට නවය තෙක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | අවරෝහණ අක්ෂර අටේ සිට හය තෙක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | අවරෝහණ අක්ෂර පහක් හෝ හතරක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | අවරෝහණ අක්ෂර තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. |
| | 19.5.3 නියමිත ප්‍රමාණයට ලිවීම | අවරෝහණ අක්ෂර එකොළහේ සිට නවය තෙක් නියමිත ප්‍රමාණයට ලියයි. | අවරෝහණ අක්ෂර අටේ සිට හය තෙක් නියමිත ප්‍රමාණයට ලියයි. | අවරෝහණ අක්ෂර පහක් හෝ හතරක් නියමිත ප්‍රමාණයට ලියයි. | අවරෝහණ අක්ෂර තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් නියමිත ප්‍රමාණයට ලියයි. |
| | 19.5.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම | නිවැරදි දිශාව අනුගමනය කරමින් අවරෝහණ අක්ෂර එකොළහේ සිට නවය තෙක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් අවරෝහණ අක්ෂර අටේ සිට හය තෙක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් අවරෝහණ අක්ෂර පහක් හෝ හතරක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් අවරෝහණ අක්ෂර තුනක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් ලියයි. |

**ක්‍රියාකාරකම 19.3, 19.4, 19.6, 19.7, 19.8 : අකුරු එකතු කර වචන කියවමු; ලියමු.**

- පස්රූලේ 'ල, ළ, උ, ඌ, ද' යන අකුරු ලිවීමට සහ කියවීමට හඳුන්වා දීමෙන් අනතුරුව එම අකුරු යෙදුණු වචන පස්රූලේ ලිවීමට සහ කියවීමට සිසුන් යොමු කරන්න.
- මේ ආකාරයට හඳුන්වා දෙන එක් එක් අකුර භාවිත කරමින් අර්ථවත් වචන සාදා පස්රූලේ ලිවීමට සහ කියවීමට සිසුන් යොමු කරන්න.
- වචන බලා ලිවීමේ අභ්‍යාසවලින් පසු අසා ලිවීමේ අභ්‍යාසවල ද සිසුන් නිරත කරවන්න.
- මේ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.
- වචන ලිවීමේදී අකුරු අතර නිසි පරතරය තබමින් ලිවීමට උපදෙස් දෙන්න.
- මේ සඳහා හුණු පුවරුව හෝ ප්‍රදර්ශන පුවරුව හෝ භාවිත කරමින් වචනවල අකුරු අතර නිසි පරතරය තබන ආකාරය ආදර්ශනය කරන්න.
- අනතුරුව **අකුරු නුවණ 3** පොතෙහි ඇති පස්රූලේ තිත් මත වචන ලිවීමේ අභ්‍යාසවලින් පසු බලා ලිවීමේ අභ්‍යාසවල ද සිසුන් නිරත කරන්න.
- වචන අසා ලිවීම සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.
- උගත් අකුරු භාවිත කරමින් වචන ගොඩනැඟීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- පළමුවන ශ්‍රේණියේ මෙතෙක් උගත් අකුරු යොදා අකුරු දෙකේ, තුනේ වචන පස්රූලේ ලිවීම සිදු කරන්න.
- මේ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි නිරත වන අතරතුර සෑම සිසුවකු ම කරා ගොස්, ඔවුන් වචන ලියන ආකාරය පිළිබඳ විමසිලිමත් වන්න.
- සෑම සිසුවෙකුගේ ම අභ්‍යාස පොත් පරීක්ෂා කිරීමේදී, අකුරු නිවැරදි ව ලියා තිබේ දැයි විමසිලිමත් විය යුතු අතර, වැරදි ලෙස ලියා ඇති නම් නිවැරදි කර ගැනීමට සහාය වන්න.
- මෙලෙස ඉතුරු අවරෝහණ අක්ෂර ලිවීම හඳුන්වා දීම ද සිදු කරන්න.
- අවරෝහණ අක්ෂර හඳුන්වා දීමෙන් අනතුරුව එම අකුරු යෙදුණු වචන ලිවීමට හා කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- වචන කියවීමේදී අකුරු නිවැරදි ව උච්චාරණය කිරීමට සිසුන් පුහුණු කරන්න.
- **වචන උච්චාරණයේදී වචනවල මුල් අකුර, අග අකුර අවධාරණය වන සේ උච්චාරණය කරවන්න.**
- සිසුන් කණ්ඩායම් දෙකකට හෝ සුදුසු පරිදි කුඩා කණ්ඩායම් ලෙස හෝ යුගල වශයෙන් හෝ වෙන් කරන්න.
- එක් කණ්ඩායමක හෝ යුගලයක අයෙකු හෝ වචන කාඩ්පතක් පෙන්වා නම් කරන ලද කණ්ඩායමකට හෝ යුගලයේ අනෙක් සිසුවාට හෝ එම වචන කාඩ්පත කියවීමට දෙන්න.
- මෙය ක්‍රීඩාවක් ලෙස සිදු කරන්න.
- **උගත් අකුරු භාවිත කර රිද්මයානුකූල වචන සකස් කර සිසුන්ට කියවීමට අවස්ථාව ලබා දෙන්න.**
  උදා:- ⋆ උල, අල, මල ⋆ උර, දර, අර, ඉර
- උගත් පිලි රහිත අකුරු යෙදුණු වචන, කියවීම් පොතේ ඇති පාඩම්වලින් සොයා කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- වචන කියවීම සඳහා ගමන් ගන්නා මඟතොටදී හෝ යන එන ස්ථානවලදී හෝ දකින්නට ලැබෙන නාම පුවරු කියවීමට උපදෙස් ලබා දෙන්න.
- එසේ දකින්නට ලැබුණු වචන මොනවා දැයි සිසුන්ගෙන් විමසන්න.
- පස්රූලේ වචන ලිවීමට සහ කියවීමට හඳුන්වා දුන් ඉහත ක්‍රමය ම අනුගමනය කරමින් තනිරූලේ වචන ලිවීම ද කියවීම ද සිදු කරන්න.
- තනිරූලේ වචන බලා ලිවීම සඳහාත් වචන අසා ලිවීම සඳහාත් වචන ගොඩනැඟීම සඳහාත් තනිරූල් පොතක් භාවිත කරන්න.
- වචන ගොඩනැඟීමේදී පෙර උගත් අක්ෂර සමග වචන ලිවීමටත් කියවීමටත් සිසුන්ට අවස්ථාව දෙන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 19.3 නිර්දිෂ්ට අවරෝහණ අක්ෂර යෙදුණු පිලි රහිත අකුරු දෙකේ සහ තුනේ වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් පස්රුලේ ලියයි. | 19.3.1 නියමිත අංග සහිත වීම | අකුරුවල නියමිත අංග සහිත ව වචන හතර ම ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන තුනක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන දෙකක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව එක් වචනයක් ලියයි. |
| | 19.3.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන හතර ම ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන තුනක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන දෙකක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව එක් වචනයක් ලියයි. |
| | 19.3.3 නියමිත ප්‍රමාණයට ලිවීම | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන හතර ම ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන තුනක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන දෙකක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව එක් වචනයක් ලියයි. |
| | 19.3.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන හතර ම ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන තුනක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන දෙකක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් එක් වචනයක් ලියයි. |
| | 19.3.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම | අකුරු අතර නිසි පරතරය තබමින් වචන හතර ම ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන තුනක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන දෙකක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් එක් වචනයක් ලියයි. |
| 19.4 පස්රුලේ ලියන ලද වචන හතර නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නගා කියවයි. | 19.4.1 නිවැරදි වීම | වචන හතර ම නිවැරදි ව උච්චාරණය කරයි. | වචන තුනක් නිවැරදි ව උච්චාරණය කරයි. | වචන දෙකක් නිවැරදි ව උච්චාරණය කරයි. | එක් වචනයක් නිවැරදි ව උච්චාරණය කරයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 19.6 නිර්දිෂ්ට අවරෝහණ අක්ෂර යෙදුණු පිලි රහිත අකුරු දෙකේ සහ තුනේ වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරුලේ ලියයි. | 19.6.1 නියමිත අංග සහිත වීම | අකුරුවල නියමිත අංග සහිත ව වචන හතර ම ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන තුනක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන දෙකක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව එක් වචනයක් ලියයි. |
| | 19.6.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන හතර ම ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන තුනක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන දෙකක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව එක් වචනයක් ලියයි. |
| | 19.6.3 නියමිත ප්‍රමාණයට ලිවීම | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන හතර ම ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන තුනක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන දෙකක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව එක් වචනයක් ලියයි. |
| | 19.6.4 නිවැරදි දිශාව අනුග මනය කිරීම | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන හතර ම ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන තුනක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන දෙකක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් එක් වචනයක් ලියයි. |
| | 19.6.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම | අකුරු අතර නිසි පරතරය තබමින් වචන හතර ම ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන තුනක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන දෙකක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් එක් වචනයක් ලියයි. |
| 19.7 නිර්දිෂ්ට මධ්‍ය අක්ෂර, ආරෝහණ අක්ෂර සහ අවරෝහණ අක්ෂර යෙදුණු පිලි රහිත අකුරු දෙකේ, තුනේ සහ හතරේ වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරුලේ ලියයි. | 19.7.1 නියමිත අංග සහිත වීම | අකුරුවල නියමිත අංග සහිත ව වචන හයක් හෝ පහක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන හතරක් හෝ තුනක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන දෙකක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව එක් වචනයක් ලියයි. |
| | 19.7.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන හයක් හෝ පහක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන හතරක් හෝ තුනක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන දෙකක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව එක් වචනයක් ලියයි. |
| | 19.7.3 නියමිත ප්‍රමාණයට ලිවීම | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන හයක් හෝ පහක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන හතරක් හෝ තුනක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන දෙකක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව එක් වචනයක් ලියයි. |
| | 19.7.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන හයක් හෝ පහක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන හතරක් හෝ තුනක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන දෙකක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් එක් වචනයක් ලියයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 19.7.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම | අකුරු අතර නිසි පරතරය තබමින් වචන හයක් හෝ පහක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන හතරක් හෝ තුනක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන දෙකක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් එක් වචනයක් ලියයි. |
| 19.8 තනිරූලේ ලියන ලද වචන හය නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නඟා කියවයි. | 19.8.1 නිවැරදි වීම | වචන හයක් හෝ පහක් නිවැරදි ව උච්චාරණය කරයි. | වචන හතරක් හෝ තුනක් නිවැරදි ව උච්චාරණය කරයි. | වචන දෙකක් නිවැරදි ව උච්චාරණය කරයි. | එක් වචනයක් නිවැරදි ව උච්චාරණය කරයි. |

**විෂය නිර්දේශයේ උද්ධෘතය**

| සමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | ඇගයීම් නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා<br>ශා.භා.කා | 20. කියවීමේදී හා ලිවීමේදී හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු නිවැරදි ව භාවිත කරයි. | ■ මධ්‍ය අක්ෂර<br>■ ආරෝහණ අක්ෂර<br>■ අවරෝහණ අක්ෂර<br>■ හල් කිරීමේ ලකුණ (කොඩිය, රැහැන)<br>■ නිවැරදි උච්චාරණය<br>■ පස්රූල<br>■ තනිරූල<br>■ කියවීම<br>■ ලිවීම<br>■ ලිවීමේ යාන්ත්‍රික කුසලතා (අකුරක නියමිත අංග, හැඩය, ප්‍රමාණය, දිශාව හා වචනයක අකුරු අතර පරතරය) | ■ සවන් දීම<br>■ කතා කිරීම<br>■ කියවීම<br>■ ලිවීම | 20.1 නිවැරදි ව හල් කිරීමේ ලකුණ (කොඩිය) යොදා අකුරු පහක් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් පස්රූලේ ලියයි. | 20.1.1 නියමිත අංග සහිත වීම<br>20.1.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>20.1.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>20.1.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම |
| | | | | 20.2 නිවැරදි ව හල් කිරීමේ ලකුණ (රැහැන) යොදා අකුරු පහක් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් පස්රූලේ ලියයි. | 20.2.1 නියමිත අංග සහිත වීම<br>20.2.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>20.2.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>20.2.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ■ උගත් අකුරුවලින් සමන්විත වචන<br>■ අක්ෂර සංයෝජනය<br>■ හල් කිරීමේ ලකුණ සහිත දෙකේ වචන<br>■ හල් කිරීමේ ලකුණ සහිත අකුරු තුනේ වචන | | 20.3<br>හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු දෙකේ සහ තුනේ වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් පස්රුලේ ලියයි. | 20.3.1 නියමිත අංග සහිත වීම<br>20.3.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>20.3.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>20.3.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම<br>20.3.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම |
| | | | | 20.4<br>පස්රුලේ ලියන ලද හල් කිරීමේ ලකුණ යෙදුණු වචන හතරක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නඟා කියවයි. | 20.4.1 නිවැරදි වීම |
| | | | | 20.5<br>නිවැරදි ව හල් කිරීමේ ලකුණ (කොඩිය) යොදා අකුරු පහක් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරුලේ ලියයි. | 20.5.1 නියමිත අංග සහිත වීම<br>20.5.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>20.5.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>20.5.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම |
| | | | | 20.6<br>නිවැරදි ව හල් කිරීමේ ලකුණ (රැහැන) යොදා අකුරු පහක් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරුලේ ලියයි. | 20.6.1 නියමිත අංග සහිත වීම<br>20.6.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>20.6.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>20.6.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම |
| | | | | 20.7<br>හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු දෙකේ සහ තුනේ වචන දෙක බැගින් තනිරුලේ යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් ලියයි. | 20.7.1 නියමිත අංග සහිත වීම<br>20.7.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>20.7.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>20.7.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම<br>20.7.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 20.8 තනිරූලේ ලියන ලද හල් කිරීමේ ලකුණ යෙදුණු වචන හතරක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නඟා කියවයි. | 20.8.1 නිවැරදි වීම |

**හල් කිරීමේ ලකුණ හඳුන්වා දීම සහ භාවිතය**

- හල් කිරීමේ ලකුණ භාවිත කරන ආකාරය හඳුන්වා දීම ද පළමුවන ශ්‍රේණිය සඳහා නියමිත ය. ඒ අනුව පළමුවන ශ්‍රේණියේ දෙවන වාරයේදී මෙම අද්දැකීම සිසුන්ට ලබා දීම සිදු කරනු ලබයි.
- කියවීමේදී හා ලිවීමේදී හල් කිරීමේ ලකුණේ භාවිතය ප්‍රදර්ශනය කිරීම සඳහා පළමුවන ශ්‍රේණියේදී උගත් අක්ෂර සඳහා හල් ලකුණ යොදා පස්රූලේ සහ තනිරූලේ ලිවීම හා කියවීමත් එම අකුරු යෙදුණු වචන පස්රූලේ සහ තනිරූලේ ලිවීමත්, කියවීමත් සිදු කළ යුතු ය.
- කියවීමේදී හා ලිවීමේදී හල් කිරීමේ ලකුණේ භාවිතය හඳුන්වා දීමේදී එම අකුරු හුණු පුවරුවේ ලියා ප්‍රදර්ශනය කිරීමත් හල් ලකුණ යෙදුණු වචන හුණු පුවරුවේ ලියා ප්‍රදර්ශනය කිරීමත් එම වචන නිවැරදි ව උච්චාරණය කරන ආකාරය පැහැදිලි කර දීමත් සිදු කළ යුතු ය.
- හල් කිරීමේ ලකුණ, කොඩිය සහ රැහැන ලෙස ස්වරූප දෙකකින් හඳුන්වා දෙනු ලබයි.
- හල් කිරීමේ ලකුණ සහිත අකුරුවල ශබ්දය සහ එහි ස්වරූපය හඳුන්වා දීම සඳහා ක්‍රියාකාරකම් සිදු කිරීමෙන් අනතුරුව එම අකුරු පස්රූලේ බලා ලිවීමත් අසා ලිවීමත් සිදු කළ යුතු ය.
- ඉන් අනතුරුව හල් කිරීමේ ලකුණ සහිත වචන පස්රූලේ බලා ලිවීමත් අසා ලිවීමත් වචන ගොඩනඟා ලිවීමත් සිදු කළ යුතු ය.
- මෙවැනි ලිඛිත ක්‍රියාකාරකම් ආරම්භයේදී මෙන් ම එම ක්‍රියාකාරකම් අතරතුරදී සහ අවසානයේදී ශබ්ද නඟා කියවීමේ අභ්‍යාසවල ද සිසුන් නිරත කරවිය යුතු ය.
- මෙම ක්‍රමවේදයට ම හල් කිරීමේ ලකුණ යොදා තනිරූලේ ලිවීමටත් කියවීමටත් පුහුණු කිරීම වැදගත් වේ.

**ක්‍රියාකාරකම 20.1, 20.2, 20.3, 20.4, 20.5, 20.6, 20.7, 20.8 :**

**හල් කිරීමේ ලකුණ (කොඩිය) යොදා අකුරු, වචන ලියමු; කියවමු.**

**කාලය** : පැය 10යි.

**ඉගෙනුම් සම්පත්** : අකුරු කාඩ්, වචන කාඩ්

**වාංමාලාව** : හල් කිරීමේ ලකුණ, කොඩිය, රැහැන

**පියවර 01**

- පහත කවිය සිසුන් සමග කිහිප වරක් ගායනා කරන්න.

අකුරුවලට යොදන
කොඩියක් සේ පෙනෙන
හල් ලකුණේ හැඩය
යොදමු නියම ලෙසට

අකුරුවලට යොදන
රැහැන නමින් කියන
හල් ලකුණේ හැඩය
යොදමු නියම ලෙසට

- මෙම කවි පෙළෙන් පසු හල් කිරීමේ ලකුණේ ස්වරූපය ඉස්මතු වන පරිදි සාකච්ඡා කරන්න.
- ඒ අනුව හල් කිරීමේ ලකුණ ස්වරූප දෙකකින් යුක්ත බව පැහැදිලි කරන්න.
- එම ස්වරූප දෙක හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා දක්වන්න.

1. කොඩිය     2. රැහැන 

**පියවර 02**

- පහත කවිය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

**මල්**

සල් මල් ගස්
රත් මල් ගස්
කහ මල් ගස්
ලස්සන ගස්

සමන් එන්න
මල් බලන්න
ලස්සන මල්
අරන් යන්න

- මෙම කවිය සිසුන් සමග දෙවතාවක් පමණ ගායනා කරන්න.
- කවියේ හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු සහිත වචන මොනවා දැයි සිසුන්ගෙන් විමසන්න.
- එම කවියේ හල් කිරීමේ ලකුණ යෙදුණු වචනවල හල් අකුරේ ශබ්දය සුවිශේෂ කර අවධාරණය කරන්න.
- එම අකුරු උච්චාරණය කිරීමේදී ඇති වන ශබ්දමය වෙනස පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- සිසුන් සමග සාකච්ඡා කරමින් හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරු යටින් ඉරක් හෝ අකුරු වටා රවුමක් අඳින්න.

**පියවර 03**

- පළමුවන ශ්‍රේණියේදී උගත් අකුරු සඳහා හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යොදා පස්රූලේ නිවැරදි ව ලියන ආකාරය හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ආදර්ශනය කර පෙන්වන්න.

- එම එක් එක් අකුර උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන්ට ද එම අකුරු කිහිප වරක් උච්චාරණය කර පුහුණු වීමට අවස්ථාව ලබා දෙන්න.
- එම එක් එක් අකුර හිස් අවකාශයේ ලියා පෙන්වීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- **අකුරු නුවණ 3** පොතෙහි හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරු පස්රුලේ තිත් මත ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- **අකුරු නුවණ 3** පොතෙහි හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරු පස්රුලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරු පස්රුලේ අසා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- මේ සඳහා පස්රුල් පොතක් භාවිත කරන්න.

**පියවර 04**

- හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරු දෙකේ වචන, බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- මේ සඳහා පස්රුල් පොතක් භාවිත කරන්න.

**පියවර 05**

- හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරු එකතු කර වචන ගොඩනගා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- මෙහිදී ඔබගේ නිර්මාණාත්මක කුසලතා භාවිත කර කාඩ්පත්වලින් වචන ගොඩනැගීමේ අභ්‍යාසවල, ප්‍රහේලිකා සම්පූර්ණ කිරීමේ අභ්‍යාසවල, අකුරු මාරු කර දී වචන ගොඩනැගීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- මෙවැනි වචන ගොඩනැගීමේ අභ්‍යාස කිහිපයක් නිර්මාණය කර ලබා දී, හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරු නිවැරදි ව භාවිත කරන ආකාරය සංවර්ධනය කරන්න.

**පියවර 06**

- හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරු දෙකේ වචන කියවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 07**

- හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරු දෙකේ වචන අසා ලිවීමේ අභ්‍යාස සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මේ සඳහා පස්රුල් පොතක් භාවිත කරන්න.

**පියවර 08**

- හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරු තුනේ වචන කියවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 09**

- හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරු තුනේ වචන බලා ලිවීමේ අභ්‍යාස සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මේ සඳහා පස්රුල් පොතක් භාවිත කරන්න.

**පියවර 10**

- හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරු තුනේ වචන අසා ලිවීමේ අභ්‍යාස සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඒ සඳහා පස්රුල් පොතක් භාවිත කරන්න.

**පියවර 11**

- පළමුවන ශ්‍රේණියේදී උගත් අකුරු සඳහා හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යොදා තනිරුලේ නිවැරදි ව ලියන ආකාරය හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ආදර්ශනය කර පෙන්වන්න.
- එම එක් එක් අකුර උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- එම අකුරු කිහිප වරක් උච්චාරණය කර සිසුන්ට පුහුණු වීමට අවස්ථාව ලබා දෙන්න.
- එම එක් එක් අකුර, හිස් අවකාශයේ ලියා පෙන්වීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරු තනිරුලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරු තනිරුලේ අසා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.

**පියවර 12**

- හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරු දෙකේ වචන බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- මේ සඳහා තනිරුල් පොතක් භාවිත කරන්න.

**පියවර 13**

- හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරු දෙකේ වචන අසා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- මේ සඳහා තනිරුල් පොතක් භාවිත කරන්න.

**පියවර 14**

- හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරු එකතු කර වචන ගොඩනඟා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- මෙහිදී ඔබගේ නිර්මාණාත්මක කුසලතා භාවිත කර කාඩ්පත්වලින් වචන ගොඩනැඟීම, අභ්‍යාසවල, ප්‍රහේලිකා සම්පූර්ණ කිරීම, අකුරු මාරු කර දී වචන ගොඩනැඟීම වැනි අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- මෙවැනි වචන ගොඩනැඟීමේ අභ්‍යාස කිහිපයක් නිර්මාණය කර ලබා දී, හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරු නිවැරදි ව භාවිත කරන ආකාරය සංවර්ධනය කරන්න.

**පියවර 15**

- හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරු තුනේ වචන කියවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 16**

- හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරු තුනේ වචන බලා ලිවීමේ අභ්‍යාස සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මේ සඳහා තනිරුල් පොතක් භාවිත කරන්න.

**පියවර 17**

- හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරු තුනේ වචන අසා ලිවීමේ අභ්‍යාස සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මේ සඳහා තනිරුල් පොතක් භාවිත කරන්න.

**ක්‍රියාකාරකම 20.1, 20.2, 20.3, 20.4, 20.5, 20.6, 20.7, 20.8 :**


**හල් කිරීමේ ලකුණ (රැහැන) යොදා අකුරු, වචන ලියමු; කියවමු.**

### පියවර 01

- හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය යෙදුණු අකුරක් සහ රැහැන යෙදුණු අකුරක් හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියන්න.
- එම අකුරු දෙක උච්චාරණය කර පෙන්වන්න.
- මෙලෙස හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය සහ රැහැන යෙදුණු අකුරු කිහිපයක් හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියන්න.
- එම අකුරු සිසුන් සමග එක් ව උච්චාරණය කරන්න.
- ඒ අනුව හල් කිරීමේ ලකුණ ලෙස කොඩිය සහ රැහැන යෙදුණු අකුරු උච්චාරණය කරන විට ඇති වන ශබ්දමය ස්වරූපය පිළිබඳ සාකච්ඡා කරන්න.

### පියවර 02

- පහත වචන සහිත කාඩ්පත් වෙන වෙන ම සකස් කර ගන්න.




- එම එක් එක් කාඩ්පත සිසුන්ට පෙන්වන්න.
- එක් එක් වචනය සිසුන් සමග එක් ව ශබ්ද නඟා කියවන්න.
- මෙහිදී රැහැන නොමැති වචනය මුලින් පෙන්වා ශබ්ද නඟා කියවන්න.
- දෙවනුව එම වචනයට රැහැන යෙදූ වචනය පෙන්වා ශබ්ද නඟා කියවන්න.
- ඉන් අනතුරුව එම වචන දෙක එක ළඟ ශබ්ද නඟා කියවන්න.
- වචන දෙකෙහි ඇති ශබ්දමය වෙනස සිසුන්ට අවධාරණය කරන්න.
- මෙලෙස සියලු ම වචන භාවිත කර ඉහත ආකාරයට පැහැදිලි කිරීම් සිදු කරන්න.
- එම වචනවල හල් කිරීමේ ලකුණ සඳහා රැහැන යොදා ඇති ආකාරය සරල ව පැහැදිලි කරන්න.

### පියවර 03

- හල් කිරීමේ ලකුණ ලෙස රැහැන යෙදුණු අකුරු පස්රුලේ ලියන ආකාරය හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා ආදර්ශනය කරන්න.
- ඒ අනුව **අකුරු නුවණ 3** පොතෙහි ඇති රැහැන යෙදුණු අකුරු තිත් මත ලිවීමේ සහ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.

**පියවර 04**

- පළමුවන ශ්‍රේණියේදී උගත් අකුරු සඳහා හල් කිරීමේ ලකුණ ලෙස රැහැන යොදා පස්රූලේ නිවැරදි ව ලියන ආකාරය හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ආදර්ශනය කර පෙන්වන්න.
- එම එක් එක් අකුර උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- එම අකුරු කිහිප වරක් උච්චාරණය කර සිසුන්ට පුහුණු වීමට අවස්ථාව ලබා දෙන්න.
- එම එක් එක් අකුර, හිස් අවකාශයේ ලියා පෙන්වීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- හල් කිරීමේ ලකුණ ලෙස රැහැන යෙදුණු අකුරු පස්රූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- හල් කිරීමේ ලකුණ ලෙස රැහැන යෙදුණු අකුරු පස්රූලේ අසා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- රැහැන යෙදෙන අකුරු අසා ලිවීම සඳහා යොමු කරන්න.
- මේ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.

**පියවර 05**

- හල් කිරීමේ ලකුණ ලෙස රැහැන යෙදුණු අකුරු දෙකේ වචන පස්රූලේ ලියන ආකාරය පිළිබඳ හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා ආදර්ශනය කරන්න.
- එම වචන පස්රූලේ ලියන ආකාරය අවධාරණය කරන්න.
- ලියන ලද වචන කියවීම සඳහා යොමු කරන්න.

**පියවර 06**

- රැහැන යෙදුණු අකුරු දෙකේ වචන අසා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- මේ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.

**පියවර 07**

- හල් කිරීමේ ලකුණ ලෙස රැහැන යෙදුණු අකුරු එකතු කර වචන ගොඩනගා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- මෙහිදී ඔබගේ නිර්මාණාත්මක කුසලතා භාවිත කර කාඩ්පත්වලින් වචන ගොඩනැගීමේ අභ්‍යාසවල, ප්‍රහේලිකා සම්පූර්ණ කිරීමේ අභ්‍යාසවල, අකුරු මාරු කර දී වචන ගොඩනැගීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- මෙවැනි වචන ගොඩනැගීමේ අභ්‍යාස කිහිපයක් නිර්මාණය කර ලබා දී, හල් කිරීමේ ලකුණ ලෙස රැහැන යෙදුණු අකුරු නිවැරදි ව භාවිත කරන ආකාරය සංවර්ධනය කරන්න.

**පියවර 08**

- හල් කිරීමේ ලකුණ ලෙස රැහැන යෙදුණු අකුරු තුනේ වචන පස්රූලේ ලියන ආකාරය පිළිබඳ හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා ආදර්ශනය කරන්න.
- එම වචන පස්රූලේ ලියන ආකාරය අවධාරණය කරන්න.
- ලියන ලද වචන කියවීම සඳහා යොමු කරන්න.

**පියවර 09**

- රැහැන යෙදුණු අකුරු තුනේ වචන අසා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- මේ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.

**පියවර 10**

- හල් කිරීමේ ලකුණ ලෙස රැහැන යෙදුණු අකුරු එකතු කර වචන ගොඩනඟා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- මෙහිදී ඔබගේ නිර්මාණාත්මක කුසලතා භාවිත කර කාඩ්පත්වලින් වචන ගොඩනැඟීමේ අභ්‍යාසවල, ප්‍රහේලිකා සම්පූර්ණ කිරීමේ අභ්‍යාසවල, අකුරු මාරු කර දී වචන ගොඩනැඟීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- මෙවැනි වචන ගොඩනැඟීමේ අභ්‍යාස කිහිපයක් නිර්මාණය කර ලබා දී, හල් කිරීමේ ලකුණ ලෙස රැහැන යෙදුණු අකුරු නිවැරදි ව භාවිත කරන ආකාරය සංවර්ධනය කරන්න.

**පියවර 11**

- පළමුවන ශ්‍රේණියේදී උගත් අකුරු සඳහා හල් කිරීමේ ලකුණ ලෙස රැහැන යොදා තනිරූලේ නිවැරදි ව ලියන ආකාරය හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ආදර්ශනය කර පෙන්වන්න.
- එම එක් එක් අකුරට රැහැන යොදා ඇති ආකාරය මෙන් ම එය තනිරූලේ පිහිටා ඇති ආකාරය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- එම එක් එක් අකුර උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- අකුරු කිහිප වරක් උච්චාරණය කර පුහුණු වීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එම එක් එක් අකුර හිස් අවකාශයේ ලියා පෙන්වීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- හල් කිරීමේ ලකුණ ලෙස රැහැන යෙදුණු අකුරු තනිරූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- හල් කිරීමේ ලකුණ ලෙස රැහැන යෙදුණු අකුරු තනිරූලේ අසා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.

**පියවර 12**

- හල් කිරීමේ ලකුණ ලෙස රැහැන යෙදුණු අකුරු දෙකේ වචන බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- මේ සඳහා තනිරූල් පොතක් භාවිත කරන්න.

**පියවර 13**

- හල් කිරීමේ ලකුණ ලෙස රැහැන යෙදුණු අකුරු දෙකේ වචන අසා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- මේ සඳහා තනිරූල් පොතක් භාවිත කරන්න.

**පියවර 14**

- හල් කිරීමේ ලකුණ ලෙස රැහැන යෙදුණු අකුරු එකතු කර වචන ගොඩනඟා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- මෙහිදී ඔබගේ නිර්මාණාත්මක කුසලතා භාවිත කර කාඩ්පත්වලින් වචන ගොඩනැඟීමේ අභ්‍යාසවල, ප්‍රහේලිකා සම්පූර්ණ කිරීමේ අභ්‍යාසවල, අකුරු මාරු කර දී වචන ගොඩනැඟීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- මෙවැනි වචන ගොඩනැඟීමේ අභ්‍යාස කිහිපයක් නිර්මාණය කර ලබා දී, හල් කිරීමේ ලකුණ ලෙස රැහැන යෙදුණු අකුරු නිවැරදි ව භාවිත කරන ආකාරය සංවර්ධනය කරන්න.
- ඒ සඳහා නිර්මාණශීලී විනෝදාත්මක ක්‍රියාකාරකම් සකස් කර ගන්න.

**පියවර 15**

- හල් කිරීමේ ලකුණ ලෙස රැහැන යෙදුණු අකුරු තුනේ වචන කියවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 16**

- හල් කිරීමේ ලකුණ ලෙස රැහැන යෙදුණු අකුරු තුනේ වචන බලා ලිවීමේ අභ්‍යාස සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මේ සඳහා තනිරූල් පොතක් භාවිත කරන්න.

**පියවර 17**

- හල් කිරීමේ ලකුණ ලෙස රැහැන යෙදුණු අකුරු තුනේ වචන අසා ලිවීමේ අභ්‍යාස සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

- කියවීම් පොතේ ඇති පාඩම්වල හල් කිරීමේ ලකුණ යෙදුණු වචන සොයා කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. අකුරු ලිවීමේ දුෂ්කරතා දක්වන සිසුන් සඳහා වැලිපිල්ලේ ලිවීම සහ හිදැස්පත්වල ලිවීම වැනි ක්‍රියාකාරකම් යෝග්‍ය පරිදි භාවිත කරන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 20.1 නිවැරදි ව හල් කිරීමේ ලකුණ (කොඩිය) යොදා අකුරු පහක් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් පස්රූලේ ලියයි. | 20.1.1 නියමිත අංග සහිත වීම | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු පහ ම නියමිත අංග සහිත ව ලියයි. | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු හතරක් හෝ තුනක් නියමිත අංග සහිත ව ලියයි. | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු දෙකක් නියමිත අංග සහිත ව ලියයි. | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ එක් අකුරක් නියමිත අංග සහිත ව ලියයි. |
| | 20.1.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු පහ ම නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු හතරක් හෝ තුනක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු දෙකක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ එක් අකුරක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. |
| | 20.1.3 නියමිත ප්‍රමාණයට ලිවීම | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු පහ ම නියමිත ප්‍රමාණයට ලියයි. | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු හතරක් හෝ තුනක් නියමිත ප්‍රමාණයට ලියයි. | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු දෙකක් නියමිත ප්‍රමාණයට ලියයි. | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ එක් අකුරක් නියමිත ප්‍රමාණයට ලියයි. |
| | 20.1.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම | නිවැරදි දිශාව අනුගමනය කරමින් හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු පහ ම ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු හතරක් හෝ තුනක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු දෙකක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ එක් අකුරක් ලියයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 20.2<br>නිවැරදි ව හල් කිරීමේ ලකුණ (රැහැන) යොදා අකුරු පහක් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් පස්රුලේ ලියයි. | 20.2.1<br>නියමිත අංග සහිත වීම | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු පහ ම නියමිත අංග සහිත ව ලියයි. | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු හතරක් හෝ තුනක් නියමිත අංග සහිත ව ලියයි. | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු දෙකක් නියමිත අංග සහිත ව ලියයි. | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ එක් අකුරක් නියමිත අංග සහිත ව ලියයි. |
| | 20.2.2<br>නිවැරදි හැඩයෙන් යුතු වීම | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු පහ ම නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු හතරක් හෝ තුනක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු දෙකක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ එක් අකුරක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. |
| | 20.2.3<br>නියමිත ප්‍රමාණයට ලිවීම | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු පහ ම නියමිත ප්‍රමාණයට ලියයි. | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු හතරක් හෝ තුනක් නියමිත ප්‍රමාණයට ලියයි. | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු දෙකක් නියමිත ප්‍රමාණයට ලියයි. | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ එක් අකුරක් නියමිත ප්‍රමාණයට ලියයි. |
| | 20.2.4<br>නිවැරදි දිශාව අනුගමනය කිරීම | නිවැරදි දිශාව අනුගමනය කරමින් හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු පහ ම ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු හතරක් හෝ තුනක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු දෙකක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ එක් අකුරක් ලියයි. |
| 20.3<br>හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු දෙකේ සහ තුනේ වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් පස්රුලේ ලියයි. | 20.3.1<br>නියමිත අංග සහිත වීම | අකුරුවල නියමිත අංග සහිත ව වචන හතර ම ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන තුනක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන දෙකක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව එක් වචනයක් ලියයි. |
| | 20.3.2<br>නිවැරදි හැඩයෙන් යුතු වීම | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන හතර ම ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන තුනක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන දෙකක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව එක් වචනයක් ලියයි. |
| | 20.3.3<br>නියමිත ප්‍රමාණයට ලිවීම | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන හතර ම ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන තුනක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන දෙකක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව එක් වචනයක් ලියයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 20.3.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන හතර ම ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන තුනක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන දෙකක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් එක් වචනයක් ලියයි. |
| | 20.3.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම | අකුරු අතර නිසි පරතරය තබමින් වචන හතර ම ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන තුනක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන දෙකක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් එක් වචනයක් ලියයි. |
| 20.4 පස්රූලේ ලියන ලද හල් කිරීමේ ලකුණ යෙදුණු වචන හතර නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නඟා කියවයි. | 20.4.1 නිවැරදි වීම | වචන හතර ම නිවැරදි ව උච්චාරණය කරයි. | වචන තුනක් නිවැරදි ව උච්චාරණය කරයි. | වචන දෙකක් නිවැරදි ව උච්චාරණය කරයි. | එක් වචනයක් නිවැරදි ව උච්චාරණය කරයි. |
| 20.5 නිවැරදි ව හල් කිරීමේ ලකුණ (කොඩිය) යොදා අකුරු පහක් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරූලේ ලියයි. | 20.5.1 නියමිත අංග සහිත වීම | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු පහ ම නියමිත අංග සහිත ව ලියයි. | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු හතරක් හෝ තුනක් නියමිත අංග සහිත ව ලියයි. | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු දෙකක් නියමිත අංග සහිත ව ලියයි. | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ එක් අකුරක් නියමිත අංග සහිත ව ලියයි. |
| | 20.5.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු පහ ම නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු හතරක් හෝ තුනක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු දෙකක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ එක් අකුරක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. |
| | 20.5.3 නියමිත ප්‍රමාණයට ලිවීම | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු පහ ම නියමිත ප්‍රමාණයට ලියයි. | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු හතරක් හෝ තුනක් නියමිත ප්‍රමාණයට ලියයි. | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු දෙකක් නියමිත ප්‍රමාණයට ලියයි. | හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ එක් අකුරක් නියමිත ප්‍රමාණයට ලියයි. |
| | 20.5.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම | නිවැරදි දිශාව අනුගමනය කරමින් හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු පහ ම ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු හතරක් හෝ තුනක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ අකුරු දෙකක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් හල් කිරීමේ ලකුණ (කොඩිය) යෙදූ එක් අකුරක් ලියයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 20.6 නිවැරදි ව හල් කිරීමේ ලකුණ (රැහැන) යොදා අකුරු පහක් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරුලේ ලියයි. | 20.6.1 නියමිත අංග සහිත වීම | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු පහ ම නියමිත අංග සහිත ව ලියයි. | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු හතරක් හෝ තුනක් නියමිත අංග සහිත ව ලියයි. | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු දෙකක් නියමිත අංග සහිත ව ලියයි. | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ එක් අකුරක් නියමිත අංග සහිත ව ලියයි. |
| | 20.6.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු පහ ම නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු හතරක් හෝ තුනක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු දෙකක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ එක් අකුරක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. |
| | 20.6.3 නියමිත ප්‍රමාණයට ලිවීම | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු පහ ම නියමිත ප්‍රමාණයට ලියයි. | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු හතරක් හෝ තුනක් නියමිත ප්‍රමාණයට ලියයි. | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු දෙකක් නියමිත ප්‍රමාණයට ලියයි. | හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ එක් අකුරක් නියමිත ප්‍රමාණයට ලියයි. |
| | 20.6.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම | නිවැරදි දිශාව අනුගමනය කරමින් හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු පහ ම ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු හතරක් හෝ තුනක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ අකුරු දෙකක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් හල් කිරීමේ ලකුණ (රැහැන) යෙදූ එක් අකුරක් ලියයි. |
| 20.7 හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු දෙකේ තුනේ වචන දෙක බැගින් තනිරුලේ යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් ලියයි. | 20.7.1 නියමිත අංග සහිත වීම | අකුරුවල නියමිත අංග සහිත ව වචන හතර ම ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන තුනක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන දෙකක් ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව එක් වචනයක් ලියයි. |
| | 20.7.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන හතර ම ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන තුනක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන දෙකක් ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව එක් වචනයක් ලියයි. |
| | 20.7.3 නියමිත ප්‍රමාණයට ලිවීම | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන හතර ම ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන තුනක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන දෙකක් ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව එක් වචනයක් ලියයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 20.7.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන හතර ම ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන තුනක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන දෙකක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් එක් වචනයක් ලියයි. |
| | 20.7.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම | අකුරු අතර නිසි පරතරය තබමින් වචන හතර ම ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන තුනක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන දෙකක් ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් එක් වචනයක් ලියයි. |
| 20.8 තනිරුලේ ලියන ලද හල් කිරීමේ ලකුණ යෙදුණු වචන හතර නිවැරදි උච්චාරණයෙන් යුතු ව ශබ්ද නඟා කියවයි. | 20.8.1 නිවැරදි වීම | වචන හතර ම නිවැරදි ව උච්චාරණය කරයි. | වචන තුනක් නිවැරදි ව උච්චාරණය කරයි. | වචන දෙකක් නිවැරදි ව උච්චාරණය කරයි. | එක් වචනයක් නිවැරදි ව උච්චාරණය කරයි. |

මනා ලෙස භාෂාවක් භාවිත කිරීම ඉතා වැදගත් වූවකි. චතුර්විධ භාෂා කුසලතාවලට අයත් 'කියවීම' යන්න යාන්ත්‍රික වූ කුසලතාවකි. ඒ අනුව පළමුවන ශ්‍රේණියේ සිට ම කියවීම සඳහා විධිමත් පදනමක් සැපයීම වැදගත් වේ. එහිදී 'ශබ්ද නඟා' කියවීම ප්‍රමුඛ කර ගත් ඉගෙනුම් අවස්ථා සඳහා සිසුන් යොමු කිරීම සිදු කළ යුතු ය. ශබ්ද නඟා කියවීමේදී නිවැරදි උච්චාරණයෙන් කියවීම, උචිත වේගයෙන් කියවීම සහ හැඟීම් ප්‍රකාශන සහිත ව කියවීම කළ යුතු ය. කියවීම් පොතේ 'වචන උගනිමු' ලෙස සඳහන් වන පාඩම යටතේ පිලි රහිත අකුරු යෙදුණු සරල වචන සහ වගන්ති ඇතුළත් වේ. ඉන් අනතුරුව පිලි යෙදුණු වචන සහිත පාඩම් ඇතුළත් වේ. අනුක්‍රමයෙන් ගොඩනැඟෙන පාඩම් පිළිබඳ අවධානය යොමු කර සිසුන් අදාළ කියවීමේ අවස්ථා වෙත යොමු කිරීම ඔබ සතු වගකීමකි. බහුල ව භාවිත වන අකුරුවලින් සැදුම්ලත් වචනවලින් යුත් සරල ඡේද, කවි, කතන්දර කියවීමට යොමු කිරීම ද සිදු කළ යුතු අතර සංකීර්ණ කියවීම් අවස්ථා වෙත ක්‍රමික ව යොමු කිරීම වැදගත් වේ.

කියවීමේ වටිනාකම සහ එහි සුවිශේෂ ලක්ෂණ පිළිබඳ අවබෝධයෙන් යුතු ව සිසුන්ගේ ශබ්ද නඟා කියවීමේ හැකියාව වර්ධනය කරමු.

**විෂය නිර්දේශයේ උද්ධෘතය**

| සමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | ඇගයීම් නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා<br>ශා.භා.කා | 24.<br>ඡේද, කතන්දර හා දෙබස් ශබ්ද නඟා නිවැරදි ව කියවයි. | 'අපේ ගෙදර, අපේ පාසල සහ අප අවට සත්තු' යන තේමා ඇසුරෙන් වචන හැටකින් යුතු සරල ඡේදයක්/ කතන්දරයක්/ දෙබසක්<br>■ සරල වාක්‍ය<br>■ සරල වචන<br>■ කෙටි දෙබස්<br>■ වාගාලාප<br>■ කෙටි ඡේද හා කතන්දර (වචන 60)<br>■ කථන ව්‍යවහාරය | ■ කියවීම<br>■ සවන් දීම | 24.1 කථන ව්‍යවහාරයෙන් රචිත වචන හැටකින් යුත් සරල ඡේදයක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව හැඟීම් ප්‍රකාශන සහිත ව උචිත වේගයෙන් ශබ්ද නඟා කියවයි. | 24.1.1 නිවැරදි වීම<br>24.1.2 උචිත වේගය<br>24.1.3 නිර්දිෂ්ට විරාම ලකුණුවලට අනුගත වීම |
| | | | | 24.2 කථන ව්‍යවහාරයෙන් රචිත වචන හැටකින් යුත් සරල කතන්දරයක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව හැඟීම් ප්‍රකාශන සහිත ව උචිත වේගයෙන් ශබ්ද නඟා කියවයි. | 24.2.1 නිවැරදි වීම<br>24.2.2 හැඟීම් ප්‍රකාශන සහිත වීම<br>24.2.3 උචිත වේගය<br>24.2.4 හඬ පාලනය<br>24.2.5 නිර්දිෂ්ට විරාම ලකුණුවලට අනුගත වීම |
| | | | | 24.3 කථන ව්‍යවහාරයෙන් රචිත කෙටි වාගාලාප අටකින් යුත් දෙබසක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව හැඟීම් ප්‍රකාශන සහිත ව උචිත වේගයෙන් ශබ්ද නඟා කියවයි. | 24.3.1 නිවැරදි වීම<br>24.3.2 හැඟීම් ප්‍රකාශන සහිත වීම<br>24.3.3 උචිත වේගය<br>24.3.4 හඬ පාලනය<br>24.3.5 නිර්දිෂ්ට විරාම ලකුණුවලට අනුගත වීම |

**ක්‍රියාකාරකම 24.1, 24.2, 24.3 : ශබ්ද නඟා කියවමු.**

**කාලය** : පැය 15යි.

**ඉගෙනුම් සම්පත්** : කියවීම් පොත

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- කියවීම් පොතෙහි ඇති ඡේද, කතන්දර, දෙබස් සහ කවි 'සහකියවීමේ' ක්‍රමවේදය භාවිත කරමින් කියවීම සිදු කරන්න..
- **කියවීම් පොතේ ඇති පාඩම්වලින් උගත් අකුරු හා හල් ලකුණු යෙදුණු අකුරු සහිත වචන ඇතුළත් පාඩම් ශබ්ද නඟා කියවීමට අවස්ථාව ලබා දෙන්න.**
- එහිදී නිවැරදි උච්චාරණය, උචිත වේගය හා හැඟීම් ප්‍රකාශන සහිත ව කියවීම සඳහා සිසුන්ට සහාය වන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 24.1 කථන ව්‍යවහාරයෙන් රචිත වචන හැටකින් යුත් සරල ඡේදයක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව හැඟීම් ප්‍රකාශන සහිත ව උචිත වේගයෙන් ශබ්ද නඟා කියවයි. | 24.1.1 නිවැරදි වීම | වචන හැටේ සිට පනස් පහ තෙක් නිවැරදි ව උච්චාරණය කරයි. | වචන පනස් හතරේ සිට පනහ තෙක් නිවැරදි ව උච්චාරණය කරයි. | වචන හතළිස් නවයේ සිට හතළිහ තෙක් නිවැරදි ව උච්චාරණය කරයි. | තිස් නවයක් හෝ ඊට අඩු වචන සංඛ්‍යාවක් නිවැරදි ව උච්චාරණය කරයි. |
| | 24.1.2 උචිත වේගය | උචිත වේගය මැනවින් පවත්වා ගනිමින් කියවයි. | | උචිත වේගයකින් නො කියවයි. | |
| | 24.1.3 නිර්දිෂ්ට විරාම ලකුණුවලට අනුගත වීම | විරාම ලකුණුවලට අනුගත වෙයි. | | විරාම ලකුණුවලට අනුගත නො වෙයි. | |
| 24.2 කථන ව්‍යවහාරයෙන් රචිත වචන හැටකින් යුත් සරල කතන්දරයක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව හැඟීම් ප්‍රකාශන සහිත ව උචිත වේගයෙන් ශබ්ද නඟා කියවයි. | 24.2.1 නිවැරදි වීම | වචන හැටේ සිට පනස් පහ තෙක් නිවැරදි ව උච්චාරණය කරයි. | වචන පනස් හතරේ සිට පනහ තෙක් නිවැරදි ව උච්චාරණය කරයි. | වචන හතළිස් නවයේ සිට හතළිහ තෙක් නිවැරදි ව උච්චාරණය කරයි. | තිස් නවයක් හෝ ඊට අඩු වචන සංඛ්‍යාවක් නිවැරදි ව උච්චාරණය කරයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 24.2.2 හැඟීම් ප්‍රකාශන සහිත වීම | කතන්දරයේ අදහසට අනුව ඉතා මැනවින් හැඟීම් ප්‍රකාශනය ඉස්මතු වෙයි. | | කතන්දරයේ අදහසට අනුව හැඟීම් ප්‍රකාශනය ඉස්මතු නො වෙයි. | |
| | 24.2.3 හඬ පාලනය | ඉතා හොඳින් හඬ පාලනය සිදු කරයි. | | හඬ පාලනය සිදු නො කරයි. | |
| | 24.2.4 උචිත වේගය | උචිත වේගය මැනවින් පවත්වා ගනිමින් කියවයි. | | උචිත වේගයකින් නො කියවයි. | |
| | 24.2.5 නිර්දිෂ්ට විරාම ලකුණුවලට අනුගත වීම | විරාම ලකුණුවලට අනුගත වෙයි. | | විරාම ලකුණුවලට අනුගත නො වෙයි. | |
| 24.3 කථන ව්‍යවහාරයෙන් රචිත කෙටි වාගාලාප අටකින් යුත් දෙබසක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව හැඟීම් ප්‍රකාශන සහිත ව උචිත වේගයෙන් ශබ්ද නගා කියවයි. | 24.3.1 නිවැරදි වීම | වචන එකක් හෝ දෙකක් හැර ඉතුරු සියලු වචන නිවැරදි ව උච්චාරණය කරයි. | වචන තුනක් හෝ හතරක් හැර ඉතුරු සියලු වචන නිවැරදි ව උච්චාරණය කරයි. | වචනවලින් අඩකට වැඩි ප්‍රමාණයක් නිවැරදි ව උච්චාරණය කරයි. | වචනවලින් අඩකට අඩු ප්‍රමාණයක් නිවැරදි ව උච්චාරණය කරයි. |
| | 24.3.2 හැඟීම් ප්‍රකාශන සහිත වීම | අදහසට අනුව ඉතා මැනවින් හැඟීම් ප්‍රකාශනය ඉස්මතු වෙයි. | | අදහසට අනුව හැඟීම් ප්‍රකාශනය ඉස්මතු නො වෙයි. | |
| | 24.3.3 හඬ පාලනය | ඉතා හොඳින් හඬ පාලනය සිදු කරයි. | | හඬ පාලනය සිදු නො කරයි. | |
| | 24.3.4 උචිත වේගය | උචිත වේගය මැනවින් පවත්වා ගනිමින් කියවයි. | | උචිත වේගයකින් නො කියවයි. | |
| | 24.3.5 නිර්දිෂ්ට විරාම ලකුණුවලට අනුගත වීම | විරාම ලකුණුවලට අනුගත වෙයි. | | විරාම ලකුණුවලට අනුගත නො වෙයි. | |

මෙම ඉගෙනුම් පලයට අදාළ තක්සේරුකරණය ඉහත පරිදි දක්වා ඇතත් පිලි රහිත වචන සහ හල් කිරීම සහිත වචන උච්චාරණය කිරීම පමණක් මෙහිදී සලකා බැලිය යුතු ය. ඒ අනුව මෙම ඉගෙනුම් පලය යටතේ 24.1, 24.2, 24.3 යන කාර්ය සාධන ප්‍රමිතිවලට අදාළ තක්සේරුව සංකේතවලින් සටහන් නොකර අදාළ තක්සේරු පත්‍රිකාවේ ඇමුණුමක් ලෙස මේ වන විට පිලි රහිත වචන කියවීමටත්, හල් ලකුණ සහිත වචන කියවීමටත් එක් එක් සිසුන්ට ඇති හැකියාව විස්තර කර සටහනක් ලෙස පවත්වා ගැනීම සිදු කරන්න.

# තුන්වන වාරය

**තුන්වන වාරයට නිර්දිෂ්ට ඉගෙනුම් පල**

- සමානාර්ථවත් වචනවල ශබ්දාර්ථ හඳුනා ගෙන උචිත පරිදි භාවිත කරයි.
- විරුද්ධාර්ථවත් වචනවල ශබ්දාර්ථ හඳුනා ගෙන උචිත පරිදි භාවිත කරයි.
- කියවීමේදී හා ලිවීමේදී පිලි යෙදුණු අකුරු නිවැරදි ව භාවිත කරයි.
- අර්ථවත් වාක්‍ය කථිත ව්‍යවහාරයෙන් නිවැරදි ව ලියයි.
- ප්‍රායෝගික කාර්යයන්වලදී කියවීමේ පුරුද්ද ප්‍රදර්ශනය කරයි.
- ඡේද, කතන්දර හා දෙබස් ශබ්ද නගා නිවැරදි ව කියවයි.
- පොතක් කියවීමේදී සැලකිලිමත් විය යුතු මූලික කරුණු පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරමින් පොත් කියවයි.
- සරල ළමා කවි / ගීත තාලානුකූල ව ගායනා කරයි.
- අසා රස විඳින ලද කතන්දරයක් මතකයෙන් කියයි.
- ළමා කතන්දරයක අන්තර්ගතය ඇසුරෙන් චිත්‍රයක් ඇඳ ඉදිරිපත් කරයි.
- ළමා ගීතයක අන්තර්ගතය ඇසුරෙන් චිත්‍රයක් ඇඳ ඉදිරිපත් කරයි.
- පින්තූර කිහිපයක් ඇසුරින් කතන්දරයක් ගොඩනගා ඉදිරිපත් කරයි.

භාෂාවක් භාවිතයේදී 'වාංමාලාව' වැදගත් වේ. අලුත් වචන හඳුනා ගැනීම මෙන් ම එම වචනවල භාවිත අර්ථය පිළිබඳ ලබන අවබෝධය සහ අවස්ථෝචිත ව එම වචන භාවිත කිරීමේ හැකියාව වර්ධනය කිරීම ද අවශ්‍ය වේ. ඒ අනුව 15 සහ 16 යන ඉගෙනුම් පලවලින් සිසුන්ගේ වාංමාලාව සංවර්ධනය කිරීම අපේක්ෂා කෙරෙයි.

**විෂය නිර්දේශයේ උද්ධෘතය**

| සාමාන්‍ය භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා<br>ශා.භා.කා | 15. සමානාර්ථවත් වචනවල ශබ්දාර්ථ හඳුනා ගෙන උචිත පරිදි භාවිත කරයි. | 'අපේ ගෙදර' යන තේමාව ඇසුරෙන් වචන හැටකට නොවැඩි නිර්දිෂ්ට සමානාර්ථවත් පද පහක් සහිත නිර්මිත කතන්දරයක්/ ඡේදයක්<br>■ සමානාර්ථවත් වචන (අම්මා-මව, තාත්තා-පියා, ගෙදර-නිවස, පාර-මාර්ගය, කැලෑව-වනය)<br>■ ශබ්ද නඟා කියවීම<br>■ නිවැරදි උච්චාරණය<br>■ අවධානය<br>■ අවබෝධය<br>■ වාක්‍ය නිර්මාණය, ඉදිරිපත් කිරීම (වාක්‍ය ප්‍රකාශ කිරීම) | ■ සවන් දීම<br>■ කතා කිරීම<br>■ කියවීම | 15.1 දෙන ලද වචන හැටකින් යුත් පෙළෙහි සලකුණු කරන ලද වචන පහක් සඳහා යෙදෙන සමානාර්ථවත් වචනය බැගින් අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි. | 15.1.1 නිවැරදි වීම |
| | | | | 15.2 නිර්දිෂ්ට සමානාර්ථවත් වචන යුගල පහ අතරින් තෝරා ගත් වචන යුගල දෙකක් සඳහා අර්ථවත් වාක්‍යයක් බැගින් සකස් කර කියයි. | 15.2.1 අර්ථවත් වීම |

**ක්‍රියාකාරකම 15.1, 15.2, 15.3 : සමානාර්ථවත් වචන අර්ථවත් පරිදි භාවිත කරමු.**

**කාලය** : පැය 01යි.

**ඉගෙනුම් සම්පත්** : පින්තූරයට අදාළ QR කේතය, අම්මා-මව, තාත්තා-පියා, ගෙදර-නිවස, පාර-මාර්ගය, කැලෑව-වනය යන වචන ලියූ කාඩ්පත් සහ ඊට අදාළ රූප කාඩ්පත්, A3 කඩදාසි


**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- පහත සඳහන් ඡේදයට කිහිප වරක් සවන් දීමට සිසුන් යොමු කරන්න.

**පාර** අයිනේ තිබෙන අපේ **ගෙදර** හරි ම ලස්සනයි. **නිවස** පිටුපස ඇති **කැලෑව** නිසා අපට සිසිලසක් ලැබෙනවා. තාත්තා නිතර ම එම කැලෑවට යනවා. **වනය** බොහෝ අලංකාර බව තාත්තා පවසනවා. තාත්තා නොයෙක් වර්ගයේ පලතුරු සහ කොළ වර්ග ගෙනැවිත් **මාර්ගය** අසල ඇති කඩයට දෙනවා. අලුත් පලතුරු අපටත් ගෙනවිත් දෙනවා. **තාත්තා** ගෙනෙන කොළ වර්ගවලින් **අම්මා** අපට රසවත් කැඳ සාදා දෙනවා. කොළ කැඳ පානය කිරීම අපේ ඇඟට ගුණදායක බව **මව** සහ **පියා** නිතර ම පවසනවා.

- එම ඡේදයේ ඇතුළත් **අම්මා-මව, තාත්තා-පියා, ගෙදර-නිවස, පාර-මාර්ගය, කැලෑව-වනය** යන වචන සුවිශේෂ කර ඡේදයේ අන්තර්ගතය සිසුන්ට සරල ව පැහැදිලි කරන්න.
- පහත දැක්වෙන පින්තූරය සැම සිසුවෙකුට ම පෙනෙන පරිදි පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- ඒ සඳහා පහත QR කේතය ද භාවිත කළ හැකි ය.



Channel NIE

- නිර්දිෂ්ට සමානාර්ථවත් වචන කාඩ්පත්වල ලියා සකස් කර ගන්න.
- එම සමානාර්ථවත් වචන ඉස්මතු වන ආකාරයට පින්තූරයේ ඇති පුද්ගලයන් සහ දේවල් නම් කරන්න.
- ඒ අනුව සකස් කර ගත් සමානාර්ථවත් වචන සිසුන් සමග සාකච්ඡා කරමින් පින්තූරයේ අදාළ තැන්වල සවි කරන්න.
- එම සමානාර්ථවත් වචන යුගල යෙදී ඇති පරිසරය පිළිබඳ සරල ව පැහැදිලි කරමින් සිසුන් සමග සාකච්ඡාවේ යෙදෙන්න.
- ඒ අනුව එක් වචනයකට සමාන අර්ථය දෙන තවත් වචන තිබෙන බව ඉහත උදාහරණ ඇසුරෙන් තහවුරු කරන්න.

**පියවර 02**

- එම ඡේදය කියවීමට සිසුන් යොමු කරන්න.
- මෙහිදී සහකියවීමේ ක්‍රමශිල්පය භාවිත කරන්න.

**පියවර 03**

- සිසුන් කණ්ඩායම් කරන්න.
- අම්මා, තාත්තා, ගෙදර, පාර, කැලෑව යන පින්තූර A4 ප්‍රමාණයේ පත්‍රිකාවල ඇඳ කණ්ඩායමකට රූප පත්‍රිකා කට්ටලය බැගින් ලබා දෙන්න.
- නිර්දිෂ්ට වචන දහය ලියා සකස් කර ගත් කඩදාසි තීරු කට්ටලය බැගින් ද සෑම කණ්ඩායමකට ම ලබා දෙන්න.
- එක් එක් පින්තූරයට අදාළ වචන දෙක තෝරා ප්‍රකාශ කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.

**පියවර 04**

- A3 කඩදාසියක් සෑම කණ්ඩායමකට ම ලබා දෙන්න.
- පියවර 03හි ලබා දුන් රූප පත්‍රිකා කඩදාසිය මත පේළියට තබන ලෙස සෑම කණ්ඩායමකට ම උපදෙස් දෙන්න.
- එම එක් එක් රූප පත්‍රිකාවලට අදාළ වචන පත්‍රිකා දෙක ද එක් එක් රූපයට ඉදිරියෙන් තබන ලෙසට සිසුන් දැනුවත් කරන්න.
- නිවැරදි ව තබා ඇති කණ්ඩායම්වල රූප හා වචන පත්‍රිකා A3 කොළයේ ඇලවීමට යොමු කරන්න.
- සිසුන් ඇලවූ පත්‍රිකා ප්‍රදර්ශනය කරන්න.
- එම වචන සිසුන් ලවා ද කියවන්න.

**පියවර 05**

- ගුරුවරයා විසින් 'අම්මා, තාත්තා, ගෙදර, පාර, කැලෑව' යන වචන වරකට එක බැගින් පවසන්න.
- එම වචන සඳහා උගත් සමානාර්ථවත් වචන පැවසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**පියවර 06**

- එක් එක් සමානාර්ථවත් වචනය බැගින් යොදා අර්ථවත් වාක්‍ය ප්‍රකාශ කරන ආකාරය සඳහා ගුරු ආදර්ශන ලබා දෙන්න.
- එම සමානාර්ථවත් වචන යුගල පහ අතරින් තෝරා ගත් වචන යුගල දෙකක් සඳහා වාක්‍යයක් බැගින් සකස් කර වාචික ව ප්‍රකාශ කිරීමට සෑම සිසුවෙකුට ම අවස්ථාව දෙන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 15.1 දෙන ලද වචන හැටකින් යුත් පෙළෙහි සලකුණු කරන ලද වචන පහක් සඳහා යෙදෙන සමානාර්ථවත් වචනය බැගින් අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි. | 15.1.1 නිවැරදි වීම | වචන පහකට හෝ හතරකට සමානාර්ථවත් වචනය බැගින් ප්‍රකාශ කරයි. | වචන තුනකට සමානාර්ථවත් වචනය බැගින් ප්‍රකාශ කරයි. | වචන දෙකකට සමානාර්ථවත් වචනය බැගින් ප්‍රකාශ කරයි. | එක් වචනයක් සඳහා සමානාර්ථවත් වචනයක් ප්‍රකාශ කරයි. |
| 15.2 නිර්දිෂ්ට සමානාර්ථවත් වචන යුගල පහ අතරින් තෝරා ගත් වචන යුගල දෙකක් සඳහා අර්ථවත් වාක්‍යයක් බැගින් සකස් කර කියයි. | 15.2.1 අර්ථවත් වීම | වාක්‍ය හතර ම අර්ථවත් ව සකස් කර කියයි. | වාක්‍ය තුනක් අර්ථවත් ව සකස් කර කියයි. | වාක්‍ය දෙකක් අර්ථවත් ව සකස් කර කියයි. | එක් වාක්‍යයක් අර්ථවත් ව සකස් කර කියයි. |

**විෂය නිර්දේශයේ උද්ධෘතය**

| සාමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා<br>ශා.භා.කා | 16. විරුද්ධාර්ථවත් වචනවල ශබ්දාර්ථ හඳුනා ගෙන උචිත පරිදි භාවිත කරයි. | 'අපේ ගෙදර' යන තේමාව ඇසුරෙන් වචන හැටකට නොවැඩි නිර්දිෂ්ට විරුද්ධාර්ථවත් පද පහක් සහිත නිර්මිත කතන්දරයක්/ ඡේදයක්<br>■ විරුද්ධාර්ථවත් වචන (උඩ-යට, ලොකු-පොඩි, ඉදිරිපස-පිටුපස, ඉහළ-පහළ, අග-මුල)<br>■ ශබ්ද නඟා කියවීම<br>■ නිවැරදි උච්චාරණය<br>■ අවධානය<br>■ අවබෝධය<br>■ වාක්‍ය නිර්මාණය, ඉදිරිපත් කිරීම (වාක්‍ය ප්‍රකාශ කිරීම) | ■ සවන් දීම<br>■ කතා කිරීම<br>■ කියවීම | 16.1 දෙන ලද වචන හැටකින් යුත් පෙළෙහි සලකුණු කරන ලද වචන පහක් සඳහා යෙදෙන සමානාර්ථවත් වචනය බැගින් අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි. | 16.1.1 නිවැරදි වීම |
| | | | | 16.2 නිර්දිෂ්ට සමානාර්ථවත් වචන යුගල පහ අතරින් තෝරා ගත් වචන යුගල දෙකක් සඳහා අර්ථවත් වාක්‍යයක් බැගින් සකස් කර කියයි. | 16.2.1 අර්ථවත් වීම |

**ක්‍රියාකාරකම 16.1, 16.2, 16.3 : විරුද්ධාර්ථවත් වචන අර්ථවත් පරිදි භාවිත කරමු.**

**කාලය** : පැය 01යි.

**ඉගෙනුම් සම්පත්** : පින්තූරයට අදාළ QR කේතය, උඩ-යට, ලොකු-කුඩා, ඉදිරිපස-පිටුපස, ඉහළ-පහළ, අග-මුල යන වචන ලියූ කාඩ්පත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- පහත සඳහන් ඡේදයට කිහිප වරක් සවන් දීමට සිසුන් යොමු කරන්න.

නයනගේ නිවස **ඉදිරිපස** අඹ ගසක් තිබෙනවා. එහි **ඉහළ** අත්තකත් **පහළ** අත්තකත් ඉදුණු අඹ තිබෙනවා නයන දැක්කා. නයන නිවස **පිටුපස** සිටි පවනිටත් මල්ලිටත් කතා කළා. ගසේ **උඩ** තිබුණු ඉදුණු අඹ, නයන ගස **යට** සිට පෙන්නුවා. පවනි දිග ලීයක් ගෙනාවා. ලීයේ **අග** කෙළවරට කෙක්කක් බැන්දා. **මුල** කෙළවරින් අල්ලා, නයන ඉදුණු අඹ කැඩුවා. පවනි සහ මල්ලී **ලොකු** අඹ සහ **කුඩා** අඹ වෙන් කළා. තුන් දෙනා ම අඹ බෙදා ගෙන කෑවා.

- එම කතන්දරයේ ඇතුළත් උඩ-යට, ලොකු-කුඩා, ඉදිරිපස-පිටුපස, ඉහළ-පහළ, අග-මුල යන වචන සුවිශේෂ කර කතාවේ අන්තර්ගතය සිසුන්ට සරල ව පැහැදිලි කරන්න.
- පහත දැක්වෙන පින්තූරය සෑම සිසුවෙකුට ම පෙනෙන පරිදි පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- ඒ සඳහා පහත QR කේතය ද භාවිත කළ හැකි ය.



Channel NIE

- නිර්දිෂ්ට විරුද්ධාර්ථවත් වචන කාඩ්පත්වල ලියා සකස් කර ගන්න.
- එම විරුද්ධාර්ථවත් වචන ඉස්මතු වන ආකාරයට පින්තූරයේ ඇති පුද්ගලයන් සහ දේවල් නම් කරන්න.
- ඒ අනුව සකස් කර ගත් විරුද්ධාර්ථවත් වචන සිසුන් සමග සාකච්ඡා කරමින් පින්තූරයේ අදාළ තැන්වල සවි කරන්න.
- එම විරුද්ධාර්ථවත් වචන යුගල යෙදී ඇති පරිසරය පිළිබඳ සරල ව පැහැදිලි කරමින් සිසුන් සමග සාකච්ඡාවේ යෙදෙන්න.
- ඒ අනුව එක් වචනයකට විරුද්ධාර්ථය දෙන වෙනත් වචනයක් තිබෙන බව ඉහත උදාහරණ ඇසුරෙන් තහවුරු කරන්න.

**පියවර 02**

- එම ඡේදය කියවීමට සිසුන් යොමු කරන්න.
- මෙහිදී සහකියවීමේ ක්‍රමශිල්පය භාවිත කරන්න.

**පියවර 03**

- නැවත වරක් පින්තූරයේ සවි කර ඇති වචන පෙන්වමින් විරුද්ධාර්ථවත් වචන සිසුන්ට සරල ව පැහැදිලි කරන්න.
- එම වචන යුගල එකට ගොනු කර කිහිප වරක් සිසුන් සමග කියවන්න.
- එක් එක් වචනය සඳහා යෙදෙන විරුද්ධාර්ථවත් වචනය බැගින් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**පියවර 04**

- එක් එක් විරුද්ධාර්ථවත් වචනය බැගින් යොදා අර්ථවත් වාක්‍ය ප්‍රකාශ කරන ආකාරය සඳහා ගුරු ආදර්ශන ලබා දෙන්න.
- එම විරුද්ධාර්ථවත් වචන යුගල අතරින් තෝරා ගත් වචන යුගල දෙකක් සඳහා අර්ථවත් වාක්‍යයක් බැගින් සකස් කර වාචික ව ප්‍රකාශ කිරීමට සෑම සිසුවෙකුට ම අවස්ථාව දෙන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | **4** | **3** | **2** | **1** |
| 16.1 දෙන ලද වචන හැටකින් යුත් පෙළෙහි සලකුණු කරන ලද වචන පහක් සඳහා යෙදෙන විරුද්ධාර්ථවත් වචනය බැගින් අවබෝධයෙන් යුතු ව ප්‍රකාශ කරයි. | 16.1.1 නිවැරදි වීම | වචන පහකට හෝ හතරකට විරුද්ධාර්ථවත් වචනය බැගින් ප්‍රකාශ කරයි. | වචන තුනකට විරුද්ධාර්ථවත් වචනය බැගින් ප්‍රකාශ කරයි. | වචන දෙකකට විරුද්ධාර්ථවත් වචනය බැගින් ප්‍රකාශ කරයි. | එක් වචනයක් සඳහා විරුද්ධාර්ථවත් වචනයක් ප්‍රකාශ කරයි. |
| 16.2 නිර්දිෂ්ට විරුද්ධාර්ථවත් වචන යුගල පහ අතරින් තෝරා ගත් වචන යුගල දෙකක් සඳහා වාක්‍යයක් බැගින් සකස් කර කියයි. | 16.2.1 අර්ථවත් වීම | වාක්‍ය හතර ම අර්ථවත් ව සකස් කර කියයි. | වාක්‍ය තුනක් අර්ථවත් ව සකස් කර කියයි. | වාක්‍ය දෙකක් අර්ථවත් ව සකස් කර කියයි. | එක් වාක්‍යයක් අර්ථවත් ව සකස් කර කියයි. |

භාෂාව භාවිතයේදී අක්ෂර පිළිබඳ දැනුම වැදගත් වේ. පළමුවන ශ්‍රේණියේ පළමුවන සහ දෙවන වාරවලදී පිලි රහිත අක්ෂර ලිවීමේ හා කියවීමේ හැකියාව මෙන් ම දෙවන වාරයේදී අක්ෂරවලට හල් කිරීමේ ලකුණ යොදා ලිවීමට හා කියවීමට ද හඳුන්වා දී ඇත. පිලි භාවිතය හඳුන්වා දීම තුන්වන වාරයේදී සිදු කරනු ලබයි.

පළමුවන ශ්‍රේණිය සඳහා නිර්දිෂ්ට පිලි පහළොවකි. එම පිලි යෙදුණු අකුරු සහ වචන කියවීමත් පස්රූලේ සහ තනිරූලේ ලිවීමත් මෙහිදී සිදු කරනු ලබයි. හඳුන්වා දෙනු ලබන පිල්ල යෙදුණු වචන ඔස්සේ පිල්ලේ ශබ්දය හඳුන්වා දීමත් ඒ සමග ම පිල්ලේ හැඩය හඳුන්වා දීමත් එම පිල්ල අකුරකට යොදන ආකාරය පිළිබඳ හඳුන්වා දීමත් අකුරකට පිල්ල යොදා ශබ්ද කරනු ලබන ආකාරය හඳුන්වා දීමත් සිදු කරනු ලබයි. කියවීමේදී සහ ලිවීමේදී පිලි නිවැරදි ව හඳුනා ගැනීම හා භාවිතය අත්‍යවශ්‍ය වේ. පහත සඳහන් ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවීමෙන් නිරවද්‍ය ලෙස පිලි භාවිතය ඉගෙන ගැනීමට අවස්ථාව සැලසෙයි.

**පිලි හඳුන්වා දීමේ අනුක්‍රමය**

| අනු අංකය | පිල්ලේ නම | නියෝජනය වන ස්වරය | පිල්ල | උදාහරණ |
|---|---|---|---|---|
| 01 | ඇලපිල්ල | ආ | ා | කා |
| 02 | කෙටි ඇදපිල්ල | ඇ | ැ | කැ |
| 03 | දික් ඇදපිල්ල | ඈ | ෑ | කෑ |
| 04 | කෙටි ඉස්පිල්ල | ඉ | ි | කි |
| 05 | දික් ඉස්පිල්ල | ඊ | ී | කී |
| 06 | කෙටි කොන් පාපිල්ල | උ | ු | ලු |
| 07 | කෙටි වක් පාපිල්ල | උ | ු | කු |
| 08 | කෙටි ඇද පාපිල්ල | උ | ැ | රු |
| 09 | දික් කොන් පාපිල්ල | ඌ | ූ | ලූ |
| 10 | දික් වක් පාපිල්ල | ඌ | ූ | කූ |
| 11 | දික් ඇද පාපිල්ල | ඌ | ෑ | රූ |
| 12 | කොම්බුව | එ | ෙ | කෙ |
| 13 | කොම්බුව සහ හල් කිරීමේ ලකුණ | ඒ | ෙ ් / ෙ ් | කේ/මේ |
| 14 | කොම්බුව සහ ඇලපිල්ල | ඔ | ො | කො |
| 15 | කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ | ඕ | ෝ | කෝ |

**විෂය නිර්දේශයේ උද්ධෘතය**

| සමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | ඇගයීම් නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා<br>ශා.භා.කා | 21. කියවීමේදී හා ලිවීමේදී පිලි යෙදුණු අකුරු නිවැරදි ව භාවිත කරයි. | ▪ මධ්‍ය අක්ෂර<br>▪ ආරෝහණ අක්ෂර<br>▪ අවරෝහණ අක්ෂර<br>▪ හල් ලකුණ<br>▪ නිවැරදි උච්චාරණය<br>▪ කියවීම<br>▪ ලිවීම<br>▪ අසා ලිවීම<br>▪ ලිවීමට සූදානම (නිවැරදි ව අසුන් ගැනීම, පොත තබා ගැනීම, පැන්සල ඇල්ලීම)<br>▪ පස්රුල<br>▪ තනිරුල<br>▪ ලිවීමේ යාන්ත්‍රික කුසලතා (අකුරක නියමිත අංග, හැඩය, ප්‍රමාණය, දිශාව හා වචනයක අකුරු අතර පරතරය) | ▪ සවන් දීම<br>▪ කතා කිරීම<br>▪ කියවීම ලිවීම | 21.1 නිර්දිෂ්ට පිලි පහළොව යෙදුණු අකුර බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් පස්රුලේ ලියයි. | 21.1.1 නියමිත අංග සහිත වීම<br>21.1.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>21.1.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>21.1.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම |
| | | | | 21.2 නිර්දිෂ්ට පිලි පහළොව යෙදුණු අකුර බැගින් නිවැරදි ව උච්චාරණය කරමින් ශබ්ද නඟා කියවයි. | 21.2.1 නිවැරදි වීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ■ උගත් අකුරුවලින් සමන්විත වචන<br>■ අක්ෂර සංයෝජනය<br>■ පිලි (ඇලපිල්ල, කෙටි ඇදපිල්ල, දික් ඇදපිල්ල, කෙටි ඉස්පිල්ල, දික් ඉස්පිල්ල, කෙටි කොන් පාපිල්ල, දික් කොන් පාපිල්ල, කෙටි වක් පාපිල්ල, දික් වක් පාපිල්ල, කෙටි ඇද පාපිල්ල, දික් ඇද පාපිල්ල, කොම්බුව, කොම්බුව සහ හල් ලකුණ, කොම්බුව සහ ඇලපිල්ල, ඇලපිල්ල සහිත හල් ලකුණ)<br>■ පිලි සහිත අකුරු දෙකේ වචන<br>■ පිලි සහිත අකුරු තුනේ වචන<br>■ පිලි සහිත අකුරු හතරේ වචන | | 21.3 නිර්දිෂ්ට එක් එක් පිල්ල යෙදුණු අකුරු හතරකට නොවැඩි වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් පස්රූලේ අසා ලියයි. | 21.3.1 නියමිත අංග සහිත වීම<br>21.3.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>21.3.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>21.3.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම<br>21.3.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම |
| | | | | 21.4 නිර්දිෂ්ට පිලි පහළොව යෙදුණු අකුර බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරූලේ ලියයි. | 21.4.1 නියමිත අංග සහිත වීම<br>21.4.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>21.4.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>21.4.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම |
| | | | | 21.5 නිර්දිෂ්ට පිලි පහළොව යෙදුණු අකුර බැගින් නිවැරදි ව උච්චාරණය කරමින් ශබ්ද නගා කියවයි. | 21.5.1 නිවැරදි වීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | 21.6 නිර්දිෂ්ට එක් එක් පිල්ල යෙදුණු අකුරු හතරකට නොවැඩි වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරූලේ අසා ලියයි. | 21.6.1 නියමිත අංග සහිත වීම<br>21.6.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>21.6.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>21.6.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම<br>21.6.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම |

**ක්‍රියාකාරකම 21.1, 21.2, 21.3, 21.4, 21.5, 21.6 : ඇලපිල්ල හඳුනා ගනිමු; නිවැරදි ව භාවිත කරමු.**

**කාලය** : පැය 02යි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- **අකුරු නුවණ 4** පොතේ පිටු අංක 1හි ඇතුළත් පහත සඳහන් කවිය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

හඳ වටකර තාරකා
රන්වන් රන් තාරකා
අර බලන්න තාරකා
පාට පාට තාරකා

හඳ වටකර තාරකා
පායන රන් තාරකා
කහ පාටට තාරකා
බබළනවා තාරකා

- ඉහත කවියට සවන් දීම සඳහා සිසුන් යොමු කරන්න.
- කවිය දෙවතාවක් පමණ ගායනා කරන්න.

**පියවර 02**

- ඉහත කවිය කිහිප වරක් සිසුන් සමග ගායනා කරන්න.
- එම කවියෙහි මුලට 'ආ' ශබ්දය යෙදුණු වචනයක් හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියන්න.
- එම වචනය කිහිප වරක් උච්චාරණය කරන්න.
- එම වචනය සිසුන් සමග ද කිහිප වරක් උච්චාරණය කරන්න.
- එහිදී වචනයේ මුලට යෙදෙන 'ආ' ශබ්දය අවධාරණය කරන්න.
- වචනයක මුලට 'ආ' ශබ්දය යෙදුණු, කවියේ ඇතුළත් වෙනත් වචනයක් පැවසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙලෙස කවියෙහි ඇතුළත් 'ආ' ශබ්දය යෙදුණු වචන සොයා පැවසීමට අවස්ථාව දෙන්න. (මෙහිදී සිසුන් සමග සාකච්ඡා කර අදාළ වචන සෙවීම සහ පැවසීම සිදු කරන්න.)
- එම වචන වෙන ම තීරුවක සටහන් කරන්න.
- අනතුරුව එම වචන කිහිප වරක් ශබ්ද නඟා සිසුන් සමග කියවන්න. එහිදී ඇසෙන 'ආ' ශබ්දය අවධාරණය කරන්න.

**පියවර 03**

- ඉහත වචනවල 'ආ' ශබ්දය සඳහා 'ආ' අකුර වෙනුවට වෙනත් සංකේතයක් යෙදී ඇති බව පවසන්න.
- එම සංකේතය ඇලපිල්ල නමින් හඳුන්වන බව පවසන්න.
- ඇලපිල්ලේ හැඩය හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා දක්වන්න.

| ා |
|---|

- ඉහත සංකේතය ඇලපිල්ල බවත් එහි ශබ්දය 'ආ' බවත් අවධාරණය කරන්න.
- කවියෙන් උපුටා ලියූ වචනවල ඇලපිල්ල යෙදුණු අකුරු යටින් ඉරක් අඳින්න. (මෙය සිසුන් සමග සාකච්ඡා කරමින් සිදු කරන්න.)
- අකුරට එම පිල්ල යෙදී ඇති ස්ථානය සිසුන් සමග සාකච්ඡා කරමින් අවධාරණය කරන්න.
- එම අකුරු උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම අකුරු කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම අකුරු තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.
- අනතුරුව එම වචන උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම වචන කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම වචන තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.

**පියවර 04**

- **අකුරු නුවණ 4** පොතෙහි පිටු අංක 1හි ඇති කවිය සිසුන්ට කියවීමට යොමු කරන්න.
- එම කවිය කියවා එහි ඇති 'ආ' ශබ්දය යෙදුණු අකුරු යටින් ඉරක් ඇඳීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකමෙහි යෙදෙන අතරතුර සිසුන් අසලට ගොස් ඔවුන්ට සහාය වන්න.

**පියවර 05**

- අකුරු කිහිපයකට ඇලපිල්ල යොදා පස්රූලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි ඇලපිල්ල යෙදුණු අකුරු පස්රූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- 'ආ' ශබ්දය යෙදුණු අකුරු අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.

**පියවර 06**

- ඇලපිල්ල යෙදුණු අකුරු සහිත වචන පස්රූලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- වචන පස්රූලේ ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- එහිදී අකුරු අතර නිසි පරතරය තබා ලිවීම පිළිබඳ අවධාරණය කරන්න.
- බලා ලියන ලද වචන ශබ්ද නඟා කියවීම සඳහා ද යොමු කරන්න.
- ඇලපිල්ල යෙදුණු අකුරු සහිත වචන කියවීමට සිසුන් යොමු කරන්න.
- ඇලපිල්ල යෙදුණු අකුරු සහිත වචන අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.

**පියවර 07**

- ඇලපිල්ල යෙදුණු අකුරු තනිරූලේ ලිවීම ආදර්ශනය කරන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- තෝරා ගත් අකුරු කිහිපයකට ඇලපිල්ල සහිත කාඩ්පතක් තබමින් එම අකුරු ශබ්ද කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඒ සඳහා ගුරු සහාය ලබා දෙන්න.

**පියවර 08**

- ඇලපිල්ල යෙදුණු අකුරු කිහිපයක් තනිරූලේ ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි ඇලපිල්ල යෙදුණු අකුරු තනිරූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

හාවා මාලා පාට
තාර පාර

- වචන ලිවීම සඳහා තනිරූල් පොතක් භාවිත කරන්න.
- එම වචන ලිවීමේදී ඇලපිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- ඇලපිල්ල යෙදුණු අකුරු දෙකේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 09**

- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

රබාන මාළුවා

තාරාවා නළාව

පාසල

- එම වචන ලිවීමේදී ඇලපිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- ඇලපිල්ල යෙදුණු අකුරු තුනේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 10**

- ඇලපිල්ල යෙදුණු අකුරු දෙකේ සහ අකුරු තුනේ වචන පහ බැගින් ගොඩනැගීම සඳහා සිසුන් යොමු කරන්න.
- ඒ සඳහා නිර්මාණශීලි විනෝදාත්මක ක්‍රියාකාරකම් සකස් කර ගන්න.

කියවීම් පොතේ ඇති පාඩම්වලින් ඇලපිල්ල යෙදුණු අකුරු සහිත වචන සොයා කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 21.1, 21.2, 21.3, 21.4, 21.5, 21.6 : කෙටි ඇදපිල්ල හඳුනා ගනිමු; නිවැරදි ව භාවිත කරමු.**

**කාලය** : පැය 02යි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

### පියවර 01

- **අකුරු නුවණ 4** පොතේ පිටු අංක 5හි ඇතුළත් පහත සඳහන් කවිය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

හා පැටවා - බැද්ද වටා
හැම තැනක ම - පැන යනවා

වැස්ස වැහැල - හැම තැනක ම
ළා තණ පැළ - බබළනවා

ළා තණ පැළ - දැක හාවා
කන් ඔසවා - උඩ පැන්නා

- ඉහත කවියට සවන් දීම සඳහා සිසුන් යොමු කරන්න.
- කවිය දෙවතාවක් පමණ ගායනා කරන්න.

### පියවර 02

- ඉහත කවිය කිහිප වරක් සිසුන් සමග ගායනා කරන්න.
- එම කවියෙහි මුලට 'ඇ' ශබ්දය යෙදුණු වචනයක් හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියන්න.
- එම වචනය කිහිප වරක් උච්චාරණය කරන්න.
- එම වචනය සිසුන් සමග ද කිහිප වරක් උච්චාරණය කරන්න.
- එහිදී වචනයේ මුලට යෙදෙන 'ඇ' ශබ්දය අවධාරණය කරන්න.
- වචනයක මුලට 'ඇ' ශබ්දය යෙදුණු, කවියේ ඇතුළත් වෙනත් වචනයක් පැවසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙලෙස කවියෙහි ඇතුළත් 'ඇ' ශබ්දය යෙදුණු වචන සොයා පැවසීමට අවස්ථාව දෙන්න. (මෙහිදී සිසුන් සමග සාකච්ඡා කර අදාළ වචන සෙවීම සහ පැවසීම සිදු කරන්න.)
- එම වචන වෙන ම තීරුවක සටහන් කරන්න.
- අනතුරුව එම වචන කිහිප වරක් ශබ්ද නගා සිසුන් සමග කියවන්න.
- එහිදී ඇසෙන 'ඇ' ශබ්දය අවධාරණය කරන්න.

### පියවර 03

- ඉහත වචනවල 'ඇ' ශබ්දය සඳහා 'ඇ' අකුර වෙනුවට වෙනත් සංකේතයක් යෙදී ඇති බව පවසන්න.
- එම සංකේතය කෙටි ඇදපිල්ල නමින් හඳුන්වන බව පවසන්න.
- කෙටි ඇදපිල්ලේ හැඩය හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා දක්වන්න.

ැ

- ඉහත සංකේතය කෙටි ඇදපිල්ල බවත් එහි ශබ්දය 'ඇ' බවත් අවධාරණය කරන්න.
- කවියෙන් උපුටා ලියූ වචනවල කෙටි ඇදපිල්ල යෙදුණු අකුරු යටින් ඉරක් අඳින්න. (මෙය සිසුන් සමග සාකච්ඡා කරමින් සිදු කරන්න.)
- අකුරට එම පිල්ල යෙදී ඇති ස්ථානය සිසුන් සමග සාකච්ඡා කරමින් අවධාරණය කරන්න.
- එම අකුරු උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම අකුරු කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම අකුරු තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.
- අනතුරුව එම වචන උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම වචන කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම වචන තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.

### පියවර 04

- **අකුරු නුවණ 4** පොතෙහි පිටු අංක 5හි ඇති කවිය සිසුන්ට කියවීමට යොමු කරන්න.
- එම කවිය කියවා එහි ඇති 'ඇ' ශබ්දය යෙදුණු අකුරු යටින් ඉරක් ඇඳීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකමෙහි යෙදෙන අතරතුර සිසුන් අසලට ගොස් ඔවුන්ට සහාය වන්න.

### පියවර 05

- අකුරු කිහිපයකට කෙටි ඇදපිල්ල යොදා පස්රූලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි කෙටි ඇදපිල්ල යෙදුණු අකුරු පස්රූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- 'ඇ' ශබ්දය යෙදුණු අකුරු අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.

### පියවර 06

- කෙටි ඇදපිල්ල යෙදුණු අකුරු සහිත වචන පස්රූලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- එම වචන පස්රූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- එහිදී අකුරු අතර නිසි පරතරය තබා ලිවීම පිළිබඳ අවධාරණය කරන්න.
- බලා ලියන ලද වචන ශබ්ද නගා කියවීම සඳහා ද යොමු කරන්න.
- කෙටි ඇදපිල්ල යෙදුණු අකුරු සහිත වචන කියවීමට සිසුන් යොමු කරන්න.
- කෙටි ඇදපිල්ල යෙදුණු අකුරු සහිත වචන අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.

**පියවර 07**

- කෙටි ඇදපිල්ල යෙදුණු අකුරු තනිරූලේ ලිවීම ආදර්ශනය කරන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- තෝරා ගත් අකුරු කිහිපයකට කෙටි ඇදපිල්ල සහිත කාඩ්පතක් තබමින් එම අකුරු ශබ්ද කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න
- ඒ සඳහා ගුරු සහාය ලබා දෙන්න.

**පියවර 08**

- කෙටි ඇදපිල්ල යෙදුණු අකුරු කිහිපයක් තනිරූලේ ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි කෙටි ඇදපිල්ල යෙදුණු අකුරු බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | |
|---|---|
| කැඳ | පැය |
| දැල | රැය |
| මැද | |

- වචන ලිවීම සඳහා තනිරූල් පොතක් භාවිත කරන්න.
- එම වචන ලිවීමේදී කෙටි ඇදපිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- කෙටි ඇදපිල්ල යෙදුණු අකුරු දෙකේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 09**

- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| පැහැය | වැල්ල | රැල්ල | වැස්ස | කැරට් |

- එම වචන ලිවීමේදී කෙටි ඇදපිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- කෙටි ඇදපිල්ල යෙදුණු අකුරු තුනේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 10**

- කෙටි ඇදපිල්ල යෙදුණු අකුරු දෙකේ සහ අකුරු තුනේ වචන පහ බැගින් ගොඩනැගීම සඳහා සිසුන් යොමු කරන්න.
- ඒ සඳහා නිර්මාණශීලි විනෝදාත්මක ක්‍රියාකාරකම් සකස් කර ගන්න.

කියවීම් පොතේ ඇති පාඩම්වලින් කෙටි ඇදපිල්ල යෙදුණු අකුරු සහිත වචන සොයා කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 21.1, 21.2, 21.3, 21.4, 21.5, 21.6 : දික් ඇදපිල්ල හඳුනා ගනිමු; නිවැරදි ව භාවිත කරමු.**

**කාලය** : පැය 02යි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- **අකුරු නුවණ 4** පොතේ පිටු අංක 9හි ඇතුළත් පහත සඳහන් කවිය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

> දෑ සමන්
> මල් අරන්
> මාලයක් හදනවා
>
> මාලයක්
> සාදලා
> හැඩ වැඩත් කරනවා
>
> උදෑසනට
> හැන්දෑවට
> අතට අරන් බලනවා

- ඉහත කවියට සවන් දීම සඳහා සිසුන් යොමු කරන්න.
- කවිය දෙවතාවක් පමණ ගායනා කරන්න.

**පියවර 02**

- ඉහත කවිය කිහිප වරක් සිසුන් සමග ගායනා කරන්න.
- එම කවියෙහි මුලට 'ඈ' ශබ්දය යෙදුණු වචනයක් හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියන්න.
- එම වචනය කිහිප වරක් උච්චාරණය කරන්න.
- එම වචනය සිසුන් සමග ද කිහිප වරක් උච්චාරණය කරන්න.
- එහිදී වචනයේ මුලට යෙදෙන 'ඈ' ශබ්දය අවධාරණය කරන්න.
- වචනයක මුලට 'ඈ' ශබ්දය යෙදුණු, කවියේ ඇතුළත් වෙනත් වචනයක් පැවසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙලෙස කවියෙහි ඇතුළත් 'ඈ' ශබ්දය යෙදුණු වචන සොයා පැවසීමට අවස්ථාව දෙන්න. (මෙහිදී සිසුන් සමග සාකච්ඡා කර අදාළ වචන සෙවීම සහ පැවසීම සිදු කරන්න.)
- එම වචන වෙන ම තීරුවක සටහන් කරන්න.
- අනතුරුව එම වචන කිහිප වරක් ශබ්ද නගා සිසුන් සමග කියවන්න.
- එහිදී ඇසෙන 'ඈ' ශබ්දය අවධාරණය කරන්න.

**පියවර 03**

- ඉහත වචනවල 'ඈ' ශබ්දය සඳහා 'ඈ' අකුර වෙනුවට වෙනත් සංකේතයක් යෙදී ඇති බව පවසන්න.
- එම සංකේතය දික් ඇදපිල්ල නමින් හඳුන්වන බව පවසන්න.

- දික් ඇදපිල්ලේ හැඩය හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා දක්වන්න.

| ෑ |
|---|

- ඉහත සංකේතය දික් ඇදපිල්ල බවත් එහි ශබ්දය 'ඈ' බවත් අවධාරණය කරන්න.
- කවියෙන් උපුටා ලියූ වචනවල දික් ඇදපිල්ල යෙදුණු අකුරු යටින් ඉරක් අඳින්න. (මෙය සිසුන් සමග සාකච්ඡා කරමින් සිදු කරන්න.)
- අකුරට එම පිල්ල යෙදී ඇති ස්ථානය සිසුන් සමග සාකච්ඡා කරමින් අවධාරණය කරන්න.
- එම අකුරු උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම අකුරු කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම අකුරු තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.
- අනතුරුව එම වචන උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම වචන කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම වචන තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.

**පියවර 04**

- **අකුරු නුවණ 4** පොතෙහි පිටු අංක 9හි ඇති කවිය සිසුන්ට කියවීමට යොමු කරන්න.
- එම කවිය කියවා එහි ඇති 'ඈ' ශබ්දය යෙදුණු අකුරු යටින් ඉරක් ඇඳීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකමෙහි යෙදෙන අතරතුර සිසුන් අසලට ගොස් ඔවුන්ට සහාය වන්න.

**පියවර 05**

- අකුරු කිහිපයකට දික් ඇදපිල්ල යොදා පස්රුලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි දික් ඇදපිල්ල යෙදුණු අකුරු පස්රුලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- 'ඈ' ශබ්දය යෙදුණු අකුරු අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රුල් පොතක් භාවිත කරන්න.

**පියවර 06**

- දික් ඇදපිල්ල යෙදුණු අකුරු සහිත වචන පස්රුලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- එම වචන පස්රුලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- එහිදී අකුරු අතර නිසි පරතරය තබා ලිවීම පිළිබඳ අවධාරණය කරන්න.
- බලා ලියන ලද වචන ශබ්ද නඟා කියවීම සඳහා ද යොමු කරන්න.
- දික් ඇදපිල්ල යෙදුණු අකුරු සහිත වචන කියවීමට සිසුන් යොමු කරන්න.
- දික් ඇදපිල්ල යෙදුණු අකුරු සහිත වචන අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රුල් පොතක් භාවිත කරන්න.

**පියවර 07**

- දික් ඇදපිල්ල යෙදුණු අකුරු තනිරූලේ ලිවීම ආදර්ශනය කරන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- තෝරා ගත් අකුරු කිහිපයකට දික් ඇදපිල්ල සහිත කාඩ්පතක් තබමින් එම අකුරු ශබ්ද කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඒ සඳහා ගුරු සහාය ලබා දෙන්න.

**පියවර 08**

- දික් ඇදපිල්ල යෙදුණු අකුරු කිහිපයක් තනිරූලේ ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි දික් ඇදපිල්ල යෙදුණු අකුරු තනිරූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | |
|---|---|
| රෑන | පෑන |
| දෑස | කෑම |

- වචන ලිවීම සඳහා තනිරූල් පොතක් භාවිත කරන්න.
- එම වචන ලිවීමේදී දික් ඇදපිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- දික් ඇදපිල්ල යෙදුණු අකුරු දෙකේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 09**

- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| බෑගය | තෑග්ග | කෑරලා | මෑ වැල | ලෑල්ල |

- වචන ලිවීම සඳහා තනිරූල් පොතක් භාවිත කරන්න.
- එම වචන ලිවීමේදී දික් ඇදපිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- දික් ඇදපිල්ල යෙදුණු අකුරු තුනේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 10**

- දික් ඇදපිල්ල යෙදුණු අකුරු දෙකේ සහ අකුරු තුනේ වචන පහ බැගින් ගොඩනැගීම සඳහා සිසුන් යොමු කරන්න.
- ඒ සඳහා නිර්මාණශීලි විනෝදාත්මක ක්‍රියාකාරකම් සකස් කර ගන්න.

කියවීම් පොතේ ඇති පාඩම්වලින් දික් ඇදපිල්ල යෙදුණු අකුරු සහිත වචන සොයා කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 21.1, 21.2, 21.3, 21.4, 21.5, 21.6 : කෙටි ඉස්පිල්ල හඳුනා ගනිමු; නිවැරදි ව භාවිත කරමු.**

**කාලය** : පැය 02යි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- **අකුරු නුවණ 4** පොතේ පිටු අංක 13හි ඇතුළත් පහත සඳහන් කවිය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

| |
|---|
| මලින් මලට පියඹා යන<br>සමනලයන් ලස්සනයි<br><br>ගසින් ගසට පියඹා යන<br>ගිරා ළිහිණි කඩිසරයි<br><br>බට්ති මලිති මිහිරි හඬින්<br>කියන කවිත් ලස්සනයි<br><br>බට්ති මලිති ගිරා ළිහිණි<br>සමනලයන් හරි හැඩයි |


- ඉහත කවියට සවන් දීම සඳහා සිසුන් යොමු කරන්න.
- කවිය දෙවතාවක් පමණ ගායනා කරන්න.

**පියවර 02**

- ඉහත කවිය කිහිප වරක් සිසුන් සමග ගායනා කරන්න.
- එම කවියෙහි මුලට 'ඉ' ශබ්දය යෙදුණු වචනයක් හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියන්න.
- එම වචනය කිහිප වරක් උච්චාරණය කරන්න.
- එම වචනය සිසුන් සමග ද කිහිප වරක් උච්චාරණය කරන්න.
- එහිදී වචනයේ මුලට යෙදෙන 'ඉ' ශබ්දය අවධාරණය කරන්න.
- වචනයක මුලට 'ඉ' ශබ්දය යෙදුණු, කවියේ ඇතුළත් වෙනත් වචනයක් පැවසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙලෙස කවියෙහි ඇතුළත් 'ඉ' ශබ්දය යෙදුණු වචන සොයා පැවසීමට අවස්ථාව දෙන්න.. (මෙහිදී සිසුන් සමග සාකච්ඡා කර අදාළ වචන සෙවීම සහ පැවසීම සිදු කරන්න.)
- එම වචන වෙන ම තීරුවක සටහන් කරන්න.
- අනතුරුව එම වචන කිහිප වරක් ශබ්ද නගා සිසුන් සමග කියවන්න.
- එහිදී ඇසෙන 'ඉ' ශබ්දය අවධාරණය කරන්න.

**පියවර 03**

- ඉහත වචනවල 'ඉ' ශබ්දය සඳහා 'ඉ' අකුර වෙනුවට වෙනත් සංකේතයක් යෙදී ඇති බව පවසන්න.
- එම සංකේතය කෙටි ඉස්පිල්ල නමින් හඳුන්වන බව පවසන්න.
- කෙටි ඉස්පිල්ලේ හැඩය හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා දක්වන්න.



- ඉහත සංකේතය කෙටි ඉස්පිල්ල බවත් එහි ශබ්දය 'ඉ' බවත් අවධාරණය කරන්න.
- කවියෙන් උපුටා ලියූ වචනවල කෙටි ඉස්පිල්ල යෙදුණු අකුරු යටින් ඉරක් අඳින්න. (මෙය සිසුන් සමග සාකච්ඡා කරමින් සිදු කරන්න.)
- අකුරට එම පිල්ල යෙදී ඇති ස්ථානය සිසුන් සමග සාකච්ඡා කරමින් අවධාරණය කරන්න.
- එම අකුරු උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම අකුරු කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම අකුරු තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.
- අනතුරුව එම වචන උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම වචන කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම වචන තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.

**පියවර 04**

- **අකුරු නුවණ 4** පොතෙහි පිටු අංක 13හි සඳහන් කවිය සිසුන්ට කියවීමට යොමු කරන්න.
- එම කවිය කියවා එහි ඇති 'ඉ' ශබ්දය යෙදුණු අකුරු යටින් ඉරක් ඇඳීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකමෙහි යෙදෙන අතරතුර සිසුන් අසලට ගොස් ඔවුන්ට සහාය වන්න.

**පියවර 05**

- අකුරු කිහිපයකට කෙටි ඉස්පිල්ල යොදා පස්රුලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි කෙටි ඉස්පිල්ල යෙදුණු අකුරු පස්රුලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- 'ඉ' ශබ්දය යෙදුණු අකුරු අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රුල් පොතක් භාවිත කරන්න.

**පියවර 06**

- කෙටි ඉස්පිල්ල යෙදුණු අකුරු සහිත වචන පස්රුලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- එම වචන පස්රුලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- එහිදී අකුරු අතර නිසි පරතරය තබා ලිවීම පිළිබඳ අවධාරණය කරන්න.
- බලා ලියන ලද වචන ශබ්ද නඟා කියවීම සඳහා ද යොමු කරන්න.
- කෙටි ඉස්පිල්ල යෙදුණු අකුරු සහිත වචන කියවීමට සිසුන් යොමු කරන්න.
- කෙටි ඉස්පිල්ල යෙදුණු අකුරු සහිත වචන අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රුල් පොතක් භාවිත කරන්න.

**පියවර 07**

- කෙටි ඉස්පිල්ල යෙදුණු අකුරු තනිරූලේ ලිවීම ආදර්ශනය කරන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- තෝරා ගත් අකුරු කිහිපයකට කෙටි ඉස්පිල්ල සහිත කාඩ්පතක් තබමින් එම අකුරු ශබ්ද කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න
- ඒ සඳහා ගුරු සහාය ලබා දෙන්න.

**පියවර 08**

- කෙටි ඉස්පිල්ල යෙදුණු අකුරු කිහිපයක් තනිරූලේ ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි කෙටි ඉස්පිල්ල යෙදුණු අකුරු තනිරූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| සිත | බිම | හිම | කිරි | මිදි |

- වචන ලිවීම සඳහා තනිරූල් පොතක් භාවිත කරන්න.
- එම වචන ලිවීමේදී කෙටි ඉස්පිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- කෙටි ඉස්පිල්ල යෙදුණු අකුරු දෙකේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 09**

- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| ගිරය | මිනිසා | නිරිත | සාරිය | නරියා | පිඟාන |

- එම වචන ලිවීමේදී කෙටි ඉස්පිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- කෙටි ඉස්පිල්ල යෙදුණු අකුරු තුනේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 10**

- කෙටි ඉස්පිල්ල යෙදුණු අකුරු දෙකේ සහ අකුරු තුනේ වචන පහ බැගින් ගොඩනැගීම සඳහා සිසුන් යොමු කරන්න.
- ඒ සඳහා නිර්මාණශීලී විනෝදාත්මක ක්‍රියාකාරකම් සකස් කර ගන්න.

කියවීම් පොතේ ඇති පාඩම්වලින් කෙටි ඉස්පිල්ල යෙදුණු අකුරු සහිත වචන සොයා කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 21.1, 21.2, 21.3, 21.4, 21.5, 21.6 : දීක් ඉස්පිල්ල හඳුනා ගනිමු; නිවැරදි ව භාවිත කරමු.**

**කාලය** : පැය 02යි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- **අකුරු නුවණ 4** පොතේ පිටු අංක 17හි ඇතුළත් පහත සඳහන් කවිය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

| | |
|---|---|
| මී මැස්සනි | - එන්න එන්න |
| මිහිරි ගීත | - ගයන්න |
| මී හාමීත් | - එන්න එන්න |
| වීණාවක් | - වයන්න |
| හා හාමිත් | - එන්න එන්න |
| මිහිරි ගීත | - අහන්න |
| සීතල උදය ම පටන් - ගීත නදට නටන්න | |


- ඉහත කවියට සවන් දීම සඳහා සිසුන් යොමු කරන්න.
- කවිය දෙවතාවක් පමණ ගායනා කරන්න.

**පියවර 02**

- ඉහත කවිය කිහිප වරක් සිසුන් සමග ගායනා කරන්න.
- එම කවියෙහි මුලට 'ඊ' ශබ්දය යෙදුණු වචනයක් හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියන්න.
- එම වචනය කිහිප වරක් උච්චාරණය කරන්න.
- එම වචනය සිසුන් සමග ද කිහිප වරක් උච්චාරණය කරන්න.
- එහිදී වචනයේ මුලට යෙදෙන 'ඊ' ශබ්දය අවධාරණය කරන්න.
- වචනයක මුලට 'ඊ' ශබ්දය යෙදුණු, කවියේ ඇතුළත් වෙනත් වචනයක් පැවසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙලෙස කවියෙහි ඇතුළත් 'ඊ' ශබ්දය යෙදුණු වචන සොයා පැවසීමට අවස්ථාව දෙන්න. (මෙහිදී සිසුන් සමග සාකච්ඡා කර අදාළ වචන සෙවීම සහ පැවසීම සිදු කරන්න.)
- එම වචන වෙන ම තීරුවක සටහන් කරන්න.
- අනතුරුව එම වචන කිහිප වරක් ශබ්ද නගා සිසුන් සමග කියවන්න.
- එහිදී ඇසෙන 'ඊ' ශබ්දය අවධාරණය කරන්න.

**පියවර 03**

- ඉහත වචනවල 'ඊ' ශබ්දය සඳහා 'ඊ' අකුර වෙනුවට වෙනත් සංකේතයක් යෙදී ඇති බව පවසන්න.
- එම සංකේතය දීක් ඉස්පිල්ල නමින් හඳුන්වන බව පවසන්න.
- දීක් ඉස්පිල්ලේ හැඩය හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා දක්වන්න.



- ඉහත සංකේතය දික් ඉස්පිල්ල බවත් එහි ශබ්දය 'ඊ' බවත් අවධාරණය කරන්න.
- කවියෙන් උපුටා ලියූ වචනවල දික් ඉස්පිල්ල යෙදුණු අකුරු යටින් ඉරක් අඳින්න. (මෙය සිසුන් සමග සාකච්ඡා කරමින් සිදු කරන්න.)
- අකුරට එම පිල්ල යෙදී ඇති ස්ථානය සිසුන් සමග සාකච්ඡා කරමින් අවධාරණය කරන්න.
- එම අකුරු උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම අකුරු කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම අකුරු තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.
- අනතුරුව එම වචන උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම වචන කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම වචන තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.

**පියවර 04**

- **අකුරු නුවණ 4** පොතෙහි පිටු අංක 17හි සඳහන් කවිය සිසුන්ට කියවීමට යොමු කරන්න.
- එම කවිය කියවා එහි ඇති 'ඊ' ශබ්දය යෙදුණු අකුරු යටින් ඉරක් ඇඳීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකමෙහි යෙදෙන අතරතුර සිසුන් අසලට ගොස් ඔවුන්ට සහාය වන්න.

**පියවර 05**

- අකුරු කිහිපයකට දික් ඉස්පිල්ල යොදා පස්රූලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි දික් ඉස්පිල්ල යෙදුණු අකුරු පස්රූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- 'ඊ' ශබ්දය යෙදුණු අකුරු අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.

**පියවර 06**

- දික් ඉස්පිල්ල යෙදුණු අකුරු සහිත වචන පස්රූලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- එම වචන පස්රූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- එහිදී අකුරු අතර නිසි පරතරය තබා ලිවීම පිළිබඳ අවධාරණය කරන්න.
- බලා ලියන ලද වචන ශබ්ද නඟා කියවීම සඳහා ද යොමු කරන්න.
- දික් ඉස්පිල්ල යෙදුණු අකුරු සහිත වචන කියවීමට සිසුන් යොමු කරන්න.
- දික් ඉස්පිල්ල යෙදුණු අකුරු සහිත වචන අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.

**පියවර 07**

- දික් ඉස්පිල්ල යෙදුණු අකුරු තනිරූලේ ලිවීම ආදර්ශනය කරන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

- තෝරා ගත් අකුරු කිහිපයකට දික් ඉස්පිල්ල සහිත කාඩ්පතක් තබමින් එම අකුරු ශබ්ද කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න
- ඒ සඳහා ගුරු සහාය ලබා දෙන්න.

**පියවර 08**

- දික් ඉස්පිල්ල යෙදුණු අකුරු කිහිපයක් තනිරූලේ ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි දික් ඉස්පිල්ල යෙදුණු අකුරු තනිරූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| සීයා | බීම | හීන | ලීය | මීයා |

- වචන ලිවීම සඳහා තනිරූල් පොතක් භාවිත කරන්න.
- එම වචන ලිවීමේදී දික් ඉස්පිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- දික් ඉස්පිල්ල යෙදුණු අකුරු තුනේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 09**

- දික් ඉස්පිල්ල යෙදුණු අකුරු දෙකේ සහ අකුරු තුනේ වචන පහ බැගින් ගොඩනැගීම සඳහා සිසුන් යොමු කරන්න.
- ඒ සඳහා නිර්මාණශීලි විනෝදාත්මක ක්‍රියාකාරකම් සකස් කර ගන්න.

කියවීම් පොතේ ඇති පාඩම්වලින් දික් ඉස්පිල්ල යෙදුණු අකුරු සහිත වචන සොයා කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 21.1, 21.2, 21.3, 21.4, 21.5, 21.6 : කෙටි කොන් පාපිල්ල හඳුනා ගනිමු; නිවැරදි ව භාවිත කරමු.**

**කාලය** : පැය 02යි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- **අකුරු නුවණ 4** පොතේ පිටු අංක 21හි ඇතුළත් පහත සඳහන් කවිය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

පුංචි පුංචි - තිත් වැටිච්ච
පුංචි මුවා මං

ළා දලු කන - අහිංසක ම
පුංචි මුවා මං

රංචු පිටින් - යන්න කැමති
පුංචි මුවා මං

පුංචි ළමයි - හරි ම කැමති
පුංචි මුවා මං


- ඉහත කවියට සවන් දීම සඳහා සිසුන් යොමු කරන්න.
- කවිය දෙවතාවක් පමණ ගායනා කරන්න.

**පියවර 02**

- ඉහත කවිය කිහිප වරක් සිසුන් සමග ගායනා කරන්න.
- එම කවියෙහි මුලට 'උ' ශබ්දය යෙදුණු වචනයක් හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියන්න.
- එම වචනය කිහිප වරක් උච්චාරණය කරන්න.
- එම වචනය සිසුන් සමග ද කිහිප වරක් උච්චාරණය කරන්න.
- එහිදී වචනයේ මුලට යෙදෙන 'උ' ශබ්දය අවධාරණය කරන්න.
- වචනයක මුලට 'උ' ශබ්දය යෙදුණු, කවියේ ඇතුළත් වෙනත් වචනයක් පැවසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙලෙස කවියෙහි ඇතුළත් 'උ' ශබ්දය යෙදුණු වචන සොයා පැවසීමට අවස්ථාව දෙන්න. (මෙහිදී සිසුන් සමග සාකච්ඡා කර අදාළ වචන සෙවීම සහ පැවසීම සිදු කරන්න.)
- එම වචන වෙන ම තීරුවක සටහන් කරන්න.
- අනතුරුව එම වචන කිහිප වරක් ශබ්ද නගා සිසුන් සමග කියවන්න.
- එහිදී ඇසෙන 'උ' ශබ්දය අවධාරණය කරන්න.

**පියවර 03**

- ඉහත වචනවල 'උ' ශබ්දය සඳහා 'උ' අකුර වෙනුවට වෙනත් සංකේතයක් යෙදී ඇති බව පවසන්න.
- එම සංකේතය කෙටි කොන් පාපිල්ල නමින් හඳුන්වන බව පවසන්න.
- කෙටි කොන් පාපිල්ලේ හැඩය හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා දක්වන්න.



- ඉහත සංකේතය කෙටි කොන් පාපිල්ල බවත් එහි ශබ්දය 'උ' බවත් අවධාරණය කරන්න.
- කවියෙන් උපුටා ලියූ වචනවල කෙටි කොන් පාපිල්ල යෙදුණු අකුරු යටින් ඉරක් අඳින්න. (මෙය සිසුන් සමග සාකච්ඡා කරමින් සිදු කරන්න.)
- අකුරට එම පිල්ල යෙදී ඇති ස්ථානය සිසුන් සමග සාකච්ඡා කරමින් අවධාරණය කරන්න.
- එම අකුරු උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම අකුරු කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම අකුරු තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.
- අනතුරුව එම වචන උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම වචන කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම වචන තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.

### පියවර 04

- **අකුරු නුවණ 4** පොතෙහි පිටු අංක 21හි ඇති කවිය සිසුන්ට කියවීමට යොමු කරන්න.
- එම කවිය කියවා එහි ඇති 'උ' ශබ්දය යෙදුණු අකුරු යටින් ඉරක් ඇඳීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකමෙහි යෙදෙන අතරතුර සිසුන් අසලට ගොස් ඔවුන්ට සහාය වන්න.

### පියවර 05

- අකුරු කිහිපයකට කෙටි කොන් පාපිල්ල යොදා පස්රුලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි කෙටි කොන් පාපිල්ල යෙදුණු අකුරු පස්රුලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- 'උ' ශබ්දය යෙදුණු අකුරු අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රුල් පොතක් භාවිත කරන්න.

### පියවර 06

- කෙටි කොන් පාපිල්ල යෙදුණු අකුරු සහිත වචන පස්රුලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- එම වචන පස්රුලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- එහිදී අකුරු අතර නිසි පරතරය තබා ලිවීම පිළිබඳ අවධාරණය කරන්න.
- බලා ලියන ලද වචන ශබ්ද නගා කියවීම සඳහා ද යොමු කරන්න.
- කෙටි කොන් පාපිල්ල යෙදුණු අකුරු සහිත වචන කියවීමට සිසුන් යොමු කරන්න.
- කෙටි කොන් පාපිල්ල යෙදුණු අකුරු සහිත වචන අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රුල් පොතක් භාවිත කරන්න.

### පියවර 07

- කෙටි කොන් පාපිල්ල යෙදුණු අකුරු තනිරුලේ ලිවීම ආදර්ශනය කරන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- තෝරා ගත් අකුරු කිහිපයකට කෙටි කොන් පාපිල්ල සහිත කාඩ්පතක් තබමින් එම අකුරු ශබ්ද කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඒ සඳහා ගුරු සහාය ලබා දෙන්න.

### පියවර 08

- කෙටි කොන් පාපිල්ල යෙදුණු අකුරු කිහිපයක් තනිරුලේ ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි කෙටි කොන් පාපිල්ල යෙදුණු අකුරු තනිරුලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| නුග | මුවා | හුණු | දුර | සුබ |

- වචන ලිවීම සඳහා තනිරුල් පොතක් භාවිත කරන්න.

- එම වචන ලිවීමේදී කෙටි කොන් පාපිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- කෙටි කොන් පාපිල්ල යෙදුණු අකුරු දෙකේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 09**

- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| යුගය | බුබුළු | මුහුද | රවුම | ඔටුවා |

- එම වචන ලිවීමේදී කෙටි කොන් පාපිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- කෙටි කොන් පාපිල්ල යෙදුණු අකුරු තුනේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 10**

- කෙටි කොන් පාපිල්ල යෙදුණු අකුරු දෙකේ සහ අකුරු තුනේ වචන පහ බැගින් ගොඩනැඟීම සඳහා සිසුන් යොමු කරන්න.
- ඒ සඳහා නිර්මාණශීලි විනෝදාත්මක ක්‍රියාකාරකම් සකස් කර ගන්න.
- එම කතන්දර පොත්වල ඇතුළත් කෙටි කොන් පාපිල්ල සහිත වචන සොයා ලිවීමටත් කියවීමටත් යොමු කරන්න.
- මෙය ක්‍රීඩාවක් ආකාරයට සිදු කරන්න.

කියවීම් පොතේ ඇති පාඩම්වලින් කෙටි කොන් පාපිල්ල යෙදුණු අකුරු සහිත වචන සොයා කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 21.1, 21.2, 21.3, 21.4, 21.5, 21.6 : කෙටි වක් පාපිල්ල හඳුනා ගනිමු; නිවැරදි ව භාවිත කරමු.**

**කාලය** : පැය 02යි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- **අකුරු නුවණ 4** පොතේ පිටු අංක 25හි ඇතුළත් පහත සඳහන් කවිය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

වත්ත පහළ - කුඹුර අසල
කුමුදු සමන් - මල් පිපිලා

පුංචි තුඩින් - මල් පැණි බී
මීමැස්සන් - පියඹනවා

කුඹුර පුරා - ගුමු ගුමු ගී
මිහිරි හඬින් - පතුරනවා

- ඉහත කවියට සවන් දීම සඳහා සිසුන් යොමු කරන්න.
- කවිය දෙවතාවක් පමණ ගායනා කරන්න.

**පියවර 02**

- ඉහත කවිය කිහිප වරක් සිසුන් සමග ගායනා කරන්න.
- එම කවියෙහි මුලට 'උ' ශබ්දය යෙදුණු වචනයක් හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියන්න.
- එම වචනය කිහිප වරක් උච්චාරණය කරන්න.
- එම වචනය සිසුන් සමග ද කිහිප වරක් උච්චාරණය කරන්න.
- එහිදී වචනයේ මුලට යෙදෙන 'උ' ශබ්දය අවධාරණය කරන්න.
- වචනයක මුලට 'උ' ශබ්දය යෙදුණු, කවියේ ඇතුළත් වෙනත් වචනයක් පැවසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙලෙස කවියෙහි ඇතුළත් 'උ' ශබ්දය යෙදුණු වචන සොයා පැවසීමට අවස්ථාව දෙන්න. (මෙහිදී සිසුන් සමග සාකච්ඡා කර අදාළ වචන සෙවීම සහ පැවසීම සිදු කරන්න.)
- එම වචන වෙන ම තීරුවක සටහන් කරන්න.
- අනතුරුව එම වචන කිහිප වරක් ශබ්ද නඟා සිසුන් සමග කියවන්න.
- එහිදී ඇසෙන 'උ' ශබ්දය අවධාරණය කරන්න.

**පියවර 03**

- ඉහත වචනවල 'උ' ශබ්දය සඳහා 'උ' අකුර වෙනුවට වෙනත් සංකේතයක් යෙදී ඇති බව පවසන්න.
- එම සංකේතය කෙටි වක් පාපිල්ල නමින් හඳුන්වන බව පවසන්න.
- කෙටි වක් පාපිල්ලේ හැඩය හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා දක්වන්න.

| ු |
|---|

- ඉහත සංකේතය කෙටි වක් පාපිල්ල බවත් එහි ශබ්දය 'උ' බවත් අවධාරණය කරන්න.
- කවියෙන් උපුටා ලියූ වචනවල කෙටි වක් පාපිල්ල යෙදුණු අකුරු යටින් ඉරක් අඳින්න. (මෙය සිසුන් සමග සාකච්ඡා කරමින් සිදු කරන්න.)
- අකුරට එම පිල්ල යෙදී ඇති ස්ථානය සිසුන් සමග සාකච්ඡා කරමින් අවධාරණය කරන්න.
- එම අකුරු උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම අකුරු කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම අකුරු තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.
- අනතුරුව එම වචන උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම වචන කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම වචන තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.

**පියවර 04**

- **අකුරු නුවණ 4** පොතෙහි පිටු අංක 25හි ඇති කවිය සිසුන්ට කියවීමට යොමු කරන්න.
- එම කවිය කියවා එහි ඇති 'උ' ශබ්දය යෙදුණු අකුරු යටින් ඉරක් ඇඳීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකමෙහි යෙදෙන අතරතුර සිසුන් අසලට ගොස් ඔවුන්ට සහාය වන්න.

**පියවර 05**

- අකුරු කිහිපයකට කෙටි වක් පාපිල්ල යොදා පස්රූලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි කෙටි වක් පාපිල්ල යෙදුණු අකුරු පස්රූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- 'උ' ශබ්දය යෙදුණු අකුරු අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.

**පියවර 06**

- කෙටි වක් පාපිල්ල යෙදුණු අකුරු සහිත වචන පස්රූලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- එම වචන පස්රූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- එහිදී අකුරු අතර නිසි පරතරය තබා ලිවීම පිළිබඳ අවධාරණය කරන්න.
- බලා ලියන ලද වචන ශබ්ද නඟා කියවීම සඳහා ද යොමු කරන්න.
- කෙටි වක් පාපිල්ල යෙදුණු අකුරු සහිත වචන කියවීමට සිසුන් යොමු කරන්න.
- කෙටි වක් පාපිල්ල යෙදුණු අකුරු සහිත වචන අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.

**පියවර 07**

- කෙටි වක් පාපිල්ල යෙදුණු අකුරු තනිරූලේ ලිවීම ආදර්ශනය කරන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- තෝරා ගත් අකුරු කිහිපයකට කෙටි වක් පාපිල්ල සහිත කාඩ්පතක් තබමින් එම අකුරු ශබ්ද කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඒ සඳහා ගුරු සහාය ලබා දෙන්න.

**පියවර 08**

- කෙටි වක් පාපිල්ල යෙදුණු අකුරු කිහිපයක් තනිරූලේ ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි කෙටි වක් පාපිල්ල යෙදුණු අකුරු තනිරූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න..

| |
|---|
| කුඩ කුස කුර තුඩ ගුල |

- වචන ලිවීම සඳහා තනිරූල් පොතක් භාවිත කරන්න.
- එම වචන ලිවීමේදී කෙටි වක් පාපිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- කෙටි වක් පාපිල්ල යෙදුණු අකුරු දෙකේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 09**

- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| වතුර | කුකුළා | ගුහාව | කතුර | මිතුරා |
|---|---|---|---|---|

- එම වචන ලිවීමේදී කෙටි වක් පාපිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- කෙටි වක් පාපිල්ල යෙදුණු අකුරු තුනේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 10**

- කෙටි වක් පාපිල්ල යෙදුණු අකුරු දෙකේ සහ අකුරු තුනේ වචන පහ බැගින් ගොඩනැගීම සඳහා සිසුන් යොමු කරන්න.
- ඒ සඳහා නිර්මාණශීලී විනෝදාත්මක ක්‍රියාකාරකම් සකස් කර ගන්න.

කියවීම් පොතේ ඇති පාඩම්වලින් කෙටි වක් පාපිල්ල යෙදුණු අකුරු සහිත වචන සොයා කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 21.1, 21.2, 21.3, 21.4, 21.5, 21.6 : කෙටි ඇද පාපිල්ල හඳුනා ගනිමු; නිවැරදි ව භාවිත කරමු.**

**කාලය** : පැය 02යි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- **අකුරු නුවණ 4** පොතේ පිටු අංක 28හි ඇතුළත් පහත සඳහන් කවිය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

හිරු බැස යයි
කරුවල එයි
හඳ පායයි
කරුවල යයි

මුළු අහස ම
සරු කරමින්
කහ පාටින්
තරු බබළයි

- ඉහත කවියට සවන් දීම සඳහා සිසුන් යොමු කරන්න.
- කවිය දෙවතාවක් පමණ ගායනා කරන්න.

**පියවර 02**

- ඉහත කවිය කිහිප වරක් සිසුන් සමග ගායනා කරන්න.
- එම කවියෙහි මුලට 'උ' ශබ්දය යෙදුණු වචනයක් හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියන්න.
- එම වචනය කිහිප වරක් උච්චාරණය කරන්න.

- එම වචනය සිසුන් සමග ද කිහිප වරක් උච්චාරණය කරන්න.
- එහිදී වචනයේ මුලට යෙදෙන 'උ' ශබ්දය අවධාරණය කරන්න.
- වචනයක මුලට 'උ' ශබ්දය යෙදුණු, කවියේ ඇතුළත් වෙනත් වචනයක් පැවසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙලෙස කවියෙහි ඇතුළත් 'උ' ශබ්දය යෙදුණු වචන සොයා පැවසීමට අවස්ථාව දෙන්න. (මෙහිදී සිසුන් සමග සාකච්ඡා කර අදාළ වචන සෙවීම සහ පැවසීම සිදු කරන්න.)
- එම වචන වෙන ම තීරුවක සටහන් කරන්න.
- අනතුරුව එම වචන කිහිප වරක් ශබ්ද නගා සිසුන් සමග කියවන්න.
- එහිදී ඇසෙන 'උ' ශබ්දය අවධාරණය කරන්න.

**පියවර 03**

- ඉහත වචනවල 'උ' ශබ්දය සඳහා 'උ' අකුර වෙනුවට වෙනත් සංකේතයක් යෙදී ඇති බව පවසන්න.
- එම සංකේතය කෙටි ඇද පාපිල්ල නමින් හඳුන්වන බව පවසන්න.
- කෙටි ඇද පාපිල්ලේ හැඩය හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා දක්වන්න.

| ැ |
|---|

- ඉහත සංකේතය කෙටි ඇද පාපිල්ල බවත් එහි ශබ්දය 'උ' බවත් අවධාරණය කරන්න.
- කවියෙන් උපුටා ලියූ වචනවල කෙටි ඇද පාපිල්ල යෙදුණු අකුරු යටින් ඉරක් අඳින්න. (මෙය සිසුන් සමග සාකච්ඡා කරමින් සිදු කරන්න.)
- අකුරට එම පිල්ල යෙදී ඇති ස්ථානය සිසුන් සමග සාකච්ඡා කරමින් අවධාරණය කරන්න.
- එම අකුර උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම අකුර කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම අකුර තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.
- අනතුරුව එම වචන උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම වචන කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම වචන තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.

**පියවර 04**

- **අකුරු නුවණ 4** පොතෙහි පිටු අංක 28හි ඇති කවිය සිසුන්ට කියවීමට යොමු කරන්න.
- එම කවිය කියවා එහි ඇති 'උ' ශබ්දය යෙදුණු අකුරු යටින් ඉරක් ඇඳීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම අකුර උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකමෙහි යෙදෙන අතරතුර සිසුන් අසලට ගොස් ඔවුන්ට සහාය වන්න.

**පියවර 05**

- 'ර' අකුරට කෙටි ඇද පාපිල්ල යොදා පස්රූලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි 'රැ' අකුර පස්රූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- ඒ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.

**පියවර 06**

- කෙටි ඇද පාපිල්ල යෙදුණු අකුර සහිත වචන පස්රූලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- එම වචන පස්රූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- එහිදී අකුරු අතර නිසි පරතරය තබා ලිවීම පිළිබඳ අවධාරණය කරන්න.
- බලා ලියන ලද වචන ශබ්ද නඟා කියවීම සඳහා ද යොමු කරන්න.
- කෙටි ඇද පාපිල්ල යෙදුණු අකුර සහිත වචන කියවීමට සිසුන් යොමු කරන්න.
- කෙටි ඇද පාපිල්ල යෙදුණු අකුර සහිත වචන අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.

**පියවර 07**

- කෙටි ඇද පාපිල්ල යෙදුණු අකුර තනිරූලේ ලිවීම ආදර්ශනය කරන්න.
- එම අකුර උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- 'ර' අකුරට කෙටි ඇද පාපිල්ල සහිත කාඩ්පතක් තබමින් එම අකුර ශබ්ද කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න
- ඒ සඳහා ගුරු සහාය ලබා දෙන්න.

**පියවර 08**

- කෙටි ඇද පාපිල්ල යෙදුණු අකුර තනිරූලේ ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි කෙටි ඇද පාපිල්ල යෙදුණු අකුර තනිරූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න..
- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | | | |
|---|---|---|---|
| රුව | තරු | සරු | ඔරු |

- වචන ලිවීම සඳහා තනිරූල් පොතක් භාවිත කරන්න.
- එම වචන ලිවීමේදී කෙටි ඇද පාපිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- කෙටි ඇද පාපිල්ල යෙදුණු අකුරු දෙකේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 09**

- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | | | |
|---|---|---|---|
| තරුව | ඔරුව | දරුවා | පාරුව |

- එම වචන ලිවීමේදී කෙටි ඇද පාපිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න..
- කෙටි ඇද පාපිල්ල යෙදුණු අකුරු තුනේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 10**

- කෙටි ඇද පාපිල්ල යෙදුණු අකුරු දෙකේ සහ අකුරු තුනේ වචන පහ බැගින් ගොඩනැගීම සඳහා සිසුන් යොමු කරන්න.
- ඒ සඳහා නිර්මාණශීලී විනෝදාත්මක ක්‍රියාකාරකම් සකස් කර ගන්න.

කියවීම් පොතේ ඇති පාඩම්වලින් කෙටි ඇද පාපිල්ල යෙදුණු අකුරු සහිත වචන සොයා කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 21.1, 21.2, 21.3, 21.4, 21.5, 21.6 : දීක් කොන් පාපිල්ල හඳුනා ගනිමු; නිවැරදි ව භාවිත කරමු.**

**කාලය** : පැය 02යි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- **අකුරු නුවණ 4** පොතේ පිටු අංක 30හි ඇතුළත් පහත සඳහන් කවිය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

| | |
|---|---|
| පූසා ආවා | බූලා ආවා |
| පූසයි බූලයි | කිරි ටික බිවුවා |
| බඩගිනි නැති වී | පූසා දිවුවා |
| නිදිමත නැති වී | බූලත් දිවුවා |
| නූල් පන්දුවක් | ඇඳ යට තිබුණා |
| චූටි හිනාවක් | මූණට ආවා |
| පූසයි බූලයි | එකමුතු වීලා |
| නූල් පන්දුවට | දැතින් ගැහුවා |

- ඉහත කවියට සවන් දීම සඳහා සිසුන් යොමු කරන්න.
- කවිය දෙවතාවක් පමණ ගායනා කරන්න.


**පියවර 02**

- ඉහත කවිය කිහිප වරක් සිසුන් සමග ගායනා කරන්න.
- එම කවියෙහි ඇති මුලට 'ඌ' ශබ්දය යෙදුණු වචනයක් හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියන්න.
- එම වචනය කිහිප වරක් උච්චාරණය කරන්න.
- එම වචනය සිසුන් සමග ද කිහිප වරක් උච්චාරණය කරන්න.
- එහිදී වචනයේ මුලට යෙදෙන 'ඌ' ශබ්දය අවධාරණය කරන්න.
- වචනයක මුලට 'ඌ' ශබ්දය යෙදුණු, කවියේ ඇතුළත් වෙනත් වචනයක් පැවසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙලෙස කවියෙහි ඇතුළත් 'ඌ' ශබ්දය යෙදුණු වචන සොයා පැවසීමට අවස්ථාව දෙන්න.. (මෙහිදී සිසුන් සමග සාකච්ඡා කර අදාළ වචන සෙවීම සහ පැවසීම සිදු කරන්න.)
- එම වචන වෙන ම තීරුවක සටහන් කරන්න.
- අනතුරුව එම වචන කිහිප වරක් ශබ්ද නගා සිසුන් සමග කියවන්න.
- එහිදී ඇසෙන 'ඌ' ශබ්දය අවධාරණය කරන්න.

**පියවර 03**

- ඉහත වචනවල 'ඌ' ශබ්දය සඳහා 'උ' අකුර වෙනුවට වෙනත් සංකේතයක් යෙදී ඇති බව පවසන්න.
- එම සංකේතය දික් කොන් පාපිල්ල නමින් හඳුන්වන බව පවසන්න.

- දික් කොන් පාපිල්ලේ හැඩය හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා දක්වන්න.



- ඉහත සංකේතය දික් කොන් පාපිල්ල බවත් එහි ශබ්දය 'උෟ' බවත් අවධාරණය කරන්න.
- කවියෙන් උපුටා ලියූ වචනවල දික් කොන් පාපිල්ල යෙදුණු අකුරු යටින් ඉරක් අඳින්න. (මෙය සිසුන් සමග සාකච්ඡා කරමින් සිදු කරන්න.)
- අකුරට එම පිල්ල යෙදී ඇති ස්ථානය සිසුන් සමග සාකච්ඡා කරමින් අවධාරණය කරන්න.
- එම අකුරු උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම අකුරු කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම අකුරු තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.
- අනතුරුව එම වචන උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම වචන කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම වචන තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.

**පියවර 04**

- **අකුරු නුවණ 4** පොතෙහි පිටු අංක 30හි ඇති කවිය සිසුන්ට කියවීමට යොමු කරන්න.
- එම කවිය කියවා එහි ඇති 'උෟ' ශබ්දය යෙදුණු අකුරු යටින් ඉරක් ඇඳීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකමෙහි යෙදෙන අතරතුර සිසුන් අසලට ගොස් ඔවුන්ට සහාය වන්න.

**පියවර 05**

- අකුරු කිහිපයකට දික් කොන් පාපිල්ල යොදා පස්රූලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි දික් කොන් පාපිල්ල යෙදුණු අකුරු පස්රූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- 'උෟ' ශබ්දය යෙදුණු අකුරු අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.

**පියවර 06**

- දික් කොන් පාපිල්ල යෙදුණු අකුරු සහිත වචන පස්රූලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- එම වචන පස්රූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- එහිදී අකුරු අතර නිසි පරතරය තබා ලිවීම පිළිබඳ අවධාරණය කරන්න.
- බලා ලියන ලද වචන ශබ්ද නඟා කියවීම සඳහා ද යොමු කරන්න.
- දික් කොන් පාපිල්ල යෙදුණු අකුරු සහිත වචන කියවීමට සිසුන් යොමු කරන්න.
- දික් කොන් පාපිල්ල යෙදුණු අකුරු සහිත වචන අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.

**පියවර 07**

- දික් කොන් පාපිල්ල යෙදුණු අකුරු තනිරූලේ ලිවීම ආදර්ශනය කරන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

- තෝරා ගත් අකුරු කිහිපයකට දික් කොන් පාපිල්ල සහිත කාඩ්පතක් තබමින් එම අකුරු ශබ්ද කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඒ සඳහා ගුරු සහාය ලබා දෙන්න.

**පියවර 08**

- දික් කොන් පාපිල්ල යෙදුණු අකුරු කිහිපයක් තනිරූලේ ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි දික් කොන් පාපිල්ල යෙදුණු අකුරු තනිරූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| නූල | සූර | පූසා | හූනා | බූලා |

- වචන ලිවීම සඳහා තනිරූල් පොතක් භාවිත කරන්න.
- එම වචන ලිවීමේදී දික් කොන් පාපිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- දික් කොන් පාපිල්ල යෙදුණු අකුරු දෙකේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 09**

- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| බූන්දි | සූකිරි | දූවිලි | පූජාව | සූදුරු |

- එම වචන ලිවීමේදී දික් කොන් පාපිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- දික් කොන් පාපිල්ල යෙදුණු අකුරු තුනේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 10**

- දික් කොන් පාපිල්ල යෙදුණු අකුරු දෙකේ සහ අකුරු තුනේ වචන පහ බැගින් ගොඩනැඟීම සඳහා සිසුන් යොමු කරන්න.
- ඒ සඳහා නිර්මාණශීලි විනෝදාත්මක ක්‍රියාකාරකම් සකස් කර ගන්න.

කියවීම් පොතේ ඇති පාඩම්වලින් දික් කොන් පාපිල්ල යෙදුණු අකුරු සහිත වචන සොයා කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 21.1, 21.2, 21.3, 21.4, 21.5, 21.6 : දික් වක් පාපිල්ල හඳුනා ගනිමු; නිවැරදි ව භාවිත කරමු.**

**කාලය** : පැය 02යි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- **අකුරු නුවණ 4** පොතේ පිටු අංක 34හි ඇතුළත් පහත සඳහන් කවිය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

| | | |
|---|---|---|
| කුඹී කුඹී | - | කුඹී යාළු |
| එකමුතුවයි | - | හරි කදිමයි |
| කුඹී රංචු | - | නිතර සිටිති |
| කුඩය යට | - | කෑම අරන් |
| කුඹී කුඹී | - | සමගිය නිති |
| සුරකින හැටි | - | හරි අපූරු |

- ඉහත කවියට සවන් දීම සඳහා සිසුන් යොමු කරන්න.
- කවිය දෙවතාවක් පමණ ගායනා කරන්න.

**පියවර 02**

- ඉහත කවිය කිහිප වරක් සිසුන් සමග ගායනා කරන්න.
- එම කවියෙහි ඇති මුලට 'ඌ' ශබ්දය යෙදුණු වචනයක් හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියන්න.
- එම වචනය කිහිප වරක් උච්චාරණය කරන්න.
- එම වචනය සිසුන් සමග ද කිහිප වරක් උච්චාරණය කරන්න.
- එහිදී වචනයේ මුලට යෙදෙන 'ඌ' ශබ්දය අවධාරණය කරන්න.
- වචනයක මුලට 'ඌ' ශබ්දය යෙදුණු, කවියේ ඇතුළත් වෙනත් වචනයක් පැවසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙලෙස කවියෙහි ඇතුළත් 'ඌ' ශබ්දය යෙදුණු වචන සොයා පැවසීමට අවස්ථාව දෙන්න.. (මෙහිදී සිසුන් සමග සාකච්ඡා කර අදාළ වචන සෙවීම සහ පැවසීම සිදු කරන්න.)
- එම වචන වෙන ම තීරුවක සටහන් කරන්න.
- අනතුරුව එම වචන කිහිප වරක් ශබ්ද නඟා සිසුන් සමග කියවන්න.
- එහිදී ඇසෙන 'ඌ' ශබ්දය අවධාරණය කරන්න.

**පියවර 03**

- ඉහත වචනවල 'ඌ' ශබ්දය සඳහා 'උ' අකුර වෙනුවට වෙනත් සංකේතයක් යෙදී ඇති බව පවසන්න.
- එම සංකේතය දික් වක් පාපිල්ල නමින් හඳුන්වන බව පවසන්න.

- දික් වක් පාපිල්ලේ හැඩය හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා දක්වන්න.

ූ

- ඉහත සංකේතය දික් වක් පාපිල්ල බවත් එහි ශබ්දය 'ඌ' බවත් අවධාරණය කරන්න.
- කවියෙන් උපුටා ලියූ වචනවල දික් වක් පාපිල්ල යෙදුණු අකුරු යටින් ඉරක් අඳින්න. (මෙය සිසුන් සමග සාකච්ඡා කරමින් සිදු කරන්න.)
- අකුරට එම පිල්ල යෙදී ඇති ස්ථානය සිසුන් සමග සාකච්ඡා කරමින් අවධාරණය කරන්න.
- එම අකුරු උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම අකුරු කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම අකුරු තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.
- අනතුරුව එම වචන උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම වචන කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම වචන තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.

**පියවර 04**

- **අකුරු නුවණ 4** පොතෙහි පිටු අංක 34හි ඇති කවිය සිසුන්ට කියවීමට යොමු කරන්න.
- එම කවිය කියවා එහි ඇති 'ඌ' ශබ්දය යෙදුණු අකුරු යටින් ඉරක් ඇඳීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකමෙහි යෙදෙන අතරතුර සිසුන් අසලට ගොස් ඔවුන්ට සහාය වන්න.

**පියවර 05**

- අකුරු කිහිපයකට දික් වක් පාපිල්ල යොදා පස්රූලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි දික් වක් පාපිල්ල යෙදුණු අකුරු පස්රූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- 'ඌ' ශබ්දය යෙදුණු අකුරු අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.

**පියවර 06**

- දික් වක් පාපිල්ල යෙදුණු අකුරු සහිත වචන පස්රූලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- එම වචන පස්රූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- එහිදී අකුරු අතර නිසි පරතරය තබා ලිවීම පිළිබඳ අවධාරණය කරන්න.
- බලා ලියන ලද වචන ශබ්ද නගා කියවීම සඳහා ද යොමු කරන්න.
- දික් වක් පාපිල්ල යෙදුණු අකුරු සහිත වචන කියවීමට සිසුන් යොමු කරන්න.
- දික් වක් පාපිල්ල යෙදුණු අකුරු සහිත වචන අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.

**පියවර 07**

- දික් වක් පාපිල්ල යෙදුණු අකුරු තනිරූලේ ලිවීම ආදර්ශනය කරන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- තෝරා ගත් අකුරු කිහිපයකට දික් වක් පාපිල්ල සහිත කාඩ්පතක් තබමින් එම අකුරු ශබ්ද කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න
- ඒ සඳහා ගුරු සහාය ලබා දෙන්න.

**පියවර 08**

- දික් වක් පාපිල්ල යෙදුණු අකුරු කිහිපයක් තනිරූලේ ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි දික් වක් පාපිල්ල යෙදුණු අකුරු තනිරූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | | | |
|---|---|---|---|
| කූර | කූඩ | කූරා | කූඹි |

- වචන ලිවීම සඳහා තනිරූල් පොතක් භාවිත කරන්න.
- එම වචන ලිවීමේදී දික් වක් පාපිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- දික් වක් පාපිල්ල යෙදුණු අකුරු දෙකේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 09**

- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| කූඩය | කූඹියා | කූඩැල්ලා | කූනිස්සා | පින්තූර |

- එම වචන ලිවීමේදී දික් වක් පාපිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- දික් වක් පාපිල්ල යෙදුණු අකුරු තුනේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 10**

- දික් වක් පාපිල්ල යෙදුණු අකුරු දෙකේ සහ අකුරු තුනේ වචන පහ බැගින් ගොඩනැඟීම සඳහා සිසුන් යොමු කරන්න.
- ඒ සඳහා නිර්මාණශීලි විනෝදාත්මක ක්‍රියාකාරකම් සකස් කර ගන්න.

කියවීම් පොතේ ඇති පාඩම්වලින් දික් වක් පාපිල්ල යෙදුණු අකුරු සහිත වචන සොයා කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 21.1, 21.2, 21.3, 21.4, 21.5, 21.6 : දික් ඇද පාපිල්ල හඳුනා ගනිමු; නිවැරදි ව භාවිත කරමු.**

**කාලය** : පැය 02යි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- **අකුරු නුවණ 4** පොතේ පිටු අංක 37හි ඇතුළත් පහත සඳහන් කවිය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

| | | |
|---|---|---|
| රූපා නැන්දා | - | රූකඩ හදන්න |
| කඩිසර ගමනින් | - | එනවා සැම දින |
| රූකඩ හදලා | - | ලස්සන කරලා |
| රූස්ස ගස් යට | - | කදිමට තියලා |
| රූකඩ බලන්න | - | එන්නට කියලා |
| රූපා නැන්දා | - | සැමට ම කිවුවා |

- ඉහත කවියට සවන් දීම සඳහා සිසුන් යොමු කරන්න.
- කවිය දෙවතාවක් පමණ ගායනා කරන්න.

**පියවර 02**

- ඉහත කවිය කිහිප වරක් සිසුන් සමග ගායනා කරන්න.
- එම කවියෙහි ඇති මුලට 'ඌ' ශබ්දය යෙදුණු වචනයක් හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියන්න.
- එම වචනය කිහිප වරක් උච්චාරණය කරන්න.
- එම වචනය සිසුන් සමග ද කිහිප වරක් උච්චාරණය කරන්න.
- එහිදී වචනයේ මුලට යෙදෙන 'ඌ' ශබ්දය අවධාරණය කරන්න.
- වචනයක මුලට 'ඌ' ශබ්දය යෙදුණු, කවියේ ඇතුළත් වෙනත් වචනයක් පැවසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙලෙස කවියෙහි ඇතුළත් 'ඌ' ශබ්දය යෙදුණු වචන සොයා පැවසීමට අවස්ථාව දෙන්න. (මෙහිදී සිසුන් සමග සාකච්ඡා කර අදාළ වචන සෙවීම සහ පැවසීම සිදු කරන්න.)
- එම වචන වෙන ම තීරුවක සටහන් කරන්න.
- අනතුරුව එම වචන කිහිප වරක් ශබ්ද නඟා සිසුන් සමග කියවන්න.
- එහිදී ඇසෙන 'ඌ' ශබ්දය අවධාරණය කරන්න.

**පියවර 03**

- ඉහත වචනවල 'ඌ' ශබ්දය සඳහා 'ඌ' අකුර වෙනුවට වෙනත් සංකේතයක් යෙදී ඇති බව පවසන්න.
- එම සංකේතය දික් ඇද පාපිල්ල නමින් හඳුන්වන බව පවසන්න.
- දික් ඇද පාපිල්ලේ හැඩය හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා දක්වන්න.

ෑ

- ඉහත සංකේතය දික් ඇද පාපිල්ල බවත් එහි ශබ්දය 'ඇෑ' බවත් අවධාරණය කරන්න.
- කවියෙන් උපුටා ලියූ වචනවල දික් ඇද පාපිල්ල යෙදුණු අකුරු යටින් ඉරක් අඳින්න. (මෙය සිසුන් සමග සාකච්ඡා කරමින් සිදු කරන්න.)
- අකුරට එම පිල්ල යෙදී ඇති ස්ථානය සිසුන් සමග සාකච්ඡා කරමින් අවධාරණය කරන්න.
- එම අකුර උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම අකුර කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම අකුර තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.
- අනතුරුව එම වචන උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම වචන කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම වචන තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.

**පියවර 04**

- **අකුරු නුවණ 4** පොතෙහි පිටු අංක 37හි ඇති කවිය සිසුන්ට කියවීමට යොමු කරන්න.
- එම කවිය කියවා එහි ඇති 'ඇෑ' ශබ්දය යෙදුණු අකුර යටින් ඉරක් ඇඳීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම අකුර උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකමෙහි යෙදෙන අතරතුර සිසුන් අසලට ගොස් ඔවුන්ට සහාය වන්න.

**පියවර 05**

- 'ර' අකුරට දික් ඇද පාපිල්ල යොදා පස්රුලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි දික් ඇද පාපිල්ල යෙදුණු අකුරු පස්රුලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- 'ඇෑ' ශබ්දය යෙදුණු අකුර අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රුල් පොතක් භාවිත කරන්න.

**පියවර 06**

- දික් ඇද පාපිල්ල යෙදුණු අකුර සහිත වචන පස්රුලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- එම වචන පස්රුලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- එහිදී අකුරු අතර නිසි පරතරය තබා ලිවීම පිළිබඳ අවධාරණය කරන්න.
- බලා ලියන ලද වචන ශබ්ද නඟා කියවීම සඳහා ද යොමු කරන්න.
- දික් ඇද පාපිල්ල යෙදුණු අකුර සහිත වචන කියවීමට සිසුන් යොමු කරන්න.
- දික් ඇද පාපිල්ල යෙදුණු අකුර සහිත වචන අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රුල් පොතක් භාවිත කරන්න.

### පියවර 07

- දික් ඇද පාපිල්ල යෙදුණු අකුර තනිරූලේ ලිවීම ආදර්ශනය කරන්න.
- එම අකුර උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- 'ර' අකුරට දික් ඇද පාපිල්ල සහිත කාඩ්පතක් තබමින් එම අකුරු ශබ්ද කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න
- ඒ සඳහා ගුරු සහාය ලබා දෙන්න.

### පියවර 08

- දික් ඇද පාපිල්ල යෙදුණු අකුර තනිරූලේ ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි දික් ඇද පාපිල්ල යෙදුණු අකුර තනිරූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | |
|---|---|
| රූප | රූල |

- වචන ලිවීම සඳහා තනිරූල් පොතක් භාවිත කරන්න.
- එම වචන ලිවීමේදී දික් ඇද පාපිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- දික් ඇද පාපිල්ල යෙදුණු අකුරු දෙකේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

### පියවර 09

- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| රූස්ස | රූකඩ | රූපය | අඩිරූල | රූපවාහිනිය |

- එම වචන ලිවීමේදී දික් ඇද පාපිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- දික් ඇද පාපිල්ල යෙදුණු අකුරු තුනේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

### පියවර 10

- දික් ඇද පාපිල්ල යෙදුණු අකුරු දෙකේ සහ අකුරු තුනේ වචන පහ බැගින් ගොඩනැගීම සඳහා සිසුන් යොමු කරන්න.
- ඒ සඳහා නිර්මාණශීලි විනෝදාත්මක ක්‍රියාකාරකම් සකස් කර ගන්න.

කියවීම් පොතේ ඇති පාඩම්වලින් දික් ඇද පාපිල්ල යෙදුණු අකුරු සහිත වචන සොයා කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 21.1, 21.2, 21.3, 21.4, 21.5, 21.6 : කොම්බුව හඳුනා ගනිමු; නිවැරදි ව භාවිත කරමු.**

**කාලය** : පැය 02යි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

### පියවර 01

- **අකුරු නුවණ 4** පොතේ පිටු අංක 39හි ඇතුළත් පහත සඳහන් කවිය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

> නෙල්ලි වෙරළු බෙලි
> රස ගුණ පලතුරු
> කමු අපි නිරතුරු
> ලෙඩ දුක් වෙයි දුරු
>
> කෙසෙල් දෙළුම් රස
> හරි ම අගෙයි මට
> පලතුරු සැමට ම
> සලසයි සුව සෙත

- ඉහත කවියට සවන් දීම සඳහා සිසුන් යොමු කරන්න.
- කවිය දෙවතාවක් පමණ ගායනා කරන්න.

### පියවර 02

- ඉහත කවිය කිහිප වරක් සිසුන් සමග ගායනා කරන්න.
- එම කවියෙහි මුලට 'එ' ශබ්දය යෙදුණු වචනයක් හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියන්න.
- එම වචනය කිහිප වරක් උච්චාරණය කරන්න.
- එම වචනය සිසුන් සමග ද කිහිප වරක් උච්චාරණය කරන්න.
- එහිදී වචනයේ මුලට යෙදෙන 'එ' ශබ්දය අවධාරණය කරන්න.
- වචනයක මුලට 'එ' ශබ්දය යෙදුණු, කවියේ ඇතුළත් වෙනත් වචනයක් පැවසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙලෙස කවියෙහි ඇතුළත් 'එ' ශබ්දය යෙදුණු වචන සොයා පැවසීමට අවස්ථාව දෙන්න. (මෙහිදී සිසුන් සමග සාකච්ඡා කර අදාළ වචන සෙවීම සහ පැවසීම සිදු කරන්න.)
- එම වචන වෙන ම තීරුවක සටහන් කරන්න.
- අනතුරුව එම වචන කිහිප වරක් ශබ්ද නගා සිසුන් සමග කියවන්න.
- එහිදී ඇසෙන 'එ' ශබ්දය අවධාරණය කරන්න.

### පියවර 03

- ඉහත වචනවල 'එ' ශබ්දය සඳහා 'එ' අකුර වෙනුවට වෙනත් සංකේතයක් යෙදී ඇති බව පවසන්න.
- එම සංකේතය කොම්බුව නමින් හඳුන්වන බව පවසන්න.
- කොම්බුවේ හැඩය හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා දක්වන්න.

ෙ

- ඉහත සංකේතය කොම්බුව බවත් එහි ශබ්දය 'එ' බවත් අවධාරණය කරන්න.
- කවියෙන් උපුටා ලියූ වචනවල කොම්බුව යෙදුණු අකුරු යටින් ඉරක් අඳින්න. (මෙය සිසුන් සමග සාකච්ඡා කරමින් සිදු කරන්න.)
- අකුරට එම පිල්ල යෙදී ඇති ස්ථානය සිසුන් සමග සාකච්ඡා කරමින් අවධාරණය කරන්න.
- එම අකුරු උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම අකුරු කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම අකුරු තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.
- අනතුරුව එම වචන උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම වචන කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම වචන තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.

**පියවර 04**

- **අකුරු නුවණ 4** පොතෙහි පිටු අංක 39හි ඇති කවිය සිසුන්ට කියවීමට යොමු කරන්න.
- එම කවිය කියවා එහි ඇති 'එ' ශබ්දය යෙදුණු අකුරු යටින් ඉරක් ඇඳීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකමෙහි යෙදෙන අතරතුර සිසුන් අසලට ගොස් ඔවුන්ට සහාය වන්න.

**පියවර 05**

- අකුරු කිහිපයකට කොම්බුව යොදා පස්රූලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි කොම්බුව යෙදුණු අකුරු පස්රූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- 'එ' ශබ්දය යෙදුණු අකුරු අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.

**පියවර 06**

- කොම්බුව යෙදුණු අකුරු සහිත වචන පස්රූලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- එම වචන පස්රූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- එහිදී අකුරු අතර නිසි පරතරය තබා ලිවීම පිළිබඳ අවධාරණය කරන්න.
- බලා ලියන ලද වචන ශබ්ද නඟා කියවීම සඳහා ද යොමු කරන්න.
- කොම්බුව යෙදුණු අකුරු සහිත වචන කියවීමට සිසුන් යොමු කරන්න.
- කොම්බුව යෙදුණු අකුරු සහිත වචන අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.

**පියවර 07**

- කොම්බුව යෙදුණු අකුරු තනිරූලේ ලිවීම ආදර්ශනය කරන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- තෝරා ගත් අකුරු කිහිපයකට කොම්බුව සහිත කාඩ්පතක් තබමින් එම අකුරු ශබ්ද කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න
- ඒ සඳහා ගුරු සහාය ලබා දෙන්න.

### පියවර 08

- කොම්බුව යෙදුණු අකුරු කිහිපයක් තනිරූලේ ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි කොම්බුව යෙදුණු අකුරු තනිරූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| |
|---|
| බෙර ගෙල තෙල් බෙලි රෙදි |

- වචන ලිවීම සඳහා තනිරූල් පොතක් භාවිත කරන්න.
- එම වචන ලිවීමේදී කොම්බුව නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරවන්න.
- කොම්බුව යෙදුණු අකුරු දෙකේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

### පියවර 09

- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| |
|---|
| ගෙදර කෙසෙල් සෙවණ බෙරය නෙලුම් |

- එම වචන ලිවීමේදී කොම්බුව නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- කොම්බුව යෙදුණු අකුරු තුනේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

### පියවර 10

- කොම්බුව යෙදුණු අකුරු දෙකේ සහ අකුරු තුනේ වචන පහ බැගින් ගොඩනැගීම සඳහා සිසුන් යොමු කරන්න.
- ඒ සඳහා නිර්මාණශීලී විනෝදාත්මක ක්‍රියාකාරකම් සකස් කර ගන්න.

කියවීම් පොතේ ඇති පාඩම්වලින් කොම්බුව යෙදුණු අකුරු සහිත වචන සොයා කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 21.1, 21.2, 21.3, 21.4, 21.5, 21.6 : කොම්බුව සහ හල් කිරීමේ ලකුණ හඳුනා ගනිමු; නිවැරදි ව භාවිත කරමු.**

**කාලය** : පැය 02යි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

### පියවර 01

- **අකුරු නුවණ 4** පොතේ පිටු අංක 43හි ඇතුළත් පහත සඳහන් කවිය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

> පේර ගසේ අතු මත්තේ
> ලේන් හාමි සිටින අගේ
> ඉදුණු පේර කන්න වගේ
> බලයි නිතර හතර වටේ
>
> පේර කෑව ලේන් හාමි
> බඩ පුරවා සතුටු වෙලා
> ටිං ටිං ගා හඬ නගලා
> පේර ගසට තුති පිදුවා


- ඉහත කවියට සවන් දීම සඳහා සිසුන් යොමු කරන්න.
- කවිය දෙවතාවක් පමණ ගායනා කරන්න.

### පියවර 02

- ඉහත කවිය කිහිප වරක් සිසුන් සමග ගායනා කරන්න.
- එම කවියෙහි මුලට 'ඒ' ශබ්දය යෙදුණු වචනයක් හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියන්න.
- එම වචනය කිහිප වරක් උච්චාරණය කරන්න.
- එම වචනය සිසුන් සමග ද කිහිප වරක් උච්චාරණය කරන්න.
- එහිදී වචනයේ මුලට යෙදෙන 'ඒ' ශබ්දය අවධාරණය කරන්න.
- වචනයක මුලට 'ඒ' ශබ්දය යෙදුණු, කවියේ ඇතුළත් වෙනත් වචනයක් පැවසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙලෙස කවියෙහි ඇතුළත් 'ඒ' ශබ්දය යෙදුණු වචන සොයා පැවසීමට අවස්ථාව දෙන්න.. (මෙහිදී සිසුන් සමග සාකච්ඡා කර අදාළ වචන සෙවීම සහ පැවසීම සිදු කරන්න.)
- එම වචන වෙන ම තීරුවක සටහන් කරන්න.
- අනතුරුව එම වචන කිහිප වරක් ශබ්ද නගා සිසුන් සමග කියවන්න.
- එහිදී ඇසෙන 'ඒ' ශබ්දය අවධාරණය කරන්න.

### පියවර 03

- ඉහත වචනවල 'ඒ' ශබ්දය සඳහා 'ඒ' අකුර වෙනුවට වෙනත් සංකේතයක් යෙදී ඇති බව පවසන්න.
- එම සංකේතය කොම්බුව නමින් හඳුන්වන බව පවසන්න.
- කොම්බුව සහ හල් කිරීමේ ලකුණ සහිත අවස්ථා දෙක නිරූපණය වන හැඩ හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා දක්වන්න.



- ඉහත සංකේතය කොම්බුව සහ හල් කිරීමේ ලකුණ බවත් එහි ශබ්දය 'ඒ' බවත් අවධාරණය කරන්න.
- කවියෙන් උපුටා ලියූ වචනවල කොම්බුව සහ හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු යටින් ඉරක් අඳින්න. (මෙය සිසුන් සමග සාකච්ඡා කරමින් සිදු කරන්න.)
- අකුරට එම පිල්ල යෙදී ඇති ස්ථානය සිසුන් සමග සාකච්ඡා කරමින් අවධාරණය කරන්න.
- එම අකුරු උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම අකුරු කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම අකුරු තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.
- අනතුරුව එම වචන උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම වචන කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම වචන තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.

**පියවර 04**

- **අකුරු නුවණ 4** පොතෙහි පිටු අංක 43හි ඇති කවිය සිසුන්ට කියවීමට යොමු කරන්න.
- එම කවිය කියවා එහි ඇති 'ඒ' ශබ්දය යෙදුණු අකුරු යටින් ඉරක් ඇඳීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකමෙහි යෙදෙන අතරතුර සිසුන් අසලට ගොස් ඔවුන්ට සහාය වන්න.

**පියවර 05**

- අකුරු කිහිපයකට කොම්බුව සහ හල් කිරීමේ ලකුණ යොදා පස්රුලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි කොම්බුව සහ හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු පස්රුලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- 'ඒ' ශබ්දය යෙදුණු අකුරු අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රුල් පොතක් භාවිත කරන්න.

**පියවර 06**

- කොම්බුව සහ හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු සහිත වචන පස්රුලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- එම වචන පස්රුලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- එහිදී අකුරු අතර නිසි පරතරය තබා ලිවීම පිළිබඳ අවධාරණය කරන්න.
- බලා ලියන ලද වචන ශබ්ද නඟා කියවීම සඳහා ද යොමු කරන්න.
- කොම්බුව සහ හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු සහිත වචන කියවීමට සිසුන් යොමු කරන්න.
- කොම්බුව සහ හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු සහිත වචන අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රුල් පොතක් භාවිත කරන්න.

**පියවර 07**

- කොම්බුව සහ හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු තනිරුලේ ලිවීම ආදර්ශනය කරන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- තෝරා ගත් අකුරු කිහිපයකට කොම්බුව සහ හල් කිරීමේ ලකුණ සහිත කාඩ්පතක් තබමින් එම අකුරු ශබ්ද කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න
- ඒ සඳහා ගුරු සහාය ලබා දෙන්න.

**පියවර 08**

- කොම්බුව සහ හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු කිහිපයක් තනිරුලේ ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි කොම්බුව සහ හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු තනිරුලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| ලේනා | පේර | වේයා | සේර | හේන |

- වචන ලිවීම සඳහා තනිරුල් පොතක් භාවිත කරන්න.
- එම වචන ලිවීමේදී කොම්බුව සහිත හල් කිරීමේ ලකුණ නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- කොම්බුව සහිත හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු දෙකේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 09**

- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| මේසය | බේසම | සේසත | වේවැල | ඩේලියා |

- එම වචන ලිවීමේදී කොම්බුව සහිත හල් කිරීම නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- කොම්බුව සහිත හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු තුනේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 10**

- කොම්බුව සහිත හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු දෙකේ සහ අකුරු තුනේ වචන පහ බැගින් ගොඩනැගීම සඳහා සිසුන් යොමු කරන්න.
- ඒ සඳහා නිර්මාණශීලි විනෝදාත්මක ක්‍රියාකාරකම් සකස් කර ගන්න.

කියවීම් පොතේ ඇති පාඩම්වලින් කොම්බුව සහ හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු සහිත වචන සොයා කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 21.1, 21.2, 21.3, 21.4, 21.5, 21.6 : කොම්බුව සහ ඇලපිල්ල හඳුනා ගනිමු; නිවැරදි ව භාවිත කරමු.**

**කාලය** : පැය 02යි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- **අකුරු නුවණ 4** පොතේ පිටු අංක 48හි ඇතුළත් පහත සඳහන් කවිය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

> ගොවි මාමා කුඹුර කොටා
> නියර බඳියි කඩිමුඩියේ
> කොක්කු ඇවිත් කුඹුර වටේ
> පෙළගැසිලා සිටින අගේ
>
> ගොවි මාමගෙ කුඹුර අසල
> පොල් ගස් මොර ගස් ද තිබේ
> ගොවි මාමට සෙවණ දෙන්න
> කොහොඹ ගසුත් හොඳට හැදේ

- ඉහත කවියට සවන් දීම සඳහා සිසුන් යොමු කරන්න.
- කවිය දෙවතාවක් පමණ ගායනා කරන්න.

**පියවර 02**

- ඉහත කවිය කිහිප වරක් සිසුන් සමග ගායනා කරන්න.
- එම කවියෙහි මුලට 'ඔ' ශබ්දය යෙදුණු වචනයක් හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියන්න.
- එම වචනය කිහිප වරක් උච්චාරණය කරන්න.
- එම වචනය සිසුන් සමග ද කිහිප වරක් උච්චාරණය කරන්න.
- එහිදී වචනයේ මුලට යෙදෙන 'ඔ' ශබ්දය අවධාරණය කරන්න.
- වචනයක මුලට 'ඔ' ශබ්දය යෙදුණු, කවියේ ඇතුළත් වෙනත් වචනයක් පැවසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙලෙස කවියෙහි ඇතුළත් 'ඔ' ශබ්දය යෙදුණු වචන සොයා පැවසීමට අවස්ථාව දෙන්න. (මෙහිදී සිසුන් සමග සාකච්ඡා කර අදාළ වචන සෙවීම සහ පැවසීම සිදු කරන්න.)
- එම වචන වෙන ම තීරුවක සටහන් කරන්න.
- අනතුරුව එම වචන කිහිප වරක් ශබ්ද නගා සිසුන් සමග කියවන්න.
- එහිදී ඇසෙන 'ඔ' ශබ්දය අවධාරණය කරන්න.

**පියවර 03**

- ඉහත වචනවල 'ඔ' ශබ්දය සඳහා 'ඔ' අකුර වෙනුවට වෙනත් සංකේතයක් යෙදී ඇති බව පවසන්න.
- එම සංකේතය කොම්බුව සහ ඇලපිල්ල නමින් හඳුන්වන බව පවසන්න.
- කොම්බුව සහ ඇලපිල්ලේ හැඩ හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා දක්වන්න.

ෙ ා

- ඉහත සංකේතය කොම්බුව සහ ඇලපිල්ල බවත් එහි ශබ්දය 'ඔ' බවත් අවධාරණය කරන්න.
- කවියෙන් උපුටා ලියූ වචනවල කොම්බුව සහ ඇලපිල්ල යෙදුණු අකුරු යටින් ඉරක් අඳින්න. (මෙය සිසුන් සමග සාකච්ඡා කරමින් සිදු කරන්න.)
- අකුරට එම පිල්ල යෙදී ඇති ස්ථානය සිසුන් සමග සාකච්ඡා කරමින් අවධාරණය කරන්න.
- එම අකුරු උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම අකුරු කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම අකුරු තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.
- අනතුරුව එම වචන උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම වචන කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම වචන තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.

**පියවර 04**

- **අකුරු නුවණ 4** පොතෙහි පිටු අංක 48හි ඇති කවිය සිසුන්ට කියවීමට යොමු කරන්න.
- එම කවිය කියවා එහි ඇති 'ඔ' ශබ්දය යෙදුණු අකුරු යටින් ඉරක් ඇඳීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකමෙහි යෙදෙන අතරතුර සිසුන් අසලට ගොස් ඔවුන්ට සහාය වන්න.

**පියවර 05**

- අකුරු කිහිපයකට කොම්බුව සහිත ඇලපිල්ල යොදා පස්රූලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි කොම්බුව සහ ඇලපිල්ල යෙදුණු අකුරු පස්රූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- 'ඔ' ශබ්දය යෙදුණු අකුරු අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.

**පියවර 06**

- කොම්බුව සහ ඇලපිල්ල යෙදුණු අකුරු සහිත වචන පස්රූලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- එම වචන පස්රූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- එහිදී අකුරු අතර නිසි පරතරය තබා ලිවීම පිළිබඳ අවධාරණය කරන්න.
- බලා ලියන ලද වචන ශබ්ද නගා කියවීම සඳහා ද යොමු කරන්න.
- කොම්බුව සහ ඇලපිල්ල යෙදුණු අකුරු සහිත වචන කියවීමට සිසුන් යොමු කරන්න.
- කොම්බුව සහ ඇලපිල්ල යෙදුණු අකුරු සහිත වචන අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රූල් පොතක් භාවිත කරන්න.

**පියවර 07**

- කොම්බුව සහ ඇලපිල්ල යෙදුණු අකුරු තනිරූලේ ලිවීම ආදර්ශනය කරන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- තෝරා ගත් අකුරු කිහිපයකට කොම්බුව සහ ඇලපිල්ල සහිත කාඩ්පතක් තබමින් එම අකුරු ශබ්ද කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඒ සඳහා ගුරු සහාය ලබා දෙන්න.

**පියවර 08**

- කොම්බුව සහ ඇලපිල්ල යෙදුණු අකුරු කිහිපයක් තනිරූලේ ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි කොම්බුව සහ ඇලපිල්ල යෙදුණු අකුරු තනිරූලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| පොත | දොළ | කොළ | මොර | කොස් |

- වචන ලිවීම සඳහා තනිරූල් පොතක් භාවිත කරන්න.
- එම වචන ලිවීමේදී කොම්බුව සහ ඇලපිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- කොම්බුව සහ ඇලපිල්ල යෙදුණු අකුරු දෙකේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 09**

- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| කොහොඹ | පොහොර | ගොවියා | කොස්ස | කොමඩු |

- එම වචන ලිවීමේදී කොම්බුව සහ ඇලපිල්ල නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- කොම්බුව සහ ඇලපිල්ල යෙදුණු අකුරු තුනේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 10**

- කොම්බුව සහ ඇලපිල්ල යෙදුණු අකුරු දෙකේ සහ අකුරු තුනේ වචන පහ බැගින් ගොඩනැඟීම සඳහා සිසුන් යොමු කරන්න.
- ඒ සඳහා නිර්මාණශීලි විනෝදාත්මක ක්‍රියාකාරකම් සකස් කර ගන්න.

කියවීම් පොතේ ඇති පාඩම්වලින් කොම්බුව සහ ඇලපිල්ල යෙදුණු අකුරු සහිත වචන සොයා කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 21.1, 21.2, 21.3, 21.4, 21.5, 21.6 : කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ හඳුනා ගනිමු; නිවැරදි ව භාවිත කරමු.**

**කාලය** : පැය 02යි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- **අකුරු නුවණ 4** පොතේ පිටු අංක 52හි ඇතුළත් පහත සඳහන් කවිය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

> රෝස ගහේ මල් පිපිලා
> බිංදු බිංදු පිනි වැටිලා
> ඉර එළියට හැඩ වීලා
> රෝස මලක් දිලිසෙනවා
>
> රෝස මලින් සරසාලා
> පෝච්චිය ම හැඩ කරලා
> මේසය උඩ එය තියලා
> සෝදිසියෙන් හැඩ බැලුවා

- ඉහත කවියට සවන් දීම සඳහා සිසුන් යොමු කරන්න.
- කවිය දෙවතාවක් පමණ ගායනා කරන්න.

**පියවර 02**

- ඉහත කවිය කිහිප වරක් සිසුන් සමග ගායනා කරන්න.
- එම කවියෙහි මුලට 'ඕ' ශබ්දය යෙදුණු වචනයක් හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියන්න.
- එම වචනය කිහිප වරක් උච්චාරණය කරන්න.
- එම වචනය සිසුන් සමග ද කිහිප වරක් උච්චාරණය කරන්න.
- එහිදී වචනයේ මුලට යෙදෙන 'ඕ' ශබ්දය අවධාරණය කරන්න.
- වචනයක මුලට 'ඕ' ශබ්දය යෙදුණු, කවියේ ඇතුළත් වෙනත් වචනයක් පැවසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙලෙස කවියෙහි ඇතුළත් 'ඕ' ශබ්දය යෙදුණු වචන සොයා පැවසීමට අවස්ථාව දෙන්න. (මෙහිදී සිසුන් සමග සාකච්ඡා කර අදාළ වචන සෙවීම සහ පැවසීම සිදු කරන්න.)
- එම වචන වෙන ම තීරුවක සටහන් කරන්න.
- අනතුරුව එම වචන කිහිප වරක් ශබ්ද නඟා සිසුන් සමග කියවන්න.
- එහිදී ඇසෙන 'ඕ' ශබ්දය අවධාරණය කරන්න.

**පියවර 03**

- ඉහත වචනවල 'ඔ' ශබ්දය සඳහා 'ඕ' අකුර වෙනුවට වෙනත් සංකේතයක් යෙදී ඇති බව පවසන්න.
- එම සංකේතය කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ නමින් හඳුන්වන බව පවසන්න.
- කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා දක්වන්න.

ෙ ා්

- ඉහත සංකේතය කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ බවත් එහි ශබ්දය 'ඕ' බවත් අවධාරණය කරන්න.
- කවියෙන් උපුටා ලියූ වචනවල කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු යටින් ඉරක් අඳින්න. (මෙය සිසුන් සමග සාකච්ඡා කරමින් සිදු කරන්න.)
- අකුරට එම පිල්ල යෙදී ඇති ස්ථානය සිසුන් සමග සාකච්ඡා කරමින් අවධාරණය කරන්න.
- එම අකුරු උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම අකුරු කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම අකුරු තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.
- අනතුරුව එම වචන උච්චාරණය කරන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග එම වචන කිහිප වරක් උච්චාරණය කරන්න.
- සිසුන්ට එම වචන තනි ව උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.

**පියවර 04**

- **අකුරු නුවණ 4** පොතෙහි පිටු අංක 52හි ඇති කවිය සිසුන්ට කියවීමට යොමු කරන්න.
- එම කවිය කියවා එහි ඇති 'ඕ' ශබ්දය යෙදුණු අකුරු යටින් ඉරක් ඇඳීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ක්‍රියාකාරකමෙහි යෙදෙන අතරතුර සිසුන් අසලට ගොස් ඔවුන්ට සහාය වන්න.

**පියවර 05**

- අකුරු කිහිපයකට කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ යොදා පස්රුලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු පස්රුලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න.
- 'ඕ' ශබ්දය යෙදුණු අකුරු අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රුල් පොතක් භාවිත කරන්න.

**පියවර 06**

- කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු සහිත වචන පස්රුලේ ලියන ආකාරය ආදර්ශනය කරන්න.
- එම වචන පස්රුලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න.
- එහිදී අකුරු අතර නිසි පරතරය තබා ලිවීම පිළිබඳ අවධාරණය කරන්න.
- බලා ලියන ලද වචන ශබ්ද නඟා කියවීම සඳහා ද යොමු කරන්න.
- කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු සහිත වචන කියවීමට සිසුන් යොමු කරන්න.
- කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු සහිත වචන අසා ලිවීම සඳහා ද ලබා දෙන්න.
- ඒ සඳහා පස්රුල් පොතක් භාවිත කරන්න.

**පියවර 07**

- කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු තනිරුලේ ලිවීම ආදර්ශනය කරන්න.
- එම අකුරු උච්චාරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- තෝරා ගත් අකුරු කිහිපයකට කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ සහිත කාඩ්පතක් තබමින් එම අකුරු ශබ්ද කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඒ සඳහා ගුරු සහාය ලබා දෙන්න.

**පියවර 08**

- කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු කිහිපයක් තනිරුලේ ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- **අකුරු නුවණ 4** පොතෙහි කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු තනිරුලේ බලා ලිවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරන්න...
- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| මෝරා | ගෝවා | සෝයා | කෝපි | දෝසි |

- වචන ලිවීම සඳහා තනිරුල් පොතක් භාවිත කරන්න.
- එම වචන ලිවීමේදී කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු දෙකේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 09**

- පහත දැක්වෙන වචන කියවීමට සහ බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| හෝරාව | දෝලාව | බෝලය | රෝදය | ජෝගුව |

- එම වචන ලිවීමේදී කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු තුනේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එම වචන ලිවීමේදී කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ නිවැරදි ව යෙදීමටත් අකුරු අතර නිසි පරතරය තබා ලිවීමටත් සිසුන් යොමු කරන්න.
- කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු තුනේ වචන අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 10**

- කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු දෙකේ සහ අකුරු තුනේ වචන පහ බැගින් ගොඩනැගීම සඳහා සිසුන් යොමු කරන්න.
- ඒ සඳහා නිර්මාණශීලි විනෝදාත්මක ක්‍රියාකාරකම් සකස් කර ගන්න.
- කියවීම් පොතේ ඇති පාඩම්වලින් කොම්බුව සහ ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ යෙදුණු අකුරු සහිත වචන සොයා කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

උගත් සියලු පිළි අකුරු කිහිපයකට යොදා සිසුන්ට කියවීමට අවස්ථාව දෙන්න. මෙහිදී එක් අකුරකට විවිධ පිළි යෙදීමේදී සිදු වන ශබ්දමය වෙනස අවධාරණය කරන්න. උදාහරණ : කා, කැ, කෑ, කි, කී, කු, කූ, කෙ, කේ, කො, කෝ

තක්සේරුකරණය :

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 21.1 නිර්දිෂ්ට පිලි පහළොව යෙදුණු අකුර බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් පස්රුලේ ලියයි. | 21.1.1 නියමිත අංග සහිත වීම | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු පහළොවක් හෝ දහහතරක් නියමිත අංග සහිත ව ලියයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු දහතුනක් හෝ දොළහක් නියමිත අංග සහිත ව ලියයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු එකොළහත් අටත් අතර සංඛ්‍යාවක් නියමිත අංග සහිත ව ලියයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු අටකට අඩු සංඛ්‍යාවක් නියමිත අංග සහිත ව ලියයි. |
| | 21.1.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු පහළොවක් හෝ දහහතරක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු දහතුනක් හෝ දොළහක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු එකොළහත් අටත් අතර සංඛ්‍යාවක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු අටකට අඩු සංඛ්‍යාවක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. |
| | 21.1.3 නියමිත ප්‍රමාණයට ලිවීම | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු පහළොවක් හෝ දහහතරක් නියමිත ප්‍රමාණයට ලියයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු දහතුනක් හෝ දොළහක් නියමිත ප්‍රමාණයට ලියයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු එකොළහත් අටත් අතර සංඛ්‍යාවක් නියමිත ප්‍රමාණයට ලියයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු අටකට අඩු සංඛ්‍යාවක් නියමිත ප්‍රමාණයට ලියයි. |
| | 21.1.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම | නිවැරදි දිශාව අනුගමනය කරමින් නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු පහළොවක් හෝ දහහතරක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු දහතුනක් හෝ දොළහක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු එකොළහත් අටත් අතර සංඛ්‍යාවක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු අටකට අඩු සංඛ්‍යාවක් ලියයි. |
| 21.2 නිර්දිෂ්ට පිලි පහළොව යෙදුණු අකුර බැගින් නිවැරදි ව උච්චාරණය කරමින් ශබ්ද නඟා කියවයි. | 21.2.1 නිවැරදි වීම | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු පහළොවක් හෝ දහහතරක් නිවැරදි ව උච්චාරණය කරයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු දහතුනක් හෝ දොළහක් නිවැරදි ව උච්චාරණය කරයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු එකොළහත් අටත් අතර සංඛ්‍යාවක් නිවැරදි ව උච්චාරණය කරයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු අටකට අඩු සංඛ්‍යාවක් නිවැරදි ව උච්චාරණය කරයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 21.3 නිර්දිෂ්ට එක් එක් පිල්ල යෙදුණු අකුරු හතරකට නොවැඩි වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් පස්රූලේ අසා ලියයි. | 21.3.1 නියමිත අංග සහිත වීම | අකුරුවල නියමිත අංග සහිත ව වචන තිහත් විසිහතත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන විසිහයත් විසිහතරත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන විසිතුනත් පහළොවත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන පහළොවට අඩු සංඛ්‍යාවක් අසා ලියයි. |
| | 21.3.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන තිහත් විසිහතත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන විසිහයත් විසිහතරත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන විසිතුනත් පහළොවත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන පහළොවට අඩු සංඛ්‍යාවක් අසා ලියයි. |
| | 21.3.3 නියමිත ප්‍රමාණයට ලිවීම | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන තිහත් විසිහතත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන විසිහයත් විසිහතරත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන විසිතුනත් පහළොවත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන පහළොවට අඩු සංඛ්‍යාවක් අසා ලියයි. |
| | 21.3.4 නියමිත ප්‍රමාණයට ලිවීම | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන තිහත් විසිහතත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන විසිහයත් විසිහතරත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන විසිතුනත් පහළොවත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන පහළොවට අඩු සංඛ්‍යාවක් අසා ලියයි. |
| | 21.3.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම | අකුරු අතර නිසි පරතරය තබමින් වචන තිහත් විසිහතත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන විසිහයත් විසිහතරත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන විසිතුනත් පහළොවත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන පහළොවට අඩු සංඛ්‍යාවක් අසා ලියයි. |
| 21.4 නිර්දිෂ්ට පිලි පහළොව යෙදුණු අකුර බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරූලේ ලියයි. | 21.4.1 නියමිත අංග සහිත වීම | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු පහළොවක් හෝ දහහතරක් නියමිත අංග සහිත ව ලියයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු දහතුනක් හෝ දොළහක් නියමිත අංග සහිත ව ලියයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු එකොළහත් අටත් අතර සංඛ්‍යාවක් නියමිත අංග සහිත ව ලියයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු අටකට අඩු සංඛ්‍යාවක් නියමිත අංග සහිත ව ලියයි. |
| | 21.4.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු පහළොවක් හෝ දහහතරක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු දහතුනක් හෝ දොළහක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු එකොළහත් අටත් අතර සංඛ්‍යාවක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු අටකට අඩු සංඛ්‍යාවක් නිවැරදි හැඩයෙන් යුතු ව ලියයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 21.4.3 නියමිත ප්‍රමාණයට ලිවීම | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු පහළොවක් හෝ දහහතරක් නියමිත ප්‍රමාණයට ලියයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු දහතුනක් හෝ දොළහක් නියමිත ප්‍රමාණයට ලියයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු එකොළහත් අටත් අතර සංඛ්‍යාවක් නියමිත ප්‍රමාණයට ලියයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු අටකට අඩු සංඛ්‍යාවක් නියමිත ප්‍රමාණයට ලියයි. |
| | 21.4.4 නිවැරදි දිශාව අනුමතනය කිරීම | නිවැරදි දිශාව අනුගමනය කරමින් නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු පහළොවක් හෝ දහහතරක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු දහතුනක් හෝ දොළහක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු එකොළහත් අටත් අතර සංඛ්‍යාවක් ලියයි. | නිවැරදි දිශාව අනුගමනය කරමින් නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු අටකට අඩු සංඛ්‍යාවක් ලියයි. |
| 21.5 නිර්දිෂ්ට පිලි පහළොව යෙදුණු අකුර බැගින් නිවැරදි ව උච්චාරණය කරමින් ශබ්ද නඟා කියවයි. | 21.5.1 නිවැරදි වීම | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු පහළොවක් හෝ දහහතරක් නිවැරදි ව උච්චාරණය කරයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු දහතුනක් හෝ දොළහක් නිවැරදි ව උච්චාරණය කරයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු එකොළහත් අටත් අතර සංඛ්‍යාවක් නිවැරදි ව උච්චාරණය කරයි. | නිර්දිෂ්ට පිලි යෙදුණු අකුරු අටකට අඩු සංඛ්‍යාවක් නිවැරදි ව උච්චාරණය කරයි. |
| 21.6 නිර්දිෂ්ට එක් එක් පිල්ල යෙදුණු අකුරු හතරකට නොවැඩි වචන දෙක බැගින් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරුලේ අසා ලියයි. | 21.6.1 නියමිත අංග සහිත වීම | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන තිහත් විසිහතත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන විසිහයත් විසිහතරත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන විසිතුනත් පහළොවත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරුවල නියමිත අංග සහිත ව වචන පහළොවට අඩු සංඛ්‍යාවක් අසා ලියයි. |
| | 21.6.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන තිහත් විසිහතත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන විසිහයත් විසිහතරත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන විසිතුනත් පහළොවත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරුවල නිවැරදි හැඩය සහිත ව වචන පහළොවට අඩු සංඛ්‍යාවක් අසා ලියයි. |
| | 21.6.3 නියමිත ප්‍රමාණයට ලිවීම | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන තිහත් විසිහතත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන විසිහයත් විසිහතරත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන විසිතුනත් පහළොවත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරුවල නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව වචන පහළොවට අඩු සංඛ්‍යාවක් අසා ලියයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 21.6.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන තිහත් විසිහතත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන විසිහයත් විසිහතරත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන විසිතුනත් පහළොවත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් වචන පහළොවට අඩු සංඛ්‍යාවක් අසා ලියයි. |
| | 21.6.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම | අකුරු අතර නිසි පරතරය තබමින් වචන තිහත් විසිහතත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන විසිහයත් විසිහතරත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන විසිතුනත් පහළොවත් අතර සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරු අතර නිසි පරතරය තබමින් වචන පහළොවට අඩු සංඛ්‍යාවක් අසා ලියයි. |

**විෂය නිර්දේශයේ උද්ධෘතය**

| සාමාන්‍ය භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | ඇගයීම් නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා<br>ශා.භා.කා | 22. අර්ථවත් වාක්‍ය කථන ව්‍යවහාරයෙන් නිවැරදි ව ලියයි. | 'අප අවට සත්තු' තේමාව ඇසුරෙන් කථන ව්‍යවහාරයෙන් රචිත වචන 60කට නොවැඩි අත් අකුරින් ලියන ලද සරල කතන්දරයක්<br>▪ බලා ලිවීම<br>▪ අසා ලිවීම<br>▪ වාක්‍ය නිර්මාණය කිරීම<br>▪ වචන අතර නිසි පරතරය<br>▪ නැවතීමේ ලකුණ | ▪ සවන් දීම<br>▪ කියවීම<br>▪ ලිවීම | 22.1 වචන හතරකට නොවැඩි කථන ව්‍යවහාරයේ වාක්‍ය දෙකක් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරුලේ නිවැරදි ව බලා ලියයි. | 22.1.1 නියමිත අංග සහිත වීම<br>22.1.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>22.1.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>22.1.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම<br>22.1.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම<br>22.1.6 වචන අතර නිසි පරතරය තැබීම<br>22.1.7 නැවතීමේ ලකුණ නිවැරදි ව යෙදීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ■ කථන ව්‍යවහාරය<br>■ අර්ථාවබෝධය<br>■ වචන හතරක පමණ වාක්‍ය<br>■ වාක්‍යයක අර්ථවත් ලෙස වචන ගැළපීම<br>■ අකුරු නිවැරදි ව ලිවීම | | 22.2 වචන හතරකට නොවැඩි කථන ව්‍යවහාරයේ වාක්‍ය දෙකක් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරූලේ නිවැරදි ව අසා ලියයි. | 22.2.1 නියමිත අංග සහිත වීම<br>22.2.2 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>22.2.3 නියමිත ප්‍රමාණයට ලිවීම<br>22.2.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම<br>22.2.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම<br>22.2.6 වචන අතර නිසි පරතරය තැබීම<br>22.2.7 නැවතීමේ ලකුණ නිවැරදි ව යෙදීම |
| | | | | 22.3 දෙන ලද වචන නිවැරදි ව ගළපා වචන හතරකට නොවැඩි කථන ව්‍යවහාරයේ අර්ථවත් වාක්‍ය දෙකක් නිර්මාණය කර යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරූලේ ලියයි. | 22.3.1 වචන නිවැරදි ව ගැළපීම<br>22.3.2 නියමිත අංග සහිත වීම<br>22.3.3 නිවැරදි හැඩයෙන් යුතු වීම<br>22.3.4 නියමිත ප්‍රමාණයට ලිවීම<br>22.3.5 නිවැරදි දිශාව අනුගමනය කිරීම<br>22.3.6 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම<br>22.3.7 වචන අතර නිසි පරතරය තැබීම<br>22.3.8 නැවතීමේ ලකුණ නිවැරදි ව යෙදීම |

**ක්‍රියාකාරකම 22.1, 22.2, 22.3 : වාක්‍ය ලියමු.**

**කාලය** : පැය 03යි.

**ඉගෙනුම් සම්පත්** : විශාල ලෙස සකස් කර ගත් ඡේදය, වචන කාඩ්පත්, පින්තූරවලට අදාළ QR කේත

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- පහත සඳහන් කතන්දරය කිහිප වරක් ශබ්ද නඟා කියවන්න.

**හොඳ යහළුවෝ**

හා පැංචයි මුව පැංචයි හරි ම යාළුයි. ඒ දෙන්නා හවසට සෙල්ලම් කරනවා. දවසක් මේ දෙන්නා ගං ඉවුරට ආවා. අලි පැංචා ගඟේ නානවා. 'අපිත් ආසයි නාන්න' හා පැංචා කිව්වා. 'මං නාවන්නම්' අලි පැංචා කිව්වා. 'අපි වතුරට බහින්න බයයි' මුව පැංචා කිව්වා. 'එන්න, මගේ පිටට නගින්න. ගඟ මැදට එක්ක යන්නම්' කියා අලි පැංචා පහත් වුණා. හා පැංචා පිට උඩට පැන්නා. හොඬවැලෙන් උස්සා මුව පැංචාව පිට උඩින් තියා ගත්තා. තුන්දෙනා ම ගඟ මැදට ගියා. හොඬවැලෙන් වතුර ගෙන යහළුවන් නෑව්වා. අලි පැංචා යහළුවන් දෙදෙනාව ගොඩට ගෙනාවා. හා පැංචාත් මුව පැංචාත් අලි පැංචාට ස්තුති කළා.

- ඉහත සඳහන් කතන්දරයේ අන්තර්ගතය සිසුන් සමග සාකච්ඡා කරන්න.
- එම කතන්දරය සිසුන් සමග ද කිහිප වරක් ශබ්ද නඟා කියවන්න.

**පියවර 02**

- ඉහත කතන්දරයේ ඇතුළත් පළමුවන වාක්‍යය හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියන්න.

  උදා : හා පැංචයි මුව පැංචයි හරි ම යාළුයි.
- මෙම වාක්‍යයේ අදහස සිසුන්ට සරල ව පැහැදිලි කරන්න.
- එම වාක්‍යයට නිශ්චිත සහ පැහැදිලි අදහසක් ලැබී ඇත්තේ එම වාක්‍යයේ ඇතුළත් වචන නිවැරදි ලෙස ගැළපීමෙන් බව සිසුන්ට පැහැදිලි කරන්න.
- මෙලෙස කතන්දරයේ ඇතුළත් වාක්‍ය කිහිපයක් උදාහරණයට ගෙන අර්ථවත් ලෙස වාක්‍ය ගොඩනැඟී ඇති ආකාරය සිසුන්ට පැහැදිලි කර දෙන්න.
- වචන නිවැරදි ලෙස ගැළපීමෙන් අර්ථවත් වාක්‍ය ගොඩනැඟිය හැකි බවත් එය ලියා දැක්වීමේදී තව දුරටත් අර්ථවත් වීම උදෙසා නැවතීමේ ලකුණ ලෙස තිත '.' යෙදීමේ වැදගත්කමත් ලියන ලද වාක්‍ය උදාහරණයට ගෙන සරල ව පැහැදිලි කර දෙන්න.
- ඒ අනුව තිත '.' වාක්‍යයක් අවසානයේ යෙදෙන ආකාරය ඉස්මතු කරමින් අදාළ පැහැදිලි කිරීම් සිදු කරන්න.
- ලියන ලද වාක්‍ය සිසුන් සමග කිහිප වරක් කියවන්න.
- නැවත නැවතත් එම වාක්‍යවල තිත '.' යෙදී ඇති අවස්ථාව සහ ස්ථානය පිළිබඳ අවධාරණය කරන්න.

**පියවර 03**

- 'හොඳ යහළුවෝ' කතන්දරය විශාල ලෙස සකස් කර සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.
- එම කතන්දරය කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- කතන්දරය කියවීමේදී එහි අදහස අවබෝධ කර ගැනීම උදෙසා නැවතීමේ ලකුණට අනුගත ව කියවීමේ වැදගත්කම සහ එහි ප්‍රායෝගික භාවිතය ප්‍රදර්ශනය සඳහා ගුරු ආදර්ශනය ලබා දෙන්න.

**පියවර 04**

- 'හොඳ යහළුවෝ' කතන්දරයේ ඇතුළත් වාක්‍ය තනිරූලේ ලියන ආකාරය පිළිබඳ හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියා ආදර්ශනය කරන්න.
- මෙහිදී ලිවීමේ යාන්ත්‍රික කුසලතා කෙරෙහි සැලකිලිමත් වීම පිළිබඳ ඉදිරිපත් කරන වාක්‍ය ඇසුරෙන් පැහැදිලි කරන්න.
- වාක්‍ය ලිවීමේදී වචන අතර පරතරය මෙන් ම වචනයක අකුරු අතර පරතරය තබන ආකාරය පිළිබඳ ද සරල ව පැහැදිලි කරන්න.
- වාක්‍ය අවසානයේ නැවතීමේ ලකුණ ලෙස තිත '.' යෙදීම අවධාරණය කරන්න.

**පියවර 05**

- 'හොඳ යහළුවෝ' කතන්දරයේ ඇතුළත් වාක්‍ය දෙකක් බලා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එහිදී ලිවීමේ යාන්ත්‍රික කුසලතා අනුගමනය කිරීම මෙන් ම වාක්‍යවල වචන අතර පරතරය මෙන් ම වචනයක අකුරු අතර පරතරය තැබීම සහ නිවැරදි ස්ථානයේ තිත '.' තැබීම කෙරෙහි සැලකිලිමත් වන්න.

**පියවර 06**

- 'හොඳ යහළුවෝ' කතන්දරයේ ඇතුළත් වාක්‍ය දෙකක් අසා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එහිදී ලිවීමේ යාන්ත්‍රික කුසලතා අනුගමනය කිරීම මෙන් ම වාක්‍යවල වචන අතර පරතරය මෙන් ම වචනයක අකුරු අතර පරතරය තැබීම සහ නිවැරදි ස්ථානයේ තිත '.' තැබීම කෙරෙහි සැලකිලිමත් වන්න.

**පියවර 07**

- වාක්‍ය නිර්මාණය සඳහා පහත වචන කාඩ්පත් සාදා ගන්න.

| | | | |
|---|---|---|---|
| මම | හොඳ | ළමයෙක් | අපි |
| පාසලට | ආදරෙයි. | මල්ලී | සෙල්ලම් |
| කරනවා. | අක්කා | කවි | කියනවා. |

- මෙම වාක්‍ය කාඩ්පත් අපිළිවෙළට තබා ප්‍රදර්ශනය කරන්න.
- එම වචන ගළපා අර්ථවත් වාක්‍ය ගොඩනගන අයුරු එකින් එක පැහැදිලි කරන්න.

**පියවර 08**

- මෙලෙස අපිළිවෙළට ඇති වචන ගළපා අර්ථවත් වාක්‍ය ගොඩනගන ආකාරය හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ඉදිරිපත් කරන්න.
- වාක්‍ය අර්ථවත් වීමට වචන මනා ව නිවැරදි ව ගැළපිය යුතු බවට එම වාක්‍ය ඇසුරෙන් සරල ව අවධාරණය කරන්න.

**පියවර 09**

- සිසුන් යුගල කරන්න.
- වාක්‍ය කිහිපයක් ගොඩනැඟිය හැකි වචන සහිත කාඩ්පත් සිසු යුගලවලට ලබා දෙන්න.
- එම වචන කාඩ්පත් ගළපා අර්ථවත් වාක්‍ය ගොඩනැඟීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් සිසුන්ට ලබා දෙන්න.

**පියවර 10**

- පහත සඳහන් පින්තූරය සෑම සිසුවෙකුට ම පෙනෙන පරිදි පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- ඒ සඳහා පහත QR කේතය භාවිත කළ හැකි ය.



Channel NIE

- එම පින්තූරය හොඳින් නිරීක්ෂණය කිරීමට සිසුන් යොමු කරන්න.
- එම පින්තූරයෙහි අන්තර්ගතය සිසුන් සමග සාකච්ඡා කරන්න.
- එම අන්තර්ගතය ඉස්මතු වන පරිදි වාක්‍ය ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඒ සඳහා පළමුව ගුරු ආදර්ශනයක් සිදු කරන්න.
- පින්තූරයෙන් ඉස්මතු වන අන්තර්ගතය වාක්‍ය ලෙස හුණු පුවරුවේ හෝ ප්‍රදර්ශන පුවරුවේ හෝ ලියන්න.
- මෙහිදී සිසුන් සමග සාකච්ඡා කරමින් අදාළ වාක්‍ය ලිවීම සිදු කරන්න.

**පියවර 11**

- පහත පින්තූර දෙක සැම සිසුවෙකුට ම පෙනෙන පරිදි පන්තියේ ප්‍රදර්ශනය කරන්න. ඒ සඳහා පහත QR කේත භාවිත කළ හැකි ය.

**උදාහරණ :**





- ඉහත පින්තූර දෙකෙන් කැමති පින්තූරයක් දෙස බලා එහි අන්තර්ගතය ඉස්මතු වන පරිදි අර්ථවත් වාක්‍ය දෙකක් ගොඩනඟා ලිවීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 22.1 වචන හතරකට නොවැඩි කථන ව්‍යවහාරයේ වාක්‍ය දෙකක් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරූලේ නිවැරදි ව බලා ලියයි. | 22.1.1 නියමිත අංග සහිත වීම | අකුරු එකක් හෝ දෙකක් හැර ඉතුරු අකුරු නියමිත අංග සහිත ව බලා ලියයි. | අකුරු තුනක් හෝ හතරක් හැර ඉතුරු අකුරු නියමිත අංග සහිත ව බලා ලියයි. | අකුරුවලින් අඩකට වැඩි සංඛ්‍යාවක් නියමිත අංග සහිත ව බලා ලියයි. | අකුරුවලින් අඩකට අඩු සංඛ්‍යාවක් නියමිත අංග සහිත ව බලා ලියයි. |
| | 22.1.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | අකුරු එකක් හෝ දෙකක් හැර ඉතුරු අකුරු නිවැරදි හැඩය සහිත ව බලා ලියයි. | අකුරු තුනක් හෝ හතරක් හැර ඉතුරු අකුරු නිවැරදි හැඩය සහිත ව බලා ලියයි. | අකුරුවලින් අඩකට වැඩි සංඛ්‍යාවක් නියමිත හැඩය සහිත ව බලා ලියයි. | අකුරුවලින් අඩකට අඩු සංඛ්‍යාවක් නියමිත හැඩය සහිත ව බලා ලියයි. |
| | 22.1.3 නියමිත ප්‍රමාණයට ලිවීම | අකුරු එකක් හෝ දෙකක් හැර ඉතුරු අකුරු නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව බලා ලියයි. | තුනක් හෝ හතරක් හැර ඉතුරු අකුරු නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව බලා ලියයි. | අකුරුවලින් අඩකට වැඩි සංඛ්‍යාවක් නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව බලා ලියයි. | අකුරුවලින් අඩකට අඩු සංඛ්‍යාවක් නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව බලා ලියයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 22.1.4 නිවැරදි දිශාව අනුගමනය කිරීම | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් අකුරු එකක් හෝ දෙකක් හැර ඉතුරු අකුරු බලා ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් අකුරු තුනක් හෝ හතරක් හැර ඉතුරු අකුරු බලා ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් අකුරුවලින් අඩකට වැඩි සංඛ්‍යාවක් බලා ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් අකුරුවලින් අඩකට අඩු සංඛ්‍යාවක් බලා ලියයි. |
| | 22.1.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම | සියලු ම අකුරු අතර නිසි පරතරය තබයි. | | සියලු ම අකුරු අතර නිසි පරතරය නො තබයි. | |
| | 22.1.6 වචන අතර නිසි පරතරය තැබීම | සියලු ස්ථානවල වචන අතර නිසි පරතරය තබයි. | | සියලු ස්ථානවල වචන අතර නිසි පරතරය නො තබයි. | |
| | 22.1.7 නැවතීමේ ලකුණ නිවැරදි ව යෙදීම | වාක්‍ය දෙකෙහි ම නැවතීමේ ලකුණ නිවැරදි ස්ථානයේ යොදයි. | | වාක්‍ය දෙකෙහි ම නැවතීමේ ලකුණ නිවැරදි ස්ථානයේ නො යොදයි. | |
| 22.2 වචන හතරකට නොවැඩි කථන ව්‍යවහාරයේ වාක්‍ය දෙකක් යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරුලේ නිවැරදි ව අසා ලියයි. | 22.2.1 නියමිත අංග සහිත වීම | අකුරු එකක් හෝ දෙකක් හැර ඉතුරු අකුරු නියමිත අංග සහිත ව අසා ලියයි. | අකුරු තුනක් හෝ හතරක් හැර ඉතුරු අකුරු නියමිත අංග සහිත ව අසා ලියයි. | අකුරුවලින් අඩකට වැඩි සංඛ්‍යාවක් නියමිත අංග සහිත ව අසා ලියයි. | අකුරුවලින් අඩකට අඩු සංඛ්‍යාවක් නියමිත අංග සහිත ව අසා ලියයි. |
| | 22.2.2 නිවැරදි හැඩයෙන් යුතු වීම | අකුරු එකක් හෝ දෙකක් හැර ඉතුරු අකුරු නිවැරදි හැඩය සහිත ව අසා ලියයි. | අකුරු තුනක් හෝ හතරක් හැර ඉතුරු අකුරු නිවැරදි හැඩය සහිත ව අසා ලියයි. | අකුරුවලින් අඩකට වැඩි සංඛ්‍යාවක් නියමිත හැඩය සහිත ව බලා ලියයි. | අකුරුවලින් අඩකට අඩු සංඛ්‍යාවක් නියමිත හැඩය සහිත ව බලා ලියයි. |
| | 22.2.3 නියමිත ප්‍රමාණයට ලිවීම | අකුරු එකක් හෝ දෙකක් හැර ඉතුරු අකුරු නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව අසා ලියයි. | අකුරු තුනක් හෝ හතරක් හැර ඉතුරු අකුරු නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව අසා ලියයි. | අකුරුවලින් අඩකට වැඩි සංඛ්‍යාවක් නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව අසා ලියයි. | අකුරුවලින් අඩකට අඩු සංඛ්‍යාවක් නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව අසා ලියයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 22.2.4 නිවැරදි දිශාව අනුග මනය කිරීම | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් අකුරු එකක් හෝ දෙකක් හැර ඉතුරු අකුරු අසා ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් තුනක් හෝ හතරක් හැර ඉතුරු අකුරු අසා ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් අඩකට වැඩි සංඛ්‍යාවක් අසා ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් අකුරුවලින් අඩකට අඩු සංඛ්‍යාවක් අසා ලියයි. |
| | 22.2.5 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම | සියලු ම අකුරු අතර නිසි පරතරය තබයි. | | සියලු ම අකුරු අතර නිසි පරතරය නො තබයි. | |
| | 22.2.6 වචන අතර නිසි පරතරය තැබීම | සියලු ස්ථානවල වචන අතර නිසි පරතරය තබයි. | | සියලු ස්ථානවල වචන අතර නිසි පරතරය නො තබයි. | |
| | 22.2.7 නැවතීමේ ලකුණ නිවැරදි ව යෙදීම | වාක්‍ය දෙකෙහි ම නැවතීමේ ලකුණ නිවැරදි ස්ථානයේ යොදයි. | | වාක්‍ය දෙකෙහි ම නැවතීමේ ලකුණ නිවැරදි ස්ථානයේ නො යොදයි. | |
| 22.3 දෙන ලද වචන නිවැරදි ව ගළපා වචන හතරකට නොවැඩි කථන ව්‍යවහාරයේ අර්ථවත් වාක්‍ය දෙකක් නිර්මාණය කර යාන්ත්‍රික කුසලතා ප්‍රදර්ශනය කරමින් තනිරුලේ ලියයි. | 22.3.1 වචන නිවැරදි ව ගැළපීම | වාක්‍ය දෙකෙහි ම වචන නිවැරදි ව ගළපා ලියයි. | එක් වාක්‍යයක පමණක් වචන නිවැරදි ව ගළපා ලියයි. | වචන ගැළපීමේ බොහෝ අඩු පාඩු සහිත ව වාක්‍ය දෙක ම ලියයි. | අන් අයගේ උදවු ඇති ව එක් වාක්‍යයක් පමණක් ලියයි. |
| | 22.3.2 නියමිත අංග සහිත වීම | අකුරු එකක් හෝ දෙකක් හැර ඉතුරු අකුරු නියමිත අංග සහිත ව ලියයි. | අකුරු තුනක් හෝ හතරක් හැර ඉතුරු අකුරු නියමිත අංග සහිත ව ලියයි. | අකුරුවලින් අඩකට වැඩි සංඛ්‍යාවක් නියමිත අංග සහිත ව ලියයි. | අකුරුවලින් අඩකට අඩු සංඛ්‍යාවක් නියමිත අංග සහිත ව ලියයි. |
| | 22.3.3 නිවැරදි හැඩයෙන් යුතු වීම | අකුරු එකක් හෝ දෙකක් හැර ඉතුරු අකුරු නිවැරදි හැඩය සහිත ව ලියයි. | අකුරු තුනක් හෝ හතරක් හැර ඉතුරු අකුරු නිවැරදි හැඩය සහිත ව ලියයි. | අකුරුවලින් අඩකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි හැඩය සහිත ව ලියයි. | අකුරුවලින් අඩකට අඩු සංඛ්‍යාවක් නිවැරදි හැඩය සහිත ව ලියයි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 22.3.4 නියමිත ප්‍රමාණයට ලිවීම | අකුරු එකක් හෝ දෙකක් හැර ඉතුරු අකුරු නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව ලියයි. | අකුරු තුනක් හෝ හතරක් හැර ඉතුරු අකුරු නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව ලියයි. | අකුරුවලින් අඩකට වැඩි සංඛ්‍යාවක් නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව ලියයි. | අකුරුවලින් අඩකට අඩු සංඛ්‍යාවක් නියමිත ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් ව ලියයි. |
| | 22.3.5 නිවැරදි දිශාව අනුගමනය කිරීම | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් අකුරු එකක් හෝ දෙකක් හැර ඉතුරු අකුරු ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් තුනක් හෝ හතරක් හැර ඉතුරු අකුරු ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් අඩකට වැඩි සංඛ්‍යාවක් ලියයි. | අකුරු ලිවීමේ නිවැරදි දිශාව අනුගමනය කරමින් අකුරුවලින් අඩකට අඩු සංඛ්‍යාවක් ලියයි. |
| | 22.3.6 වචනයක අකුරු අතර නිසි පරතරය තැබීම | සියලු ම අකුරු අතර නිසි පරතරය තබයි. | | සියලු ම අකුරු අතර නිසි පරතරය නො තබයි. | |
| | 22.3.7 වචන අතර නිසි පරතරය තැබීම | සියලු ස්ථානවල වචන අතර නිසි පරතරය තබයි. | | සියලු ස්ථානවල වචන අතර නිසි පරතරය නො තබයි. | |
| | 22.3.8 නැවතීමේ ලකුණ නිවැරදි ව යෙදීම | වාක්‍ය දෙකෙහි ම නැවතීමේ ලකුණ නිවැරදි ස්ථානයේ යොදයි. | | වාක්‍ය දෙකෙහි ම නැවතීමේ ලකුණ නිවැරදි ස්ථානයේ නො යොදයි. | |

ප්‍රායෝගික කාර්යයන්වලදී කියවීමේ පුරුද්ද ඉතා වැදගත් වේ. භාෂාවක් නිවැරදි ව ඉගෙන ගෙන එය අර්ථාන්විත ලෙස භාවිත කිරීමේ හැකියාව ප්‍රාථමික අවධියේ සිසුන්ට තිබිය යුතු ය. භාෂාවක් නිවැරදි ව භාවිත කිරීමේ හැකියාව ක්‍රම ක්‍රමයෙන් සංවර්ධනය කළ යුතු ය. එහිදී ප්‍රායෝගික අවස්ථාවල භාෂාව භාවිත කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දීම වැදගත් වේ. තම ජීවිතයේ විවිධ අවස්ථාවල අර්ථාන්විත ලෙස භාෂාව භාවිත කිරීමට සිදු වන්නේ ය යන අවබෝධය සිසුන්ට ලබා දීම ද මෙහිදී සිදු විය යුතු ය. ප්‍රායෝගික ජීවිතයේ භාෂාත්මක කටයුතු නිවැරදි ව සිදු කිරීමට අවශ්‍ය පදනම පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමු.

## විෂය නිර්දේශයේ උද්ධෘතය

| සමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | ඇගයීම් නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා<br>ශා.භා.කා | 23. ප්‍රායෝගික කාර්යයන්වලදී කියවීමේ පුරුද්ද ප්‍රදර්ශනය කරයි. | 'අපේ සම්පත් හා නිපැයුම්' තේමාව ඇසුරෙන් ඉදිරිපත් කරන භාණ්ඩවල නම්<br>■ භාණ්ඩ නාමකරණය සඳහා ලේබල්<br>■ නිවැරදි ව කියවීම<br>■ නිවැරදි උච්චාරණය<br>■ ශබ්ද නඟා කියවීම<br>■ අවධානය<br>■ අවබෝධය<br>■ නිරීක්ෂණය | ■ කියවීම<br>■ සවන් දීම | 23.1 භාණ්ඩ නාමකරණය සඳහා භාවිත කරන ලේබල් පහක් නිවැරදි ව උච්චාරණය කරමින් ශබ්ද නඟා කියවයි. | 23.1.1 නිවැරදි වීම |
| | | | | 23.2 ලේබල් පහක් කියවා එක් එක් ලේබලයට අදාළ භාණ්ඩ නිවැරදි ව තෝරා ඉදිරිපත් කරයි. | 23.2.1 නිවැරදි වීම |

**ක්‍රියාකාරකම 23.1, 23.2 : ලේබල්වල නම් කියමු; තෝරා ඉදිරිපත් කරමු.**

**කාලය** : පැය 01යි.

**වාංමාලාව** : ලේබල්වල නම්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

### පියවර 01

- වෙළඳ පොළක භාණ්ඩ නාමකරණය කර ඇති අවස්ථාවක් සිසුන්ට ඉදිරිපත් කරන්න.
- එහි භාණ්ඩ නාමකරණය කර ඇති ආකාරය සහ එහි ප්‍රායෝගික වැදගත්කම පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

### පියවර 02

- සිසුන් කණ්ඩායම්වලට වෙන් කරන්න.
- සිසු කණ්ඩායම් සෙල්ලම් ගෙවල්වලට යොමු කරන්න.
- සෙල්ලම් ගෙදරක් දැමීමට අවශ්‍ය උපකරණ සැම කණ්ඩායමකට ම ලබා දෙන්න.
- සිසුන් සෙල්ලම් ගෙදර මුළුතැන්ගෙය සඳහා යොමු කරන්න.
- එහිදී සෙල්ලම් ගෙදර මුළුතැන්ගෙයෙහි කුළුබඩු සහ ධාන්‍ය වර්ග දැමීමට සුදුසු භාජන සහ ධාන්‍ය වර්ගවල නම් ලියූ ලේබල් සැම කණ්ඩායමකට ම ලබා දෙන්න.
- මෙහිදී සැම දෙනාට ම එක් ලේබලයක් බැගින් හෝ අදාළ කුළුබඩු සහ ධාන්‍ය වර්ගය සහිත භාජනයේ ඇලවීමට අවස්ථාව ලබා දෙන්න.
- කණ්ඩායමේ සියලු ම දෙනා එක් ව ඇලවූ ලේබල් කියවීමට යොමු කරන්න.

### පියවර 03

- ඉහත සඳහන් කුළුබඩු සහ ධාන්‍ය වර්ගවල නම් සහිත ලේබල් ගුරුවරයා විසින් හුණු පුවරුවේ ලියන්න.
- එම ලේබල්වල සඳහන් නම් එක් වරක් ශබ්ද නඟා කියවන්න.
- අනතුරුව සිසුන්ට ද කියවීමට අවස්ථාව දෙන්න.

### පියවර 04

- සෙල්ලම් ගෙවල්වල ඇති විවිධ ද්‍රව්‍ය ලේබල් කරන්න.
- ගුරුවරයා විසින් එම එක් එක් ලේබලයෙහි ඇති නමක් බැගින් පවසන්න.
- ගුරුවරයා විසින් පවසන ලද එක් එක් ලේබලයට අදාළ නම කියවූ පසු සිසුන් විසින් සෙල්ලම් ගෙය තුළ ඇති ලේබල් කියවා අදාළ භාණ්ඩය තෝරා ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.
- මෙය ක්‍රීඩාවක් ආකාරයට සිදු කරන්න.

**පියවර 05**

- නිවසක මුලුතැන්ගෙයි ඇති කුළුබඩු, ධාන්‍ය වර්ග වැනි දේවල්වල ලේබල් ඇලවීම මගින් ඇති වන වාසි සහගත තත්ත්වය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- මේ ආකාරයට විවිධ ද්‍රව්‍ය ලේබල් කර ඇති අවස්ථා පැවසීමටත් එමගින් සිදු වූ වාසි පිළිබඳවත් සාකච්ඡා කරන්න.
- මේ පිළිබඳ සිසු අද්දැකීම් පැවසීමට ද අවස්ථාව ලබා දෙන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | **4** | **3** | **2** | **1** |
| 23.1 භාණ්ඩ නාමකරණය සඳහා භාවිත කරන ලේබල් පහක් නිවැරදි ව උච්චාරණය කරමින් ශබ්ද නඟා කියවයි. | 23.1.1 නිවැරදි වීම | ලේබල් පහක හෝ හතරක වචන නිවැරදි ව උච්චාරණය කරයි. | ලේබල් තුනක වචන නිවැරදි ව උච්චාරණය කරයි. | ලේබල් දෙකක වචන නිවැරදි ව උච්චාරණය කරයි. | ලේබල් එකක වචන නිවැරදි ව උච්චාරණය කරයි. |
| 23.2 ලේබල් පහක් කියවා එක් එක් ලේබලයට අදාළ භාණ්ඩ නිවැරදි ව තෝරා ඉදිරිපත් කරයි. | 23.2.1 නිවැරදි වීම | භාණ්ඩ පහක් හෝ හතරක් නිවැරදි ව තෝරා ඉදිරිපත් කරයි. | භාණ්ඩ තුනක් නිවැරදි ව තෝරා ඉදිරිපත් කරයි. | භාණ්ඩ දෙකක් නිවැරදි ව තෝරා ඉදිරිපත් කරයි. | එක් භාණ්ඩයක් නිවැරදි ව තෝරා ඉදිරිපත් කරයි. |

## විෂය නිර්දේශයේ උද්ධෘතය

| සාමාන්‍ය භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | ඇගයීම් නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා | 24. ඡේද, කතන්දර හා දෙබස් ශබ්ද නඟා නිවැරදි ව කියවයි. | 'අපේ ගෙදර', 'අපේ සත්ත්ව ලෝකය' වැනි විවිධ තේමා ඇසුරෙන් වචන හැටකින් යුතු සරල ඡේදයක්/ කතන්දරයක්/ දෙබසක්<br>■ සරල වාක්‍ය<br>■ සරල වචන<br>■ කෙටි දෙබස්<br>■ වාගාලාප<br>■ කෙටි ඡේද හා කතන්දර (වචන 60)<br>■ කථන ව්‍යවහාරය | ■ කියවීම<br>■ සවන් දීම | 24.1 කථන ව්‍යවහාරයෙන් රචිත වචන හැටකින් යුත් සරල ඡේදයක් හැඟීම් ප්‍රකාශන සහිත ව උචිත වේගයෙන් ශබ්ද නඟා කියවයි. | 24.1.1 නිවැරදි වීම<br>24.1.2 උචිත වේගය<br>24.1.3 නිර්දිෂ්ට විරාම ලකුණුවලට අනුගත වීම |
| | | | | 24.2 කථන ව්‍යවහාරයෙන් රචිත වචන හැටකින් යුත් සරල කතන්දරයක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව හැඟීම් ප්‍රකාශන සහිත ව උචිත වේගයෙන් ශබ්ද නඟා කියවයි. | 24.2.1 නිවැරදි වීම<br>24.2.2 හැඟීම් ප්‍රකාශන සහිත වීම<br>24.2.3 හඬ පාලනය<br>24.2.4 උචිත වේගය<br>24.2.5 නිර්දිෂ්ට විරාම ලකුණුවලට අනුගත වීම |
| | | | | 24.3 කථන ව්‍යවහාරයෙන් රචිත කෙටි වාගාලාප අටකින් යුත් දෙබසක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව හැඟීම් ප්‍රකාශන සහිත ව උචිත වේගයෙන් ශබ්ද නඟා කියවයි. | 24.3.1 නිවැරදි වීම<br>24.3.2 හැඟීම් ප්‍රකාශන සහිත වීම<br>24.3.3 හඬ පාලනය<br>24.3.4 උචිත වේගය<br>24.3.5 නිර්දිෂ්ට විරාම ලකුණුවලට අනුගත වීම |

**ක්‍රියාකාරකම 24.1, 24.2, 24.3 : ශබ්ද නඟා කියවමු.**

**කාලය** : පැය 23යි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- කියවීම් පොතෙහි ඇති ඡේද, කතන්දර, දෙබස් සහ කවි 'සහකියවීමේ' ක්‍රමවේදය භාවිත කරමින් කියවීම සිදු කරන්න..
- **කියවීම් පොතේ ඇති පාඩම් ශබ්ද නඟා කියවීමට ද වැඩි අවස්ථාවක් ලබා දෙන්න.**
- එහිදී නිවැරදි උච්චාරණය, උචිත වේගය හා හැඟීම් ප්‍රකාශන සහිත ව කියවීම සඳහා සිසුන්ට සහාය වන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | | ප්‍රවීණතාවට දුරස්ථ ය. | |
|---|---|---|---|---|---|
| | | 4 | 3 | 2 | 1 |
| 24.1 කථන ව්‍යවහාරයෙන් රචිත වචන හැටකින් යුත් සරල ඡේදයක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව හැඟීම් ප්‍රකාශන සහිත ව උචිත වේගයෙන් ශබ්ද නඟා කියවයි. | 24.1.1 නිවැරදි වීම | වචන හැටත් පනස්පහත් අතර සංඛ්‍යාවක් නිවැරදි ව උච්චාරණය කරයි. | වචන පනස්හතරත් පනහත් අතර සංඛ්‍යාවක් නිවැරදි ව උච්චාරණය කරයි. | වචන හතළිස් නවයත් හතළිහත් අතර සංඛ්‍යාවක් නිවැරදි ව උච්චාරණය කරයි. | හතළිහට අඩු වචන සංඛ්‍යාවක් නිවැරදි ව උච්චාරණය කරයි. |
| | 24.1.2 උචිත වේගය | උචිත වේගය මැනවින් පවත්වා ගනිමින් කියවයි. | | උචිත වේගයකින් නො කියවයි. | |
| | 24.1.3 නිර්දිෂ්ට විරාම ලකුණුවලට අනුගත වීම | විරාම ලකුණුවලට අනුගත වෙයි. | | විරාම ලකුණුවලට අනුගත නො වෙයි. | |

<table>
<tr>
<td rowspan="2">24.2<br>කථන ව්‍යවහාරයෙන් රචිත වචන හැටකින් යුත් සරල කතන්දරයක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව හැඟීම් ප්‍රකාශන සහිත ව උචිත වේගයෙන් ශබ්ද නඟා කියවයි.</td>
<td>24.2.1<br>නිවැරදි වීම</td>
<td>වචන හැටත් පනස්පහත් අතර සංඛ්‍යාවක් නිවැරදි ව උච්චාරණය කරයි.</td>
<td>වචන පනස්හතරත් පනහත් අතර සංඛ්‍යාවක් නිවැරදි ව උච්චාරණය කරයි.</td>
<td>වචන හතළිස් නවයත් හතළිහත් අතර සංඛ්‍යාවක් නිවැරදි ව උච්චාරණය කරයි.</td>
<td>හතළිහට අඩු වචන සංඛ්‍යාවක් නිවැරදි ව උච්චාරණය කරයි.</td>
</tr>
<tr>
<td>24.2.2<br>හැඟීම් ප්‍රකාශන සහිත වීම</td>
<td colspan="2">කතන්දරයේ අදහසට අනුව ඉතා මැනවින් හැඟීම් ප්‍රකාශනය ඉස්මතු වෙයි.</td>
<td colspan="2">කතන්දරයේ අදහසට අනුව හැඟීම් ප්‍රකාශනය ඉස්මතු නො වෙයි.</td>
</tr>
<tr>
<td rowspan="3"></td>
<td>24.2.3<br>හඬ පාලනය</td>
<td colspan="2">ඉතා හොඳින් හඬ පාලනය සිදු කරයි.</td>
<td colspan="2">හඬ පාලනය සිදු නො කරයි.</td>
</tr>
<tr>
<td>24.2.4<br>උචිත වේගය</td>
<td colspan="2">උචිත වේගය මැනවින් පවත්වා ගනිමින් කියවයි.</td>
<td colspan="2">උචිත වේගයකින් නො කියවයි.</td>
</tr>
<tr>
<td>24.2.5<br>නිර්දිෂ්ට විරාම ලකුණුවලට අනුගත වීම</td>
<td colspan="2">විරාම ලකුණුවලට අනුගත වෙයි.</td>
<td colspan="2">විරාම ලකුණුවලට අනුගත නො වෙයි.</td>
</tr>
</table>

| | | | | | |
|---|---|---|---|---|---|
| 24.3 කථන ව්‍යවහාරයෙන් රචිත කෙටි වාගාලාප අටකින් යුත් දෙබසක් නිවැරදි උච්චාරණයෙන් යුතු ව හැඟීම් ප්‍රකාශන සහිත ව උචිත වේගයෙන් ශබ්ද නඟා කියවයි. | 24.3.1 නිවැරදි වීම | වචන එකක් හෝ දෙකක් හැර ඉතුරු සියලු වචන නිවැරදි ව උච්චාරණය කරයි. | වචන තුනක් හෝ හතරක් හැර ඉතුරු සියලු වචන නිවැරදි ව උච්චාරණය කරයි. | වචනවලින් අඩකට වැඩි ප්‍රමාණයක් නිවැරදි ව උච්චාරණය කරයි. | වචනවලින් අඩකට අඩු ප්‍රමාණයක් නිවැරදි ව උච්චාරණය කරයි. |
| | 24.3.2 හැඟීම් ප්‍රකාශන සහිත වීම | අදහසට අනුව ඉතා මැනවින් හැඟීම් ප්‍රකාශනය ඉස්මතු වෙයි. | | අදහසට අනුව හැඟීම් ප්‍රකාශනය ඉස්මතු නො වෙයි. | |
| | 24.3.3 හඬ පාලනය | ඉතා හොඳින් හඬ පාලනය සිදු කරයි. | | හඬ පාලනය සිදු නො කරයි. | |
| | 24.3.4 උචිත වේගය | උචිත වේගය මැනවින් පවත්වා ගනිමින් කියවයි. | | උචිත වේගයකින් නො කියවයි. | |
| | 24.3.5 නිර්දිෂ්ට විරාම ලකුණුවලට අනුගත වීම | විරාම ලකුණුවලට අනුගත වෙයි. | | විරාම ලකුණුවලට අනුගත නො වෙයි. | |

ජීවිතයේ සාර්ථකත්වය සඳහා තම මව්බස නිසි ලෙස භාවිත කිරීමට ඇති හැකියාව වැදගත් ය. තම මව්බස නිසි ලෙස භාවිත කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන රැසකි. 'පොත් කියවීම' යනු එයින් එක් අවස්ථාවකි. පොත් කියවීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන ඉමහත් ය.

පොත් කියවීමට සිසුන් තුළ රුචිකත්වයක් ඇති කිරීම වැදගත් වේ. පළමුවන ශ්‍රේණියේ සිට ම මෙම හැකියාව සිසුන් තුළ සංවර්ධනය කළ යුතු ය.

පොත් කියවීම සඳහා අකුරු, වචන, වාක්‍ය නිවැරදි ව කියවීමට ඇති හැකියාව අත්‍යවශ්‍ය වූවකි. ඒ අනුව පොත් කියවීම සඳහා සිසුන් යොමු කිරීමත් පොත් කියවීමෙන් ලබා ගන්නා දැනුම සිසුන්ගේ ජීවිතය කෙරෙහි ඵලදායි ලෙස යොදා ගන්නා ආකාරයත් සිසුන් සමග සාකච්ඡා කිරීම වැදගත් වේ.
.

**විෂය නිර්දේශයේ උද්ධෘතය**

| සමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලකෂණ | කාර්ය සාධන ප්‍රමිති | ඇගයීම් නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා<br>ශා.භා.කා | 25.<br>පොතක් කියවීමේදී සැලකිලිමත් විය යුතු මූලික කරුණු පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරමින් පොත් කියවයි. | විවිධ තේමාවලට අදාළ කතන්දර පොත්<br>■ පොතේ මාතෘකාව<br>■ පිටකවරයේ චිත්‍රය<br>■ පොතේ කර්තෘ<br>■ නිරීක්ෂණය<br>■ ශබ්ද නඟා කියවීම<br>■ නිවැරදි උච්චාරණය<br>■ හඬ පාලනය<br>■ උචිත වේගය<br>■ අවධානය<br>■ අවබෝධය<br>■ සංයමය | ■ සවන් දීම<br>■ කතා කිරීම<br>■ කියවීම | 25.1 වචන හැටකින් පමණ සමන්විත කතන්දර පොතක පිටකවරය නිරීක්ෂණය කර එහි මාතෘකාව හා කතුවරයාගේ නම ශබ්ද නඟා කියවයි. | 25.1.1 නිවැරදි වීම |
| | | | | 25.2 වචන හැටකින් පමණ සමන්විත කතන්දර පොතක පිටකවරය නිරීක්ෂණය කර එහි මාතෘකාව සහ චිත්‍රය ඇසුරෙන් කතන්දරයේ අන්තර්ගතය පිළිබඳ පුරෝකථනයක් ඉදිරිපත් කරයි. | 25.2.1 මාතෘකාව සහ චිත්‍රය අතර අන්තර් සම්බන්ධතාවක් සහිත පුරෝකථනයක් වීම |
| | | | | 25.3 වචන හැටකින් පමණ සමන්විත කතන්දර පොතක් නිවැරදි උච්චාරණයෙන්, හඬ පාලනයෙන් හා උචිත වේගයෙන් යුතු ව ශබ්ද නඟා කියවයි. | 25.3.1 නිවැරදි වීම<br>25.3.2 හඬ පාලනය<br>25.3.3 උචිත වේගය<br>25.3.4 නිර්දිෂ්ට විරාම ලකුණුවලට අනුගත වීම |
| | | | | 25.4 වචන හැටකින් පමණ සමන්විත කතන්දර පොතක් කියවා එහි අන්තර්ගතය පිළිබඳ අදහසක් ඉදිරිපත් කරයි. | 25.4.1 පැහැදිලි වීම |

**ක්‍රියාකාරකම 25.1, 25.2, 25.3, 25.4 : පොත් කියවමු.**

**කාලය** : පැය 01යි.

**ඉගෙනුම් සම්පත්** : විවිධ තේමාවලට අදාළ කතන්දර පොත්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- සිසුන්ට කතන්දර පොතක් පෙන්වන්න.
- පිටකවරයෙහි චිත්‍රය, පොතේ නම සහ කතුවරයාගේ නම කෙරෙහි සිසු අවධානය යොමු කරන්න.
- කතන්දර පොතේ නම සහ කතුවරයාගේ නම ශබ්ද නඟා කියවන්න.
- මෙලෙස තවත් කතන්දර පොත් කිහිපයක් සිසුන්ට පෙන්වා පිටකවරයෙහි චිත්‍රය, පොතේ නම සහ කතුවරයාගේ නම කෙරෙහි සිසු අවධානය යොමු කරන්න.
- ඒ අනුව කතන්දර පොත්වල පිටකවරයෙහි එම පොතට අදාළ චිත්‍රයක් සහිත ව පොතේ නම සහ කතුවරයාගේ නම සඳහන් වී ඇති බව සිසුන් සමග සාකච්ඡා කරන්න.

**පියවර 02**

- සිසුන් කණ්ඩායම් කරන්න.
- කණ්ඩායමකට එක බැගින් කතන්දර පොත් ලබා දෙන්න.
- පිටකවරය හොඳින් නිරීක්ෂණය කිරීම සඳහා සිසුන් යොමු කර ඊට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- පොතේ නම හා කතුවරයාගේ නම ශබ්ද නඟා පැවසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**පියවර 03**

- සිසුන් අඩකවයක් ආකාරයට වාඩි කරන්න.
- ගුරුවරයා විසින් කතන්දර පොතක් සිසුන්ට පෙන්වන්න.
- එම පොතෙහි ඇතුළත් පොතේ නම සහ කතුවරයාගේ නම ශබ්ද නඟා කියවන්න.
- එම පොතෙහි පිටකවරයේ චිත්‍රය කෙරෙහි සිසු අවධානය යොමු කරන්න.
- එම චිත්‍රයේ අන්තර්ගත වී ඇති දේවල් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- එම කරුණු ඔස්සේ ඉදිරිපත් කළ හැකි අදහසක් චිත්‍රයෙන් ප්‍රකාශ වන්නේ දැයි සිතීමට සිසුන් සමග බුද්ධිකලම්බන සාකච්ඡාවක් සිදු කරන්න.
- ඒ ඇසුරෙන් ප්‍රකාශිත අදහස් සිසුන්ගෙන් විමසමින් සාකච්ඡාවක යෙදෙන්න.

**පියවර 04**

- ඉහත පියවර 03හි ප්‍රකාශිත අදහස් සමග පොතේ නම ගැළපීම සඳහා සිසුන් බුද්ධිකලම්බන සාකච්ඡාවක නිරත කරන්න.
- ඒ අනුව චිත්‍රයෙන් ප්‍රකාශිත අදහස සහ පොතේ නම අතර ඇති සබඳතාව පිළිබඳ සිසුන් සමග සාකච්ඡාවක යෙදෙන්න.
- මෙලෙස කතන්දර පොතක පිටකවරය හොඳින් නිරීක්ෂණය කර පොතේ නම සහ චිත්‍රය ඇසුරෙන් කතන්දරයේ අන්තර්ගතය පිළිබඳ පුරෝකථනයක් කළ හැකි බව සිසුන්ට පැහැදිලි කරන්න.
- ඒ අනුව තවත් කතන්දර පොත් කිහිපයක් උදාහරණයට ගෙන එහි පිටකවරයේ ඇති චිත්‍රය සහ පොතේ නම අතර සබඳතාව ඇසුරෙන් කතන්දරයේ අන්තර්ගතය පිළිබඳ පුරෝකථන ප්‍රකාශ කිරීමේ අද්දැකීම්වල සිසුන් නිරත කරන්න.

**පියවර 05**

- සිසුන් කණ්ඩායම්වලට වෙන් කරන්න.
- සැම කණ්ඩායමකට ම කතන්දර පොත බැගින් ලබා දෙන්න.
- කණ්ඩායම්වලට දෙන ලද කතන්දර පොතෙහි පිටකවරය නිරීක්‍ෂණය කර එහි පොතේ නම හා චිත්‍රය ඇසුරෙන් කතන්දරයේ අන්තර්ගතය පිළිබඳ පුරෝකථනයක් සැම සිසුවෙකුට ම පැවසීමට අවස්ථාව දෙන්න.

**පියවර 06**

- කතන්දර පොතක් තෝරා ගන්න.
- කතන්දරය ශබ්ද නඟා කියවන්න.
- කතන්දරය රසවත් ව සිසුන්ට කියා දෙන්න.

**පියවර 07**

- තම කණ්ඩායමට ලැබුණු කතන්දරය නිවැරදි උච්චාරණයෙන්, උචිත හඬ පාලනයෙන් සහ උචිත වේගයෙන් කියවීමට සිසුන් යොමු කරන්න.
- සැම සිසුවෙකුට ම කියවීමට අවස්ථාව දෙන්න.

**පියවර 08**

- කියවන ලද කතන්දරය ඇසුරෙන් එහි අන්තර්ගතය පිළිබඳ අදහසක් තම කණ්ඩායමට ප්‍රකාශ කිරීමට සැම සිසුවෙකුට ම සහාය වන්න.
- ඒ පිළිබඳ ගුරු ආදර්ශනයක් පළමු ව ලබා දෙන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 25.1<br>වචන හැටකින් පමණ සමන්විත කතන්දර පොතක පිටකවරය නිරීක්ෂණය කර එහි මාතෘකාව හා කතුවරයාගේ නම ශබ්ද නඟා කියවයි. | 25.1.1<br>නිවැරදි වීම | මාතෘකාව හා කතුවරයාගේ නම නිවැරදි ව කියවයි. | මාතෘකාව හා කතුවරයාගේ නම නිවැරදි ව නො කියවයි. |
| 25.2<br>වචන හැටකින් පමණ සමන්විත කතන්දර පොතක පිටකවරය නිරීක්ෂණය කර එහි මාතෘකාව සහ චිත්‍රය ඇසුරෙන් කතන්දරයේ අන්තර්ගතය පිළිබඳ පුරෝකථනයක් ඉදිරිපත් කරයි. | 25.2.1<br>මාතෘකාව සහ චිත්‍රය අතර අන්තර් සම්බන්ධතාවක් සහිත පුරෝකථනයක් වීම | චිත්‍රයට සහ මාතෘකාවට වඩාත් ගැළපෙන පුරෝකථනයක් ඉදිරිපත් කරයි. | චිත්‍රයට සහ මාතෘකාවට ගැළපෙන පුරෝකථනයක් ඉදිරිපත් නො කරයි. |

| | | 4 | 3 | 2 | 1 |
|---|---|---|---|---|---|
| 25.3 වචන හැටකින් පමණ සමන්විත කතන්දර පොතක් නිවැරදි උච්චාරණයෙන්, හඬ පාලනයෙන් හා උචිත වේගයෙන් යුතු ව ශබ්ද නඟා කියවයි. | 25.3.1 නිවැරදි වීම | වචන හැටත් පනස්පහත් අතර සංඛ්‍යාවක් නිවැරදි ව උච්චාරණය කරයි. | වචන පනස්හතරත් පනහත් අතර සංඛ්‍යාවක් නිවැරදි ව උච්චාරණය කරයි. | වචන හතළිස් නවයත් හතළිහත් අතර සංඛ්‍යාවක් නිවැරදි ව උච්චාරණය කරයි. | හතළිහට අඩු වචන සංඛ්‍යාවක් නිවැරදි ව උච්චාරණය කරයි. |
| | 25.3.2 හඬ පාලනය | ඉතා හොඳින් හඬ පාලනය සිදු කරයි. | | හඬ පාලනය සිදු නො කරයි. | |
| | 25.3.3 උචිත වේගය | උචිත වේගය මැනවින් පවත්වා ගනිමින් කියවයි. | | උචිත වේගයකින් නො කියවයි. | |
| | 25.3.4 නිර්දිෂ්ට විරාම ලකුණුවලට අනුගත වීම | විරාම ලකුණුවලට අනුගත වෙයි. | | විරාම ලකුණුවලට අනුගත නො වෙයි. | |
| 25.4 වචන හැටකින් පමණ සමන්විත කතන්දර පොතක් කියවා එහි අන්තර්ගතය පිළිබඳ අදහසක් ඉදිරිපත් කරයි. | 25.4.1 පැහැදිලි වීම | ඉතා පැහැදිලි ව අදහස ඉදිරිපත් කරයි. | | පැහැදිලි ව අදහස ඉදිරිපත් නො කරයි. | |

භාෂාවක් නිවැරදි ව ග්‍රහණය කර ගත හැකි නම් සාහිත්‍ය නිර්මාණ රස විඳීමට එයින් ප්‍රබල පිටුබලයක් සැපයෙයි. එමෙන්ම කෙනෙකුගේ නිර්මාණශීලීත්වය උදෙසා ද භාෂා භාවිතයේ නිපුණත්වය ඉතා වැදගත් වෙයි. ඒ අනුව පහත සඳහන් ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවීමෙන් රස විඳීමේ කුසලතාව සහ නිර්මාණශීලීත්වයට අවශ්‍ය පදනම සැපයෙයි.

**විෂය නිර්දේශයේ උද්ධෘතය**

| සමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්‍ෂණ | කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා | 26. සරල ළමා කවි / ගීත තාලානුකූල ව ගායනා කරයි. | 'අපේ ගෙදර' තේමාව ඇසුරෙන් රචිත කවි දෙකක් සහ සරල ළමා ගීතයක්<br>■ සරල වචන<br>■ කවි පද<br>■ තාලය/රිද්මය<br>■ සාමූහික ගායනය<br>■ නිවැරදි උච්චාරණය<br>■ තාල තැබීම<br>■ අවධානය<br>■ සංයමය<br>■ ඉරියවු<br>■ අංග චලන | ■ සවන් දීම<br>■ කතා කිරීම<br>■ කියවීම | 26.1 සරල ළමා කවි දෙකක් උචිත ලෙස තාල තබමින් සාමූහික ව ගායනා කරයි. | 26.1.1 උච්චාරණය නිවැරදි වීම<br>26.1.2 තාල තැබීම නිවැරදි වීම |
| | | | | 26.2 සරල ළමා ගීතයක් උචිත ලෙස තාල තබමින් සාමූහික ව ගායනා කරයි. | 26.2.1 උච්චාරණය නිවැරදි වීම<br>26.2.2 තාල තැබීම නිවැරදි වීම |

**ක්‍රියාකාරකම 26.1, 26.2** : **කවි / ගීත තාලයට ගයමු.**

**කාලය** : පැය 01යි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පියවර 01**

- සිසුන් කණ්ඩායම් කරන්න.
- ඇස්. මහින්ද හිමියන් විසින් රචිත "හොඳ ළමයා" කවි පෙළෙහි ඇතුළත් 'පාට සුවඳ එක වගේ' යන කවියටත් 'මව්පියන්ට ගුරුවරුන්ට' යන කවියටත් කිහිප වරක් සවන් දීමට අවස්ථාව ලබා දෙන්න.
- එම කවිවල අන්තර්ගතය සරල ව සිසුන්ට පැහැදිලි කර දෙන්න.
- එහි ඇති ආදර්ශවල වැදගත්කම සහ ඒවා ජීවිතයට එක් කර ගැනීමෙන් ජීවිතය අර්ථවත් වන ආකාරය සිසුන් සමග සාකච්ඡා කරන්න.

**පියවර 02**

- එම කවි දෙකට තාල තබන ආකාරය ආදර්ශනය කරන්න.
- සිසුන් සමග කවි දෙක තාල තබමින් කිහිප වරක් ගායනා කරන්න.
- අනතුරුව එම කවි දෙක තාල තබමින් කණ්ඩායම් වශයෙන් සාමූහික ව ගායනා කිරීමට අවස්ථාව දෙන්න.

**පියවර 03**

- ඇස්. මහින්ද හිමියන් විසින් රචිත 'රාත්‍රිය' කවි පන්තියට කිහිප වරක් සවන් දීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- එම කවි පන්තියේ අන්තර්ගතය සරල ව සිසුන්ට පැහැදිලි කර දෙන්න.
- ස්වභාදහමේ ඇති අලංකාරවත්බව සහ එම අවස්ථා වින්දනය කිරීමෙන් සිතට දැනෙන සතුට, සැනසීම පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- මෙම අවස්ථා පිළිබඳ සිසු අද්දැකීම් ප්‍රකාශ කිරීමට ද අවස්ථාව ලබා දෙන්න.

**පියවර 04**

- එම කවි පන්තියට තාල තබන ආකාරය ආදර්ශනය කරන්න.
- සියලු ම සිසුන් සමග කවි පන්තිය තාල තබමින් කිහිප වරක් ගායනා කරන්න.
- අනතුරුව එම කවි පන්තිය තාල තබමින් කණ්ඩායම් වශයෙන් සාමූහික ව ගායනා කිරීමට අවස්ථාව දෙන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 26.1 සරල ළමා කවි දෙකක් උචිත ලෙස තාල ලබමින් සාමූහික ව ගායනා කරයි. | 26.1.1 උච්චාරණය නිවැරදි වීම | සියලු වචන නිවැරදි ව උච්චාරණය කරයි. | සියලු වචන නිවැරදි ව උච්චාරණය නො කරයි. |
| | 26.1.2 තාල තැබීම නිවැරදි වීම | නිවැරදි ව තාල තබයි. | නිවැරදි ව තාල නො තබයි. |
| 26.2 සරල ළමා ගීතයක් උචිත ලෙස තාල තබමින් සාමූහික ව ගායනා කරයි. | 26.2.1 උච්චාරණය නිවැරදි වීම | සියලු වචන නිවැරදි ව උච්චාරණය කරයි. | සියලු වචන නිවැරදි ව උච්චාරණය නො කරයි. |
| | 26.2.2 තාල තැබීම නිවැරදි වීම | නිවැරදි ව තාල තබයි. | නිවැරදි ව තාල නො තබයි. |

## විෂය නිර්දේශයේ උද්ධෘතය

| සමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්‍ෂණ | කාර්ය සාධන ප්‍රමිති | ඇගයීම් නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා | 27. අසා රස විඳින ලද කතන්දරයක් මතකයෙන් කියයි. | අපේ ගෙදර' තේමාව ඇසුරෙන් නිර්මිත චරිත තුනකින් යුක්ත වචන හැටකට නොවැඩි කතන්දරයක් ■ චරිත ■ සිද්ධි ■ සිද්ධි අතර අන්තර් සම්බන්ධතාව ■ අනුපිළිවෙළ ■ කථන ව්‍යවහාරය ■ අවබෝධය ■ සංයමය ■ ස්මරණය ■ නිවැරදි උච්චාරණය ■ හඬ පාලනය ■ හැඟීම් ප්‍රකාශන ■ අංග චලන | ■ සවන් දීම ■ කතා කිරීම | 27.1 සවන් දෙන ලද ළමා කතන්දරයේ ඇතුළත් චරිත දෙකක් නම් කරයි. | 27.1.1 නිවැරදි වීම |
| | | | | 27.2 සවන් දෙන ලද ළමා කතන්දරයේ ඇතුළත් සිද්ධි දෙකක් නම් කරයි. | 27.2.1 නිවැරදි වීම |
| | | | | 27.3 සවන් දෙන ලද ළමා කතන්දරය එහි චරිත හා සිද්ධි අතර අන්තර් සම්බන්ධතාව සහිත ව මතකයෙන් නැවත කියයි. | 27.3.1 චරිත හා සිද්ධි අතර අන්තර් සම්බන්ධතාවයක් සහිත වීම 27.3.2 හඬ පාලනය 27.3.3 හැඟීම් ප්‍රකාශන සහිත වීම |

**ක්‍රියාකාරකම 27.1, 27.2, 27.3 : කතන්දරයක් මතකයෙන් කියමු.**

**කාලය** : පැය 01යි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- සිසුන් සවන් දීමට යොමු කර පහත සඳහන් කතන්දරය පවසන්න.

**අපි හරි යාළුයි**

එක කැලැවක අලි පැටියෙකුයි හා පැටියෙකුයි බොහොම යාළුකමින් සිටියා. මේ දෙන්නා සෙල්ලම් කළේ හරි ම සමගියෙන්. එක්කෙනෙකුට අනිත් කෙනා නැතුව ඉන්න බෑ. හවසට සෙල්ලම් කරන්න මේ දෙන්නා ගමේ පිට්ටනියට එනවා. බැරිවෙලා හරි සෙල්ලම් කරන වේලාවට එක්කෙනෙකුට එන්න ප්‍රමාද වුණොත් අනිත් කෙනා ඉන්නෙ හරි ම නොඉවසිල්ලෙන්.

හා පැටියා උදෙන් ම ඉස්කෝලෙ යනවා. අලි පැටියා තමයි හා පැටියාව ඉස්කෝලෙට ගෙනියන්නේ. හා පැටියා අලි පැටියගේ පිට උඩ නැග ගෙන ඉස්කෝලෙ යන්නේ පුදුම සතුටකින්. හා පැටියා ඉස්කෝලේ ගේට්ටුව ළඟදී බැහැල යනකොට අලි පැටියට හරි ම දුකයි. ඒ දුකට අලි පැටියා පැත්තකට වෙලා අඬන වෙලාවලුත් තියෙනවා. දවසක් හා පැටියා අලි පැටියාගේ ඇස්වල තිබුණු කඳුළු දැක්කා. 'ඇයි මගේ යාළුවේ ඔයාට මම නැතුව පාළුයි ද ? ඒක ද මේ අඬන්නේ ?' කියල හා පැටියා ඇහුවා.

'මට ගොඩක් දුකයි හා පැටියෝ. මමත් ආසයි ඔයා වගේ ඉස්කෝලේ යන්න.' අලි පැටියා කිවුවා. 'හරි, මමත් ආසයි ඔයා මගේ පන්තියේ ම ඉන්නවා නම්. මම අපේ ගුරුතුමීගෙන් අහන්නම්' යැයි හා පැටියා පැවසුවා. එදා හා පැටියා ඉස්කෝලේ ගිහින් මේ විස්තරේ ගුරුතුමීට කිවුවා. 'ඊළඟ දවසේ ඉඳන් ඔයාගේ යාළුවටත් ඉස්කෝලෙට එන්න කියන්න.' ගුරුතුමී පැවසුවා.

හා පැටියා එදා ඉස්කෝලේ ඇරෙනකම් ඉවසිල්ලක් නැතුව හිටියේ මේ පණිවුඩය අලි පැටියාට කියන්න. ඉස්කෝලේ ඇරුණු ගමන් ම ගෙදර ගිහින් සෙල්ලම් කරන වේලාව එනතුරු නොසිට හා පැටියා පිට්ටනියට ගියා. ටික වෙලාවකින් අලි පැටියා ආවා. හා පැටියා අලි පැටියාට පණිවුඩය කිවුවා. අලි පැටියාට හරි ම සතුටුයි. ඒ සතුටටත් එක්ක දෙන්න ම බොහෝ වෙලා යනකම් සෙල්ලම් කළා. පසුවදා ඉඳන් අලි පැටියයි හා පැටියයි දෙන්න ම ඉස්කෝලේ ගියෙත් එකට. ආවෙත් එකටමයි.

**පියවර 02**

- කතන්දරයේ අන්තර්ගතය සිසුන්ට සරල ව පැහැදිලි කරමින් සිසුන් සමග සාකච්ඡා කරන්න.
- එහිදී සිසු අදහස්වලට ප්‍රමුඛ ඉඩක් ලබා දෙන්න.
- අප අවට සිටින අය පිළිබඳ සහ ඔවුන්ගේ හැඟීම් පිළිබඳ අවබෝධ කර ගැනීම මෙන් ම ඔවුන්ගේ අවශ්‍යතා තේරුම් ගෙන කටයුතු කිරීමේ වැදගත්කම සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ඒ අනුව මෙවැනි යහපත් ගුණාංග ජීවිතයට එක් කර ගැනීමේ වැදගත්කම අවධාරණය කරන්න.
- මේ පිළිබඳ සිසු අදහස්වලට අවස්ථාව ලබා දෙන්න.

**පියවර 03**

- සවන් දෙන ලද කතන්දරයේ ඇතුළත් චරිත දෙකක් නම් කිරීමට සැම සිසුවෙකුට ම අවස්ථාව ලබා දෙන්න.

**පියවර 04**

- සවන් දෙන ලද කතන්දරයේ ඇතුළත් සිද්ධි දෙකක් නම් කිරීමට සැම සිසුවෙකුට ම අවස්ථාව ලබා දෙන්න.

**පියවර 05**

- සවන් දෙන ලද ළමා කතන්දරය එහි සිද්ධි හා චරිත අතර අන්තර් සම්බන්ධතාවයෙන් යුතු ව මතකයෙන් පැවසීමට සැම සිසුවෙකුට ම අවස්ථාව දෙන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 27.1 සවන් දෙන ලද ළමා කතන්දරයේ ඇතුළත් චරිත දෙකක් නම් කරයි. | 27.1.1 නිවැරදි වීම | චරිත දෙක ම නිවැරදි ව නම් කරයි. | චරිත දෙක ම නිවැරදි ව නම් නො කරයි. |
| 27.2 සවන් දෙන ලද ළමා කතන්දරයේ ඇතුළත් සිද්ධි දෙකක් නම් කරයි. | 27.2.1 නිවැරදි වීම | සිද්ධි දෙක ම නිවැරදි ව නම් කරයි. | සිද්ධි දෙක ම නිවැරදි ව නම් නො කරයි. |
| 27.3 සවන් දෙන ලද ළමා කතන්දරය එහි චරිත හා සිද්ධි අතර අන්තර් සම්බන්ධතාව සහිත ව මතකයෙන් නැවත කියයි. | 27.3.1 චරිත හා සිද්ධි අතර අන්තර් සම්බන්ධතාවයක් සහිත වීම | චරිත හා සිද්ධි අතර අන්තර් සම්බන්ධතාව ඉතා හොඳින් සුරකියි. | චරිත හා සිද්ධි අතර අන්තර් සම්බන්ධතාව සුරැකීමට අපොහොසත් වෙයි. |
| | 27.3.2 හඬ පාලනය | ඉතා හොඳින් හඬ පාලනය සිදු කරයි. | හඬ පාලනය සිදු නො කරයි. |
| | 27.3.3 හැඟීම් ප්‍රකාශන සහිත වීම | කතන්දරයේ අදහසට අනුව ඉතා මැනවින් හැඟීම් ප්‍රකාශනය ඉස්මතු වෙයි. | කතන්දරයේ අදහසට අනුව හැඟීම් ප්‍රකාශනය ඉස්මතු නො වෙයි. |

## විෂය නිර්දේශයේ උද්ධෘතය

| සමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | ඇගයීම් නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා | 28. ළමා කතන්දරයක අන්තර්ගතය ඇසුරෙන් චිත්‍රයක් ඇඳ ඉදිරිපත් කරයි. | 'අප අවට සත්තු' තේමාව ඇසුරෙන් රචිත වචන හැටකින් යුත් සරල ළමා කතන්දරයක්<br>■ අවධානයෙන් සවන් දීම<br>■ කතන්දරයෙහි අන්තර්ගත සිද්ධි හා චරිත<br>■ අවබෝධය<br>■ අදහස් ප්‍රකාශනය<br>■ සංයමය<br>■ ඉරියවු ප්‍රදර්ශනය | ■ සවන් දීම<br>■ කතා කිරීම | 28.1 සවන් දෙන ලද ළමා කතන්දරයේ ඇතුළත් චරිත දෙකක් නම් කරයි. | 28.1.1 නිවැරදි වීම |
| | | | | 28.2 සවන් දෙන ලද ළමා කතන්දරයේ ඇතුළත් සිද්ධි දෙකක් නම් කරයි. | 28.2.1 නිවැරදි වීම |
| | | | | 28.3 සවන් දෙන ලද ළමා කතන්දරයේ ඇතුළත් සිද්ධි අතුරින් එක් සිද්ධියක් චිත්‍රයට නගයි. | 28.3.1 චිත්‍රයෙන් සිද්ධිය නිරූපණය වීම |

**ක්‍රියාකාරකම 28.1, 28.2, 28.3 : කතන්දරය ඇසුරෙන් චිත්‍රයක් අඳිමු.**

**කාලය** : පැය 01යි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පියවර 01**

- පහත සඳහන් කතන්දරයට සිසුන්ට කිහිප වරක් සවන් දීමට යොමු කරන්න.

**රෑ සාදය**

වේයන් හරි ම කඩිසරයි. වැඩක් නැතුව ඉන්න වෙලාවක් හොයා ගන්න අමාරුයි. හැම වේලාවෙ ම පුංචි පුංචි පස් ගුළි අරන් ගෙයක් හදනවා. මේ ගෙදර හදන්නේ එක්කෙනෙකුට ඉන්න ම නෙමෙයි. හැම දෙනාට ම ඉන්නයි. හැමදෙනා ම එකතු වෙලා විවේකයක් නොගෙන ම ගේ හදන්නේ වැසි කාලය අත ළඟ ම එන බව දැනගෙනයි. ඉක්මනින් ගේ හදලා අවසන් කළ යුතු නිසා වේයන්ගේ නායකයා රැස්වීමක් කැඳෙවුවා. ගේ හදන වැඩේ බෙදා ගෙන කරන්න තීරණය කළා.

පස් ගේන්න, බිත්ති බඳින්න, බිත්තිවල ජනෙල් දොරවල් දාන්න වැඩ බෙදා ගත්තා. වේ හාමිනේලා දොර රෙදි, ජනෙල් රෙදි දමා ගේ ඇතුළ සරසන්න බාර ගත්තා, කොහොම හරි වැස්සට කලින් ගේ හදලා අවසන් කළා. ගෙදර ලොකු සාදයක් පවත්වන්න වේයන්ගේ නායකයා තීරණය කළා. දිනයක් නියම කරලා කුඹියන්ටයි, තණකොළ පෙත්තන්ටයි, කණාමැදිරියන්ටයි ආරාධනා කළා. සාදය පැවැත්වුණේ රාත්‍රී කාලයේ. කුඹියන් සහ තණකොළ පෙත්තන් කෑම වර්ග ගොඩක් අරගෙන සාදයට ආවා. කණාමැදිරියන් සාදයට පැමිණ නොමිලේ ම ආලෝකය ලබා දුන්නා. එදා රෑ වේයන්ගේ ගේ ඇතුළ දිව්‍ය ලෝකයක් වගේ. හැමෝම ගොඩක් සතුටු වුණා.

- කතන්දරයේ අන්තර්ගතය සිසුන්ට සරල ව පැහැදිලි කරමින් සිසුන් සමග සාකච්ඡා කරන්න.
- එහිදී සිසු අදහස්වලට ප්‍රමුඛ ඉඩක් ලබා දෙන්න.
- අප ජීවත් වන විට විවිධ කාලවලදී අනපේක්ෂිත අවස්ථාවලට මුහුණ දීමට සිදු වන බවත් ඒ සඳහා බුද්ධිමත් ව සිතා බලා එවැනි අවස්ථාවලට මුහුණ දිය යුතු බවත් ජීවිතයේ විවිධ කටයුතු සඳහා සැලසුම් සහගත ව කටයුතු කළ යුතු බවත් එක් ව කටයුතු කිරීමේ වටිනාකම පිළිබඳවත් නායකයාගේ යහපත් අදහස්වලට ගරු කළ යුතු බවත් කතන්දරය ඇසුරෙන් සාකච්ඡා කරන්න.
- ඒ අනුව මෙවැනි අද්දැකීම් ඔස්සේ ජීවිතයේ සාර්ථකත්වය ලබා ගන්නා ආකාරය සහ එහි වැදගත්කම අවධාරණය කරන්න.
- මේ පිළිබඳ සිසු අදහස්වලට ද අවස්ථාව ලබා දෙන්න.

**පියවර 02**

- කතන්දරයේ ඇතුළත් චරිත දෙකක් නම් කිරීමට සෑම සිසුවෙකුට ම අවස්ථාව දෙන්න.

**පියවර 03**

- කතන්දරයේ ඇතුළත් සිද්ධි දෙකක් නම් කිරීමට සෑම සිසුවෙකුට ම අවස්ථාව දෙන්න.

**පියවර 04**

- සවන් දෙන ලද කතන්දරයේ ඇතුළත් එක් සිද්ධියක් චිත්‍රයට නැඟීමට සෑම සිසුවෙකුට ම උපදෙස් දෙන්න.

**පියවර 05**

- අඳින ලද චිත්‍රය සුදුසු පරිදි වර්ණ ගන්වා ඉදිරිපත් කිරීමට සෑම සිසුවෙකුට ම අවස්ථාව දෙන්න.
- අඳින ලද චිත්‍රයේ අන්තර්ගතය ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 28.1 සවන් දෙන ලද ළමා කතන්දරයේ ඇතුළත් චරිත දෙකක් නම් කරයි. | 28.1.1 නිවැරදි වීම | චරිත දෙක ම නිවැරදි ව නම් කරයි. | චරිත දෙක ම නිවැරදි ව නම් නො කරයි. |
| 28.2 සවන් දෙන ලද ළමා කතන්දරයේ ඇතුළත් සිද්ධි දෙකක් නම් කරයි. | 28.2.1 නිවැරදි වීම | සිද්ධි දෙක ම නිවැරදි ව නම් කරයි. | සිද්ධි දෙක ම නිවැරදි ව නම් නො කරයි. |
| 28.3 සවන් දෙන ලද ළමා කතන්දරයේ ඇතුළත් සිද්ධි අතුරින් එක් සිද්ධියක් චිත්‍රයට නඟයි. | 28.3.1 චිත්‍රයෙන් සිද්ධිය නිරූපණය වීම | සිද්ධිය නිරූපණය වන අයුරින් චිත්‍රයක් අඳියි. | සිද්ධිය නිරූපණය වන අයුරින් චිත්‍රයක් ඇඳීමට අපොහොසත් වෙයි. |

## විෂය නිර්දේශයේ උද්ධෘතය

| සමාජ භාෂා කාර්ය /ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | ඇගයීම් නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා | 29.<br>ළමා ගීතයක අන්තර්ගතය ඇසුරෙන් චිත්‍රයක් ඇඳ ඉදිරිපත් කරයි. | 'පොළොව හා අහස'<br>තේමාව ඇසුරෙන් රචිත සරල ළමා ගීතයක්<br>■ අවධානයෙන් සවන් දීම<br>■ ගීතයෙහි අන්තර්ගත කරුණු<br>■ අවබෝධය<br>■ අදහස් ප්‍රකාශනය<br>■ සංයමය<br>■ ඉරියවු ප්‍රදර්ශනය<br>■ වර්ණ භාවිතය | ■ සවන් දීම<br>■ කතා කිරීම | 29.1<br>සවන් දෙන ලද ළමා ගීතයේ සඳහන් සිද්ධි දෙකක් නම් කරයි. | 29.1.1 නිවැරදි වීම |
| | | | | 29.2<br>සවන් දෙන ලද ළමා ගීතයේ සඳහන් සිද්ධි අතුරින් එක් සිද්ධියක් චිත්‍රයට නඟයි. | 29.2.1 චිත්‍රයෙන් සිද්ධිය නිරූපණය වීම |

**ක්‍රියාකාරකම 29.1, 29.2 : ළමා ගීතයක් ඇසුරෙන් චිත්‍රයක් අඳිමු.**

**කාලය** : පැය 01යි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය :**

### පියවර 01

- "මහගෙදර" චිත්‍රපටයේ ඇතුළත් 'නිල් අහස් තලේ අගේ - නෑ වලාකුළු' යන ගීතයට කිහිප වරක් සවන් දීමට සිසුන් යොමු කරන්න.
- ගීතයේ අන්තර්ගතය සිසුන් සමග සරල ව සාකච්ඡා කරන්න.
- රාත්‍රී අහසක ඇති චමත්කාරවත් බව සිත් ගන්නා අයුරින් පෙන්වා දෙන්න.
- මෙවැනි අද්දැකීම් ලබා ගැනීමේ වැදගත්කම අවධාරණය කරන්න.
- මෙවැනි අවස්ථා පිළිබඳ සිසු අද්දැකීම් පැවසීමට ද අවස්ථාව දෙන්න.

### පියවර 02

- සවන් දෙන ලද ළමා ගීතයේ ඇතුළත් සිද්ධි දෙකක් නම් කිරීමට සැම සිසුවෙකුට ම අවස්ථාව දෙන්න.

### පියවර 03

- සවන් දෙන ලද ළමා ගීතයේ ඇතුළත් එක් සිද්ධියක් චිත්‍රයට නැගීමට සැම සිසුවෙකුට ම උපදෙස් දෙන්න.

### පියවර 04

- අඳින ලද චිත්‍රය සුදුසු පරිදි වර්ණ ගන්වා ඉදිරිපත් කිරීමට සැම සිසුවෙකුට ම අවස්ථාව දෙන්න.
- අඳින ලද චිත්‍රයේ අන්තර්ගතය ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 29.1<br>සවන් දෙන ලද ළමා ගීතයේ සඳහන් සිද්ධි දෙකක් නම් කරයි. | 29.1.1<br>නිවැරදි වීම | සිද්ධි දෙක ම නිවැරදි ව නම් කරයි. | සිද්ධි දෙක ම නිවැරදි ව නම් නො කරයි. |
| 29.2<br>සවන් දෙන ලද ළමා ගීතයේ සඳහන් සිද්ධි අතුරින් එක් සිද්ධියක් චිත්‍රයට නඟයි. | 29.2.1<br>චිත්‍රයෙන් සිද්ධිය නිරූපණය වීම | සිද්ධිය නිරූපණය වන අයුරින් චිත්‍රයක් අඳියි.<br>. | සිද්ධිය නිරූපණය වන අයුරින් චිත්‍රයක් ඇඳීමට අපොහොසත් වෙයි. |

**විෂය නිර්දේශයේ උද්ධෘතය**

| සමාජ භාෂා කාර්ය/ ශාස්ත්‍රීය භාෂා කාර්ය | ඉගෙනුම් පලය | අන්තර්ගතය | සුවිශේෂ භාෂා ලක්ෂණ | කාර්ය සාධන ප්‍රමිති | ඇගයීම් නිර්ණායක |
|---|---|---|---|---|---|
| ස.භා.කා | 30. පින්තූර කිහිපයක් ඇසුරින් කතන්දරයක් ගොඩනගා ඉදිරිපත් කරයි. | 'අප අවට සත්තු' තේමාව ඇසුරෙන් නිර්මිත චරිත දෙකකින් යුත් එකිනෙක හා සබැඳි සිද්ධි හතරක් ඇතුළත් පින්තූර හතරක්<br>■ චරිත<br>■ සිද්ධි<br>■ චරිත හා සිද්ධි අතර අන්තර් සම්බන්ධතාව<br>■ අනුපිළිවෙළ<br>■ කථන ව්‍යවහාරය<br>■ අවබෝධය<br>■ සංයමය | ■ සවන් දීම<br>■ කතා කිරීම | 30.1 දෙන ලද පින්තූර හතර නිරීක්ෂණය කර එක් එක් පින්තූරවල ඇති දේවල් ප්‍රකාශ කරයි. | 30.1.1 නිවැරදි වීම |
| | | | | 30.2 දෙන ලද පින්තූර, සිද්ධි අතර අන්තර් සම්බන්ධතාව ගොඩනැගෙන පරිදි අනුපිළිවෙළට පෙළගස්වයි. | 30.2.1 පින්තූර සහ සිද්ධි අතර අන්තර් සම්බන්ධතාවක් සහිත වීම |
| | | ■ හැඟීම් ප්‍රකාශන<br>■ අංග චලන<br>■ නිවැරදි උච්චාරණය<br>■ හඬ පාලනය | | 30.3 දෙන ලද පින්තූර හතර ඇසුරෙන් චරිත හා සිද්ධි අතර අන්තර් සම්බන්ධතාවක් සහිත ව කතන්දරයක් ගොඩනගා වාචික ව ඉදිරිපත් කරයි. | 30.3.1 චරිත හා සිද්ධි අතර අන්තර් සම්බන්ධතාවක් සහිත වීම<br>30.3.2 හඬ පාලනය<br>30.3.3 හැඟීම් ප්‍රකාශනය |

**ක්‍රියාකාරකම 30.1, 30.2, 30.3 : පින්තූර ඇසුරෙන් කතන්දරයක් ගොඩනගමු.**





**කාලය** : පැය 01යි.

**ඉගෙනුම් සම්පත්** : කතන්දරයට අදාළ පින්තූර ඇතුළත් QR කේත

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය** :

### පියවර 01

- පහත සඳහන් පින්තූර හතර අනුපිළිවෙළින් තොර ව සෑම සිසුවෙකුට ම පෙනෙන පරිදි පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- ඒ සඳහා පහත QR කේත භාවිත කළ හැකි ය.

- එම එක් එක් පින්තූරය සියුම් ව නිරීක්ෂණය සඳහා සිසුන් යොමු කරන්න.
- එක් එක් පින්තූරයේ ඇතුළත් දේවල් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

### පියවර 02

- පින්තූර හතර, සිද්ධි අතර අන්තර් සම්බන්ධතාව ගොඩනැගෙන පරිදි පෙළගැස්විය හැකි ආකාරය පවසන ලෙසට සිසුන්ට උපදෙස් දෙන්න.
- ඒ අනුව පින්තූර හතර නිවැරදි ලෙස පෙළගස්වන්න.


### පියවර 03

- පින්තූර හතර ඇසුරෙන් චරිත හා සිද්ධි අතර අන්තර් සම්බන්ධතාවක් සහිත ව කතන්දරයක් ගොඩනගා ඉදිරිපත් කිරීමට සිසුන්ට සහාය වන්න.

### පියවර 04

- පහත පින්තූර හතර සෑම සිසුවෙකුට ම පෙනෙන පරිදි පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- ඒ සඳහා පහත QR කේත භාවිත කළ හැකි ය.
- එම එක් එක් පින්තූරවල ඇති දේවල් ප්‍රකාශ කිරීම සඳහා සිසුන්ට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.

උදාහරණ :



### පියවර 05

- පින්තූර හතර කතන්දරයක් ගොඩනැඟිය හැකි ආකාරයේ අනුපිළිවෙළට සකස් කර ඉදිරිපත් කිරීම සඳහා සෑම සිසුවෙකුට ම අවස්ථාව ලබා දෙන්න.

### පියවර 06

- පින්තූරවල චරිත සහ සිද්ධි අතර මනා අන්තර් සම්බන්ධතාවක් සහිත කතන්දරයක් ගොඩනඟා ප්‍රකාශ කිරීම සඳහා සෑම සිසුවෙකුට ම අවස්ථාව දෙන්න.

**තක්සේරුකරණය :**

| කාර්ය සාධන ප්‍රමිති | තක්සේරු නිර්ණායක | ප්‍රවීණතාවට පැමිණ ඇත. | ප්‍රවීණතාවට දුරස්ථ ය. |
|---|---|---|---|
| 30.1 දෙන ලද පින්තූර හතර නිරීක්ෂණය කර එක් එක් පින්තූරවල ඇති දේවල් ප්‍රකාශ කරයි. | 30.1.1 නිවැරදි වීම | පින්තූර හතරෙහි ම ඇති දේවල් නිවැරදි ව ප්‍රකාශ කරයි. | පින්තූර හතරෙහි ම ඇති දේවල් නිවැරදි ව ප්‍රකාශ නො කරයි. |

| | | | |
|---|---|---|---|
| 30.2 දෙන ලද පින්තූර, සිද්ධි අතර අන්තර් සම්බන්ධතාව ගොඩනැගෙන පරිදි අනුපිළිවෙළට පෙළගස්වයි. | 30.2.1 පින්තූර සහ සිද්ධි අතර අන්තර් සම්බන්ධතාවක් සහිත වීම | පින්තූර සහ සිද්ධි අතර අන්තර් සම්බන්ධතාවක් සහිත ව අනුපිළිවෙළට පෙළගස්වයි. | පින්තූර සහ සිද්ධි අතර අන්තර් සම්බන්ධතාවක් සහිත ව අනුපිළිවෙළට පෙළගැස්වීමට අපොහොසත් වෙයි. |
| 30.3 දෙන ලද පින්තූර හතර ඇසුරෙන් චරිත හා සිද්ධි අතර අන්තර් සම්බන්ධතාවක් සහිත ව කතන්දරයක් ගොඩනගා වාචික ව ඉදිරිපත් කරයි. | 30.3.1 චරිත හා සිද්ධි අතර අන්තර් සම්බන්ධතාවක් සහිත වීම | චරිත හා සිද්ධි අතර අන්තර් සම්බන්ධතාව සුරකියි. | චරිත හා සිද්ධි අතර අන්තර් සම්බන්ධතාව සුරැකීමට අපොහොසත් වෙයි. |
| | 30.3.2 හඬ පාලනය | ඉතා හොඳින් හඬ පාලනය සිදු කරයි. | හඬ පාලනය සිදු නො කරයි. |
| | 30.3.3 හැඟීම් ප්‍රකාශනය | කතන්දරයේ අදහසට අනුව ඉතා මැනවින් හැඟීම් ප්‍රකාශනය ඉස්මතු වෙයි. | කතන්දරයේ අදහසට අනුව හැඟීම් ප්‍රකාශනය ඉස්මතු නො වෙයි. |

**මව්බස-ගුරු මාර්ගෝපදේශය (සි), 1 ශ්‍රේණිය**

தாய்மொழி-ஆசிரியர் வழிகாட்டி (சி), தரம் 1

මව්බස-ගුරු මාර්ගෝපදේශය (සි), 1 ශ්‍රේණිය
தாய்மொழி-ஆசிரியர் வழிகாட்டி (சி), தரம் 1